
# අසිරිමත්

# බුදුමග පියසටහන්...



අතිපූජනීය අනුනායක මහතෙරසන්

**නාඋයනේ ශ්‍රී අරියධම්ම** නාහිමිපාණන් වහන්සේගේ

**ස්වයං ලිඛිත ආත්ම සහතිකය** ඇසුරෙන් සැකසුණු ග්‍රන්ථයයි...

පටුන

# අසිරිමත් බුදුමග පියසටහන්..





අතිපූජනීය අනුනායක මහා බෝසත්

**නාඋයනේ ශ්‍රී අරියධම්ම** නාහිමිපාණන් වහන්සේගේ

**ස්වයං ලිඛිත ආත්ම සඵතිකයි** ඇසුරෙන් සැකසුණු ග්‍රන්ථයයි..

I

අසිරිමත්
බුදුමග පියසටහන්...

**පළමු මුද්‍රණය:**

ශ්‍රී.බු.ව. 2561
ව්‍ය.ව. 2017 සැප්තැම්බර්

ලිඛිත අවසරය මත නැවත මුද්‍රණය කළ හැකි ය.

**විමසීම්:**
නා උයන ආරණ්‍යය සේනාසනය,
පන්සියගම,
මැල්සිරිපුර.
දු. අංකය - 0718455332
විද්‍යුත් තැපෑල - nauyana@gmail.com

මෙම පොතෙහි PDF පිටපත www.ariyamagga.org / www.nauyana.org / www.buddhadipa.tw / www.nauyana.org.tw යන වෙබ් අඩවි වලින් බාගතකර (download) හැක.

**නොමිලේ බෙදා හැරීම පිණිසයි.**



# පූජා වේවා..!


සැදැහැ දන යහපත පිණිස වූ
"අසිරිමත් බුදුමග පියසටහන්"
බෝසත් ආත්ම සහතික විස්තරය
උතුම් තුනුරුවනට පිදූ
පිළිවෙත් පූජාවක් වේවා..!

* * * * *

"බුද්ධකාරකෙ ධම්මෙ
සම්පූරෙත්වා, අසෙසතො
අහම්පි පත්තා සම්බුද්ධො,
භවිස්සාමි අනාගතෙ

බුද්ධකාරක ධර්ම සියල්ල
සම්පූර්ණ කොට අනාගතයෙහි මම ද
සම්මා සම්බුද්ධත්වයට පත් වෙමි."

ලෝ සතට සෙත සදන මහබෝසත්
සඳ පූජනීය අප ආචාර්යෝත්තම වූ
නා උයනේ ශ්‍රී අරියධම්ම
මාහිමිපාණන් වහන්සේට
උතුම් ගුරු පඬුරක් විලස ද
පූජා වේවා..!




ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ
අනුනායක, මහෝපාධ්‍යාය,
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාධිපති හා
ප්‍රධාන අනුශාසක ව වැඩසිටි
ත්‍රිපිටකධරාචාර්ය, මහා කම්මට්ඨානාචාර්ය,
ශ්‍රී ජිනවංශ ඥානාරාම වංශාවතංශ,
ශාසනධජ, සද්ධර්මවාගීශ්වරාචාර්ය,

## බුද්ධාංකුර නා උයනේ ශ්‍රී අරියධම්මාභිධාන

මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

# හැඳින්වීම.

ලක් බුදු සසුනෙහි මෑත කාලයෙහි පහළ වූ පර්යාප්ති ප්‍රතිපත්ති සාසනයන් තුළින් තම උතුම් ප්‍රව්‍රජ්‍යා ජීවිතය ඒකාලෝකමත් කර ගනිමින් ආත්මාර්ථ මෙන්ම පරාර්ථ වූ ලෝක සාසනික මෙහෙවරෙහි ද කැප කළ දිවියෙන් යුතුව ලක් බුදු සසුනෙහි මුදුන් මල්කඩවන්ව වැඩසිටි උතුම් සංඝ පීතෘවරයන් වහන්සේ අපගේ ආචාර්යෝත්තම අතිපූජනීය නා උයනේ ශ්‍රී අරියධම්ම අනුනායක මාහිමිපාණන් වහන්සේයි.

පූජනීය ස්වාමීන් වහන්සේ ළද සුපින්බර දිවිය ළදරු කල සිටම උතුම් සංසාර ප්‍රාර්ථනාවන්ට අනුව බුදු මගට අනුයාතව ගෙවා උතුම් ප්‍රව්‍රජ්‍යාවට ද පත්ව කල්‍යාණ මිත්‍ර උතුමන් ඇසුරෙහි පිරූ සම්බුද්ධත්ව පාරමී කිස හේතුවෙන් ගෞතම මුනීන්ද්‍ර සර්වඥ සාසනයෙහි ශ්‍රේෂ්ඨ සම්බුද්ධාංකුර බුද්ධ බෝධිසත්වයන් වහන්සේ නමක් ලෙසින් දෙස් විදෙස් බෞද්ධාබෞද්ධ සුවිසල් වූ සැදැහැ ජනයාගේ අපමණ වූ ගරු බුහුමනට වන්දනීය පූජනීයත්වයට පත්ව වැඩ සිට නිමා කළද මෙම අත් බැව්හි පාරමී කිස සර්වඥතා ඥානය ප්‍රතිවේධ කරන තෙක් නොකඩ කොට පිරුමට ඇති හෙයින් සමතිසක් පෙරුමන්, නැවත ද බඹ ලොවට වැඩම කොට මනු ලොවින් වසරක් සපිරී ඇත.

එදා දෙව් ලොවින් මනුලොවට බට මේ පුණ්‍යවන්ත කුල කුමරුවාණෝ ප්‍රාර්ථනා පරිද්දෙන් තිසි වයස එළැඹි පසු ගෘහාභිනිෂ්ක්‍රමණය කරමින් නා උයන ආරණ්‍යයෙහි එවකට වැඩසිටි පූජනීය විගොඩ ශ්‍රී බෝධිරක්ඛිත

ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත පැමිණ එතැන් පටන් සසුන් පිළිවෙත්හි නොපමාව යෙදුණහ.

පූජනීය විගොඩ ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇසුරෙහි මූලික බණ දහම් උගෙන පසුව ගල්දූව ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමයේදී අතිපූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන මහා ස්වාමීන් වහන්සේ වෙත බාර කළෙන් ඒ පූජනීය පණ්ඩිත මාහිමිපාණන් වහන්සේ හා මාතර ශ්‍රී ඤාණාරාම මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන තත්කාලීන කල්‍යාණ මිත්‍ර ගුරු උතුමන් වහන්සේලා ඇසුරෙහි උතුම් ප්‍රව්‍රජ්‍යා සම්පත්තියට ද පත් වූහ.

පර්යාප්ති ධර්මය ලෙස සැබෑ ලොව්තුරු දහම පෙළ වශයෙන් ද විස්තරාර්ථ විවරණ ලෙසින් ද ත්‍රිපිටකය මෙන්ම අටුවා, ටීකා හා සංගෘහිත ග්‍රන්ථ තුළින් ද ඉතාමත් ඉහළ අවබෝධයක්, පරිචයක් ලැබූහ. තත් ශාස්ත්‍රානුගත අන්‍ය උගතුන් විසින් ද මෑත කාලයේ ලක්දිව පර්යාප්ති සාසන ධර්මාවබෝධයෙහි ඉහළම ස්ථානයෙහි ලා පූජනීය නා උයනේ මහා ස්වාමීන් වහන්සේ හඳුන්වා දෙමින් එහි ප්‍රාමාණිකත්වය පෙන්වා දී ඇත.

එමෙන්ම පූජනීය මාහිමිපාණන් වහන්සේ වැඩූ ප්‍රතිපත්ති ධර්ම සම්භාරය පිළිබඳවත් එමගින් ප්‍රතිවේදිත ධර්ම ඤාණයන් පිළිබඳවත් ලෝකයා නිසිලෙස නොදත්මුත් බාහිර දර්ශනය, හැසිරීම, දේශනා විලාශය යනාදී වූ තම තමන්ට ප්‍රත්‍යක්ෂ යම් යම් කරුණු මත විටෙක පූජනීය මාහිමිපාණන් වහන්සේට "රහතන් වහන්සේ නමක්", "මාර්ග ඵලලාභී උතුමන් වහන්සේ නමක්" ආදී වූ විවිධ තත්වයන් ආරෝපණය කළහ.

එහෙත් පූජනීය මාහිමිපාණන් වහන්සේ වැඩසිටි අවදිය තුළ දී එක්තරා දායක පින්වතෙකු විසින් කරන ලද ඉල්ලීම මත තම ජීවිතය හා සබැඳි තොරතුරු සටහන් කර තැබූහ. තම ශිෂ්‍යවරයන් වහන්සේලාට ද ඒ ගැන පවසා සිටියේ "මගේ ජීවිතයේ විශේෂ කරුණු සටහන් කර තබන බවත් ජීවත් වන කාලයෙහි එය ප්‍රසිද්ධියට පත් නොකරන බවත්" ය.

එලෙස පූජනීය මාහිමිපාණන් වහන්සේගේ උත්තරීතර බෝසත් ජීවිතය තුළ මෙතෙක් කලක් ඉදිරිපත් නොවූ සුවිශේෂ කරුණු වශයෙන් තමන් වහන්සේ ප්‍රගුණ කළ භාවනා ප්‍රතිපත්තීන් හා තමන් වහන්සේ එමගින් ප්‍රතිවේධ කරගත් ධර්ම ඤාණයන්, භාවනා ඤාණයන් කවර ආකාර වී ද යන බැව් යම් පමණ හෝ දැන ගැන්මට පවතින එක ම සාධකය එම ස්වයං ලිඛිත සටහන් පමණි.

එම සටහන් අතර පූජනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ලියා ඇති "සාසනික පැවිදි ජීවන ගමනක පිය සටහන්" යන ජීවන තොරතුරුත්, උතුම් වූ භාවනා පිළිවෙත් මග වැඩීමෙන් ලබන ලද දුර්ලභ වූ අසිරිමත් අත්දැකීම් සම්භාරය පිළිබඳවත් අපට වැටහෙන පරිදි කෙටියෙන් කරුණු දැක්වීම මෙහිලා අපගේ අභිප්‍රාය වේ. නැතහොත් කියා නිම කළ නොහැකි අපමණ වූ මාහිමි ගුණ කඳ කීමක් හෝ පූජනීය මාහිමිපාණන් වහන්සේ සතු වූ භාවනා ශක්තීන් ගැන සැබෑ ලෙසින් ම අප නොදන්නා බැවින් ඒ පිළිබඳ සම්පූර්ණ ලෙස විවරණය කිරීමක් ද මෙහි දී සිදු නොවන බව සිහිපත් කරමු.

එය ද පූජනීය මාහිමිපාණන් වහන්සේගේ සුනිමල ලෝක ශාසනික සේවයට, පරාර්ථ මෙහෙවරට උපනිශ්‍රය වී,

කියවන ලෝ දනන් සිත් එපමණකට සීමා නොවී වත්මනෙහි පවා මෙවන් උත්තම බුද්ධාංකුරයන් වහන්සේලා වැඩ සිටි බව සිහිපත් කොට එවන් උත්තමයන් වහන්සේ නමක් කල්‍යාණ මිත්‍රත්වයෙන් සේවනය කිරීමට, පයිරුපාසනය කිරීමට, අනුගමනය කරනට මෙන්ම ඒ උත්තම චරිතයෙහි වූ මෙවන් ගුණ අද හෝ ඇසීමට කියවීමට ලද අප කෙතරම් පුණ්‍යවන්තයෝ වම් දැයි සිත සිතා ඒ උතුම් ගුණ කඳට තව තවත් ළං වන්ට විරි දිරි සිත් පහළව අප්‍රමාදී වීමට මෙම උත්සාහය ද හේතු සේ පවතීවා..!

එමගින් ද සැකසෙන සකල විධ වූ අපමණ කුසල ඵල රාශිය අතිපූජනීය මාහිමිපාණන් වහන්සේ තවත් එක්දහස් අටසියයක් අත් බැව් නිමා කොට සපිරූ සමත්‍රිංශත් පාරමී ධර්ම සම්භාරය තුළින් සර්වඥතාඥාන ප්‍රතිවේධය කොට සම්මා සම්බුද්ධත්වයෙන් සැනසී අසංඛ්‍ය ගණන් ලෝක සත්ත්වයන් ද සනසවන ඒ උතුම් බුද්ධ රාජ්‍යය පිණිස හේතු වේවා..!

ශිෂ්‍ය පිරිස,
නා උයන ආරණ්‍ය සේනාසනය.

# පිං පැතුම

ලොව ඇසීමට පවා අති දුලබ වූ මෙවන් උත්තම චරිතයක් හා ගුණ සමුදයක්, දෙලෝ යහපත, ත්‍රිවර්ග සැප උදකරගනු පිණිස උපනිශ්‍රය කරගැනීමට කරන උපකාරයක් සේ ලෝවැසි දනන් වෙත ඉදිරිපත් කිරීම නම් වූ මෙම සත්කාර්යය සඳහා

- ☸ උපදෙස් ලබාදීමෙන් හා නොයෙක් අයුරින් අනුග්‍රහ කළ ථේර - මධ්‍යම - නවක සියලු පූජනීය ස්වාමීන් වහන්සේලාටත්,
- ☸ මුද්‍රණ කටයුතු සඳහා විශාල ධන පරිත්‍යාගයක් සිදු කළ පිංවතුන් සැමටත්,
- ☸ පූජනීය අප මාහිමිපාණන් වහන්සේගේ රුව සිතුවම් කළ චිත්‍ර ශිල්පී මහතා හා පවුලේ සැමටත්,
- ☸ මුද්‍රණාලයාධිපතිතුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයටත්,

සියලු ආකාරයෙන් ආධාර අනුග්‍රහ උපකාර කළ සැමටත්, සදේවක ලෝක සත්වයාටත් වහා සද්ධර්මාවබෝධය පිණිසම මේ උතුම් කුසලය ද හේතු වාසනා වේවා..!

*සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා*

# පටුන


පූජා වේවා..! .................... IV

හැඳින්වීම. .................... VI

පිං පැතුම .................... X

පටුන .................... XI

උපත. 1

ජන්ම භූමිය. 4

දෙමවුපිය වරු. 7

සහෝදර සහෝදරියෝ. 8

පෙළපත හා ගිහිනම. 9

අකුරු කරණය. 9

පාසල හා ගුරුවරු. 10

ආශ්‍රිත විහාරස්ථානය. 11

විහාරාධිපති හාහිමි. 12

ඛුදුති සහා පිරිස. 13

ප්‍රථම උපෝසථ සීල සමාදානය. 14

සමාගම් ශාලාවේ වස් වාසය කරවීම. 18

දහම් පාසල. 19

බෑණියන්ගේ අභාවය. 20

කාඋයන ආරම්භ උදුව. 22

ප්‍රතිපත්ති අනුගමනය. 24

ගෘහාසිතිප් ක්‍රමනය. 28

| | |
|---|---|
| පණ්ඩුපලාස සමය. | 34 |
| ශ්‍රී ගුණාවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානයට පැමිණීම. | 37 |
| ශාසන ප්‍රව්‍රජ්‍යාව. | 39 |
| සාමණේර සමය | 41 |
| ආචාර්ය උපාධ්‍යාය මාහිමිවරු. | 40 |
| අධ්‍යයන සමය. | 47 |
| අධිශීලෝපසම්පදාව. | 50 |
| ත්‍රිපිටකය කණ්ඨෝද්ගත කිරීම. | 53 |
| වස් විසූ ස්ථාන හා ඇසුරු කළ ස්ථාන | 54 |
| භාවනා පන්ති, | 61 |
| සම්පාදිත ධර්ම ග්‍රන්ථ, | 62 |
| දඹදිව වන්දනාව, | 63 |
| විදේශ ගමන්. | 66 |
| විශේෂ පුණ්‍ය කම්, | 70 |
| පිරූ ධුත ගුණ, | 83 |
| වැඩූ කමටහන්, | 84 |
| ආශ්‍රයට ලැබුණු කල්‍යාණ මිත්‍රයෝ. | 85 |
| විශේෂ උපකාරක දායක දායිකාවෝ. | 86 |
| ලැබූ ශාසනික ධුර. | 92 |
| වැඩූ බුදුගුණ. | 92 |
| පාලි භාෂාව, මාගධිය. | 96 |
| සිවුපස ප්‍රත්‍යවේක්ෂාව. | 101 |
| ප්‍රාර්ථනා ප්‍රණිධිය, | 109 |

පෙරුම්දම් සලකුණු ....................................................125
මාහිමිපාණන් වහන්සේ වැඩූ භාවනා ක්‍රම ..................129
සමාහිත සිතක් ....................................................146
සිතට නිවාඩුවක් ....................................................152
අරූපතල සමාධි සිත ....................................................156
බෝසත් ධර්මතා ....................................................162
මොහඳුරින් වැසුණු සැබෑව ....................................165
රූප ....................................................165
නාම ....................................................168
සතිමත් බව ....................................................174
අවසන් සිහිය ....................................................179
බිඳෙන දේ තුළ නොබිඳෙන ගමන් මග ........................180
ආත්ම භාව පරීක්ෂාව ....................................................182
ඒා ඕා භාවනාවට පෙර ....................................................194
සංස්කාර විශ්ලේෂණය ....................................................196
සතළිස් ආකාර විදර්ශනාව ....................................................199
මාහිමිපාණන් වහන්සේගේ දින චරියාව ......................202
සත් ආකාර නාම - රූප විදර්ශනාව ................................211
රූප සත්තක විදර්ශනාව ....................................................211

අරූප සත්තක විදර්ශනාව.........................................213
අසුභ භාවනාව ......................................................216
භාවනාවට බාධක.....................................................219
හට ගැන්ම හා විනාශය දැකීම.................................220
උදය ............................................................................ 223
වය................................................................................ 225
උදය - වය ..................................................................... 226
සුවිශේෂත්වයක විශේෂය....................................... 228
බිඳීම දැකීම ..........................................................231
ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකයාණන් වහන්සේ ..................236
සංස්කාර කෙරෙහි වූ උපේක්ෂාව.................................240
චුද්දස වශිය........................................................... 243
අනාගත වංශය ........................................................ 248
ථෙරාසභො අරියධම්මයතිනැනාථො. ........................... 266

# ශාසනික පැවිදි ජීවන ගමනක පිය සටහන්.

පූජ්‍ය නාඋයනේ අරියධම්ම සාමිර.
නාඋයන ආරණ්‍ය සේනාසනය.
පන්සියගම. 60554.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

## උපත.

ශ්‍රී බු:- ව:- 2482. වෙසක් මස පුර සතවක තිථිය ලත් සඳුදින හෙවත්, ක්‍රි:- ව:- 1939. අප්‍රේල් මස 24. සඳුදා.

සසරෙහි පාරමී ධර්ම සම්පූර්ණ කරමින් පැමිණෙන උතුම් බුද්ධ බෝධිසත්වයන් වහන්සේලාගේ උත්පත්තිය සත්ත්වයින් අතර විශේෂ උපතක් වෙනවා. එය සතට සෙත සලසමින් භවයෙන් භවයට මහත් වූ පාරමී කුසල ධර්ම සපුරමින් තිර අදිටනින් යුතුව උතුම් වූ සම්බුද්ධත්වය තෙක් අඛණ්ඩව යන ගමනක්.

එබඳු වූ උතුම් ප්‍රාර්ථනා ඇතිව තිර ගමනක වැඩම කරන අතිපූජනීය නා උයනේ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේත් ඉතා පුණ්‍යවන්ත ආත්ම භාවයන් තුළින් තම පාරමී ධර්ම සම්භාරය මුදුන්පත් කරමින් සිටිනවා. මාහිමිපාණන් වහන්සේ මීට පෙර වූ ආත්ම භාවයෙහි ද උතුම් දිව්‍ය සම්පත්ති ප්‍රතිලාභයෙන් පාරමී පිරුවා.

1938 වර්ෂයේ අනුරාධපුර ස්වර්ණමාලි සෑ රදුන්ගේ පිළිසකර කිරීම් කටයුතුවලට සහභාගී වෙමින් සිටි අප මාහිමිපාණන් වහන්සේගේ පියාණන් හට වූ විශේෂ සිදුවීමක් පිළිබඳ විටෙක මාහිමිපාණන්ම මෙසේ සඳහන් කර තිබෙනවා. "අනුරාධපුර රුවන්වැලි චෛත්‍යරාජයාණන් ප්‍රතිසංස්කරණ කටයුතු පැවති කාලයේ වර්ෂ 1938 දී අපේ පියාණන් වහන්සේ දින හතක් ම එහි ම නැවතී දවල් කාලයේ ශ්‍රමදානයත් රාත්‍රී කාලයේ සෑ මලුව වටේ තෙල් පහන් රැගෙන බුදුගුණ කියමින් ප්‍රදක්ෂිණා කර උපස්ථාන කළ බවත් සත් වැනි දින අලුයම සෑ මලුවේ ක්ෂණික නින්දට වැටී සිටිය දී වැදගත් පණිවිඩයක් සිහිනෙන් ලැබුණු' බවත් මා සමග කීවා.

'දැන් ගෙදර යන්න පින් ඇති පුතෙක් ලැබෙනවා' යන්න ඒ පණිවිඩයයි. 1939 අප්‍රේල් මස 24 ද පින් ඇති මව්පියන් නිසා මගේ උපත සිදු වුනා." යන උපත හා සම්බන්ධ මෙම විස්තරය සුවිශේෂ උපතක් පිළිබඳ කෙරුණු පූර්ව දැනුම් දීමක් වැනිය. එසේම තවත් අවස්ථාවක දී, "මම සිටියේ ඉහළ ලොවක නේද? ඇයි මං මේ තැනට ආවේ ආයෙමත් එතැනට මම යන්නට ඕනෑ. එතැනට යන්නට නම් මම මහණ වෙන්න ඕනෑ. යි ළදරු වයසේ දී පෙර විසූ සුගති භවය ගැන මතක් වී ළපටි සිතට මෙවැනි සිත්

පහළ වූ බව මතක ඇත්තෙමි." යනුවෙන් මාහිමිපාණන් වහන්සේ ඒ පෙර දිවස ආත්ම භාවය පිළිබඳව ද තමන් වහන්සේට ළදරු අවදියේ බොහෝ වර සිතිවිලි පහළ වූ බව දක්වා ඇත. එය "තේමිය කුමරාට" මෙන් පෙර ආත්ම භාව සිහි කිරීමේ ඥාණය හේතුවෙන් පහළ වූ සිතුවිල්ලක් විය හැකිය. මෙය බෝසතාණන් වහන්සේලා සතු විශේෂ ශක්තීන් අතරින් එකක් ද වෙනවා.

මෙබඳු වූ අසිරිමත් කරුණු වලට අනුව මේ වනාහි මනුලොව ඉතා දුර්ලභ වූ ද සැබෑ ම පුණ්‍යවන්ත වූ ද උපතක්. බොහෝ ලෝවැසි දනන් ද ඒ පිංබර උපත හේතුවෙන් දහම් සුව විඳිනට පුණ්‍යවන්ත වුණා. අනාගතයේත් පූජනීය අප මාහිමිපාණන් වහන්සේගේ අසිරිමත් පාරමී ගමන නිසා අනන්ත සත්ත්වයෝ සැනසෙන බව සතපයි.

## ජන්ම භූමිය.

වයඹ පළාතේ කුරුණෑගල දිසාවේ ඉහළ ඩිකොට කෝරළේ, හිරියාල හත්පත්තුවේ (කැරලන් කඩවල වසමේ) යාපහුව ආසනයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පන්නියගම ග්‍රාම සේවා වසමේ (මීට පෙර කුඩාහොල) ඉම්හාමින්ගේ ගම.

වයඹ පළාතේ කුරුණෑගල දිසාවත් මධ්‍යම පළාතේ මාතලේ දිසාවත් අතර දිසා සීමාව වූ ඉමත්, ආඬගල - අඹන්වැව නම් වූ ගම් දෙකට සීමාව වූ ඉමත් පිහිටියේ කුඩාහොල නම් වූ අපේ ජන්මග්‍රාමයෙහි බැවින්, ගම්පති තුමා ඉම්හා බුදියන්නෑසේ නමින් හැඳින්වී ඇත. ගම්පති තුමාගේ නමින් කුඩාහොල පසු කලෙක සිට ඉම්හාමින්(ගේ)-ගේ ගම නමින් භාවිතයට පත් වී ඇත.

එවකට යාන වාහන ගමන් මගක් නොතිබූ මේ ගමේ සිට නගරයක් වෙත යාමට සැතපුම් 5. ක් පමණ පයින් යායුතුව තිබිණි.

නිලගම පිහිටි පන්සලටත් පාසලටත් සැතපුම් දෙකක් පමණ පාගමනින් යායුතු විය. ආගමානුකූලව ජීවත් වූ ගමේ වැසියෝ බොහෝ උත්සාහයෙන් ගොවිතැනින් ජීවත්වූහ. සමගිය - ගුරු ගරුත්වය - වැඩිහිටියන්ට ගෞරවය මව්පිය උවටැන, කෘතඥතා බව, සේම ආත්මගෞරවය රැකෙන සේ ජීවත් වූහ.

මේ ගමෙන් සාදුන් ගත වූ සියම් මහානිකායේ අස්ගිරි පාර්ශ්වයේ ගරුකටයුතු සම්භාවනීය සංඝපිටවිර ස්වාමීන් වහන්සේලා 6. නමක් එවකට රන්ගිරිදඹුල්ල- තලකිරියාගම, වළඳකුඹුර මකුලෝවඩ, ජෙතගේපිටිය- අනුරංගල, තලෙන්කොරුව යන විහාරස්ථානයන් හි වැඩ වාසය කළහ.

ශාසනික ඥාති සම්බන්ධයක් ඇති මේ ගමේම ජනිත උතුමෙක් නුවරයුගයේ කුඩාපොල තෙරුන් වහන්සේ නමින් සම්භාවනීයත්වයෙන් වැඩ සිටියහ. ඉම්බුලාවිරෝගම ගුණරතන නාහිමිපාණෝ, ඉඳුළුපොල නාහිමිපාණෝ, සුමංගල නාහිමි- පාණෝ, ගුණරතන නාහිමිපාණෝ,

ධම්මජෝති නාහිමි සමඟින් ද ඉතා සඳහන් ගමේ ගරුත්වය ශාසනික ප්‍රෞඪත්වය නිර්මාණයේ දී විපුල නායකත්වය දෙති.

අද තුන් කාලයේ ගෙවල් 30කින් පමණ සමන්විත වූ මේ ගමෙහි පෙළපත් වශයෙන්, දිසානායක - විජේකෝන් - මීනුවන්ගමුව - එරියගොල්ල නම් වූ පෙළපත් සතරක සාමාජිකයන් එක මෙගඩි වැසියන් අතර අඳ - ගොළු - බිහිරි - උන්මත්තක - මන්දබුද්ධික අංගවිකල ආදී අසාමාන්‍යයන් කිසිවෙක් නොසිටිය බව සත්‍යයකි. ආශ්චර්යයකි.

දැනට කතිවූ නාසැලක්, විහාරස්ථානයක් සුදුගල ආරණ්‍යය නමින් එක සෙනාසුනක් යන එහා ගමත් කඩී නමුල් සිය ගණනින් යුත් විදුන් ගම්මානයක් බවට වී පත්වී ඇති අතර, උපාසි උපාය බාර්ත් රටයේ උසස් නිළධාරීන් ද සපිනාව, ලෞකික දියුණුවට පිය නගමින් පවතින මේ ගම නොබෝ කලකින්ම ආර්ථික සෞභාග්‍ය සඳහාර පාරම්පරිකයන්ගෙන් ද දියුණු කියුණුවට පත් වී, දෙලොව ජයගෙන නිර්වාණයට අවතීර්ණ වූ ධර්මිෂ්ඨ ග්‍රාමයක් වැනි බවට පත්වේවා යනු අපේ මෛත්‍රී පූර්ණ ආශංසනයයි.

# දෙමවුපියවරු.

සී. ඇම්. කළුබණ්ඩාර දිසානායක මහතා සහ, ඇම්. ජී. කුංඩිමැණිකේ, යන ගුණවත් ගතිම ප්‍රසාදවර මවුපිය දෙපළ වහන්සේ මා ඇතුළු අප සොහොයුරු සොහොයුරියන් අට දෙනාගේ කාරුණිකත මවුපියෝ වෙති.

ධාර්මික ගොවිතැනක් කැවිලි කර්මාන්ත-යකි ගොවිතලෑයක් සාමාන්‍ය වෙළඳ ව්‍යාපාරික ජීවනෝපාය මඟයෙන් ජීවත්වූ පියාණන් වහන්සේ, පුද්ගල භාවීන් විසින් ඉතාමත් ගෞරවයෙන් සැලකීයෙන් විශ්වාසයෙන් පිළිගනු ලැබූ පාරම්පරික දේශීය වෙදවරයෙක් මෙන්ම බෞද්ධ ආගමික කටයුතුවලදී මූලිකත්වය දැරූ බෞද්ධ බෞද්ධෝපාසකත්වයෙන් පරිණතභාවයට පත්වූ කල්‍යාණමිත්‍ර ගුණවත් කෙනෙකි.

සම්‍යක්දෘෂ්ටිකත්වය කරා සෝවාන් මඟ පලයට පත්වූ ආර්යශ්‍රාවිකාවක් බඳුවූ සීලයෙන් ගුණයෙන් පිරිපුන් අපගේ මෑණියන් වහන්සේ ගමෙන් අසල් ගම්වැසියන්ගේන් ගෞරවයට පත් වූ පුණ්‍යවතියකි

ජීවිත පැවැත්මෙන් පිරිපුන් කලාපාඨමින් ආදර්ශවත් උත්තමාවක. ඕතොමත් දරුවන් අටදෙනාකුගේ මවක් වූ අතර නිරෝගී සුවයෙන්ම අවුරුදු 40 ක් පමණ ආයු වළඳා සිය මෑණියන්ගේ පතුල් වැඳ සමුගෙන අප පියාණන්ගේද පතුල් වැඳ සමුගෙන හැදින් ආයාචිත යෙන් ඉතා කෙටි වේලාවකදීම "අනිච්චේ දුක්ඛේ සංසාරේ" යන විදර්ශනාවැකිය මෙවරක් කියා සිය නුවණින් අවසන් කොට නියමුවන් අත්තොරම සෝවාන් වූ ආර්ය ශ්‍රාවිකාවක් මෙන්.

## සොහොයුරු සොහොයුරියෝ.

ඉහත නම් සඳහන් ගුණවත් මවුනිය දෙදෙනාගේ දරු පිරිස 8. දෙනෙකි.

1. ඇම්. බී. දිසානායක (සාමවිනිසුරු) මහතා.
2. ඩී. ඇම්. ලොකුමැණිකේ. දිසානායක. මහත්මිය.
3. ඩී. බී. දිසානායක මහතා.
4. එම්. බී. දිසානායක([illegible])
5. ආර්. බී. දිසානායක මහතා.
6. ඩී. ඇම්. කුඩාමැණිකේ දිසානායක මහත්මිය.
7. ජී. බී. දිසානායක මහතා.
8. ඩී. ඇම්. සිංගිරි මැණිකේ දිසානායක මහත්මිය.

මේ අටදෙනා අතුරෙන් සිවුවැන්නා මමයි.

## පෙළපත හා ගිහිනම.

සතරවැනි පරාක්‍රමබාහු රජතුමා කුරුණෑගල රාජ්‍යය කරන කාලයේ දියසානායක මහාදිකාරම් තුමාගෙන් පැවතෙන පෙළපත දියසානායක මුදියන්සේගේ නමින් භාවිතා කෙරෙන බව පියාණන් වහන්සේ ගෙන් අසන්නට ලැබිණි. කුරුණෑගල නගරයට ජලය සැපයෙන කුරුණෑගල වැව කරවන ලද්දේ එම දියසානායක මහාදිකාරම් තුමා විසින් බව ද වැඩිදුර අසන්නට ලැබිණි. ඉහත සඳහන් වූ දරුවන් අට දෙනා අතුරෙන් සතරවැනිව මගේ නම සඳහන්ව ඇත.

## අකුරු කරණය.

ළදරු වයසේදී පෙරවිසූ පුගණ්ව භවය ගැන මතක් වී උපන් ගමට මෙවැනි සිත් පහළ වූ බව මතක ඇත්තෙමි. “ මම කවියේ ඉහළ ලොවක නේද, දැයි මං මේ තැනට ආවේ, ආයෙමත් එතැනට මම යන්නට ඕනෑ. එතැනට යන්නට නම් මම මහණ වෙන්නට ඕනෑ” මේ විදිහේ සිතිවිලි [illegible] පහළ වූවා මතකයි.

වයස තුන පමණ කාලයේ දී මගේ පුංචි අයියා වන ඩී.ඩී. දියසානායකට අකුරු කියවන නැකතක යෙදී එක උදෑසනකදී.

කෙළි පාන සුදුබල්ලාවිට සතිත පූජාසනය මත තොත කබා අපේ පියාණන් වහන්සේ විසින් කාරිතුව ඇලව සුදුවත් හැඳ පොරව, සුදුනාමිව සදිය සුව වොහොතේ පුංචි අයියාට පදවූව ඉදිරියට ගොස් කොක්කව අතුරු කීවෙමි. ඒ දැක බවුතියන් ඇතුව නිවසේ හැමදෙනාම විස්මයටත් සතුටටත් පත්වූහ ආශීර්වාද කළහ. පුංචි අයියා පාසලට යවා වයස්කොට පසුව පාසලට භාරදෙන ලද්දෙමි

## පාසල හා ගුරුවරු.

ගමේ සිට සැතපුමක් දුර ආදිසල ගම්මාන යයි, එතැන් සැතපුමක් පමණ දුර කලගමයි. කලගම නීලගිරි රාජමහා විහාරයත් අපේ පාසලත් පිහිටියේ එකම භූමියක තුළය. ගමේ හායකට තිබුණේ එකම පාසලයි. එයින් එබාත්ම දුර පිහිටියේ අපේ ගමයි. මිශ්‍ර පාසලක් වූ එහි ළමයි 300ක් පමණ උගෙනුම ලැබූ. මා ඇතුළත් වන කාලයේ ගුරුවරුන් දොළොසක් පමණ සිටියේ. ප්‍රධානාචාර්ය කදිරෝල ඩබ්. ඒ. විජේකෝන් මහත්මයා, උපප්‍රධානාචාර්ය මහලගේ, එච්. ඒ. දිසානායක මහත්මයාය. මාසර දෙක තුනක් ඇතුළත ගුරුවරු පස්දෙනෙක් පමණ පත්ව ආවිය හ. මා පාසලෙන් සමුගන්නා තුරු පැවූ ගුරුවරු

දෙදෙනාම මට ආචාර්යත්වයෙන් සැලකුවේ ස්වකීය දරුවන්ට මෙනි.

එනිසා, පාසලේ සියලු ශිෂ්‍යයන් අතර ප්‍රමුඛ ශ්‍රීකර සංවරශීලී ප්‍රශංසිත උගෙනීමෙහි දක්ෂකම ශිෂ්‍යයා වශයෙන් මා ගැන පිළිගෙන සිටි බැවිනි. එසේම සියලු වාර විභාග වාරයන්හිදී ප්‍රථමස්ථානය දිනාගත්තා ලද බැවින් ද ස්වකීය ශ්‍රේණියේ සිටිද්දීම ඉහළ ශ්‍රේණියේ පාඨමාලාවන් ද ප්‍රගුණව සිටි බැවින් ද නෙවත් ශ්‍රේණියෙන් පසුවත් ශ්‍රේණියට උසස් කරන ලද්දේද වූයෙමි.

ප්‍රධානාචාර්ය තුමා හෝ වෙනත් ගුරුවර යෙක් නොඇවිත් සමහර දිනවල මම ගුරුවරයා හැර පන්තියට උගන්වීමද මට පාරත් ලද්දේ විය. ගුරුවරුන්ගේත් ශිෂ්‍යයන්ගේත් මා ගැන පැවති ආදරය විශ්වාසයත් පිළිගැනීමත් ප්‍රදර්ශනය කළ ඇත සාක්ෂි ය.

## ආශ්‍රිත විහාරස්ථානය.

තිලංගම පාසල පිහිටි භූමියෙහිම වූ තිලකසිරි රජමහා විහාරස්ථානය වට්ටගාමිණී අභය රජතුමා විසින් කරවන ලදැයි පැවසෙන ඓතිහාසික පුරාණ ස්ථානයකි. තිලංගම වැව පසුබිම් කොට කුඩා කඳුගැටයක් මුදුනේ විශාල ගල්පර්වතයක නැගෙනහිරට මුහුණලා විශාල ගල්ලෙන තුළම

ඓතිහාසික බුදුමැදුර, ධර්මශාලාව සහ ලෙන් කුටිද පිහිටා ඇත. පහත මළුවේ සංඝාවාසය බෝ මළුව ද වෙයි. රන්ගිරි දඹුළු රජමහා විහාරයේ ප්‍රතිමා චිත්‍රකර්ම නිර්මාණය කළ නිලගම මූර්ති ශිල්පීන් විසින්ම නිලගිරි රජමහා විහාරයේ ප්‍රතිමා - චිත්‍රකර්ම තනවා ඇත.

## විහාරාධිපති නාහිමි.

අතිගරු පූජනීය නිකුල ධම්මපාල හාමුදුරුවන් වහන්සේ නිලගිරි රජමහා විහාරාධිපති නයේ අධිපතිව වැඩ විසූහ. විසිතු ධම් සාමික සල්වත්ගල ලොකු හාමුදුරුවන් ගේම ශිෂ්‍ය නමකි. සල්වත්ගල ලොකු හාමුදුරුවෝ බවතට බොහෝ වයෝවෘද්ධව සල්වත්ගල පුරාණ විහාරස්ථානයේම වැඩ විසූහ.

නිකුල ධම්මපාල පූජනීය හාමුදුරුවන් වහන්සේ අපේ ගමටත් විශේෂයෙන් අපටත් සාහිත්‍ය නිතරත් බවක් දක්වූහ. අපේ ගමෙන් නික්ම පැවිදිවූ කවියාවූ සම්භාවනීය ස්වාමීන් වහන්සේලාගේ කුසීන් නිසාමය.

අපේ ගමේ සුදුගල ආරණ්‍යය (අවුරුදු 2000 කට පැරණි) ඓතිහාසිකයේ ගල්ලෙනෙහි සිතුවම් දපැරණි ශෛලයේ ප්‍රතිමා වහන්සේද වඩාහිඳුවා, ඇත්තේ නිලගිරි රජමහා විහාරයේමය.

පන්සලට පාසලට බොහෝ දුර විසි ගමක්
වුවත් අපේ ගමේ ශිෂ්‍යයෝ එකාත් පේලියාමේ
පාසලට යාම සිරිතක් කොට ඇවතුන්හ. සමහර
දවස්වල උදේම පන්සල් මිදුල වදින් නියනගොඩ
අපට අපේ ලොකු හාමුදුරුවන් වහන්සේ මිදුලේදී
හමුවෙති. හාමුදුරුවෝ අපට කාලකොට විමසති
හමිස් ගාව උගන්වති. වදින හැටි කියාදෙති
සමහර දවස්වලදී පාසලට පැමිණ පන්සිල් දෙති.
අනුශාසනා කරති. ගාථා නිවැරදිව හඬනගා කියන
හැටි කියා දෙති.

ශාසනික කුසුම් සහ නිරිස.

රංගිරි දඹුළු විහාරයේ කලක් නායක ධුරය
ඉසුලූ නුවර ලෙන්කොරෙව්විය විහාරාධිපති ශ්‍රීරතන නාහිමි
අනුරාගල විහාරාධිපති සුමංරතන නාහිමි, ධම්මවිසු
ධම්මජෝති නාහිමි, මකුලේවම විහාරාධිපති සුමනජෝති
නාහිමි. කලකිරියාව විහාරාධිපති සුමංගල නාහිමි,
හලන්තොරුව විහාරාධිපති නාහිමි, නුවර පුගමයේ
චන්ද්‍රවිසුද්ධ ඤාණසීල නාහිමි, ශාසනෝපාලිවංශික
මෙම නාහිමිවරු අපේ ගමෙන්ම බිහිවී පැවිදිව සිටි
ප්‍රසිද්ධ ධර්මකථික අපේම ස්වාමිවරු සහ නිරිසකි.

අප කුඩාම කාලයේ හලෝන්තොරුව විහාරාධි-
පති නාහිමියෝ දිනක් අපේ ගෙවත්ට වැඩම කොට සිසුන.
පසුදු උපාසා අපේ මැණියන් පිළිගත්තු දානය වළදු

ආපසු පිටත්වීමට සූදානම් වී ගුණමත් කාරුණිකව අපේ බෑණියන්ට මෙහෙම පැවසූහ, "අපේ පන්සලට නේ ඉඩම් .... මෙච්චර තියෙනවා, රබර් ඉඩම් මෙපමණ තියෙන කුඹුරු මෙපමණ තියෙනවා. ඉදිරියට මේවා පවත්වාගෙන යාමට අපේ පවුලෙන් දරුවෙකු මහණ කරවා ගන්නට ඕනෑ. ඒ නිසා මේ දරුවෙකු මහණ කරවා ගන්නට දෙනවාද"

අපේ අම්මා එකවරටම මෙහෙම කීවා.

"මගේ දරුවන්ට අනායට යන්නට දෙන්නට බැහැ" හාමුදුරුවෝ නිරුත්තර වුණා. මා ඉතා ළපටි අවදියේ සිදුවූ මේ කතාව මගේ සිතේ තදින් ඇඳී රැඳී පවතින්නා.

පැවිදිවීමේ අදිටන උපත ළදරු අවධියේම පටන් නමුත් ඉතා සඳහන් කතාව අනුව අවයස්ව වළලනා තුරු ඉක්මන් නොවී හිත තුළම තිබිත කොටගෙන උපෝස්ථේ යෙදුනෙමි.

ප්‍රථම උපෝසථ සීල සමාදානය.

ගුණවත් මවුපියන් වැඩිහිටියන් විසින් කෙරෙන දානමාන බණ භාවනා වන්දනාමාන ආදී ආගමික කටයුතු සඳහා බලාවත් සතුටෙන් සහභාගී වෙමින් පාසල් ගමනත් උත්සාහයෙන් සිදුකළ අතර ශ්‍රී ලංකාවේ නිදහස් උත්සවය 1948. පෙබරවාරි 04 වෙනිදට උදාවත් විය.

ගම්මැද්දෙමින් සැදුම ගමනකම බොදුනුයන් ශ්‍රීතත්
වූ ඒ විහාරස්ථානවලත් සැදුම පාසලකත්
උපෝසථ සීල සමාදන් වීම ආදී ආගමික
කටයුතු කරන ලෙස රජය මඟිනුත් විහාරස්-
ථාන හා පාසල් මඟිනුත් වූව රජයේ නියෝදය
පැවතිණි නිතියෙන් 1948. නොවැම්බර් පෙරෙදා
විශේෂ ආගමික වැඩසටහන් ක්‍රියාත්මක විය.

අපේ පාසලේ ගුරුවරුන් විසිනුත්
පාසල් ළමුන්හට සැලසුම කරන ලදුව
කැමති අය උපෝසථ සීල සමාදනයට
යොදවනු ලැබුහ. ඊටත් පෙරසිට අපේ
පියාණන් වහන්සේ පෙහෙවස් රැකීම සිදු
කරන්නෙකි වූ නිසා මාදියාත් පෙහෙවස්
සමාදන් වූහ.

අපේ මැතියන්ගේ මවුතුමිය අපේ
කිරිඅම්මා (ආත්තම්මා) දීර්ඝ කාලයක්ම
සතර පෝය කඩ නොකර පෙහෙවස් රකින
කෙනෙකි ඇයා ඔටත් ඒ ගැන බලවත්
ආශාවක් ඇගේ අම්මාට මතක් කෙළේ
පුදුම සතුටකින්. එයස වසර හටයක් වූ
මම උදෙන්සාන්දරව සිතාවාය කරවා
සිල් ඇඳුමින් සැරසී වැඩිවැඩියන් සමග

ගමේ බෝධියට සැපත් වූ පියාණන් වහන්සේ
විසින් සිල්පද කියවන ලදුව අටසිල් සමාදන් ව
බුද්ධ පූජාවට සහභාගී වීමි. අපේ කට්ටියම
ලස්සන පබලු වැලක් මා අතට භාරදී
" පුතේ මේ නවගුණ වැලෙන් ඉතිපිසෝ භගවා
ගාථාව කියමින් භාවනා කරන්න " යයි
දුන් උපදේශය අනුව ඉතාමත් සතුටින්
බුදුගුණ වැඩුවෙමි.
උදය වරුවේ බුදුගුණ වඩමින් ගතකොට දවල් බුද්ධ පූජා
වැඳලා, දවල් ආහාර කිස නිමවා, සිල්පිරිය සමගම
නිලගම රාජමහා විහාරස්ථානයට ගියෙමි. ගමේ සිල්
පිරිසේ චාරිත්‍රය වූයේ උදේ ගමේ බෝධියේදී සිල්
පෙරෙව් දවල් ආහාර කිස නිමවා සවස් වරුවේ
විහාරස්ථානයට ගොස් රාත්‍රී කාලය නොනිදා බාර
ගත කොට පසු දින උදුන් වසූ සිල් පසතරණය
කොට පන්සලේ හාමුදුරුවන් වහන්සේට වැඳ සමු
ගෙන ඇරලා ගමට පැමිණීමි.

පෝය දින සිල් සමාදන් වූ පිරිස
අතුරෙන් වැඩිහිටි උපාසක මහතෙක් කිව්වා
රාත්‍රියේ සමය පවත්නෙත සිල් පිරිසට සූත්‍රාවලිය
බණපොත පැරණි ශෛලියට නොකඩව කියමින්
ගත කෙළේ සවසට භාවනා වැඩීම ගැන කියනත්

උපදෙසක් ලැබී නැති බැවිනි. සිල්ගෙනෙවගත් දින රාත්‍රියේ නොනිදා ගත කරනුයේ සිල්කොරු සිල් පැහැර ගන්නවාලයි කියමිනි. එහෙත් සිල්කොරු කවුරුදැයි කිසිවෙක් හරිහැටි දැනසිටි බවක් නොවැටහිණි. නිදිගැනීම සිල්කාරයෙක් බව කියමින් මටත් කෝපි කොත්තමල්ලි වැනි බොහෝ පාන පානය කිරීමට දෙමින් නොනිදා සිටීමට උපදෙස් ලැබිණි. මුළු සතුටින් මමත් එසේ ගත කෙළේ ඉඳුරාගෙන.

ඒ අතර පූජාවලිය බණපොත ලබාගෙන බණකියන්නාටත් සිතක් පහළ වූයේ එවකට එවැනි පොත් කියවීමටත් පුළුවන් වී සිටි බැවිනි. එහෙත් මා සිල්සමාදන්වූයේම ළමාවිම උපාසක පැටියා නිසා මට තොරතුරු අසන්න එපා නොඉල්ලුවෙමි. ඉඳුරාගෙන බණ අසමින්ම සිටිද්දී මගේ සිත සතොසින බුදුන්ගේ අමුතුම ආශ්වාදයකට පත්වී එම බණ මඩුවේ විශාල පැරණි දැව කැටයමට එටදි නැලවෙනසර දිග බලා බණ වදුරන බෝසත්ලාමාමා ළිඳුළු ප්‍රතිමාවක් බවට මා පත්වී සිටින ආකාරය මනසින් පැහැදිලිව සිතට පෙනීමයේ අසිරිමත් ලෙසිනි. ජීවිතයේ අමතක නොවන මේ සිද්ධිය මගේ ජීවන් ගමනට මග පෑදමක් යයි සිතමි.

අපේ පාසලේ උප ගුරුවරයෙක් තවත් පිරිසක් සමග පන්සලට ඇවිත් පල්පිරියට පිහිටුවීම පිළිබඳව දැනුත් ආදිය පරිනමන ලේඛය පතිරා කරමනය. මා පල්ලෙහෙබාවී සවින ආකාරය දුටු අපේ ගුරුතුමා ඉමහත් සතුටින් මට සාධුකාර කෙළේ දයාවෙනි. දරුවකුට මෙන්. එහෙත් මට දැනුත්විට නුවන්තෙන් පාසල් පසුව දැකත් විට කොහෙ ත්‍රීමට ගුරුවරු උපදෙස් දී ඇත බවින්. එකත් පට පාසල් සමයේ අවකාශ ලබන පෝය දිනවල සිල්සමාදන් වීමට පුරුදුවූයේ ඉන් පත් සිතූ කමිනි. පාසලේ සමහර ළමයි මාගෙන මෙසේද අනාගත වාක්‍ය කීහ. "අපට හොඳ ගුරුවරයෙක් වෙයෙයත් ඔත්තා" යනුවෙනි. එහෙත් මා ප්‍රකාශ කෙළේ "මම ගුරුවරයෙක් වන්නේ නැත. මම ඇවිදි වන්නෙමි" යනුවෙනි.

ගමේ සමාගම් ශාලාවේ වස් වාසය කරවීම.

1948. වර්ෂයේ දීම ගමේ ග්‍රාමසංවර්ධන සමිතිය මඟින් සමාගම් ශාලාවේ ස්වාමීන් වහන්සේ නමක් වස් වසවා, උපස්ථාන කිරීමට යොදාගන්නා ලදී. සමාගමේ සභාපති ධුරය දැරුවේ අපේ පියාණන්

වහන්සේම බැවින් සංඝෝපස්ථාන කටයුතු පිළිබඳ සවිස්තර අවබෝධතාව ඔවුනතුරෙන් ඉතා අගේය. පූජ්‍ය වතුරේ සුමනරතන ස්වාමීන් වහන්සේ වැනි දක්ෂම ශිෂ්‍යයෝ වස් ශාලාව වැඩ විසූහ.

ඒ කාලේ චීවර ගණ්ඨිකාව - ගොක්කොළමුවා කුඩා ගෙතුම, චීවරකම් ආදී ශිල්පයන්ද වැදුම් පිදුම් ගාථා සජ්ඣායනාදි බාරනුද වයස 9.10. වගේ උපන් අපට එම පූජනීය ස්වාමීන් වහන්සේ උගැන්වූහ. පසුව පසු එම ස්වාමීන් වහන්සේ දේවපුර - බුලත්වල විහාරස්ථානයට වැඩම කළහ.

දහම් පාසල.

ගමේ සමාගම් ශාලාවේදීම කුඩා ළමුන්ට දහම් පාසලක් ආරම්භ කරන ලද්දේ සිත කලක් පැවැත්තී. ඇතේ ඉයාකාන් වහන්සේත්, තවත් වැඩිහිටි දෙදෙනෙකු සමග කුඩා අපට නමස්කාර - මැල්ලෙකුන - බුද්ධ ගජ්ජය - සරණාගමනය ආදී කොත් උගන්වූහ. ඊට පසුව ගුරුදීනයන්ගේ ධර්මසභා මණ්ඩපයක් පවත්වන ලදී. එයට ද සහභාගී වූයේ අවුරුදු දොළොස් උගෙන්නේ ආශාවෙන්. ද්‍රශනාවක් පැවැත්වීමත් දහම් කරුණු ගැන ප්‍රශ්නෝත්තර සාකච්ඡාවක් සිදුවිය, මෙකී කටයුත්තට සුදුසු වර්ගා දහම් කරුණුත් ඉදිරිපත් විය.

එදින උගෙන ගත් එක ගාථාවක් අදත් මතකය.

හදයකාරු කොඨර කුටිරෙ -
කොට කුණපලි න ජහු බහිකාතබ්බා,
අපි නු කිමිකා මනොකා -
අවිචම් ඉදකාකං උපනෙතබ්බා' ති.

“හෘදය ගුහාව නමැති ගෘහ කොණේ රෙඳෙන ශෝකය නමැති විෂඝෝර සර්පයා කිසි සේත් පිළියම නොකළ යුතුය. එම සොයකින් වළා ආදි විපතෙන් කිසිසේ වාත්සල්‍යයෙන් නොවැළලෙනා සේ කොටැළුවිත තත්වයට පැමිණිවිය යුතුය” යනු එහි තේරුමයි.. පාලි අක්ෂරවල විකාරවෙංගෙන් මේ ගාථාව ඇත. හිමියෝ මට තම්බල නාද වන කෙරණුවාර් දුන් අවවාදයක: ඉවසීම ම කොතෝ සේ අනුගමනය කළ යුත්තක් නිසා, එමත් ඒදිගෙන කදින් කතේ ලෙඩි පවතී.

මැණියන්ගේ අභාවය.

1952. අප්‍රේල් නවමුව මාසයකට පෙර වැඩිව අසට ලැබිණ. මට වයස 13. සපිරිණි. ඒ මාසය අවුරුදු සමය වුවත් මගේ සිතට ගලානෙත. ආශී අවුරුදු ස්වකුසිල් සෙලක් “ අපේ අම්මා අසනීපයි අසට කොහෙත් ආදරෙයි. අපිත් ඔහුගේ ආදරෙයි. එං ජීවිතය සදහටම අහිමි අසනීපයි නැති වුනොත් —

මට දුක වැඩිය. ඒ නිසා ඉස්සරවෙල මට
නැතිවුණොත් හොඳයි" මෙවැනි සිතුවිලි නිතර නිතර
සිතට පහළ වෙති. පියාණන් වහන්සේත්
අයියලා දෙන්නත් මල්ලිලා දෙන්නත් මාත් දවස
ගත කරන්නේ ඒ දවස්වල පොල්වගා කෙරෙන
ඉඩමේ ඇවිත් නිවසකයි. ආහාර ගැනීමට
පමණක් අම්මා, ඉන්න නිවසට යාම සිදුවිය.

අම්මා සෑම දින අලුයම 4.00. පමණ
අවදිව ආහාරපාන සූදානම් කිරීම සිරිතකි.
1952. මැයි මස 02. සිකුරාදින අලුයම අවදිව
ආහාර පාන සකස්කොට පියාණන් ප්‍රධාන අප සැමට
යවා උදය වරුවේ 9.00.ට පමණ පියාණන්ට
පණිවුඩයක් එවා ලද්දේ "අම්මට හදිසි
අසනීපයක් බැවින් ඉක්මනින් ගෙදර එන ලෙසය"

ඒ අතර ස්වකීය වයෝවෘද්ධ
මැණියන්ගේ පතුලමත නලල තබා "අම්මේ
මගේ වැඩි අඩු සමාවෙන්න" යයි සමුගෙන
ඒ මොහොතේම සැපත් වූ අපේ පියාණන්ගේ
පතුල් මත නලල තබා වැඳ සමාව සමු-
ගෙන, ඇඳට වී අපේ වැඩිමල් සොහොයුරු
තුමන් අමතා "මගේ රත්තරන් පුතේ! බාල
සහෝදර සහෝදරියන් ගැන හොඳින් බලාගන්න"

මේ වචන පෙළ කියා ගැනීමට අවශ්‍ය වී දෙතුන් විටක් අමතා, සුව මොහොතින්ම "අනිච්චේ දුක්ඛේ සංසාරේ" යන වචන තුන තුන්වරක් කියා හොත සියා ගැනීමෙන්ම අවසන් වූයේ මහා සිහි නුවණින් බව ඉතාමත් පැහැදිලි ලෙස වටහා දෙමින්.

මෑණියන්ගේ අභාවය ළපටි අප සැමට දරාගත නොහැකි වුවත් ධර්මානුකූලව සිත හදාගත් පියාණන්ගේ අවවාද අනුශාසනාමෙන් ඉගෙනීමේ කටයුතුවල නිරත වීමු.

## භාවනා ආරම්භය උදාව.

බෝධිසත්ව ගුණෝපේත අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත කඹුවැද්දුවේ ශ්‍රී ජිනවංශ ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සමුත්පාදකත්වයෙන් හා අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඥානාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නායකත්වයෙන් 1951. ජූනි 18. වෙනිදින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවට සම්බන්ධ ශාඛා සේනාසනයක් වශයෙන් භාවනා ආරම්භය උදාවත් වූයේ 1954. ජූලි 23. සිකුරාදා වයඹ පළාතටම ඔවකට පැවතුණේ රඹුක්ගිරි කන්ද

ආරණ්‍ය සේනාසනය පවතී. රුවන්ගිරිකන්ද ආර-
ණ්‍ය සේනාසනයවත් අභිවෘද්ධිය විදර්ශනාචාර්ය මාතලේ
සීලරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මග පෙන්වීම
අනුව, අවසිවුව - පහළ වලවිටේ මුතුබණ්ඩා වෙද
මහත්මයාගේ දායකත්වයෙන් පූජ්‍ය විගොඩ
බෝධිරතන ස්වාමීන් වහන්සේ, මෙහෙනාවක
බඹරගල ආරණ්‍යය වලන්නට වැඩම කළහ.
ඒ අවට දැනගත් කල්බිල්ල වසි, ඇම්. පී. අබේසිංහ
මහත්මයාගේ මග පෙන්වීම අනුව නාඋයන
ආරණ්‍යයට වැඩම කරවන්නට යෙදිණි.

මිහිඳු මහරහතන් වහන්සේ විසින්
ලක් බුදුසසුන පිහිටුවන ලද මුල් අවදියේ
මහරහතන් වහන්සේලාට සොබාදහමින් පේ
පැවති නාඋයන ආරණ්‍යය, දැවැන්ත නාගස්
සෙවන ඇති, ජලපහසුව ගල්ලෙන් කුටි සහිත
ගම්මානයෙන් සැතපුමකටත් වඩා දුර පිහිටි
විවේක පහසුව ඇති රමණීය සේනාසනයකි.
ඇවිත් ගල්ලෙන් පිළිසකර කරවා 1954. ජූලි
23. වෙනිදා පූජ්‍ය විගොඩ බෝධිරතන
ස්වාමීන් වහන්සේ වැඩම කරවා වඩාහිඳුවා
ලදහ. ලක්දිව කන්ද උඩරට මෙන් සමස්තෝන්නත
ජෛවගුණයන්, අලි වලසුන් සහිත සත්වයන්

පිපිල් දිය උල්පත් හා ගලායන දිය ඇල්ලන් සහිත නාඋයන ආරණ්‍යය, විවේක කාමී උතුමන්හට සොඳුරු සැවියක් බවටම පත්විය.

ප්‍රතිපත්ති අනුගමනය.

සතර පෝයට සිල්පෙහෙව ගැනීම සිරිතක් වශයෙන් පැවැත් වූ අපේ සියාතාත් වහන්සේට නාඋයන ආරණ්‍යය උදාවීමෙන් පසු සැලසුණේ ඉමහත් පුණ්‍ය ලාභයකි. සතර පෝයට පමණක් නොව අමාවක් - පසළොස්වක් පෝය දෙකට හා සිංහල අවුරුද්දටත් දින තුනාවැත්තෝ පිරිනගරන උපෝසථයන් පවත්වමින් ආරණ්‍යවාසී ස්වාමීන් වහන්සේලාගෙන් සාරවත් කුම ඉගෙන ඉතා උද්‍යෝගයෙන් ප්‍රතිපත්ති පිරීමට පුද්ගල වීම නිසා අපටත් ප්‍රතිකාර ප්‍රතිපත්ති පිරීමේ ඡන්දයක් සිතතුල පහල නිතින විය.

ඒක් දිනක පූජනීය රාජකීය පණ්ඩිත කතර සිරි සුමංගල මාහිමියන් වහන්සේත් පූජනීය නිතොට කොඩිතුවක්කු ස්වාමීන් වහන්සේත්, පූජනීය දේවාරාම ධම්මික ස්වාමීන් වහන්සේත්, නාඋයන ආරණ්‍යයේ සිට බඩුරගස්වැව බණට වැඩමකළෝ වඩින ගමන් අපේ ගම තෝරාල නැවත් ගිමන් හරිසේ. ඇති ගිලන්පස පිළිගැන්වා වැළඳවූ ගත් තෙමු. ඒ පළමු ගොට ආරණ්‍යවාසී ස්වාමීන් වහන්සේලා දැකගත් දිනයයි. පසුදිනා බඩුරගස්වැව බණ නිමවා නාඋයනට

එහිත ගමන් අපේ ගමේ සමාගම් ශාලාවේ නායක මාහිමියන් වහන්සේ ධර්ම දේශනයක් පැවැත් වූහ.

නුවර දිස්ත්‍රික්ක පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංස මාහිමියන් වහන්සේ ප්‍රධාන සඟ නමක් බඹරගස්වත්ත දම් දෙසුමක් කළහ. අප ගම හරහා කාලියකට එහිත ගමනකි. සිද්ධාර්ථ සමාගම ශාලාවේදී ගිලන්පස පිළිගැන්-වීමකට ලැබිණි. ඒ දින සවස පිරිසක් සමඟ කාලියකට ගොස් පූජනීය කඩවැද්දුවේ මාහිමි-යන් වහන්සේ විසින් පරාභව සූත්‍රයෙන් පැවැත් වූ දේශනයටත්, පූජ්‍ය මීගහතැන්නේ මේධානන්ද ස්වාමීන් වහන්සේ විසින් මංගල සූත්‍රයේ "පතිරූපදේස වාසෝ ච..." ගාථාවෙන් පැවැත් වූ දේශනයටත් සවන් දුනිමි.

1948. පොසොන් පෝයට, වයස නවයේදී ඇරඹූ උපෝසථ සමාදානය කාලයක ආරක්ෂාව සම්බන්ධව පැවැත් වීමට මඟ පෑදිණි. අපේ පියාණන් වහන්සේ විසින් ගෙදරදීත් රාත්‍රී පැය දෙකක් පමණ භාවනා, වඩන අතර නිතරම විශුද්ධි මාර්ග - අභිධර්මාර්ථ උපාසක ජනාලංකාරය, විදර්ශනා භාවනා ක්‍රමය චතුරාර්ය සත්‍යය - පටිච්ච සමුප්පාදය ආදී

දහම් පොත් කියවති. එහි සඳහන්වූවට සිත අය සමග ඒ ගැන කරුණු පහදති. ඒ කරුණු අතර අසන්නන්ට ඒ පොත් කියවන්නන්ට ලැබෙන ඵල, විශේෂයෙන් විශුද්ධිමාර්ගයේ සඳහන් භාවනා ක්‍රම ප්‍රගුණ කිරීමටත් දැඩි සේ කුශල චිත්තෝදයක් මා සිත තුළ පහළ වූයේ පූර්ව උපනිශ්‍රය හේතුවෙන් හා සත්පුරුෂ උපාශ්‍රය හේතුවෙන් ද විය හැකිය.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව මගින් නිකුත් කෙරෙන දහම් පොත් පත් සඟරා ආදියත් අපේ පියාණන් වහන්සේට නාඋයන ආරණ්‍යයෙන් ලැබෙන නිසා, ඒවා ද ප්‍රයෝජන ගත්තෙමි. අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඤාණාරාම මාහිමියන් වහන්සේ අතින් සම්පාදිත "භාවනා මාර්ගය" නමැති කුඩා දහම් පොතේ "පද්මාසනය" නමාගන්නා ආකාරය සඳහන්ව තිබුණ බැවින් ඒ උපදෙස් අනුව නිතියම පද්මාසනය පුරුදු කෙළෙමි, විනාඩි 30. පමණ පද්මාසනයෙන් වාඩිවී භාවනා කිරීමට ඉක්මනින්ම සමත් විය.

පූජනීය වතුරුගම අතුලවංශ ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත කුඩා දහම් පොතක

මෛත්‍රී භාවනාව පිළිබඳ පාඩමක් දක්නට ලැබිණි.
විශුද්ධි මාර්ගයේ දක්වෙන පිළිවෙළටම දශ දිශාවට
මෛත්‍රිය පතුරුවන පිළිවෙළ පාලිබන්ධව එහෙ සවිස්-
තරව තිබුණ බැවින් එය පාඩම් කරගත්තෙමි.
සැම දවසේම රාත්‍රී ආහාරයෙන් පසු නිදාගැනීමට
පෙර නිදන ඇඳේම බද්ධ පර්යංකය බැඳ වාඩිවී
බ්‍රහ්මචරියක ආජීව අෂ්ටමක සීලය සමාදන්ව ගෙන
කරණීය මෙත්ත සූත්‍රය කියා ඉන් අනතුරුව සවිස්තරව
දිශාචරණ මෛත්‍රිය කෙටින් කෙටින් කියවන්නෙමි.
විනාඩි කීපයක් ඇතුළතදී, ශරීර ගත කිසිත්
නොදැනී සංසිඳී අහසේ ඉන්නා සේ දැනී
ශාන්ත ආලෝකයක් සහිත ප්‍රීතිමත් තත්වයක්
ඇතිවිය. භාවනා පාඩම නිමවන තුරු එසේ පවතී.
අනන්තෝ ආකාසපරියන්ත භාවිතචිත්ත... ගතවෙන් හිඳදී
නිදාගන්නෙමි. අලුයම 5. පෙ.ව. ට අවදිවීම පිණිස
ඔරලෝසුවේ එලාම නාදවීමට සලසා නිදාගන්නා
නමුත් එලාම නාදවීමට මොහොතක් ආසන්නව ඉබේම
නින්දෙන් අවදිවීම සිදුවෙයි. තවත් පැයක් වන
නොසැලී නිදාගත් විට එකම නින්දෙන් යුතුව සිහින
දැක්මක් ද නොමැතිව සමාධි නින්දෙන් අවදි වූවාසේ
ප්‍රබෝධමත්ව අවදිවීම සිදුවේ. පසු දින දවස
පුරාම ඉමහත් ප්‍රීතියෙන් ගත වේ. ගාථා පිරිත් සූත්‍ර

ආදිය කියමින් දවසේ වැඩ කටයුතු ඉවසන් සතුටින් සිදුවෙයි. මෙවැනි අනුසස් දිනපතා රාත්‍රී මෛත්‍රී භාවනා වෙන් ලැබුණු අතර උසස් ප්‍රතිලාභයක් කරවමින් අපාය භයක් නොමැතිව සැලසේන් ගත කෙරෙමි.

පෙළි වබනාර්මයක් තරිකුව නොදැන පාලියෝ ජනයා මෛත්‍රී භාවනා වඩමින් මෙතරම් අනුසස් ඇති කර වූ ජීවිතය මේ සඳහා ඔවුන් කොට ගෙන ආරක්ෂා ගතව පැවිදිව භාවනාවෙන් ගතකිරීමට ඇත්නම් කොතරම් ප්‍රයෝජනවත් වේදැයි සිතමින් සැමදා මෛත්‍රී වඩා අනතුරුව ආකාසට්ඨාච ගාථාවෙන් දෙවියන්ට පින් පෙත් දී "මට උතුම් ලෙස මහණදම් පුරන්-නට තැනක් අවස්ථාවක් සලසාදෙවාය" ආයාචනා ප්‍රාර්ථනා ද කෙරෙමි.

## ගෘහාභිනිෂ්ක්‍රමනය.

ආගමික පිළිවෙතින් නොඅඩුව සත් සුත් සිතින් ගතකරන අතර අනේකවාරයක් මෙසේ අදිටන් කෙරෙමි. "මගේ පියාණන් වහන්සේගෙන් ඈත් වී වනගතව මහණදම් පුරන්නට අවසරද? අවසර. මගේ සහෝදර සහෝදරියන්ගෙන් ඈත් වී වනගතව මහණදම් පුරන්නට අවසරද? අවසර. මගේ ගමේද ඥාතීන්ගෙන් ද සියලූ ආශ්‍රිතයින්ගෙන් ද ඈත් වී වනගතව මහණදම් පුරන්නට මට අවසරද? අවසර.

වනගතව එක බිලක් හෝ, කැලැකොල එකක් හෝ ආහාරයට ගනිමින් මහණදම් පුරන්නට පුළුවන්ද? පුළුවන්. සංඝයාට දර දිය ඇද දෙමින් වතාවත් සපුරමින් හෝ මහණදම් පුරන්නට පුළුවන්ද? පුළුවන්. නොයෙක් කරක්කරවේ ඇය ඇසුරෙන් නොමගට නොවී, අතරමං නොවී සාදුව මහණදම් පුරන්නට පුළුවන්ද? පුළුවන්. ආපසු නිවස ගෙදර වාසයට නොපැමිණ නොහැරම අපහසුතා විඳගෙන හෝ ජීවිතාන්තය තෙක් භාවනා වඩමින් වනගතව මහණදම් පුරන්නට මට පුළුවන්ද? පුළුවන්." මෙවැනි සිතිවිලි ඇතිවන් කරමින් දිනෙන් දින මහත් ප්‍රීතියෙන් සතුටින් කලක් ගතවූ නමුත් කිසි කෙනෙකුට වචනයෙන් හෝ ඉරියව්වකින් හෝ අදහස් නොඇඟවූ හදයේ වඩා ආනුභාවයකට වත් කාගෙන්වත් බාධාවක් නොවනු පිණිසමය.

2500. බුද්ධ ජයන්ති සමය තුළ මහත් බෞද්ධ ජනතාව ඉමහත් ප්‍රබෝධයකින් ශ්‍රද්ධාවෙන් ආගමික කටයුතුවල යෙදෙමින් පැවතුණ. නාඋයන ආරණ්‍යයයේ ප්‍රධාන දායකත්වය දරන ඇම්. ජී. අමරසිංහ මහත්මයා විසින් වයස 10-11-12 පමණ කුලුදරුවන් තිදෙනෙකු තෝරාගෙන නාඋයන ආරණ්‍යවාසී ලොකු සාමීන් වහන්සේට භාරදෙනලදුව

හිසමුදු කොට ඇඳ රෙදි පොරවා දණහිස් වසාලා
සිටින අකර දිහාක අපේ ගම හරහා නාගොල්ල
ආරණ්‍යය බලා යන ගමනේදී අප හමුවූ පළමුවා
ගිලන්පස සංග්‍රහයක් කරවන ලදී.

එම දණ හිස් තුවා දරුවන් දැක්මෙන් මහත්
සතුටක් ඇති වූ මගේ සිතේ, තවදුරටත් පමා නොවී
නෙක්ඛම්මය චරිය පූර්යාශයි දුටු අදිටාන් සහලවී
මුව දුරුකර්ම වී ගැන සැලසුම් සකමින් ජීවිත
නිගමනයට පත්වීමි.

1956. 10. 25. දින සවස් වරුවේ එම දණිනය
ලැබුණා අතර (26. 3) පසුදින දවල් 12. ට. 0 පමණ
දවල් ආහාරයෙන අවසන් වූ පියාණන් වහන්සේ
ගේ පතුල් වැදි මෙන් විමසීමි, "අප්පච්චී! අද
වෙනත් ගමනක් නැති නම් මාත් එක්ක නාලියනට
යන්නට පුළුවන්ද?" "ඇයි පුතේ! අද ආරණ්‍යයට
යන්නේ" යි පියාණන් වහන්සේ විමසූහ "අප්පච්චී
මං මහණවෙන්නට ඕනෑ
විනාඩියක් තරම් කොට වේලාවකින් පියාණන්ගේ
පිළිතුර වූයේ ඉතා සතුටු මුහුණින් යුතුව "හොඳයි"
යනුවෙනි. "අදම යන්නට ඕනෑ" යැයි මා කීවා
"පුතා! අදම යන්නේ ඇයි" මගෙන් විමසූහ. "මගේ
අයියලා එහෙම එන කියයිදෝද" නෑ කීමි මං

බලාගන්නම්, පුතා! අපි හෙට උදේ දෙන්නම එළෙන ආරණ්‍යයට යමු" යයි පියාණන් වහන්සේගෙන් ලැබුණු පිළිතුරු නිසා සිත ප්‍රීතියෙන් ඔදවැඩී ගියේ අදහස සඵල වීම පිණිස වූ බැවිනි.

1956. බක්: 27. වෙනිදා උදේම සූදානම් වී සැබැවින් සියලු ඥාතීන්ට වැඳ සමුගෙන සැමදෙනාගේ ආශීර්වාදය ලබා ගෙන ගමෙන් පිටත් වූයේ තෙරුවන් ගුණ සිහිකරමින් සත පිහා පිහා වැගිරෙන තුටු කඳුළු පිසදමමින් නිවන් ගමනක්. ජීවිතයේ අවසන නොවන මෙම ගෘහාභිනිෂ්ක්‍රමණය සිහිවන කොටකොටම සිතේ ප්‍රීති සෝමනස්සය උතුරා යනුයේ නිරායාසයෙනි.

ආදුගල ගමේ සිට දුරය එළෙන් හිතවත් කිපදෙනෙක් ද අප සමගම නා උයන ආරණ්‍යය බලා ගමන් ගත්හ. පූජනීය විගොඩ ආධ්‍යාත්මික ස්වාමීන් වහන්සේ වැඩ සිටිනා ඇතාලෙන නාමැති දිග ගල්ලෙන් කුටියට ඇතුල් වී වැඳපුදා නමුවා, මගේ පියාණන් වහන්සේ, මා දෑත අල්ලාගෙන පූජනීය ස්වාමීන් වහන්සේගේ සිරි අතට පිළිගන්වා ප්‍රකාශ කළේ මෙසේය. "ස්වාමීනි! මේ මගේ පුතා, ඔබ වහන්සේ ඉදිරියේ බුද්ධ ශාසනයට භාරයි. මේ පුතා භාරගෙන උගන්වා පුහුණු කරවා මහණ කරගන්නා සේක්වා" යි පූජා කරන ලද්දෙමි.

පසු දින උදය වරුවේ ගමේ විශාල කණ්ඩ

මහුල්ලන් සමඟ ඉතාත් රැගෙන ආරණ්‍යයට පැමිණි පියාණන් වහන්සේ, දැන් හිරුමුදුන් තමා දවල් 12.00ට පමණ වෙලාවේ පසෙකට මා කැඳවා පිරිස මැද මෙවැනි ආරාධනාවක් කෙළේ අවංක තැනැත්තන් පියාණන් නොහොත් බැවිනි "පුතා! මෙසේ පැවිදි වීමට ආවේ තදින් තීරණයකින් නම්, එවැනි තදින් තීරණ අතරමග වෙනස් වෙනවා. යම් හෙයකින් පැවිදි වී ඇට අතරකදී ආපසු ගිහිතට යෙදුනොත් එක අපට මදිකමක්, එසේ නම් පුතා! අදම ආපසු ගෙදර යමු"

මේ වචන පෙළ ඇසුවූණෝ මගේ සිත තෝරුම් ගැස්මට විය පුතුනි, පැවිදි වෙන්නට කාලෙක් සිටියා පැවිදි වූවාක් මෙන් සිවුරක් හැඳපෙරව පැවිදි වීමේ ඉඟියක් අන්තිම මොහොත තෙක් මා ප්‍රකාශ නොකර සිටි බැවිනි. පියාණන්ගේ ශ්‍රද්ධා විශුද්ධ වචන පෙළ අවසානයේදී මා චිත්තයෙන් මෙසේ අවංකව කීවෙමි.

"අප්පච්චි! මා පැමිණියේ ආපසු යන ගමනක් නම් නොවේ"

මේ වචනය ඇසූ පියාණන් වහන්සේ ඉතාමත් මුදුන් කර සතුටු දී මගේ හිස දිගින් කරමින් ශ්‍රීමය සතුට අධිෂ්ඨාන බලය උදුවත් කෙළේ කල්‍යාණ මිත්‍ර පියාණන් වහන්සේ නමක් බැවිනි. එතුමාට මහ උපාධි ධුරන්ධර අත්වේවා.

එදින සවස වෙලාන් පොතු තාවිකා මගේ හිසු කෙස් කපටලූවට පඬු පොවා ගෙන හිස මුඩුකරවන ලද්දේමි

1956. 10. 29. උදය වරුවේ පඬු පෙවූ සිල් ඇඳුම් දරාගෙන දස සිල් සමාදන් වීමි. මින් පසුව ගුරු ඇඳුමත් දස සිල් කුඩා උපාසක වරු තිදෙනෙක් ප්‍රධාන දායක තුමා සමඟ නාගොල්ල ආරණ්‍යයේ සිට ආපසු පැමිණ පිටත්වූහ. ඒ පිරිස බැද්ද පූජ්‍ය ලොකු හාමුදුරුවන් වහන්සේ විසින් විදුරුවකට බහාගත් කාරුණික සලාක පිටියක් මා ඉදිරියේ තබා එයින් කැමති එකක් ගන්නා ලෙස නියම කෙරිණි. එයින් සලාකයක් අතට ගෙන දිගහැර බලද්දී "මෛත්‍රී" යන වචනය ලියවී තිබිණ. එතැන් සිට දසසිල් කාලය තුළ මට භාවිතා වූයේ <u>මෛත්‍රී උපාසක මහතා</u> යනුවෙනි. ගෙදරදී බොහෝ කලක් මෛත්‍රී භාවනාව වැඩූ නිසා මේ නම සතුටින් පිළිගතිමි.

1956. 10. 30. උදේ පාන්දරින්ම පූජ්‍ය විගොඩ බෝධිරක්ඛිත ලොකු හාමුදුරුවන් වහන්සේ දසසිල් සහ සතරදෙනෙක් ප්‍රධාන දායකතුමා වන ඇම්. ඊ. අමරසිංහ මහත්මයත් සමඟ උදේ දානය නිමවා දවලට දානය සූදානම් කරවා නාඋයනෙන් විගොඩට වැඩම කළහ. ඒ ගමන කල් ඇතිව යොදාගෙන තිබුණ ගමනකි. පූජ්‍ය ලොකු හාමුදුරුවන් වහන්සේට වෛද්‍ය ප්‍රතිකාර ගැනීම සඳහා විගොඩ සිය ගමට වැඩම කරවා ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර කරවීම පිණිසය. එදින දවල් හාමුදුරුවන් වහන්සේගේ මෑණියන්ගේ නිවසට පැමිණ දවල් දානය වැළඳූහ.

ස්වාමීන් වහන්සේගේ කතින් ලියන් විලේගොඩවත්ත නමැති පොල්වත්තක අප වෙනුවෙන් තාවකාලික කුටි තුනක් ඉදි කරවා තිබිණි.

## පන්සුවලාස සමය.

ස්ථිර අධිෂ්ඨානයෙන් නිස්ම දගොල් විහිටි අතර ගම්පලාතෙන් දුරබැහැර කැලෑක තාවකී පුහුණුව ලැබීමට යෙදීමක් බවියෙන්ම සිදුවිය. විලේගොඩවත්ත වනාන්තර පරිසරයකින් යුක්ත වීමත්, ඉදිරියෙන් වෙල් යායෙන් සමන්විත පිරිසිදු පුළුලක්, පූජනීය විශේෂ බෝධිරක්ෂිත ස්වාමීන් වහන්සේගේ කල්‍යාණමිත්‍ර ඇසුරත් අප සතර දෙනාටම පුහුණුව සඳහා 'මහත් ශක්තියක් විය.

අලුයම 3.50. අවදිව මුව දෙවා, 4.00. සිට 5.00. තෙක් යෝගාසන පුහුණුවත් භාවනාවත්, 5.00. සිට 6.00. තෙක් බුද්ධවන්දනා වතාවත් සමඟ විනාඩි 15. ක පද්මාසනයෙන් භාවනාත් එක දවසේ ආරම්භය සිදුවිය. 6.00. සිට 7.00. තෙක් වතාවත් සපුරා සිල් දිනය ලැබුණු පසු බුද්ධපූජා පවත්වා දිනය වළඳා වතාවත් සපුරා 8.00. සිට 9.00. තෙක් තෙත් භාවනා කොට, 9.00. දන් පසපුව. 10.00. ට නිත්‍යවතන චරියාව පැවැත්වීය. 11.00. ආපසු කුටියට පැමිණ වී බුද්ධපූජාව පවත්වා දන් වළඳා වතාවත් සපුරා 12.00. බුද්ධවන්දනාව වතාවත් සමඟ

විනාඩි 15. ක් පද්මාසනයෙන් භාවනා වැඩීම සිදුවිය.
ඉන් අනතුරුව සිඳු දවල් විවේකතා· වේලාවේ
ස්වාමීන් වහන්සේ විසින් දේශනා කළ ධර්මය ඒ
ලොකටම අප විසින් දේශනා කිරීම සිදුවිය. ඉන්
අනතුරුව කුටි තුළේම පැදුරු කොට්ට මහල්
ඇතිරිලි ආදිය අවශ්‍යවූ කුටිවල තබා දවල්
1.ප.ව. සිට 4.ප.ව. තෙක් පොත් කියවා ගැනීම සිදුවිය.
පාලි පාමොක්ඛවිජය - පාලිභාෂාවතරණ - ද ඒක ඒක
පාඩමක් දිනපතා කටපාඩම් වනතුරුම උගෙනීම සිදුවිය.
සමහර දිනවල සවස විශ්‍රාමික විදුහල්පතිනී
හේමලතා කරුණාරත්න (ස්වාමීන් වහන්සේගේ නැන්දණිය - දෙරණ
ගොඩ) බැතියන්ගෙන් සතරවනාවර අර්ථ ඇසුවා ගත්තේ.
සවස 4.ප.ව. සිට 5.ප.ව. තෙක් සක්මන් භාවනාව. 5.ප.ව. සිට
6.ප.ව. තෙක් වත්පිළිවෙත් 6.ප.ව. සිට 7.ප.ව. තෙක් බුද්ධවන්දනා
වත්පිළිවෙත. විනාඩි 15. පර්යංක භාවනාව, සජ්ඣායනය වරින්
විනාඩි 05. බැගින් පර්යංක කාලය වැඩි කරමින් ගොස්
7.ප.ව. සිට 8.ප.ව. තෙක් පැය පර්යංකයෙන් ආනාපාන
සතිය වැඩීමට පුරුදු වීමි. රාත්‍රී 8.ප.ව. සිට 9.ප.ව
පමණ තෙක් පාඩම් පාඩුරා විශ්‍රාම ගැනීමට
නියමිතය. දවසේ දිනචරියාව සටහන් කරමින්
ඒ අතර සිදුවේ.
පිළිවෙළින් මාස දෙකක් පමණ ආනාපානසතිය

වැඩීමෙන් චිත්ත සමාධිය දැඩිසේම පහළවිය. සක්මනෝදින්
පිරිවේදීන් චිත්ත සමාධිය ඇතිවිය. තවද මහාසිඛ භාවනා
ක්‍රමය ප්‍රගුණ කරවන ලදී. එයින් ද දැඩිසේ සිත සමාධි
ගත විය. සමහරවිට කාය නොදැනී ඉතා තුනී දිය බිත්තුවක්
මෙන් සිත ඉහළට ගොස් ගමනාගමය දක්වා බිය තරමට
සියුම්ව පවතින. පුරා මාස 4. ක් සුඛකාලව ඉතා
සඳහාර් ද්‍රාවිර්යාව අනුව ශිලික ප්‍රාප්තව ලැබීම ජීවිතයේ
සුමතක නොවන බොහෝ නොවන පදනමක් සුන්දාරමත්
සංසිද්ධියක් වැනි බවට පත්විය.

ඒ කාලය තුල විනාඩි 15 – 20. කරමින් නොව
කාලයක අනුමෝදනා බණ, පැයක කරම දිග බණ
දේශනා කරමින්, පාලිභාෂාවේ මූලික දැනුමක්
බද්ධ පර්යංකයෙන් පැයක භාවනාවක්, පැයක් කරම
සක්මනක්, මහාවග් සියල්ලම ප්‍රගුණ විමට ලැබුණි.
1957. ජනවාරි 15. දුරුතු පෝයදා සාංඝිකයේ පැමිණි විරියට
අවසර පරිදි සතර සතිපට්ඨාන භාවනාව ගැන
ධර්ම දේශනාවක් නොනාවත්වා පැයක්ම දේශනා කළෙමි.
තවද, පෙබරවාරි මස නවම් පෝයදා බත්තේගොඩ
සිල් විරියකට එසේම පැයක දේශනාවක් පැවැත්වීමි.
ඒ බණ දෙතරයේම ඇසූවන් ප්‍රසාදයට පත්ව ආරාධනා
කරන ලදී. ප්‍රගුණවූ සාරමාසය තුළ බලවත් චිත්ත
ප්‍රසාදයෙන් ශරීරය උද්ධුම්මතව අයිජ්ඣාන සමාපත්ව
ගත කෙළෙමි.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමීය ආරණ්‍යවාසී ක්‍රමය. එනම්, සතර කමටහන්, සිවුපස ප්‍රත්‍යවේක්‍ෂාව, භාවනාමාත්‍ර ආහාර පරිභෝග සිව්, සිවුර ධාරණ, පංසුපේවීම, සිවුර ධෝවනාදිය, එක පිළිවෙතක් අධ්‍යයනය කරන ලදී.

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානයට පැමිණීම.

අනතුරු ස්වාමීය විශාල ගෝවිරත්න ස්වාමීන් වහන්-සේට විශාල ගමේ කුඩා පිරිවෙනේ ආරාධනයෙන් ශ්‍රී පාද වන්දනා ගමනක් යෙදුණා. ඒකට පෙර පෙබරවාරි මස තෙවැනි සතියේදී, ඇවිද්දීමේ ආයුධමී පනක් මගයෙන් ම ලවා, ලියවා, අනතුරු ස්වාමීය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී කුමාරගම නාහිමියන් වහන්සේ වෙත කැඳල් කරවන ලදී.

ශ්‍රී පාද වන්දනා ගමනත්, ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානයට අපව පිටත් කරවන ගමනත් 1957. 03.02. දිනට තීරණය විය. එදිනා උදෑසම ස්වාමීන් වහන්සේ ශ්‍රී පාද වන්දනා ගමනට පිටත් වූසේක්, අපට උපදෙස් අනුශාසනා ආශිර්වාද සියල්ල මුදුන්පත් කොට ඉමහත් දයාවෙනි. අපට එදිනා දවල් දානය, ස්වාමීන් වහන්සේගේ කුස්වරයෙක් වන, සාරම්භය පුරාම අප ගැන ඉතා-මත් ශ්‍රද්ධාවෙන් උපකාර සැලසූ, අපට සමීප ම ඉඹේ පදිංචි ආරච්චි මහතා නමින් අමතනු ලබන විජේසිංහ මහතාගේ නිවසේදී පිරිනැමිණි. දාන වළඳා අනුමෝදන් වත කියා පින්දී එතැනින්ම පිටත් වුයේ

ඇඩ්. පී. අමරසිංහ මහත්මයත් සෙසු උපාසකවරුන් මාත් සමඟ දුම්රියපොළ වන බෙම්මුල්ලටය. එතැන් දුම්රියෙන් පළමුව මරදාන දුම්රියපොළටත්, එතැන් සිට මාතර බලා යන ශීඝ්‍ර ගාමී රුහුණු කුමාරි දුම්රියෙන් අම්බලන්ගොඩටත් පැමිණියෙමු. එතැන් සිට දුම්රිය මාර්ග දිගේම පාගමනින් ගොස් සවස 6.00. ට පමණ ගල්දූව ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානයට ඇතුළු සම්බුද්ධ වන්දනාවෙන් අනතුරුව පූජනීය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඤාණාරාම මාහිමියන් වහන්සේත් පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමියන් වහන්සේත් වැඳ පුදා විශ්‍රාම ගතිමු. අපේ ආවතුම් පැවතුම් දුටු මාහිමියන් වහන්සේලා ඉතාමත් අපට දයාවෙන් පිළිගෙන "මේ ඇත්තෝ අද වුවත් පැවිදි කරවීමට සුදුසු යයි" වදාළහ.

ඉන් අනතුරුව මාර්තු 03. වෙනිදා නාවගත්ත ආරණ්‍යයේ සිට පූජනීය පණ්ඩිත ගැටමාන්නේ ශ්‍රී විමලවංශ ස්වාමීන්ද්‍රයන් වහන්සේ ද, පැවිදි කරවීමට වයස්ක උපාසක මහතුන් සමඟ ගල්දූවට වැඩම කළහ. ගල්දූවෙහි, බලපිටියේ මහකරුවේ පහතමුල්ලේ පූජ්‍ය පණ්ඩිත චන්දදස්සී ස්වාමීන් වහන්සේ විශේෂ තමන් වැඩිමයෙන් උපාසක තුමකු භාරදී සිටියේය. ගල්දූවේ කාලසටහනත් අප පුරුදු වූ දිනචරියාවත් ඉතාව ගොඩසිටි පිළිවෙත් පුරද්දී මාර්තු මස 27. වෙනිදා පැවිදි භාවය පූජනීය ස්වාමීන් වහන්සේලා තුන් නමම ඒකමතිකව තීරණය කළසේක,

ශාසන ප්‍රව්‍රජ්‍යාව.

අපේ කාරුණික පියාණන් වහන්සේම විසින් සිවුරු පිරිකර සියල්ල, නාගොල්ල ආරණ්‍යයේ වැඩසිටි පූජ්‍ය කාන්තගේ මුදිත ස්වාමීන් වහන්සේගේ උපදෙස් පරිදි සකස් කරවාගන්නා ලදුව කැප වසු පෝය ගල්දූවට ගෙනෙන ලදී. 1957. මාර්තු මස 27. වෙනි බදාදා උදේ 8.30.ට පමණ යෙදුනු සුබ මොහොතේදී අපේ උතුම් ප්‍රව්‍රජ්‍යා මංගලය සිදුවූයේ ජීවිතයේ සැමදා සිහිපත් කරමින් නිරාමිස සතුට විඳිනා අයුරිනි.

අතිපූජනීය රාජකීය පණ්ඩිත මාතර සිරි ඤාණාරාම මාහිමියන් වහන්සේ මූලාසනයේ වැඩ සිටි සේක. අතිපූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමියන් වහන්සේ අතිපූජනීය රාජකීය පණ්ඩිත පහමුල්ලේ පියදස්සි මාහිමියන් වහන්සේ, අතිපූජනීය පණ්ඩිත ගලමන්ගොඩ ශ්‍රී විමලවංශ කාවසේ-යන් වහන්සේ ද අනුපිළිවෙලින් වැඩහුන් සේක. ආචාර්යක ගුරු සහ සිසු අතර, අතිපූජනීය විශේෂ බෝධිරක්ඛිත ස්වාමීන් වහන්සේ සහ අතිපූජනීය කාන්තගේ මුදිත ස්වාමීන් වහන්සේද වැඩ සිටි සේක.

මා වෙනුවෙන් මගේ පියාණන් වහන්සේද, දෙටු සොහොයුරු සාමචිත්‍රසිංහද ආර්. ජී. දියානායක මහතා ද ආර්. පී. අමරසිංහ මහතා ද ජී. එච්. අබේසිංහබණ්ඩාර මහත්ම-යද පැමිණ සිටියහ. මේ ආසනයේ දිනකත්වයෙන්

සමලිත් වික්‍රමරත්න සේනානායක ප්‍රධාන දුසිත මාතාව ඇතුළු
පිරිස ලැස්ව සිටියහ. මුලින් හඳුන්වීමක් පූජ්‍ය
කාබැද්දුවේ මාහවේයන් වහන්සේ විසින් පැවැත්වීමෙන්
පසු අතිපූජ්‍ය මහෝපාධ්‍යාය මාතර සිරි ඤාණරතන
මාහිමියන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන් සිදුවෙමින්
අප නිදොනකට සිවුරුපිට දවටා තමටවත් දෙවා
ප්‍රව්‍රජ්‍යා දැක්වීලයෙන් සඳවූමන ලදී. මී මොහොතේ
ශුභාමත් ප්‍රීතියෙන් ගාම්භීර ශ්‍රද්ධාවෙන් මහා
සංඝ රත්නයන් විශේෂ අනුමෝදනයෙන් යෙදී, සිරියෙන්
නායකයන් ඇමති ලොකු උපාසක අතු, පූජ්‍ය කාංගොඩගම
සද්ධාසර නාහිමි ද, බලපිටියේ දේවානන්ද පූජ්‍ය
මහකරුවේ සද්ධාවිමල නාහිමි ද ඇතුළු පිරිස ඇතුළත්
කරන ලදහ. මට පූජ්‍ය නාඋයනේ අරියධම්ම නම
සම්මත කරන ලදී. 'නාඋයනේ' යන්න යොදාගත්තේ
මගේ කැමැත්තෙනි. හේතුව, ඈත අතීතයේ වැඩවුසූ
ආර්ය බෞද්ධාත්මයන් වහන්සේලා විසින් ද භාවිත
කරන ලද්දේ වැඩි ලෙසන ස්ථානයන් බැවිනි. නැවද
අපේ ගමේ නමින් ස්වාමීන් වහන්සේලා හය නමක්
පමණට සියයි එහා නිකායේ ඇසිරිරි භාවනාවේ විහාරයේ [illegible]
වල වැඩසිටින අතර මා ආරණ්‍යගතව පැවිදිවූ නිසා
ආරණ්‍යයේ නම භාවිත කිරීම වඩාත් සුදුසු යයි
සිත් වූ බැවිනි. නාඋයනේ අරියධම්ම නමින් භාවිතා කිරීම

සුදුසු යයි අනුමත කොට තිබේ නම්, පූජ්‍ය පණ්ඩිත පොල්වත්තේ විමලවංශ ස්වාමීන් වහන්සේ නායකයෝ ද මගේ කරුණු විමසා බැලීමෙනි.

## සාමණේර සමය

1957. මාර්තු 27. වෙනිදා සිට 1959. ජූලි 15. දක්වා කාලය වසර දෙකකුත් මාස තුනක් දින දහතුන මගේ සාමණේර සමයයි. පැවිදිව දින දෙකක් ගතවූ අතර දිවා වන්දනාවෙන් පසු පූජ්‍ය ගුරුතුමන්ගේ මාහිමියෝ "මේ පොඩි නම මගේ ශිෂ්‍ය නායකයෝට ඉගින්න කැමතිදැයි" මගෙන් විමසූහ. "පූජ්‍ය පණ්ඩිත මාහිමියන් වහන්සේ අවසර දෙනසේක් නම් කැමති බවයි" පිළිතුරු දුනිමි.

පූජ්‍ය මාහිමියන් වහන්සේ දෙනම සාකච්ඡා කොට මා නායකයෝට බසින ලෙස අවසර ලැබිණි. 1957 මාර්තු 30. වෙනිදා උදේ පූජ්‍ය ගුරුවාන්ගේ මාහිමියන් වහන්සේ ප්‍රධාන අපි 5. නමක් කැප්පකරු මහතා සමග ගල්දූවෙන් පිටත් වී බස්රියෙන්ට කොළඹට පැමිණ බෞද්ධ මන්දිරයේ දී ගල්දූවෙන් ගෙන ආ දානය වළඳා නැවතත් බස්රියෙන්ට කුරුණෑගලටත් සවස 6.00. ට පමණ නාවගත ආරණ්‍යයට පැමිණ වීමු. දානය වළඳා ගල්ලෙනට උඩින් පිහිටි කුඩා ගල්ලෙන මා වෙත පැවරිණි. දහගාලා ලෙන පිහිරලෙන සමග ගල්ලෙන් කුටි අටක් පමණක් පිහිටා නාවගතෙහි සකස්ව තිබිණි. අසිනෙක් ආරණ්‍ය භූමිය ගොඩෝ දුර පිහිටියේ වෙයි.

නාඋයනේදී අළුයම 3.30. අවදිවීම. පර්යංක භාවනා. 5.30. බුද්ධානුස්සති - මෛත්‍රී - භාවනා. 6.15. චංක්‍රමණ. 7.00. පිණ්ඩපාතය. 8.00. පාඩම් කිරීම. 10.00. විනය පිළිබඳ බණ - ප්‍රාතිමෝක්ෂය. 11.00. දවල් දානය. 12.00. දිවා විවේකය - මෛත්‍රී. 1.00. සිට 5.00 තෙක් අධ්‍යයනය. පාඩම්දීම පොත් කියවීම - ලිපිකෑදි අධ්‍යයන කටයුතු. 5.00. චංක්‍රමණ. 6.00 සජ්ඣායනා බුද්ධානුස්සති - මෛත්‍රී - භාවනා - වත්පිළිවෙත්. 7.30. සිට 9.30. තෙක් කුටියේ පර්යංක භාවනාව. 10.00 විවේක ගැනීම. ( මෙම දෛනික පර්යංකයේ දී සිංහල විශුද්ධිමාර්ගයේ බුද්ධානුස්සතිය සම්පූර්ණයෙන් කටපාඩ-මෙන් අනුපිළිවෙළ එකාලදී )

සතරබ්‍රහ්මවිහාර - සතිපට්ඨාන සූත්‍රය - සූත්‍රසංග්‍රහය - ධම්මපදය - කායවිරති ගාථාවෝත - අභිධර්ම සංග්‍රහය - බාලාවතාරය සම්පූර්ණ කොට වාචෝද්ගත කරන ලද්දේ නාඋයනේදීය. මීට දුර්ලභ වාසනාවක් වූ ඇත්තොරු කුටියේ පුරා වසර 6.ක් ගත කෙළෙමි. විනයධර්මය - ශාසනික ධර්මය - ගොඩනැගිල්ලේ ද එකින් එක වැඩෙමි.

නාඋයනේදී මහත් උදර රෝගාබාධයක් නිසා ගිලානව වහන්සේ ඇවිත් නාඋයනට වා පවුලට මාස 3.ක් පමණ ප්‍රතිකාර කළේමු. එහිදී ප්‍රතිකාරක නොසැලකිල්ල බව දැනුණි. අවුරුදු 8. ක් 10. ක් කරවා කල් ගිලානව වහන්සේ ඒ රෝගය එකින් එක බව නැති වැළැක්වූහ. ඉන් පසු ගුණයක් ඇතිවිය. නාඋයනේදී පූජ්‍ය ප්‍රමාණයෝත ස්වාමීන් වහන්සේත්, පූජ්‍ය සරණංකර ස්වාමීන් වහන්සේත් ඇසුරු කෙළෙමි. එක දිනකට

නායකයාට වැඩකළ පූජ්‍ය උපකාරවංශ සාමණේර වහන්සේත්
ඇසුරට ලැබිණ. එම සාමණේර වහන්සේගෙන් අභිධර්මසංග්‍රහයත්
ප්‍රත්‍යවේක්ෂා කාණ්ඩය සහ අර්ථ ඇමතිගෙනය. පසුවත් ඇතුළත්
ශික්ෂා ප්‍රාතිමෝක්ෂය කටපාඩම් කළෙමි. චිරස්ථිත බ්‍රහ්මචර්යාව
එදිට ප්‍රතිපත්ති නොකඩවා පූජාප්‍රකාරය මෙනෙහි කළයුතුයි.
ශ්‍රී සාමණේර වහන්සේගෙන් ලැබුණු අවසරය පරිදි අද කෙනෙක් දිගටම
එය පැවැත්වීම්. තවද, දහම්ල සිහිපත් කළ කාලයේදී පූර්ව
බෝධිසත්ව සාමණේර වහන්සේගෙන්ද මෙසේ අවසර ලැබිණි
“කමක් බලනවා - ඉඳිමෙනවා - හල්මෙනවා - වතුවත් ගහනවා
බව, වැගිරෙනවා - පතුරු කඩාකනවා - බඩ ලේ නහර පෙරළම
දියවී යනවා - දුගඳ හමනවා පැසවෙනවා - ඇටකටු තැන තැන
දිරනවා - පොළොවට දිරා පස් වෙනවා.. තමන්ගේ ශරීර ඇඟේම
කරන ශරීර පුද්ගල ආදීන්ගෙන් එසේම බලනවා”
මෙසේ මරණයත්, ආදීනවයත්, අශුභසංඥාවත්,
අනිත්‍ය දුක්ඛ අනාත්ම ආකාර භාවනාවන්
බලන ලෙස අවසර ලැබී තිබුණා. අද දක්වා
එසේ සලකමින් චිරස්ථිත බ්‍රහ්මචර්යාව පුරමි.

<u>පූතිමුත්ත භෛෂජ්‍යය.</u>

ඇට ඉවත් කළ අරළු රාත්තල් 1. යි.
ගෝමුත්‍ර නැලි 1. යි. (බෝතල් 1½)
සහිඳ ලුණු කලං 2. යි.
උක්සකුරු රාත්තල් ½ යි.

විළඹ් තෙල් බෝතල් 3/4 යි. මීපැණි බෝතල් 1/4 යි.

සාදාගන්නා පිළිවෙළ

උදෑසනින් ලබාගන්නාවූ එළ ගෝමුත්‍ර පෙරා බඳුනකට දමා අරළු කසට බහා පැය 24 කින් පසු අරළු කැට ඉවත්කොට අව්වේ වේලාගෙන, නැවතත් එම ගෝමුත්‍ර බඳුනටම බහා පසු දින වේලාගතයුතු. මෙසේ දින සියයකින් ගෝමුත්‍ර වැදී ගිය පසු අරළු අව්වේ වේලා එතේ දමා කොටා හැපි රෙදි කඩකින් හලා අනෙක් ද්‍රව්‍ය සමග අනාගෙන අනුභවගත යුතුය.

භාවිතය සහ විශේෂ ගුණ

උදේ හවස තේ හැන්දක පමණ වළඳා උණු පැන් ටිකක් පානය කළයුතුය. අජීර්ණ - ක්‍රිමි රෝග - ග්‍රහණි - බඩපිපුම - උදරවාත - මලබද්ධගත ආදී සියලු උදර රෝග සුව කෙරේ. ශරීරය පැහැපත් කී - හමේ රෝග සුව කී. ධාරණ ශක්තිය ස්මෘති මේධා වර්ධනය වේ. විශේෂයෙන් යෝගාවචර යතිහට දිව බෙහෙතකි.

මෙසේ සාදාගැනීමේදී ප්‍රමිතිය, අවශ්‍ය පරිදි අනුමානය කරගතයුතුය, තවද පූර්ණ පවිත්‍රතාවය සාදාගැනීමටත් උපදෙස් සඳහන් කාරණයේ සියලු ආමරෝග හා වස විෂ සර්ව විෂට පවා ගුණදෙන දිව්‍ය ඖෂධයක් මෙන් බැවිනි.

සූතිවුත්ත ආසවය

ඇට සහිත අරළු රාත්තලයි.
සහිඳළුණු කලං දෙකයි.
බිල ගෝමුත්‍ර බෝතල් හයයි. (පැලි 4. යි)
මේ අනුව ප්‍රමාණ වැඩිකරගත හැකිය.

සාදන පිළිවෙළ.

කළගෝමුත්‍ර පෙරාගෙන, අරළු පොඩිකර ගෙන, සහිඳළුණු ලූණු සමඟ ඔබ ඇති මැටි බඳුන කට බහා, රෙදිකඩකින් කට බැඳ, තවත පුවක් කොළයකින් බැඳ, හුලං නොවදින සේ මැටි බැඳ නොතෙමෙන බිමක ඔබ ඇතිව වළක් කපා වී මැද ලිප්ගල් තුනක් මත බෙහෙත් බඳුන තබා, බිමට හෝ බිත්තියකට හෝ නොගෑවෙන සේ කොට, උඩින් ලෑලි අතුරා පස් වසා මාස තුනකට පසු බෙහෙත පෙරාගත යුතුය.

අජීර්ණයක් - බඩවිතුවක් - කුමිරෝගයන් සර්ප දෂ්ටයක් වුව අවස්ථාවකදී ඔරකට අරිෂ්ටයක් වළඳන ප්‍රමාණයට පානය කළයුතු බිලක් - දෙකක් වැළඳූ පමණින් සුවෙයි. පතාරව වළඳීම අපුරුපු නොවේ. උදර රෝගයන්ට දිව්‍ය ඖෂධයක් සමානයි. යෝගාවචරයන්හට බොහෝ ප්‍රයෝජනවත් වේ.

ආචාර්ය උපාධ්‍යාය හිමිවරු.

පැවිදි වීමේ දී උපාධ්‍යායන් වහන්සේ වශයෙන් පත් වූ සේක්, අතිපූජ්‍ය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඥානාරාම හිමියන් වහන්සේ ය. අතිගරු පූජ්‍ය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශ හිමියන් වහන්සේ ආචාර්යත්වයට පත් වූ සේක.

උපසම්පදාවේදී උපාධ්‍යායන් වහන්සේ වශයෙන් පත් වූ සේක් අතිපූජ්‍ය විදර්ශනාචාර්ය මඩවල ධම්මකුසලාභිධාන නාමලා ලොකු හිමියන් වහන්සේ ය. කම්මාචාර්යයන් වහන්සේලා වශයෙන්, අතිපූජ්‍ය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඥානාරාම හිමියන් වහන්සේද, අතිපූජ්‍ය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශ හිමියන් වහන්සේද, අතිපූජ්‍ය පණ්ඩිත ගලවැවේ ශ්‍රී විමලවංශ හිමියන් වහන්සේද, අතිපූජ්‍ය ඉහගම සිරිසුමන හිමියන් වහන්සේද, අතිපූජ්‍ය දේවගොඩ මංගලසිරි හිමියන් වහන්සේද, පත් වූ සේක.

අධ්‍යාපන සමයේ දී ඉහත සඳහන් උපසම්පදාවේදී උපාධ්‍යාය කම්මාචාර්යවර හිමිවරු පත්වූ වහන්සේලාද, අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල මහානායක හිමියන් වහන්සේ ද අතිපූජ්‍ය දෙවිනුවර ඥානාවාසාභිධාන මහානායක හිමියන් වහන්සේ ද ආචාර්යත්වයට පත්වූසේක.

කවිශිෂ්ටාචාර්යයන් වහන්සේලා වශයෙන්, අතිපූජ්‍ය විශේෂ
ඥාණරක්ෂිත සාමින් වහන්සේ මා දිගල්ල යමයේ ද,
ඉන්පසු අමරපුර පූජනීය රාජකීය පණ්ඩිත මාතර සිරි
ඤාණාරාම මාහිමියන් වහන්සේද, අතිපූජ්‍ය විද්‍යාකීර්ත්‍යාචාර්ය
මාතලේ ශ්‍රී ධම්මරක්ඛිත රුවන්ගිරියේ ලොකු සාමින් වහන්සේ ද,
අතිපූජ්‍ය විද්‍යාකීර්ත්‍යාචාර්ය වෑවල බඹරකැලේ සෝමලෝක
ලොකු සාමින් වහන්සේ ද, බුද්ධවරයේදී මහාසි
මූලස්ථානයේදී අතිපූජ්‍ය පදල සාමින් වහන්සේ ද,
සද්ධම්මරංසි සංඝනායකේදී අතිපූජ්‍ය කුඹුරුගමුවංශ සාමින්
වහන්සේ ද, බෝලවියෙන් එයි විශාලවංකිත අරණයේදී
අතිපූජනීය අග්ගමහා කම්මට්ඨානාචරිය එයි ආචිනාවා
සෙයාවෝ මාහිමියන් වහන්සේද ගුරු වූ සේක.
සියලු ආකාරයෙන් ආචාර්ය උපාධ්‍යායත්ව දරමින් මාහට
ගුරු වූ අතිපූජනීය මාහිමියන් වහන්සේලා බොහෝ උපකාර
අප්‍රමාණව ඇත් සේක.

## අධ්‍යයන සමය.

පන්සිය පල්ලෑස දිසාපල් කාලයේදී විශේෂ
විල්ලෙගෙදර වත්තේ ආසනයේදී පූජනීය විශේෂ ඝෝෂිතරක්ඛිත
ස්වාමීන් වහන්සේගෙන් මූලික අධ්‍යයනය ලද්දෙමි. මෙහි
මුලදී ම ගැන සඳහන්ව ඇත. සාමණේර අවදියේදී
නාවලපිටිය ආරණ්‍යයේදීත් අශෝකාරාමයේදීත් පූජනීය
පණ්ඩිත තලල්ලේ ශ්‍රී විමලවංශ මාහිමියන් වහන්සේ
වෙතින් සිංහල-පාලි පරිවර්තනය සංස්කෘත-ඡන්දස්-අලංකාර,

විනය ප්‍රාතිමෝක්ෂ - කංඛාවිතරණී - ප්‍රාතිමෝක්ෂ වර්ණනාව. සිඛවළඳ - සිඛවළඳ විනිස - සූත්‍රපිටකයේ සඟි පොත්, ආදියත් විවරණී - ඔදල් කොසු බැඳීම - පොත් බැඳීම ආදී ශුවත් ශිල්ප හැදෑරූ ලදී. පුස්ලැල්ල ශ්‍රී රෝහණ යෝගාශ්‍රම මධ්‍යස්ථානයේදී අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශ ස්වාමීන් වහන්සේ වෙතින් හා අතිපූජ්‍ය දේවගොඩ මංගලසිරි ස්වාමීන් වහන්සේ ද වෙතින් චූඩිදරවත් පාලිභාෂාව - අර්ථකථා. විනය පිටකය සූත්‍රාන්ත පිටකය ද අධ්‍යයන කෙරිණි. විශේෂයෙන් විනය පිටකයේ පාරාජිකාපාලි - පාචිත්තියපාලි ඉතා අදක පාඩම් වාචෝද්ගත කෙරිණි.

දනමුකන්ද සංඝමංගල යෝගාශ්‍රමයේදී ද මැල්ලගල යෝගාරාම මධ්‍යස්ථානයේදී ද අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත මාතරයේ ඤාණාරාම මාහිමියන් වහන්සේ වෙතින් රූපසිද්ධි - කච්චායන ව්‍යාකරණ - මුඛමත්තදීපනී හෙවත් න්‍යාසය, මහාමොග්ගල්ලාන ව්‍යාකරණ යන්, අභිධම්ම පිටක යන් හැදෑරූ ලදී. විනය පිටකයේ ඉතිරිවූ මහාවග්ගපාලි චුල්ලවග්ගපාලි පරිවාර පාලි ඉහා නැතත් වාචෝද්ගත කෙරිණි. අභිධම්ම පිටකයේ ධම්මසංගණී ප්‍රකරණය ද වනපොත් කොට තබාගති.

ගල්දූව ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානයේදී අතිගරු පූජනීය ගලබොක්කේ පණ්ඩිත විමලවංශ ස්වාමීන් වහන්සේගෙන්ද

අස්ගිරි පූජ්‍ය දෙව්ගොඩ ධම්මලංකාර ස්වාමීන් වහන්සේගෙන්ද
විශේෂ පාඩමාලාවක් අනුව සිංහල - පාලි - සංස්කෘත ව්‍යාකරණ
ව්‍යාකරණයද අධ්‍යයනය කරන ලදී. අභිධර්ම පිටකයේ
විභංග - ධාතුකථා - පුග්ගලපඤ්ඤත්ති - කථාවත්ථු ප්‍රකරණයන්ද
[illegible] වාචෝද්ගත කෙරිණ. නැවත [illegible] සහ
ගෝතමතපෝවනයේදී අස්ගිරි පූජ්‍ය රාජකීය පණ්ඩිත
මාතර ශ්‍රී ඥානාරාම මාහිමියන් වහන්සේ ඇසුරේදී
යමක ප්‍රකරණ - පට්ඨාන මහා ප්‍රකරණ වාචෝද්ගත කෙරිණි.

ගෝතම තපෝවනයේ නැවතී සිට

මහනුවර ශ්‍රී විජයාලංකාර ආරාමයේ [illegible]
රේරුකානේ චන්දවිමල මහා නායක මාහිමියන් වහන්සේ
වෙතින් අභිධර්ම පරමාර්ථ සංක්ෂේපය හා
අභිධර්මයේ ගැඹුරු කරුණු විශ්ලේෂණය කරවා ගනිමින්
අභිධර්ම අධ්‍යයනය කෙරිණ. කොළඹ - දෙමටගොඩ
මහාවිශුද්ධාරාමයේ අස්ගිරි පූජ්‍ය දෙව්නුවර ඥානාවාස
මහානායක මාහිමියන් වහන්සේ වෙතින් අභිධර්ම
මාතෘකා සවර්ණ - ධාතුකථා සවර්ණ - යමක සවර්ණ සහිත
අභිධර්මයේ විශේෂ අධ්‍යයනයක් ලැබිණි.

දියතලාව කහගොල්ලේ ශ්‍රී සුභාරාම

විවේකාශ්‍රමයේදී අතිපූජ්‍ය කුසලදෙ බුරුම ස්වාමීන්
වහන්සේගෙන් බුරුම භාෂාව හදාරමින් බුරුම භාෂාවෙන්
මුද්‍රිත දහම් පොත් කීපයක් පරිවර්තනය කරනු ලදී.

අධිශීලෝපසම්පදාව.

නාථගන ආරණ්‍යයෙන් රත්වල අශෝකාරණ්‍ය සේනාසන භූමියට වැඩම කරවන ලද්දේ 1958.05.02 දින පූජනීය ආචාර්ය ගුරුතාණෝ මාහිමියන් වහන්සේගේ ම විශේෂ ආරාධනයකිනි.

නිවලව අරණ්‍යයේ වාර්ෂික උපසම්පදා විනයකර්මය 1958. නොවැම්බර් 25. සඳුදා යෙදී තිබුණේ නිවලව ආරණ්‍යයේ ප්‍රධාන දායකතුමා වන ජී. ඩී. සේනානායක මුහන්දිරම් රාළහාමිගේ අයදුම පරිදි ඉතා සාදරයෙනි. ඒ කාලය වනවිට උපසම්පදාවට අවශ්‍ය විනය අධ්‍යයන සියල්ල මා සම්පූර්ණ කොට තිබිණි.

පෙර දිනක පූජ්‍ය ආචාර්ය ගුරුතාණෝ මාහිමියන් වහන්සේ මගෙන් මෙසේ විමසූ සේක. "මේ අධියවඩ නම ඉක්මනින් උපසම්පදා වීම අවශ්‍යය ද" ඒ ගැන මගේ පිළිතුර වූයේ මෙයයි. "ස්වාමීන් වහන්ස! ඉක්මනින් උපසම්පදා වීම මගේ අවශ්‍යතාවක් නැත. ස්වාමීන් වහන්සේලාගේ අභිමතය අනුව උපසම්පදාව ලබන දිනකට මා කැමැත්තෙමි" "සාධු සාධු ඒ අදහස ඉතාමත් හොඳයි, යමක් ගැන දැඩි ආශාවක් කළොත් එයත් දුකක්" කියා ස්වාමීන් වහන්සේ මගේ වචනය අනුමත කොට වදාළේ සිතේ විශේෂ අදහසක් ඇතිව බව මට වැටහුණ ඉහත සඳහන් උපසම්පදා විනය කර්මය එසේ සිදුවිය.

සංඝයාගෙන් යෙදුනු එම විනය කර්මයට පූජ්‍ය ගරුවරුන්
සාමිවරුන් වහන්සේ සහභාගි නොවූ අතර, මා වෙනුවෙන්
විශේෂ උපසම්පදා විනයකර්මයක් අශෝකාරාමයේදී රත්මල
කුඩාබයේ උදකුක්ඛෙප සීමාවක් සාදවා එම ගරු
විනය කර්මය පැවැත්වීමට යෝජනා කළෙමි, අනතුරුව
පූජ්‍ය රාජකීය පණ්ඩිත කොටබද්දුවේ මාහිමියන් වහන්සේගේ
පූර්ණ අනුමතය ඇතිවිය.

රත්මල අශෝකාරාමයට දියත පිහිට ඉඩමක්
කුඩාවෙන් උදකුක්ඛෙප රත්මල කුඩාබයේ දක්ෂිණය
කවුරුත් සීමා මන්දිරයක් සකස් කරන ලද්දේ මහාපූජ්‍ය
ස්ථානයක් ලබුණු පිරිසක් මෙන් ප්‍රිතයෙන්. ඇසළමාසයේ
අතරෙන් නැගෙන වැසිවැ පවුරු අතර කුඩා බය මහබය පිරිවෙන්
පවුරෙන්. එහෙත් ගරු උපසම්පදා විනයකර්ම පවත්නා
දින සීපයක් තුළ වැසිය නැවති අහස පැදී
දෙවියන්ගේ අනුග්‍රහය දක්වන්නාක් මෙන් විය.

1959. ජූලි 15. වෙනි දින මහ පෙරහැරින්
අශෝකාරාමයේ සිට රත්මල කුඩා බය වෙත
මහයක මහන වැඩම කොට, ඉතාමත් උත්කර්ෂයෙන්
ගරු උපසම්පදා විනය කර්මය සිදු කරන ලද්දේ
අපේ පිරිසට අමතක නොවන එක්තරා ශෛලීය
විත්ත විචිත්‍ර විය දිනයේ ගුණයෙන් ඉතිරි
පැහැර යාමේ සාල කරමින්.

ගරු උපසම්පදා විනය කර්මය සඳහා සීමා මාළකයට

සැපත් වූ ගරු උපසම්පන්න සංඝ පිරිස 27. නමකි.

උපසම්පදාපේක්ෂක 5. නමකි.

උපසම්පදාපේක්ෂක :- 5 නම

1- පූජ්‍ය බුලත්සිංහල ධම්මවිමල සාමණේර හිමි.

2. " නාඋයනේ අරියධම්ම " "

3. " කෝට්ටගොඩ පියානන්ද " "

4. " දිරක්කියගල මෙත්තිය " "

5. " අහංගම විජිත " "

පළමු වනියට පැවැත්ත මා ඇතුළු පස් නමගේ

අභිනවෝපසම්පත්තිය සවස 3.50 ට සිදුවිය.

ගරු උපාධ්‍යායත්වය, කමල ආරණ්‍ය

සේනාසනාධිපති අග්‍රපූජ්‍ය විද්‍යෝදයාධිපති ධම්මවල

ධම්මනිලංකා මාපලියන් වහන්සේ දැරූසේක. කර්මාචාර්ය-

ත්වයට, අග්‍රපූජ්‍ය රාජකීය පණ්ඩිත කොතර සිරි

කුමාරගම මාහිමි, අග්‍රපූජ්‍ය රාජකීය පණ්ඩිත

කඩවැද්දුව ශ්‍රී ජිනවංශ මාහිමි, අග්‍රපූජ්‍ය පණ්ඩිත

ගලමානේ ශ්‍රී විමලවංස මාහිමි, අග්‍රපූජ්‍ය ශ්‍රාගම

අරියවංශ මාහිමි, අග්‍රපූජ්‍ය දේවානන්ද මංගලවිරි

මාහිමි යන නායක් වහන්සේලා පස් නම

පත් වූ සේක. ( දිනය:- ශ්‍රී බු: ව: 2503. ඇසළ මස පුර

11. වක තිථිය බදාදා. ක්‍ර: ව: 1959. 07. 15. )

## ත්‍රිපිටකය වාචෝද්ගත කිරීම.

රත්මල අසෝකාරාමයේදී සූත්‍රාන්ත පිටක පොත් කොටස් වශයෙන් වාචෝද්ගත කෙරිණි. පුහුල්වැල්ල - ත්‍රිකෝණා යෝගාශ්‍රම මධ්‍යස්ථානයේදී විනය පිටකය 1960. අගෝස්තු මස වාචෝද්ගත කිරීම පටන්ගෙන 1962. මාර්තු මස 02. වෙනිදා විනය පිටකය වාචෝද්ගත කොට නිමවා ලදී. [illegible] විනයධරත්වය ප්‍රසාදපත්‍ර වශයෙන් ලැබිණි. 1962. මාර්තු මස 06. වෙනිදා අභිධර්ම පිටකය පාඩම් කිරීම පටන්ගෙන 1963. අගෝස්තු මස දී සම්පූර්ණයෙන් වාචෝද්ගත කොට නිමවිය. ධර්ම විනය උගෙනිමින්, දිනපතා නියමිත අනුව සියලුම කාලය ප්‍රයෝජනවත් දවසේ පමණ වේලාවකදී පාඩම් වාචෝද්ගත කරමින් ගත කළ බැවින් ආපසු වැලපීද පහළ වනුයේ අසීමිත ධර්ම ප්‍රීතියකි.

එක් දිනක දී නවක හිමි නමක් ලිපියකින් මෙසේ අසා සිටියේය. "ස්වාමීන් වහන්ස! පාඩම් කරන ක්‍රමය මටත් දෙනු මැනවි" යනුයි. පිළිතුරු වශයෙන් මෙසේ ලියා යැව්වෙමි. "පාඩම් කිරීම සඳහා වෙළඳාම් බොහොමයක් ගැන මම නොදනිමි. එහෙත් මා වෙළඳාම් කරන ක්‍රමය මෙසේයි. උදේ පාන්දර 3.50.ට අවදි වී 4.00. සිට 5.00. තෙක් බුද්ධ පර්යංකයෙන් ආනාපාන සතිය වඩමි. දවසේ සෑම කාලයක්ම පාඩම් කිරීමට වෙලාව සපුරමි. මා වෙළඳාම් කරන්නේ මෙසේය. වෙළඳාම් කරනු මැනවි"

වස් විසූ ස්ථාන හා ඇසුරු කළ ස්ථාන.

සාමණේර භූමියේ දී පළමුවැනි වස්සානය නාරංගස් ආරණ්‍යයේ ද, දෙවැනි වස්සානය හා උපසම්පදා වීමෙන් පළමු වැනි වස්සානය රංවල අශෝකාරාමයේ ද ගත කරන ලදී.

විශේෂ ආරාධනයකගෙන් පූජනීය පණ්ඩිත ගලමාන්ගේ හාමුදුරුවන් වහන්සේ 1959. දෙසැම්බර් මස අගදී නිකවැරටියේ රඹෑ-කැළ් ආරණ්‍ය වාසයට වැඩම කරන ලද්දේ, අනුපූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශ හාමුදුරුවන් වහන්සේ ගේ කාරුණික නියමය අනුව මට පුහුල්වැල්ලේ ශ්‍රී රෝහණ යෝගාශ්‍රම මධ්‍යස්ථානයට වැඩිත්තට සලස්වා නැවැත්තෙන් උපදෙස් දෙවාවදාරණ.

ඒ අනුව 1960. ජනවාරි මස 07. වෙනිදා රංවල අශෝකාරාමයෙන් සමුගෙන හාවුලක්වත් ජනවාරි 09 දා හා උදයෙන් මාතර පුහුල්වැල්ලේ ශ්‍රී රෝහණ යෝගාශ්‍රම මධ්‍යස්ථානයට පැමිණියෙමි. පූජනීය කඩවැද්දුවේ හාමුදුරුවන් වහන්සේගේ සෙවනේ රැඳී පූජනීය දේවගොඩ මංගලසිරි හාමුදුරුවන් වහන්සේ ගේ ද උපකාර ලබමින් 1961 - ජූලි මාසයේ 27. වෙනිදා තෙක් දෙවැනි වස්සාන කාලය ගත කෙළෙමි. එහි ගතවූ කාලය තුළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ දසවස් සපිරීම නිමිත්තෙන් නවමුණ ආරණ්‍ය මූලස්ථානයේදී සාරණීය පුණ්‍යෝත්සවය පැවතිය.

1961- ජූලිමස 16-17-18. දින තුනේදී ධර්ම ලබ, සීමාබන්ධනය පැවිදි භික්ෂුව - ගරු උපසම්පදා විනය කර්මයද සිදුවිය. ත්‍රිපිටක වගීශ කාබෝද්‍යාන හිමිපාන් වහන්සේලාට සම්මාන හා ප්‍රසාද පූජා ද පැවැත්විණි. එවකට මා විනය පිටකයේ උභය විභංගය වාචෝද්ගත කොට සිටි බැවින් විභංගභාණකිය සම්මානයක් සහ එතිනා දුකුල දෙකට සිවුරක් ද ප්‍රසාද පූජා වශයෙන් මාහට ලැබිණි. 1962 වස් අවසානයේදී ශ්‍රී දෙවා සිවුර වේවැල්දෙණ ආරණ්‍යයේ තාපීන ස්වාමීන් විසින් පූජා කෙළේ

ගරු උපසම්පදා විනය කර්මයට සහභාගි වීම පිණිස දුම්බගිරිකන්දේ ලොකු හාමුදුරුවන් වහන්සේ 1961 ජූලි මස 17දා නිමලාට වැඩම කළා. නිමලාව මහාගල්ලෙනේ රාත්‍රී කාලය වැඩසිටි ආසනය ලබාම මටත් ආසනයක් ලැබිණ. එදින සැන්දෑවට පෙර ප්‍රසිද්ධ දුම්බගිරිකන්දේ ලොකු වහන්සේ භාවනා කටයුතු ගැන කරුණු කිහිප දෙනා අතර, තවත් ඇසිරිමත් කරුණක් මෙසේ සැලකළ සේක.

ස්වාමීන් වහන්සේ පැවිදි ව උපසම්පදා වූ අලුත ධූතාංග විහාරස්ථානයේ දී දිනපතා රාත්‍රියේ සජ්ඣායනා භාවනා එක "බට වඩිනාව එක භාවනා කරගන්නට සුදුසු තැනක් ලැබේවා"යි ප්‍රාර්ථනා කරමින් සිටින අතර එක් දිනක් රාත්‍රී සිහිනයේදී සිහිනෙන් ආරණ්‍ය සේනාසනයක් පෙනුණි! පුරණ ගල්වැටිපෙළ ගල්ලෙන - ගුහාවලිමග - ගලක අතේ පලකාරු - දුහ ගස මේ සියල්ල සිහිනෙන් පෙන් නිය නමුත් එම ස්ථානය

යාපනය බල කොට පිහිටි ප්‍රදේශය නමගම කෙසේවත් දැනගන්නට නොලැබී විය. එහි නාමය අනුරාධපුර - මාතලේ - නුවර - කුරුණෑගල ආදී පළාත්වල පැතිර සිද්ධස්ථාන ආරණ්‍ය සේනාසන රාශියකට යමින් ජයගමින ලක්ෂ අනූව සොයා ගන්නට ප්‍රමාද විය. මේ අතර විහාර චාරිකා කාමින් ගම් වැසියන් හඳුන්වන පැරණි සද්ධාජීවන යන [illegible] දෙකක් කරම් විසූහ. එක් උදෑසන [illegible] එම ආරණ්‍යයෙන් ගම්බලා එන්නවා මොහොතේ [illegible] කාවවයකි සොඳුමැති කාලෙනා උපාසක තුමෙකු ඉදිරියට පැමිණ වැඳ එකත් පසකට වී මෙසේ ඇසීය "ස්වාමින් වහන්සේලා දැනගන්නට බැං ආවා, තව කී දවසක් මෙතන වඩිනවාද ස්වාමීනි ස්වාමීන් වහන්සේලා වඩින බව ඔබනා ගෙදර දැනගන්නට කැමතියි ස්වාමීනි"

ස්වාමීන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ. "අපි දෙනම සතියා දෙකක් මෙතන ඉන්නවා, ඉන්පසු වෙන තැනකට වඩිනවා. අපි පමණවිය [illegible] භාවනාව ආනාපාන සතිය - කායගතා සතිය මෛත්‍රී භාවනාදිය වඩනවා" එවිට උපාසක තුමා මෙසේ කීය. "ස්වාමීනි! පූර්වයේ [illegible] වහන්සේ ජීවමාන කාලයේ නම් මමත්ට සුදුසු කමටහන් ලබාගෙන රහත් වෙනවා වඩින්නේ. අද නම් බුදුන් නැත ජීවමානය. ඒ නිසා ඉක්මනින් [illegible] දින 21. ක් ඇතුලත දී

ලේකම්වරයෙක් භාවනා කරද්දී බුදුරජාණන් වහන්සේ තමන් ඉදිරියට වඩිනවා. එවිට සුදුසු භාවනාවක් ලබාගෙන මෙය දියුණු කළහොත් ස්වාමීනි" කියා ආරණ්‍ය දෙසට ගියේය. එතුමා කවුදැයි විමසා, දැනගැනීමට අවකාශ නොවීය.

ස්වාමීන් වහන්සේ දැනට වසන ගමේ විහාරය පාත්‍රය ලබාගෙන ගම්වැසියන්ට එම උපාසක තුමාගේ හැඩිපාට කියා එතුමා කවුදැයි විමසූහ. එවිට කොහෙත් ඒ ගමේවත් අසල් ගමකවත් ඇති හැඩැයි ගම් වැසියෝ පිළිතුරු දුන්හ. එසේ නම් උපාසකතුමා ගේ වෙසින් පැමිණි ඇත්තේ ලෝක දේවතා කෙනෙක් විශ්වාසයට ඇති කර ගත්හ.

ඉන් නොබෝ කලකින් සිහිනෙන් දුටු ආරණ්‍ය සොයාගත හැකි විය. එය හාරමොල පර්වතයේ පිහිටි ගුහාවන්ගෙන් එකක් ද ආරණ්‍යයයි. එහි වැඩ වසනා කාලයේ දී ඉතා සැදැහැති උපදෙස් අනුව ස්වාමීන් වහන්සේත් තවත් සාමණේරෝ දෙනමත් ඉසිපතනයෙ ගත්ව දින 21. තුළදී ලේකම්වරය පුරන්නට පටන් ගත්හ. ස්වාමීන් වහන්සේට නම් දවස් කටයුතු වැඩ කෙරෙන් දින 21. තුළදී නොහැකි වූ නමුත් ඔහුත් රෑට දැවිදි හත් ඇතෙක් එය සම්පූර්ණ කළහ. ඉසිපතනයෙ ගාටලා හැත්තෑවක් දහයක් අනුදහයක් සමග වැඩසිටි විට

බුදුරජාණන් වහන්සේ සජීවී ස්වරූපයෙන්ම වැඩී ඇත.
එහෙත් ඒ අයට උතුරුමය ශ්‍රද්ධාව ඇති, කමටහන්
ගැනීමට ඉවසීමක් වත් වීර්යයක් නැත. ඉන් පසු බුදුරුව නැගිට්ටා.
යමෙක් කොහේ හිරි සමාධි සිහිනම ආරාධනා කරන්නෝ නම් ඉසි
කමටහන ලබාගත හැක.

පූජනීය රුවන්ගිරියේ ලොකු හාමුදුරුවන් වහන්සේ
කිරලව මහගල්ලෙනේදී වැඩ මේ ප්‍රවෘත්තිය මෙසේ ලියාතබනුයේ
කවුරුන් කොහෝ දොනාට මෙයින් ප්‍රයෝජනයක් වනු ඇතියි.

පුහුල්වැල්ලේ ශ්‍රී රෝහණ යෝගාශ්‍රමයේ සිට
1961. ජූලි මාසයේ 27. වෙනිදා පූජනීය ආචාර්ය කඩවැද්දුව
මාහිමියන් වහන්සේගේ කාරුණික ඉල්ලීමය අනුව, අනුරාධපුරය
රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඤාණාරාම මාහිමියන් වහන්සේගේ
ගෞරව දායකත්වයෙන් සිරිමංගල යෝගාශ්‍රමය බලා පිටත් වූයේ
වෙමි. උපසම්පදාවෙන් තෙවැනි වස්සානය දායකත්වයෙනි.

එසේම පසු මැල්ලගලා මාහිමියන් වහන්සේ
සමග වැඩම කොට සිටි මාස කීපයක් ගත කොට
නැවත දායකත්වයෙන්, 1962. මාර්තු 25. දා ගල්දූවට
පැමිණියෙමි. මාර්තු 27 - 30 - අප්‍රේල් 01. දින තුනෙහි
ගල්දූව - කිරලව - බුද්ධයෝගාශ්‍රමයේදී පූජ්‍යපාද ආචාර්ය කඩවැද්දුව
මාහිමියන් වහන්සේගේ ජන්ම දින සමරන පින්කම් පෙළක්
පැවැත්විය. ඒ මා මෙමා ඒ වසරේ ගල්දූවේ නැවතීමට
යෙදිනි. සතරවන වස්සානය ගල්දූව මූලස්ථානයේ

1962. දෙසැම්බර් නැවතත් දනුකන්ද වැඩම කරවන ලදුව, 1963.
අප්‍රේල් මුලටම වැඩ අනතුරුව මැල්ලගල ආවාසානුයෝගීව
ගත කෙළෙම්. 1963. ජූලි මස 07. වෙනිදා කලපුවනිව ගෝනබ-
තපෝවනයේ වසට මාහිමියන් වහන්සේ සමගම වැඩියෙමි. එම වැර
වස්සානය ගෝනබතපෝවනයේය. ප්‍රව්‍රජිත උපදම් කුසල් හද කාර්යවසාන
සමග 1964 ජූලි මස 24. තපෝවනයෙන් පිටත්ව දියතලාවේ
කහගොල්ල ශ්‍රී පුෂ්පාරාම විවේකාශ්‍රමයට පැමිණියෙමි. එවර
වස්සානය ශ්‍රී පුෂ්පාරාම විවේකාශ්‍රමයේය.

1964. දෙසැ: 06. වෙනිදා නැවතත් තපෝවනයට පැමිණ
නැවත සිට 1965. ජූලි මස 12. වෙනිදා කොස්ගල ත්‍රිපිටකධර්මායතනා-
යට වැඩියෙමි. ප්‍රව්‍රජිත ගුරුවරුන් මාහිමියන් වහන්සේට
සහාය වෙමින් නවක සිසු පිරිසට උගන්වමින් සිටියෙමි.
සත්වැනි වස්සානය ත්‍රිපිටක ධර්මායතනයේය.

1965 දෙසැම්බර් 06. වෙනිදා නැවතත් ශ්‍රී පුෂ්පාරාම
විවේකාශ්‍රමයට පැමිණ, අටවැනි වස්සානය එහි ගත කෙළෙම්.
දෙනුවන් තමනට අධ්‍යාපනය දෙමින්.

1967. මාර්තු මස 22. වෙනිදා ශ්‍රී පුෂ්පාරාම විවේකාශ්‍රම-
යෙන් පිටත්ව රඹුක්කන දළුගල විහාරස්ථානයට පැමිණ
ප්‍රව්‍රජිත ආචාර්ය කොඩවුද්දුව මාහිමියන් වහන්සේත් සමග
මාර්තු 25. වෙනිදා ගල්දූව ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම ධර්මායත-
නයට පැමිණ එහි අධ්‍යාපන කටයුතුවල යෙදී සිටියෙමි.
9 - 10. වස්සාන දෙක ගල්දූව මූලස්ථානයේ ය.

1969. ජූලි මස 24. වෙනිදා සිට දෙසැ: තෙක් රුවන්වැලිසෑය
ආරාමයේ පූජ්‍යශ්‍රී පුරවින් භාවනානුයෝගයෙන් ගත කෙළෙමි.
11. වර්ෂාවාසය රුවන්වැලිසෑයේය. නැවත ගල්දූවට පැමිණ
සිට 12. වෙනි වර්ෂාවාසය සඳහා ශ්‍රී ලංකාරාම විවේකාශ්‍ර-
මයට වැඩිකොට සිදුවිය. 1970. දෙසැම්බර් සිට ජනවාරි අග
තෙක් කොළඹ කොත්තුල් රෝහලේ නැවති පූජ්‍ය කතර
ගිරි කුසුමාරාම මහමේඝාරාම වැසිවීමට පෙළඹී උපවූන් සිදුකොට
ගල්දූවට පැමිණියෙමි. එතැන් සිට කිලිබෙලිඹ වර්ෂා
කාල හයක් ගල්දූවේමය. 1977. මැයි මස 17. දා සිට
දෙසැම්බර් 08. දා තෙක් මීරිගම බෞද්ධ ගුරු විද්‍යාලයේ නැවත
ගුරුවරුන්ට භාවනා වැඩසටහන් මෙහෙයවීම කළෙමි. 19 වෙනි
වර්ෂාවාසය මීරිගම බෞද්ධ ගුරු විද්‍යාලයේය.

1978. ජනවාරි සිට අප්‍රේල් දක්වා ගුරුවිද්‍යාලයේ
භාවනා වැඩසටහනට සහභාගීව ගල්දූවට සැපත්වීමි.
1995 තෙක් කිලිබෙලිඹ වර්ෂා කාල 18. ක් ගල්දූවේමය.
1996 - 1997. වර්ෂා දෙක බුරුමරට මෝල්මියෙන් පා-අඕක්
භාවනා මධ්‍යස්ථානයේය. 1998. නැවත ගල්දූවේ ගතකොට
1999 - 2000 - වර්ෂා දෙක තායිවාන ආරණ්‍යයේය.
2001. වර්ෂාවාසය නැවතත් බුරුමරට මෝල්මියෙන් පා-අඕක්
නිත්තලවසීවන ආරණ්‍යයේ ගත කෙළෙමි.

1967. අප්‍රේල් 20. දා සිට ජූනි 25. තෙක්
සිංහල බෞද්ධ පුස්තකාර ගැමිව පිහිටි දරණියගල කොලෙතිර_

යෝගාශ්‍රමයේ ගතකෙළෙමි. මිතිරිගල නිස්සරණ වනය - මිතිරිගල ශ්‍රී ගුණාරාම ධර්මායතනය - නිමලව ආරණ්‍ය සේනාසනය යන ස්ථානයන්හිද මහනුවර දවුලගොල්ල සෝභිතාරාමයේද විශේෂ භාවනා කටයුතු මෙහෙයවමින් එරින් වර නැවත සිටියෙමි. මැල්ලෑල යෝගාශ්‍රම මධ්‍යස්ථානයේද පූජ්‍ය මාතර ශ්‍රී ඤාණාරාම මාහිමියන් සමග භික්ෂුවරුන් නැවති සිටියෙමි. අවුරුදු 1963. අප්‍රේල් මැයි මාසවලදී මහා භාවනා මාසිය දිගටම පුහුණු කෙළෙමි.

භාවනා පන්ති,

ගල්දූව ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානයේ අධ්‍යාපන කටයුතු මෙහෙයවද්දී ශිෂ්‍ය පිරිසට භාවනා පන්ති පැවැත්වීමි. විශුද්ධි මාර්ග අනුසාරයෙනි.

මීරිගම බෞද්ධ ජන විද්‍යාලයේදී කෙටිය ඇතැම් වාර තුනක් හා එක්සත් කාලයක් (1977-78.) බෞද්ධ ගුරුවර ගුරුවරියන්හට සති දෙක ඇතැම් විශේෂ භාවනා වැඩ සටහනක් පැවැත්වීමි. පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මාහිමියන් වහන්සේ ප්‍රධාන, අධ්‍යාපන අමාත්‍යාංශයේ බෞද්ධ උපදේශක මණ්ඩලයේ ආරාධනාවෙනි. සවිස්තරව සතර කමටහන් සහ ආනාපාන සතිය වැඩ සටහනට නියමිත විය.

කොළගල ත්‍රිපිටක ධර්මායතනයේ 1982. සිට පුරා වසර පහරක් මායතනය වරක් ඇතැම්

භාවනා වැඩ සටහනක් පැවැත්වීය. කොළඹ රාජකීය
බෞද්ධ සංගමයේ විශේෂ ආරාධනයෙන් 1984. ජූනි 06.
වැනිදා සිට මාසයට වරක් බැගින් භාවනා වැඩසටහනක් පැවැත්වීය.
සතර කමටහන් - සතිපට්ඨාන 21 - සමථකලාප කමටහන්.
දීර්ඝ විදර්ශනාව (විශුද්ධිමාර්ග ඇසුරෙන්) ආශ්‍රිත විදර්ශනා
පටිපාටිගත වැඩ සටහනක් පුරා වසර 18. ක් කඩනොකර
(2002. වනවිට) පැවැත්වීය. ගාල්ලේ කඩවත්සතරයේ
බහදූරාවත් පර්සි අබේසිංහ මැතිතුමාගේ ආරාධනා-
යෙන් 1987. සිට 1997. තෙක් වසර 10. ක් පමණ
ගාල්ලේ නගර ශාලාවේ භාවනා වැඩසටහන මාසයට
වරක් බැගින් පැවැත්වීය.

## සම්පාදිත ධර්ම ග්‍රන්ථ.

ගෞතම තපෝවනයේදී "අභිවිජ්ජා" නමින්
කුඩා දහම් පොතක් පූජ්‍ය වංගීස හිමිපාණන්ගේ ආරාධනා
යෙන් සම්පාදිත විය. කොග්ගල ත්‍රිපිටක ධර්මායතනයේදී
"ශෝභන ප්‍රාර්ථනාය" නමින් කරණීය මෙත්ත සූත්‍රය ඇසුරෙන්
දහම් පොතක් ද පූජ්‍ය කරුණාරත්න මහත්මයාගේ
ආරාධනයෙන් සැපයිමි.

විශ්‍රාමික අගවිනිසුරු පරින්ද රණසිංහ
මහත්මයාගේ ආරාධනයෙන් "සමථ විදර්ශනා මාර්ගය" ප්‍රථම
බසින් සිංහල බසට පරිවර්තනය කරමින් සැපයිමි.
කොළඹ රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ආරාධනයෙන්

බුදුගුණ භාවනා - දහම් ගුණ භාවනා - සඟ ගුණ භාවනා -
මෛත්‍රී අසුභ මරණසති භාවනා - සතිපට්ඨාන භාවනා -
සමථකලාප කම්මට්ඨාන භාවනා - විදර්ශනා භාවනා -
අභිධර්ම භාවනා 1 - අභිධර්ම භාවනා 2, අභිධර්ම භාවනා 3.
මේ ග්‍රන්ථ වර්ගය සම්පාදනය කෙළෙමි.

විශ්‍රාමික අගවිනිසුරු පරින්ද රණසිංහ මහතාගේම ආරාධනාවෙන් "ආත්මකරණවාද විමසුම" ග්‍රන්ථය ද සැපයිමි. තවත් සිව්වන් දහම් පොත් රැසක් සම්පාදනය කොට ඇත්තෙමි. ඒ සියල්ල විශේෂ ආරාධනා සහිතව සම්පාදනය වූවා සේම කොට්ටේ ධර්මදූත මණ්ඩලයෙන් පරිත්‍යාග ලද්දේ වෙයි.

## දඹදිව වන්දනාව,

1981. පෙබරවාරි 26. බ්‍රහස්පතින්දා, සිට මාර්තු 24. තෙක් කාලය තුළ, සත්ගුරු වන් අල්ලපිටි ධර්මසිංහ මහත්මයාගේ වියදමෙන් පූජ්‍ය ගලමාන්නෝ මාහිමි පූජ්‍ය මාවතගම මාහිමි පූජ්‍ය විනීත හිමි මාත් මුදලිගේ මහතාත් නෙවිල් ජයසේකර මහතාගේ වන්දනා පිරිස සමග පළමුවරට දඹදිව පූජ්‍ය ස්ථාන වැඳ පුදාගත්තෙමි.

1995. පෙබරවාරි 03. සිකුරාදා සිට

පෙබරවාරි 24. තෙක් කාලය තුළ කැලණියේ ප්‍රවීර
මහත්මයාගේ සංවිධානයෙන් සිරිවර්ධන ඩබ්.ඒ.ඩී.මෙන්ඩිස් ප්‍රේමදාස
මැතිතුමන්ගේ ගමන් වියදම් මාත්‍ර, අවම ඝණ චිත්‍ර
අඩි තුනක් හා අවම දිගක දිගින් චිත්‍රයක් ලබාග
දෙවැනි වරට දඹදිව අෂ්ටස්ථාන වැඳ පුදගතිමි.

1995. නොවැ: 10. සිට නොවැ: 22. දක්වා
තෙක් කාලය තුළදී හෝමාගම ඩබ්.ඩී. එස්. පෙරේරා
කළුමහත්මයාගේ ධනව්‍යයෙන් ජෝමාලි සමාගම සමග
අඩි හතර තනක් හා අවම එතෙවන් දිගක දිගින් චිත්‍ර 23.
සමග තෙවැනි වරට දඹදිව පූජනීය ස්ථාන වැඳ පුදගතිමි.

1999. මැයි මස 07. වෙනිදා හෝමාගම සුපුන්
පෙරේරා ජෝමන්ත කුමාර සොහොයුරු දෙදෙනා සමග දඹදිව
සම්බන්ධ ශ්‍රීපාදස්ථානය වැඳ පුදගැනීමට සහ බුද්ධගයාවේ
ඇලවලේ රෝහලේ ප්‍රකාශ ලබමින් සිටින සිරිවර්ධන, ඩබ්.ඒ.ඩී.මෙන්ඩිස්
ප්‍රේමදාස මැතියන්ට සිරිත් දෙසීම සිදුවා. වදාම කෙළෙමි.

2000. පෙබරවාරි 21. වෙනිදා සිට මාර්තු 17.
තෙක් කාලය තුළදී, සිරිවර්ධන ශ්‍රී කරුණාධාර මැතියන්
ප්‍රධාන අවම දිගක දිවිකා චිත්‍රයගේ වියදමින්, සිවුවැනි
වරට දඹදිව පූජනීය ස්ථාන වැඳ පුදගතිමි.

2001. පෙබරවාරි 20. සිට මාර්තු 02. ද
තෙක් දින 10. තුළදී සිරිවර්ධන උපාලි සේනාරත් මහත්මයා-
ගේත් සිරිවර්ධන ඩබ්.පී. ආරියරත්න මහත්මයාගේත් වියදමින්

අපේම දායක දායිකා පිරිස 23. දෙනෙකුත් සමග පස්වැනි
වරට දළදිව පූජනීය යාත්‍රා වැඩසටහනේ. සකරවුන් මිත්‍රා
ගමනේදී (2000- 02. 21) යාපනයේත් යෝගී ආශ්‍රම යතන
කාශ්මීර ගුහා අවරටත් යාම අපේක්ෂක ගමනක් විය.

දළදිව වන්දනා ගමන් වාර පහේදීම ඒ ඒ
පූජනීය ස්ථාන වන්දනා කරවීම, සීලයෙහි පිහිටුවීම,
භාවනා උපදෙස් දීම- ධර්මදේශනා කිරීම, බුද්ධපූජා තැබීම
ආදී ආගමික කටයුතු මගේම ප්‍රධානත්වයෙන් සිදුවිය.
බස්රථවලදී පවා බුද්ධවන්දනා - ධර්මදේශනා පැවැත්විණි.

බුද්ධගයා ශ්‍රීමහා බෝධි ජය භූමියේ දී
තෙපැන්ඩත් කුඩා ගාථා සජ්ඣායනය වාර ගණනේ දී
සිදුකෙළෙමි. පස්වැනි වාරයේදී (2001) කෝරළේ
පිරිස 1500. පමණ වූ භාරයක් ගොඩවිත්තා තුමාගේ
භාවනා පිරිසේ දායක සාමාජිකාව යෙදුණෙමි.
ලංකාවේදී භාවනා පන්ති- ධර්මදේශනා- පිරිත් දේශනාදී
පැවැත්වීමේදී මෙන් සෙයින් ශ්‍රීමහා බෝධි ජයභූමියේ
වජ්‍රාසනය මත තලල තබා මැද- බෝධිය පුදකිරීමකොට
ඒ ඔස්සේ ආවර්ජනා කරමින් ඒ ඒ කටයුත්ත පටන්ගතිමි.
ඉක්බිති විකාට මගේ ලොබෝයක් මෙම ආශ්චර්යක්
උපන්නේ. පවසන් ලෙස විස්තුවමින් වජ්‍රාසනය මත
සර්වඥයන් වහන්සේ බුදු වූ ආකාරයත්
ප්‍රථම බෝධි මනසිකාරයෙන් සිහියට අරමුණු කරමි.

# විදේශ ගමන්.

1991- දෙසැ: 16. සිට 1992. ජනවාරි 25. තෙක් කාලය තුළ ප්‍රචාරය කුසලිද බුදුම ස්වාමීන් වහන්සේගේ ආරාධනාවෙන්, පින්වත් ඩයි. ඩබ්. හේමා ප්‍රේමදාස මැතිණිය-ගේ මගවියදමින්, සහ භික්ෂූ 5. නමක් හා දායක දායිකා 5. දෙනෙක් සමග තායිලන්තයේ සහ බුරුම රටේ වැඳුම ගමනට සහභාගි විනි. තායිලන්තයේ දින 5. ක්. බුරුමයට, රංගූන් අගනුවර පල්ලමාරුකරයේ නැවතී. රංගූන් අගනුවර, පේගු නුවර, මන්ඩලේ නුවර, අමරපුර, සගායින් බුංගා, සාගෝං, පුජ්‍යාවවුන්, මණ්ඩලා නුවර ආදී ප්‍රදේශවල ප්‍රචාරය සිතා රාශියක් වැඳ පුදගතිමු. රංගූන් නුවර සද්ධම්මරංසි යිඩා භාවනා මධ්‍යස්ථානයේ දින 10. භාවනාවට සහභාගි වීමු.

1993. ජූලි 28. සිට අගෝස්තු 12. තෙක් දෙවැනි වරට අපේ ශිෂ්‍ය ඔබේ භික්ෂූ, භාවනා මධ්‍යස්ථානයට ඇතුළු කර්ම හා තායිලන්තය සාරදිමවත් සමග ධුරියෙමි. ගමනට පූජ්‍ය සිතලාගේ වීරිය ආයුෂ්මතුන් වහන්සේත් පූජ්‍ය ගාල්ලේ සංඝ ප්‍රඥා ආයුෂ්මතුන් වහන්සේත් විශ්‍රාමික වෙද වෛද්‍ය-කල්‍යාණ ගුණසේකර මහත්මයාත් සහභාගි කරගත්තේ. වියදම් සියල්ල පින්වත් ඩබ්. ජී. ඩී. ධර්මරත්න මහත්මයාගෙනි. බුරුම රටේදී පින්වත් ඩානා සල්ලි

මහතාගේ පූර්ණ අනුග්‍රහයෙන් ගමේගොඩ ආරාමීය ලේකම්
තුමාගේ කාර්‍යකාරී සහායෙන් විශේෂයෙන් උපින්, සත් නමක්
මහාසී මධ්‍යස්ථානයෙන් 3. නමක් ප්‍රතිසංස්කාරාමයෙන් නමක
දින 9. ක් මහාසී මධ්‍යස්ථානයේ භාවනාවට ද සහභාගීවීම.
1993. දෙසැම්බර් මස 5. නමක් කබායි කාක්ෂිලාවට
ඇතුළත් කරවීමේ කාර්‍යයද සපුරා ලීමට හැකිවිය.
මා සමඟ බුරුම රට ඇවිත් කළ ඉතිරි දෙනම මාස 7-9.
ඇතුළත් භාවනාවට සහභාගි වූහ.

1994. මාර්තු 01. සිට 22. වෙනිදා තෙක්
බැලියපිටියේ ශ්‍රීධර්ම පුවර ධම්මවර ශාන්තරත්න මාහිමියන්ගේ
ආරාධනාවක් හා වියදමින් ඩී. එල්. එස්. ලියනගේ මහත්මයා
සමඟ ශ්‍රීධර්ම නුවරටත් ඡසිති නුවරටත් වන්දනා කොට
සත් කත් පුරා සාරනාත්‍ය [illegible] දෙසනා පාලිත ආගමික
සේවයක් නිමකෙළෙමි.

1995. වර්ෂයේ පෙබරවාරි සහ නොවැම්බර්
මාස දෙකේ දඹදිව වන්දනා ගමන් දෙකට සහභාගී වී
එම වර්ෂයේ දෙසැම්බර් 27. වෙනිදා මා ප්‍රමුඛ 6. නමක්
බුරුම රට බලා පිටත්වූ. අරමුණු දෙකක් තිබිණ කොයි.
එනම් පළමුවැන්න බුරුමයේ කබායි කාක්ෂිලාවේ දෙවැන්න
අධ්‍යාපනය ලැබූ ශාසන භික්ෂූන් වහන්සේලා 4. නමක්
ආපසු ලංකාවට වැඩම කරවීමයි. ඒ පසු නමත්
නුව දෙනමකටත් පූර්ණ දායකත්වය දැරුවේ ඩබ්ලිව්.
ඩබ්. පී. පී. ජයතිලකරත්න මහත්මයාය.

දෙවැනි කාරණය නම්, මාස තුනක් පමණ මහාසී මූලස්ථානයේත් බෝලබියොඩ ආශ්‍රමීය මධ්‍යස්ථානයේත් භාවනාවට සහභාගී වීමයි.

1993. වසරේ මා සමග බුරුම රට වැඩම කළ දෙනම අතුරෙන් පූජ්‍ය ගාල්ලේ සාසනසුමන ස්වාමීන්වහන්සේ බුරුම රටේ භාවනා මධ්‍යස්ථාන ආරණ්‍ය සේනාසන ආදිය ගැන සොයා බලා ලංකාවට පැමිණි පසු, බෝලබියොඩ ආශ්‍රමයේ භාවනා මධ්‍යස්ථානය ගැන කළ කතිකාවල අනුව ඒ ස්ථානයට යම් දවසක යාමට බලවත් කුතූහලයක් මා තුළ පහළවිය.

ගමන් මග බොහෝ සේ දුෂ්කර වූ ද ප්‍රදේශය මැලේරියා රෝග උත්සන්න වූ ද, රැංගුන් නුවරින් සැතපුම් 200. කටත් අධික දුරකින් වූ ද එම භාවනා මධ්‍යස්ථානයේ විශේෂත්වයට අනුවම සෑම විදර්ශනා භාවනා ප්‍රගුණ කරන බවත්, රූපාරූප අෂ්ට සමාපත්ති ලාභී අභිඥා ලාභී ලෙස පැවිදි බොහෝ දෙනෙක් සිටින බවත්, කම්මට්ඨානාචාර්යයන් වහන්සේ අභිඥාවන් විහාරගර්භ බවත්, කැප පසු සිවුරු කැප පාත්‍ර පරිහරණය, මුදල් පරිහරණය නැති අපේ ප්‍රතිපත්තියටම ගැලපෙන තැනක් බවත් දැනගැනීම කළ නිසා, ඒ ස්ථානය ගැන කලින් සිත එල්ලී පැවතිණි. බුරුම රටට ඇතුළු වූ පසු අපේ සිතූ පරිදි යාමට අපි 10. නමක්ම විශේෂ බලපත්‍රයක්ම

රෙගුන් අඟහරුවාදින් උදේ. 6.00 ට වන්ට 1996. ජනවාරි 02. බ්‍රහස්පතින්දා
සත්ධර්මයේ බෝලම්බයෙන් බැස ගංගාවෙන් නැව නැග
බෙසය එතෙර කරවා එා අවුත් නාවන මධ්‍යස්ථානයට
පැමිණ පූජ්‍ය එා අවුත් සෙයාරෝ නායකයන් වහන්සේ
දැක වැඳ පුදු ගත්තෙමු. අපට ප්‍රථමයෙන් 1995. මැයි මාසය
තුලදී අපේම උපදෙස් මත පිළිසිඳීමට කැඳවා කොට ඇති
පූජ්‍ය උඩුගම්පොල ධම්මරංසි ආයුෂ්මතාන් වහන්සේත්
දෙවනුව කැඳවා කොට ඇති පූජ්‍ය අතරගල්ලේ සංඝබෝධ
ආයුෂ්මතුන් වහන්සේත් එහිදී හමුවීම පහසු වීමරෝගයට
මහත් උපකාරයක් විය. ලංකාවේ සිට මී පෙතිනයට
පැමිණි විදේශික සාමනේර වහන්සේලා කිහිපනමක්ද හමුවූහ.

පසුදින උදේ භාවනාචාර්යයන්
වහන්සේ වෙත අප 10. නමම පිළිම පූජා සත්කාර
කොට ආනාපාන සති භාවනාව ලබාගත්තෙමු. අලුයම
4.00. සිට 5.30, උදෑසන 7.00. සිට 8.30, දවල් 12.00. සිට
1.30. හැවස 2.15. සිට 4.00. සවස 5.15. සිට 7.00.
තෙක් පර්යංක භාවනා කාලය වශයෙන් නියමිතය.
පන්සහලුව - උදේ දවල් දානය - සක්මන් ආදිය සඳහා
ඉතිරි කාලයත් රාත්‍රී 7.00. සිට 10.00 දක්වාත් භාවනාව
ගතකිරීම නියමිතය.

ජනවාරි 04. බ්‍රහස්පතින්දා දුරුතු පෝය දවස විය.
එදින උදේ දානෙන් පසු කෙල් ආහාර ගිලන්පස අසන්සිප විය.

වෛදූර්යාකාර ලෝ ප්‍රාකාරය සුවයන් ලෝ කිරියද් නැවත වඩාත්
දැනෙන් ශෝභාන විය. සම්බුදුන් පිළිවෙතට ඉතුරු වෛදූර්ය-
යේ උපදෙස් අනුව කෙල් නැති වලාව ආකාර, ඉදිරිපටම
ලබෙන සේ පුහුණුව ආචාර්යන් වහන්සේ නයට කළහ.
ශ්‍රාවක සත් තුනකින් වඩනා සුවය ලැබ් කාටවත් වැඩිවට
නැතිවිය. සතුට සති දෙක ඉතාත් අතරේ ආනාපාන සතියෙන්
රූපධ්‍යාන සතරේ, ද්වත්තිංසාකාරයෙන් ප්‍රතිබද්ධයාන 32. ක්
අපරිමිත විදුත කසිණයෙන් රූප ධ්‍යාන සතරේ, මෛත්‍රී ධ්‍යාන
528. ක් සම්පූර්ණ කෙළෙව්.

ලංකාවෝ අපේ සඟ චරියන් ආ සමග ප්‍රමුඛ
මාතෘකාව පැවිදි ව සිදුවූ තිස්සත් මාර්ග මාසයේදීම ලංකාවට
මා පැමිණීමට නියමිත බැවිනුත් පෙබරවාරි මස 11. වෙනිදා
ට, අපුත් සොයාගෙන මාපටියන් වහන්සේගෙන් සමුගෙන
රංගූන් බලා පිටත් වීමු. එතෙක් කාලයක් සඳහා
ගතේ පුවත් ජනයන්, සොයාගෙන සවාවන් වහන්සේ
විසින් ඉතාමත් කාරුණිකවත් වදාළ "නැවතත් එන්න"
යන වචනයන් නිසා, මී වෙසියේට නැවත එන්නා
ලෙස අදිටන් කරගතිමි.

පෙබරවාරි 11. වෙනිදාව ලංකාවෝ ප්‍රමුඛ
පැමිණි අපේ සඟ චරිය සමග ප්‍රාර්ථනය සිතින වැඩපිළි
වහන්සේ මූලසිත්නයේත් සහ දෙකක් වඩන ගතකොට
මාර්තු මස 08. වෙනිදා නැවත වලා, ආවෙමි.

වාර්ෂික උපසම්පදා විනය කර්මය ආදී ශාසනික කටයුතු
නිමවා පූජනීය ආචාර්ය මාහිමියන් වහන්සේගෙන් අවසරයෙන්
ආශිර්වාදයෙන් ලබා, පූජ්‍ය හිද්දේගම සිරිවිමල ආයුෂ්මතුන්
වහන්සේත් සමග 1996. ජූලි මස 27 වෙනිදා ලංකාවෙන්
පිටත්ව දෙහුන් පැරටක් එා අවුත් කොවින මධ්‍යස්ථානයට
වැඩියෙමි. ඇල්තොන්බ නගරය ඉතා පහසු කුටියක් ද
වාසයට වෙන්ව තිබිණි. පූජ්‍ය සිරිවිමල ආයුෂ්මතුන්
වහන්සේ බුරුම කැප්කරු සාන්දවේ මහතා සමග මගේ
උපස්ථාන කටයුතු සැලසූහ. දෙසැම්බර් 20. දී පෙස්ම
කැසම අසනීපයක් නැතිව සාර්ථකව කඩාරණ් වැඩිමි.

ආනන්දනා සහියෝග ජටාගොන, දුම්පහංසාකාර
අවිසීක සිදුක. බුකාවිහාර සතර, බුද්ධානුස්සති
අවිකසූත්‍රය දශ අකුසල, මරණසති, දශකාණ්ඩ, අශුභ ධ්‍යාන
ධාතු අස්සිය සතිපට්ඨාන, යන සිංහලුම ඇති ඉතා කවීසිටා
සපුරා ධාතුමාන සිතෙරටේ සිට සංකාරපෙනා කුසලය
කෙත් විද්‍යනා මාර්ගය සාර්ථකව සම්පූර්ණ කෙළෙමි.

පූජනීය පැඅවුත් සෙයාකෝ මාහිමියන් වහන්සේ
ප්‍රධාන සඟ පිරිය 5. නමක් ද පල්ලිමැස්වරු 2. නමක් ද
ප්‍රධාන දායකවරු 2. නමක් ද කැප්කරු ද යන 10. දෙනා
ශ්‍රී ලංකාවට පැමිණීම පිණිස කටයුතු සංවිධාන කෙළෙව්.
ශ්‍රී ලංකාවේ ජනතාව දායක දුයකාවන්ගේ දායකත්වයෙන්.
1997. ජනවාරි 27. සිට මාර්තු 15. තෙක් ඔවුන් පිරිසට

සියලු පහසු විහරණ ද මඟහැර ගොස්, බෞද්ධ ප්‍රජාවගේ
අවශ්‍යතා ඉතා උපරිම ලෙසම සලකමින්, සම පැමිණීම
සමන්තෙන් ගල්දූවේ මිතිරිගල ධම්මායතනයේ හා ශ්‍රී
පායමාලාව අනුව භාවනා වැඩ පැවැත්වීමයි. ඒ සඳහා
පූජ්‍ය අගොස්සළු ශාසනයේ වහන්සේ මිතිරිගල ධම්මායතනයේ
නවතින්න ගත්තේ ලබමින් සාර්ථක විය.

1997. ජූලි මාසයේ 10. වෙනිදා කෙටුව
වරෙන් පූජ්‍ය සිරිවිමල ආගන්තුක වහන්සේ
සමග ලඟට ගොස් හැම මහසංඝයාට වැඩියෙමි.
ඉතින් ශ්‍රී වසියේ මෙන්ම සියලු පහසුකම් සැලසීය.
ඒ වාරයේදී නැවතත් අභ්‍යාස සමාපත්ති කෙනී පූර්වක
කර්මස්ථාන සියල්ලම සංස්කාරෝපේක්ෂා ඥාණය තෙක්
විදර්ශනා ඥාන පරිපූර්ණවත් සපුරා, විශුද්ධිමාර්ගයේ සඳහන්
සූක්ෂ්මකාර විදර්ශනා පරිපූර්ණය පුරුදු කෙළෙමි.

මේ වාර තුනේ දීම පූජ්‍ය පාඩි [illegible]
මාතරයන් වහන්සේ ඉමහත් කාරුණිකව මා සපිරි
කැපියට ඉඩම් කරමින් කමටහන් දීම පිළිබඳයේ අවකාශ
ගොනුව ආශ්චර්යවත් අනුග්‍රහයකි. සංඝෝත්සව සඳ
දිනයන්හි සුමෙන් උදෑසන බොහෝ සංඝයා මා සමඟ
ඇවිදිමි විදේශික සහ සිංහල පැවිදි මාස්ටර්ගේ සුවේ
පාලි උච්චාරණ ට්‍රිපිටක අධ්‍යයන කරමින් ආරම්භනා කළ
බැව්ය. උපාසිකාවන් විනය කරීමලදී පළමු කමටහන

ඇවට පැවරුනා. ඔක්තෝබර් 25. වෙනිදා ආපසු
ලංකාවට පැමිණියෙමි.

1999. නොවැ: 19. සිට දෙසැ: 14- තෙක්, පූජ්‍ය
මැලේසියාවේ වජිරාරාම ස්වාමින් වහන්සේගේ ආරාධනයෙන්
පූජ්‍ය කැලුංගමුවේ අරියනන්ද ආයුෂ්මතුන් වහන්සේත් පූජ්‍ය
කන්දෙනුවර විමලධම්ම ආයුෂ්මතුන් වහන්සේත් සමග මැලේසි-
යාවට ගියෙමි. ජොහෝර් දිස්ත්‍රික්කයේ බටුපහට්
නගර පෙදෙසේ සද්ධර්මකරන භාවනා මධ්‍යස්ථානයේ
සමාධිමත් විනය කර්ම- කඨින පූජාව -සහ උපසම්පදා
විනය කර්මයද සිදුවිය. ඒ මලක්කා සදුරා, පිනාං නුවර
ඉපෝ නුවර, සබා දිස්ත්‍රික්කයේ කොටකිනබාලු- සඳකාන්-
ලහඩ්තු, තවාව්- ක්වාලාලම්පූර් ආදී නගරයන්හි
විශේෂ බෝධි පූජා හා භාවනා, සංඝෝපස්ථාන දම්දෙසුම්
දෙසැ: 14. නැවත ලංකාවට පැමිණියෙමි

මැලේසියාවේ පූජ්‍ය වජිරාරාම ආයුෂ්මතුන්
වහන්සේ බුරුමයට යාමේ ව්‍යාපෘතියේ නැවත වර
නැවත ශ්‍රී ලංකාවට පැමිණ වීරකැටිය ශ්‍රී ඥානාරාම
ධර්මායතනයෙහි නාවුලයා ආරාධනයෙන් කමටහන්
වඩා, දිව්‍යත්ව පත්ව, එහි රටේ භාවනා මධ්‍යස්-
ථානය හොඳ තැනට පවත්වාගෙන යයි, එහි යතුර
වරක් ලංකාවේ ඇති සහ චාරිකාව නැවත ඇරඹ
වැඩිම කරමින් කඨින පින්කම සහ බෝධිපූජා
පවත්වා ගත්තේ.

2000 - මැයි මාස 15. සිට 27. තෙක් දින දොළහ, මැදපෙරදිග ඊශ්‍රායල් රටේ සහ ජෝර්දාන් රටේ දම් දෙසුමට පූජ්‍ය පාලම්පිටියල ඤාණානන්ද ආයුෂ්මතුන් වහන්සේත් සමඟ ගියෙමි. ඊශ්‍රායල් රටේ ශ්‍රී ලංකා විද්‍යාලයේ විදුහල්පති සෝමවතී කොඩිකාර මහත්මයාගේ ආරාධනාවෙන්. එරට බෞද්ධ සංගමයේ දායකත්වයෙන්.

ශ්‍රී ගම්බෙද්දර කමල් වර්ණචිත්‍රා මහතාගේ විශේෂ ආරාධනයෙන් දායකත්වයෙන් ජෝර්දාන් රටේ දින දෙකකද් ධර්මදේශනා ලෙසක් පවත්වා 27 දා ලංකාවට පැමිණියෙමි.

2000 - නොවැ: 09. දා සිට 27. තෙක්, පූජ්‍ය පැයි සෙයාකෝ දායක සමිතියේ ආරාධනාව පුරස්කාර ලබමින් චුලා සිටින සිංගප්පූරුවට, පූජ්‍ය ඇරියානන්ද ආයුෂ්මතුන් වහන්සේ සමඟ, යෝන් සී මහතාගේ දායකත්වයෙන් පැමිණියෙමි.

දින 12. ක් මහිමය දෙසුමෙන් පසු පූජ්‍ය පාලි සමාගම් වහන්සේට පූජා කිරීම අපට හැකි වූයේ ලැබූ භාග්‍යයකි. ඒ ගමන්හි මැලේසියාවේ පිහිටි සාද්දිකාරාම ආරාමයටත්, මලක්කා නගරයටත්, පිනාං දූපත් ආශ්‍රිත විහාරස්ථානවලටත් ධර්ම චාරිකාව කොට, එහි ධර්ම දේශනා පවත්වා නොවැ: 27. වෙනිදා නැවත ලංකාවට පැමිණියෙමි.

2001. ජූලි මස 15. දා නැවතත් බුරුමරට පා ඕක් භාවනා මධ්‍යස්ථානයට පැමිණියෙමි. සිංගප්පූරුවේදී පූජ්‍ය පා ඕක් සයාඩෝ මාහිමියන් වහන්සේගේ කාරුණික ආරාධනය ලැබුණු නිසාත් තමා තා ඩිනාන් ඩව ලිපියකින් විශේෂ ආරාධනයක් එවා තිබුණු නිසාත් මට විවේකය අවශ්‍ය වී තිබුණු නිසාත්, ප්‍රථම ගමනේම සිද්ධිවල ආශ්චර්යවත් වෙනස්කමක් සහිත වූයෙමි. වර්ෂාවේ සිටලයිකන්ද ආරණ්‍යයේ සීලව්වල ධම්මරියන් වහන්සේත් මට නොයෙකුත් ප්‍රශ්න විසඳාගෙන, විශේෂ ප්‍රතිපත්ති කටයුතුවලට ඔය කල්‍යාණමිත්‍රයෝ අපට විශාල ශක්ති.

පා ඕක් භාවනා මධ්‍යස්ථානයේ විශාලත්වය හා ආරණ්‍යයේ අභ්‍යන්තර ආරාමය කඳුකර පරිසරය ඉතා සුන්දර. ලංකාවෙන් පිටත්වෙද්දී පවත් මනාවාදයක් පවත්වද්දී, පෙරදී අර්පිත කාර්යක්ෂම පිළිවෙළින් අපේ ධර්මසත්කාර සංචාරප්‍රවේශයට අනුව කෙටි විස්තර ගත යුතු මුද්‍රණ ලේඛන මුද්‍රණ පත්‍රිකා ගත්තෙමි.

බුද්ධශාසන නිත්‍යපරිපාලන සභාවෙන් සිටින අතර අපේ ලංකාවට පැමිණීමට කරුණු යෙදිණි. පූජ්‍ය පා ඕක් සයාඩෝ මාහිමියන් වහන්සේ අප කෙරෙහි විශේෂ අනුග්‍රහ දැක්වූහ. උපෝසථ වාර සියල්ලටම පාන්දර උදෑසනම මාසයට පැමිණියෙමි. පාරමිතා විනයකර්ම යන් කොටස් ය. පැවිදි උපසම්පදා විනය කර්මයන්ට මුල්තැන අපටම පැවරිණ. දැනුත් සිය නමක් පමණ භික්ෂූන්

පූජ්‍යය නාහිමි සමාගින් වහන්සේත්, පූජ්‍ය කුසලධම්ම - බැඳිම
ආයුෂ්මතුන් වහන්සේ දැනමත් අපගේ දළදාකම් උපස්ථායකවත්
ලබාගත්හ. මා මෙම විසින් ආචාර්ය තුමිය බෙදුම සංග්‍රහයද
කරවනු පිණිස දුන්වීම් ප්‍රවාද පෝෂණය ආරක්ෂාව සැලසූහ.
ආරක්ෂා රථයෝ බලා වාහන ගමන කාලය එදු පිණිස
මෝටර් රථයෙන් ආරක්ෂා සහ රථයෝ ආරක්ෂා ගුවන් යානයෙන්
යාමට ද සලසා දුන්හ. නැවතත් නාහිමි සීතා මධ්‍යස්ථා-
නයට විසින් මෙලොව අරඹනා කළහ.

## විශේෂ පූජනය කාලී,

අතිපූජනීය රාජකීය පණ්ඩිත කොටුවැද්දුවේ ශ්‍රී
පිතාමංගලාරාමාධිපති අපමණාචාර්ය නාහිමියන් වහන්සේගේ ජන්ම දින
සමරණයෙන් සෑම වර්ෂයකම අප්‍රේල් 01. වෙනි දින පැවැත්වෙන
විශේෂ පින්කම 1960. වර්ෂයේ සිට මෙතෙක් නොකඩවා පවත්නා-
ව ආරම්භ කෙළේය. මුලදී පුහුල්වැල්ල - කන්දෙහෙර - කමලෙව
හා දළදා මැදුරේ පින්කම පැවැත්ත අතර 1976. සිට දිගටම
ගල්දූව ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානයේ පවත්වනු ලැබේ.

මා ඇවිදිනූ දින සමරණෝත් සෑම වර්ෂයකදීම
මාර්තු 27. වෙනිදා විශේෂ පූජෝත්සවය පැවැත්වේ. 1962 පෙර
මෙතෙක් නැවත සිරිය සමාගමෙන්, 1962. සිට දිගටම මෙතෙක්
ගල්දූව ගුණවර්ධන යෝගාශ්‍රමයේ පවත්වනු ලැබේ. 1975 වසරෙන් පසු
සෑම වසරකම මාර්තු 26. සිට අප්‍රේල් 01. තෙක් දින හතක විශාල

ලොව එම පින්කම් ඇතුළු නිකාබද්ධව ලියුනෙමි. පැවි විධියක මා වෙත ලැබුන පරිෂ්කාර මාර්තු 27 වෙනිදා සඟ සතු කොට පූජා කොට සව්වන් දක්නතුරු උතුම් ලොව බුදුබව පුරන්නට ලැබේවායි ප්‍රාර්ථනා කෙළෙමි.

අතුගල පූජනීය රජකීය පණ්ඩිත මාතර සිරි ඥාණාරාම මාහිමියන් වහන්සේගේ හැටවෙනි වයස සපිරීම නිමිත්තෙන් 1961. දෙසැම්බර් මස දී ගල්දූව. දානවුකාන්ද, මල්ලගල සිරා නගර විදුහලේ විශේෂ සාංඝික පූජා, පින්කමට සහභාගී වීමි.

යෝගාශ්‍රම සංස්ථාව දස වස පූර්ණය නිමිත්තෙන් කෙළෙලවදී 1961. ජූලි මස 16.17.18. දිනයන්හි සිදුවූ සාරාණීය පින්කමට සහභාගී වීමි.

1964. බෙයත් පොහොසොතිදා ගෝනාව තපෝවනයේදී කොස්ල්ලෑ කඳුර පූජා පින්කමේදී පැය 3. ක් පමණ ගාථා සජ්ඣායනා කෙළෙමි. 1966. වර්ෂයේ පුස්සල්ලවල්ලේ සූවිස්ස විවරණ මහා පූජාවේදී එම ගාථා සජ්ඣායනා කෙළෙමි. 1967. නාවිගඩේ තුරුකෙව විහාරමහුර පූජාවට සහභාගී වීමි. 1972. ජූනි 16.17.18. අනුරාධපුර පූජනීය සිරිනා සහතේ සදුකරනා ලද, ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව විසිවෙනි වර්ෂ සමරන්නෙන් සාරාණීය පින්කමට විශේෂයෙන් සංවිධාන කටයුතු සඳහා සහභාගී වීමි. එම 17. වෙනිදා මහා සෑ මලුවේ

කොළඹින් සුදු පූජා මන්දිරාව පැමිණිවිය. මහා වංශික පුණ්‍ය චාරිකා, ඉතිහාස පොතද මා විසින් සම්පාදිත විය.

1976. ජූනි 18. වෙනිදා සිට ජපී වෛශර ත්‍රිපිට-කෝෂ් ශ්‍රී කල්‍යාණ යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රථම සභානායක දින 7. ක් ප්‍රතිපත්ති පූජා, සුව සමාගම් සංවිධාන කොට ක්‍රියාත්මක කෙළෙමි.

1978. ශ්‍රී කල්‍යාණ යෝගාශ්‍රමීය උපසම්පදා වර්ෂ 25. සපිරීම නිමිත්තෙන් ගල්දූවේ දින තුනක ජූලි 16-17.18. මහා සංඝ සම්මේලනයක් සහිත පූජෝත්සවයක් සංවිධානය කෙළෙමි. යෝගාශ්‍රමීය ඉතිහාස ග්‍රන්ථයක්ද සම්පාදනය කෙළෙමි. ථෙර සමිඳුන් වහන්සේ සමිඳුන්, නිස්සයමුත්තක සමිඳුන් ආදී සමිඳුන්ට සම්මාන පත්‍ර සහ යෝගාශ්‍රමීය කාර්තිකාවත මුද්‍රණයට යොදා දුන්නෙ. සාමණේර බණදහම් පොත සහිත යෝගාශ්‍රමීය බුද්ධවන්දනා පොත සංස්කරණය කෙළෙමි.

1961. සිට ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමීය ගරු උපසම්පදා විනයකර්ම සියල්ලට සහභාගී වීමි. 1968. වර්ෂයේ සිට සන්නිපාතලේඛක ධුරය පැවරීම නිසා එතැන් පටන් පැවති උපසම්පදා ප්‍රාර්ථනා සංවිධාන කිරීමත් මා අතින්ම සිදුවිය.

1977. මිරිස්වත බෝදිව උඩ ශිෂ්‍යාලයේ භාවනා පාඨ මාලාව, ඒ භාවනාලාව භාවනා නාම්

පොතක් බවට පත් කෙරිණි. දැනට කොහෝ වාර ගණනාවක්ම නැවත නැවත එය මුද්‍රණයෝත් නිකුත් වී ඇත.

1963. වස්සාන කාලයේ තපෝවනයේ ඉරිදා දිනට පැයක් බැගින්, පූජ්‍ය මහෝපාධ්‍යාය බාහිමියන් වහන්සේ විසින් පවත්වා අඩාල වූ තොපැත්තෑ කුරු දේශනාව නිරෝධ සමාපත්ති (34) කුසලයේ ඵල නමාව දක්වා සාර්ථකව දේශනා කෙළෙමි. (ඉරුදිනක් පාසා)

තොපැත්තෑ කුරු ගාල එඬුගාව, ගල්දූව, වැල්ලවත්ත ධර්මෝදය පිරිවෙන, තපෝවනය - ශ්‍රී පාරාමය රුවන්වැලි මහා සෑ මලුවේ දෙවරක්ද කැළණි රජමහා විහාරය, දඹදිව බුදුගයා බෝමළුවේදී දෙවරක්ද පැවැත්වීමි.

1970 – 1974 – 1991 – 1992. වර්ෂවලදී දැඩි සේ ගිලන්වූ පූජ්‍ය මහෝපාධ්‍යාය බාහිමියන් වහන්සේට ආරෝග්‍ය ශාලාවන්හි ගිලන් උවටැන් කෙළෙමි.

1989 – 1998 වර්ෂ වලදී දැඩි සේ ගිලන්වූ පූජ්‍ය ආචාර්ය කඩවැද්දුව බාහිමියන් වහන්සේට ආරෝග්‍ය ශාලාවන්හිදී ගිලන් උපස්ථාන කෙළෙමි.

1987 – 1991 – වර්ෂවලදී දැඩිසේ ගිලන්වූ මගේ පියාණන් වහන්සේට බෞද්ධ ප්‍රතිකාරක පැලවීම, මහා සාගර රත්නාය 35 වරක් පමණ ගෙදරට වැඩම කරවා මහා පිරිත් දෙකක්

සිදු කොට පූර්ණ සුවය ලබාදුන්නේය. 1992. සැප්: 25. වෙනිදා කාය දෙකකට විශේෂ වෛද්‍ය ඇවිදි කර්ම ගල්දූවේ මා සිටි ධම්ම කුටියේම නවතා උපස්ථාන කෙළේය. 1993 දෙසැම්බර් එතුමාගේ අපවත්වීමට ආසන්න දිනවලදී සියලු උපස්ථාන දින කීපයක් සිදු කෙළේය.

1984. ජූනි 06. වෙනිදා සිට මාසිකව වසර 18. කාලය තුළ කොළඹ මහජන පුස්තකාල ශාලාවේ (පුස්තකාලයේ) රජය සේවා බෞද්ධ සංගමයේ අනුග්‍රහයෙන් සමවතලම්හි කමිටුව සතිත විදර්ශනා භාවනාවක් පුහුණු කරවීමේ මහා ධර්මදානමය පුණ්‍ය කර්මය සිදු කෙළේය.

1993. පෙබරවාරි 28. රුවන්වැලි මහාසෑය අසලයේ, ජේ.ඩී. ධම්මපාලගේ මහතාගේ සංවිධානයෙන් අත්මත් බුදලාල් මහතා ආදී කොගේ දැනගේ දායකත්වයෙන් සිදුවූ අටදාන මහා පුණ්‍ය කර්මයේ පරිත්‍යාග දේශනා සහිත වන්දනාව මෙහෙය වූයෙමි, කුරුණෑගල, කාරියපොල - සමාවර්ගය අනාථ මීගලෑව - බද්දාවල රාගම පුනරුත්ථාපන රෝහල, ම-හනුවර වලිමඩ වේ ආරෝග්‍ය ශාලාවලද කොළඹ ආරෝග්‍ය ශාලාවේද සිදු වූ විශේෂ පරිත්‍යාග පුණ්‍ය කර්මයන්හිදී ධර්මදේශනා පැවැත්වීමි. කුරුණෑගල මහරෝහල ශාලාවේ දිවි සාත්තු

වටිනාකම (රු: 800000/-) අට ලක්ෂයක් වටිනා කෘත්‍රිම ශ්වසන යන්ත්‍රයක් (වෙන්ටිලේටරයක්) පරිත්‍යාග කරවූයෙමි. (1994 - 10. 04) දිනදීය.

කැළණිගල ශ්‍රාවස්ති හාමිනේගේ ආරාධනයෙන් කාවින්ද්‍රිය පාලි භාවනා මධ්‍යස්ථානය නවතන් පූජා- සංවිධාන කොට නාවගමුවේ ලොකු ස්වාමීන් වහන්සේ- ගේ ප්‍රධානත්වයෙන් මාසික භාවනා වැඩසටහන ක්‍රියාත්මක වන ලෙස සංවිධාන කෙළෙමි. 1975 වර්ෂයේ සිට මෙතෙක් ඒ වැඩ සටහන දියුණු වෙමින් පවතී.

නාමලුව ආරණ්‍යයේ අඩුපාඩුවක් වූ ගිලන්හල කොළඹ අලුත්කඩේ මැණිකියන්ගේ දායකත්වයෙන් කරවා 1986. වර්ෂයේ පූජා කරවූයෙමි. එසේම සක්මන් මළුව කරවා 1991. වර්ෂයේ පූජා කරවූයෙමි.

වසර 40. ක් තිස්සේ ජලයෙන් දුෂ්කරතා පැවති නාමලුව අරණ්‍යයට, රත්මලානේ ගුණසිංහ මහත්මයාගේ දායකත්වයෙන්, කළුකර පූජාලේ සේනාවිරත්න මහත්මයාගේ ක්‍රියාකාරීත්වයෙන් ජලාශය - ජලනල යොදවා ජලය ලබාදීමේ මහා පින්කම සිදු කෙළෙමි.

එන්. පී. ඩී. ජයවර්ධන මහත්මයාගේ දායකත්වයෙන් නාමලුව කඳු ගැටියේ ගල්ලෙන් 7. ක් සාදවා භාවනානුයෝගීන් උදෙසා පූජා කරවූයෙමි.

1965. වර්ෂයේදී තමලව පුරණ කුඹුරිය වෙනුවෙන් ගොඩ කරවා ඇවෑසි කෙතරයේ සැතැප්ම 4 ප්‍රමාණයට අඩක කුඹුරක් වශයෙන් සම්මත කරවීම 1992-1993. වසරවලදී, ආර්. ප්‍රේමදාස ජනාධිපති තුමාගේ විශේෂ අනුග්‍රහය ඇතිව ගාමිණී අතුකෝරළ ඇමැති තුමාගේ සහ එම ප්‍රදේශ ජිවිල පෙරේරා මහතාගේ පූර්ණ අනුග්‍රහයෙන් ඇදු කෙරෙවිණි.

පුහුල්වැල්ල ශ්‍රී රෝහණ යෝගාශ්‍රම මධ්‍යස්ථානයේ විහාර මන්දිරය කොන්ක්‍රීට් ඇතුළු ගමන් මග, හෝමාගම එම්. පී. එච්. පෙරේරා කාන්තාවගේ දායකත්වයෙන් වේදිකා ඇතුළුව සකස් කරවා පූජා කරන ලදී 1992. 08. 02. දින.

එමෙම දෙමහල් ආවාස ශාලාව, කොළඹ එස්. එම්. හර්බා ප්‍රේමදාස මැතිණියන්ගේ සහ උපාලි සොමරත්න ප්‍රේමදාස මහතුන්ගේ මුදලින් රු: ලක්ෂ 7.0 ක් වියදමකින් කරවා 1995. ජූලි මස දී සඟසතු කොට පූජා කරවූවෙමි.

නාඋයන ආරණ්‍යයේ දාන වළඳන ශාලාව 1997. වර්ෂයේදී, දෙමහල් භාවනා ශාලාව 1999. මැයි 27. දිනයේදී, බොරැල්ල පරිත්‍යාගශීලීන්ගේ දායකත්වයෙන් කරවා පූජා කරවූවෙමි.

බුත්තල බුදුගල්ලෙන ආරණ්‍යවාසී පූජ්‍ය කොටිකාපොල චාමින්ද ආයුෂ්මතුන් වහන්සේට

වෛද්‍ය නියමයෙන් අත්‍යාවශ්‍යවූ මුදලින් - රු: අසූදහසක වටිනා උකුල් ඇටයක්, එච්. පී. ඒ. පත්මසිරිරත්න මහත්මයා ප්‍රධාන පරිත්‍යාගශීලීන් ලවා පූජා කරවූයෙමි.

දියතලාවේ කහගොල්ල ශ්‍රී සුනාරාම විහාරාශ්‍රමය - වීරගෙල ශ්‍රී සුනාරාම ත්‍රිපිටක ධර්මායතනය කොණ්ගල ත්‍රිපිටක ධර්මායතනය - බිහාන රජවාංගල ආරණ්‍යය, දෙල්ලව අඹරගල ආරණ්‍යය යන ස්ථානවල බෝධිරෝපණය සිදුකෙළෙමි. නාඋයන ආරණ්‍යයට එවිබොන හැරා බෝධිරෝපණයද කරවූයෙමි.

1982. ජූලි මස 7. වෙනිදා, දඹුලු ගලෙව කරඳුගස්හන්දියේ පෞද්ගලික රෝහලේ ප්‍රතිකාර ලබමින් තිබියදී රෝගියෙකුගේ ජීවිතය බේරාගැනීමට මගේ ලේ දන්දී සුවපත් කරවූයෙමි. නැවත වරක් ගල්ලේනේදී ජීවිතය අනතුරට පත්ව සිටිද්දී ලේ ඇණෙවීමට ලේ දන්දුන්නෙමි.

සිරදු බුන ගුණ,

සාමණේර කාලයේදී, කලින් කල විශේෂ සම්භාණ්ඩාගාරය. ජනතා පිණ්ඩපාතගාරය, පොත්පත් ගබඩාගාරය ද පුරා ඇත්තෙමි. උපසම්පදාවෙන් පසු රුක්මූලිකාගාරය - ආලෝකාගාරය -

සෝසානිකාංගය හැර ඉතිරි 10. පුරා ඇත්තෙමි. කලින් කල ධුතාංග පුරා ඇත අතර 1969. සිට දිගටම පංසුකූලිකාංගය - යථාසන්ථතිකාංගය ද පුරා ඇත්තෙමි.

## වැඩූ කමටහන්,

පැවිදි වීමට පෙර පාසල් අවදියේදී බුදුගුණ භාවනාව හා මෛත්‍රී භාවනාව වඩා ඇත්තෙමි. සන්තුපලාස සමයේදී ආනාපාන සතිය ද මහාසී භාවනා ක්‍රමයද වැඩුවෙමි. පැවිදිව සාමණේර සමයේ දී බුදුගුණ දහම්ගුණ සංඝගුණ - මෛත්‍රී - අසුභ සති - මරණසති ආනාපාන සති - මහාසී සතිපට්ඨානාද වැඩුවෙමි. චතුර්ධාතුමනසිකාරය දිගටම ආරම්භයක් කෙළෙමි.

උපසම්පදා නවක සමයේදී මහාසී සතිපට්ඨාන භාවනාව විශේෂයෙන් වැඩිදියුණු කෙළෙමි. මධ්‍යම සමයේදී අරූප ධ්‍යාන හැර සියලුම සමථ භාවනා පෙරහුරු වීම් වශයෙන් පරිකම් කෙළෙමි. අන් අයටද කියාදුන්නෙමි. ථෙර - මහාථෙර සමයේදී වඩාත් පුහුණු කෙළෙමි.

උපසම්පදාවෙන් 38. වෙනි වසියේ සිට සමථ භාවනා මධ්‍යස්ථානයට පත්වීමෙන්, ආනාපානාසතිය චතුර්ධාතුමනසිකාරය - ද්වත්තිංසාකාරය - ආයතන විනිශ්චය - ප්‍රත්‍යවේක්ෂා සතරය අවිකල්පනාව දශ අසුභය - කසිණ 10 - අරූප කම්ස්ථාන සතර ද යන ආදී කම්ස්ථාන මුදුනටම වැඩුවෙමි. බුද්ධානුස්සති - මරණසති - උපචාර ධ්‍යාන තෙක් වැඩුවෙමි.

විදර්ශනාචාර්ය ධාතු මහාස්ථවිරයන් වහන්සේ පවා සම්පූර්ණව පවිත්‍රව විශුද්ධිමාර්ගයට අනුවම සාමණේරයකු සතුය කොට පුහුණු කෙළෙමි. මහා සතිපට්ඨාන සූත්‍රයත් මා කටපාඩමින් 21. ද සම්පූර්ණයෙන් පවත්වනට වූයෙමි.

## ආශ්‍රයට ලැබුණු කල්‍යාණ මිත්‍රයෝ.

පැවිදි වීම තෙක්, මගේ ගුරුවරුන් වූ මව්පිය දෙදෙනාත්, සහෝදර සහෝදරියෝත්, ගමේ ඥාතීන්වරයෝත් පාසලේ ගුරුවරුන්ලත් මට කල්‍යාණමිත්‍රයෝම වූහ.

පන්සල්වල වැඩසිටිය මගේ ගුරුවර ස්වාමීන් වහන්සේලා ද ගලගම පන්සලේ ලොකු ස්වාමීන් වහන්සේ ද මට කල්‍යාණමිත්‍රයෝම වූහ.

නාඋයන ආරණ්‍යයේ පූජ්‍ය ව[illegible] ... [illegible] ස්වාමීන් වහන්සේ පණ්ඩිතපාල සමයේ කල්‍යාණමිත්‍රයාණෝ වූහ.

පැවිදි ජීවිතයේදී අස්ගිරි පූජ්‍ය රාජකීය පණ්ඩිත [illegible] ශ්‍රී [illegible] මාහිමියෝ, අස්ගිරි පූජ්‍ය රාජකීය පණ්ඩිත කඹුරැගල ශ්‍රී විමලවංශ මාහිමියෝ, අස්ගිරි පූජ්‍ය පණ්ඩිත ගලමාන්නේ ශ්‍රී ශීලවංශ මාහිමියෝ, අස්ගිරි පූජ්‍ය විදර්ශනාචාර්ය මඩවල ධම්මකිත්ති මාහිමියන්, අස්ගිරි පූජ්‍ය විදර්ශනාචාර්ය මාතලේ සීලරතන මාහිමියෝ, අස්ගිරි පූජ්‍ය පණ්ඩිතාචාර්ය

වැලිවිටියේ ශ්‍රී විමලවංශ මාහිමියෝ, අතිගරු පූජ්‍ය ත්‍රිපිටකාචාර්ය ලුනුගම සිරිසුමන මාහිමියෝ, අතිගරු පූජ්‍ය දේවගොඩ මංගලසිරි මාහිමියෝ, අතිගරු පූජ්‍ය කොහොල්වත්තල පුමා මාහිමියෝ, අතිගරු පූජ්‍ය මිනුවන්ගමුවේ ඤාණ මාහිමියෝ, අතිගරු පූජ්‍ය ඕලකානේ බඳුවිමල මහානාහිමියෝ, අතිගරු පූජ්‍ය දෙව්නුවර ඥානාවාස මහානාහිමියෝ, අතිගරු පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානාහිමියෝ, අතිගරු පූජ්‍ය වජිරාරාමයේ පියදස්සි මාහිමියෝ, අතිගරු පූජ්‍ය පණ්ඩිත අකුරැටියේ ඤාණවිමල මාහිමියෝ අතිගරු පූජ්‍ය විද්‍යාවිශාරද පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද මහානාහිමියෝ, අතිගරු පූජ්‍ය පණ්ඩිත බටුවිට නන්දාරාම මාහිමියෝ අතිගරු පූජ්‍ය කොත්තේවෙල පඤ්ඤාසාර මහානාහිමියෝ, අතිගරු පූජ්‍ය මාවිතගම සෝණානන්ද මාහිමියෝ, අතිගරු පූජ්‍ය මහකුඹුක්වැව උත්තරවංශ මාහිමියෝ, අතිගරු පූජ්‍ය අත්තනගල්ලේ ධම්මාවාසි මාහිමියෝ, මේ ආදී සම්භාවනීය කල්‍යාණමිත්‍ර මණ්ඩලයක් හමුව ආශ්‍රය, ලැබීම මහා භාග්‍යයකි.

විශේෂ උපකාරක දායක දායිකාවෝ.

නාවික ආරක්ෂක සේනාංකයේ ප්‍රධාන

දායකතුමා වන ඇම්.පී. අමරසිංහ මහත්මයා දගමල්

පන්නිපිලාව සමයේදී විශේෂයෙන් උපකාරවූ මහතෙක්.
විගොඩ පවිය කාලයේදී, විලේගොදර වත්තේ අරවින්ද මහතා
ගුරුන්නැහෙගොඩ හේමලතා කරුණාරත්න විශාඛා විදුහල්පතිනී.

නාවලගේ පව පාමණෝර සමයේ ප්‍රේමබන්ධු-
තිලකසිරි මහතා, රංවල ආයෝකාරණයේදී ජී. ඩී. අමරසිරි
පොංසිඅප්පුහාමි මහතා. පුහුල්වැල්ලේදී, කෝරළගොඩ
සමරතුංග මහතා, පාතදුව කන්නංගර මහතා (දැනට පූජ්‍ය
පාතදුව ඛෙමානන්ද හිමි)

දනාවුකන්දේ පවිය කාලයේ, දනාවුකන්දේ
බෝසත් රණවුක මහත්මයා සහ මහත්මිය.
සහ ඩී. එච්. අල්විස් මෙදමහතා.

ඇල්ලගලදී, ලෙවිගේ බණ්ඩාර මහතා.
ඇඹුරුගල්ලේ මෙදමහතා - ඇටුගල මහතා

හෝමාව කපෝවනයේදී සුමනා කරුණාරත්න
බුලුවිය දෙවල. සහ එච්. ආර්. දූබරේ මහතා
කාලසූරිය මාතාව සහ රූපසිංහ මාතාව.

කොස්ගලදී ජිනදාස සිල්වා මහතා
(පසුව පූජ්‍ය දෙමන්දුවේ සාසනසෝභන හිමි)

කැහැගොල්ලේ ශ්‍රී ගුණාරාම විහාරස්ථානයේදී
අර්ස කුලසූරිය ජෝර්ජ් මහතා - දියතලාව පුදකඩදුරුර
පී. ටී. ගුණවර්ධන මහතා, දියතලාවේ, එ. පී. ගුණසේකර
මහත්මයා, සහ මිණිකින්,

ගල්දූවේ ගුණවංශ යෝගාශ්‍රම මධ්‍යස්ථානයේදී
සුමන කරුණාරත්න මහතා - එම ජනනී කරුණාරත්න මාතාව.
කොල්වින් සේනානායක මහතා - විල්සන් විජේවීර
මහතා - විල්ෆ්‍රඩ් ගුණසේකර මහතා - එම මහත්මිය.
ජෝ. ජේ. ද සිල්වා වැල්ලේවිටන් සොකෝලිහාමිනේ.
ආරියදාස විතාන ලියන මහතා. ජේ. පී. පියසේන
මහතා. සමරදාස වෙද මහතා - වැලිදෙණියේ වෙද
මහතා. ඇල්පිටියේ කරුණාරත්න මාතාව,
බලපිටියේ ධම්මික රාජපක්ෂ මහතා, එම
බිරිඳ රාජපක්ෂ මහත්මිය. කළුතර ජී. ඇම්. ගුණරත්න
විශ්‍රාමික විදුහල්පතිතුමා. කළුතර ප්‍රේමලාල් සෙනෙවිරත්න
ඉංජිනේරු මහතා.
අමරසේන ජයසිංහ වෙදමහත්මයා.
ඩී. ආර්. දිසානායක හාමුමහතා. සිරිසේන සිල්වා
මහතා. විශ්‍රාමික මහින්ද විදුහල්පති ගුණසේකර මහතා
එම මහත්මිය.
මාකඳුරේ උපාලි ප්‍රියන්ත සහ ධීර
ජයසිංහ මහතා (දැනට පූජ්‍ය මාවලගම අරියවංශ හිමි)
විශ්‍රාමික විදුහල්පති එම්. බී. ද සිල්වා මහතා
විශ්‍රාමික විදුහල්පති ජී. නාගොඩ මහතා සහ එම
මහත්මිය. ඉඳුන් විමල් වී. එස්. පී. මහතා සහ
එම වීරසේකර මහත්මිය.

විල්බට් කක්කොඩආරච්චි මහතා සහ එම මහත්මිය.
ආරියපාල ගුරුන්නාන්සේ සහ එම මහත්මිය.

කොළඹ, එස්. එම්. හේමා ප්‍රේමදාස මැතිනියෝ.
ජේ.පී. උපාලි සෙනරත් ප්‍රේමදාස මහතා සහ එම මහත්මිය.
එස්. පී. ආරියරත්න මහතා සහ එම මන්ද්‍රා ආරියරත්න මහත්මිය. ශ්‍රියා ගුණරත්න මහත්මිය.

ජීවරත්න අබේගුණවර්ධන මහත්මිය, අනුර අබේගුණවර්ධන මහත්මයා. ඩී. එස්. මුදලිගේ මහතා. ඇල්බට් එදිරිසිංහ මහතා. (දැනට පූජ්‍ය දේවමිත්‍ර හිමි)

පර්සි අබේසිංහ දිසානායක සහ එම මැතිණි අබේසිංහ මහත්මිය, එම පුත්‍රයෝ ජනක අබේසිංහ මහතා සහ මදුව අබේසිංහ මහතා.

කරුණානායක මහතා සහ එම මහත්මිය. බිම්සර පෙරේරා මහතා. ශ්‍රීලත් ගුණසේකර දෙවසීකර මහතා, ඉඳුරාගල් විජේවීර දෙවසීකර මහතා පරාක්‍රම දිසානායක දෙවසීකර මහතා. ලලිත් විජේරත්න දෙවසීකර මහතා, ශ්‍රීනාත් හත්තොටුව දෙවසීකර මහතා සහ එම මැතිණි මහත්මිය

ආර්. වී. ඩී. රණවක මහත්මයා. එල්.එස්.එල් කරුණාදාස මලවිය දොළුල පවනා දරුවරියා,

ප්‍රබුද්ධ රෝහිත් සිරිසිංහ මහත්මයා සහ එතුමාගේ මැතිණියෝ

එච්. පී. පී. ජයතිලකරත්න මහත්මයා, යූ. එස්. ගුණසේකර මහතා
අමරපාල තිලකරත්න මහතා, පත්තුවිල් සිල්වැස්ටියෝ.
ඇල්ප්‍රඩ් ගුණසේකර මහතා ඇතුළු පවුලේ පිරිස,
අයෝමා වික්‍රමසිංහ මහත්මිය.

පර්සි සිල්වා මහත්මයා සහ මහත්මිය.
විද්‍යා පතිරණ ගුණතිලක මහතා සහ මහත්මිය.
ඩී. පී. දයානන්ද මහතා සහ මහත්මිය. ඉන්ද්‍රානි සෝදරගම
මහත්මිය, අශ්විනිපුර සාරදා රණසිංහ මහත්මා ප්‍රධාන පිරිස.

එම්. ඩී. එස්. පෙරේරා කාර්‍ය මහත්මයා
ප්‍රධාන පවුලේ පිරිස, ඩී. එස්. කොතලාවල වෛද්‍යතුමා.
එස්. ඩී. ඇම්බෙන් මුදලාලි මහතා.

මෛත්‍රී සිරිවර්ධන මහතා සහ මහත්මිය.
මිත්‍ර වෙත්තමුනි මහතා සහ කාන්ති වෙත්තමුනි
මහත්මිය.

කුරුණෑගල, ජයවර්ධන ගුණරත්න මැතිණියෝ
රෙක්ස් ගුණසේකර මහතා සහ මහත්මිය.
දෙහිවල විල්ෆ්‍රඩ් ප්‍රනාන්දු මහතා, දෙහිවල විමලරත්න
මහතා, දෙහිවල මහීපාල කෝට්ටගොඩ මහතා

සුනේත්‍රා සිල්වැස්ටර් ප්‍රධාන පිරිස,
නිමල් පාලිහවඩන සිරිසේන මහතා සහ මහත්මිය.
ඩී. ආර්. යසවර්ධන මහතා ප්‍රධාන පවුලේ පිරිස.
එල්සි, ගුණවර්ධන මැතිණියන් ප්‍රධාන පවුලේ පිරිස.

ශ්‍රාවස්ති සාවිත් ප්‍රධාන පවුලේ පිරිස, ප්‍රේමතිලක බණ්ඩාර මහතා සහ කුමාරි මහත්මිය.

රාජපක්ෂ පතිරාජ් මයා, සිසෙක්වුා කම්කරු ආයතනයේ පවුලේ සියලුදෙනා. කෝට්ටේගොඩ වත්ත වෙදමහත්මයා ප්‍රධාන පවුලේ පිරිස,

ජපානයේ සිසිල් ජයසිංහ මහතා.

මිරිස්වේලියේ ජේ.ඩබ්.පී. ගුණරත්න මැතිණියෝ, මහගලන්තයේ, නයනා ඇන්සන් මහත්මිය. සිරිසිරි කුමර කාන්තංගර මවුපිය දෙපල.

නවගිලන්තයේ මල්කාන්ති පොනවීරත්න මන්ත පොනවීරත්න දෙපල,

ගල්කිස්සේ පී. එල්. එන්. ලියනගේ මවුපිය දෙපල, නුගේගොඩ ජී. පී. ලියනගේ මැතිණිය, ප්‍රතිභා ලියනගේ ගුරුතුමිය.

කමලා අතුකෝරළ මහත්මිය ඇතුළු පවුලේ පිරිස, හේමසිරි විජේරත්න මහතා සහ මහත්මිය. නිහාල් රාජපක්ෂ මහතා, රුහුණු කෝලල් ආයතනාධිපති ජයසිංහ මහතා සහ මහත්මිය.

ඩී. ජේ. අලහකෝන් මැතිණියන් ප්‍රධාන පවුලේ සියලු දෙනා. මේ ආදී කලාශූරීන් විශාල පිරිසක් විශේෂයෙන් සිහිපත් කරමි.

## ඉසිලූ ශාසනික ධුර.

1966. වර්ෂයේදී පරියාප්ති මණ්ඩලයේ සහ අධිකරණ මණ්ඩලයේ ලේකම් ධුරය දරන ලදී. 1968. ජූලි මස 04. වෙනිදා පිහිටුවන ලද ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම අන්තර්ගත දණ්ඩකර්මික කාරක සභාවේ සමලේඛක ධුරය ද සහකාරලේඛක ධුරය ද අදදක්වා දරන්නාහ. 1998. වර්ෂයේ සිට ප්‍රධාන ලේඛකධුරය සම්බන්ධ වී ඇත. මීතිරිගල නිස්සරණ වනයේ නිසබල-ධාරී ධුරය 1992. සිට පැවරී ඇත.

## ලැබූ පිදුගැන.

පැවිදි වීමට පෙර නිවසේදී සිංහලවිශුද්ධි මාර්ගයේ දැක්වෙන (කාන්ත පණ්ඩිත ධම්මවංශ නාහිමි) බුද්ධානුස්සති භාවනාව සවිස්තරව පොතේ ඇති පරිදියෙන්ම පාඩම් කරගෙන සිටියේය. භාවනා ආරම්භයේදී සැමදා රාත්‍රී 7.30. සිට 9.30. තෙක් පර්යංකයේදී එය ඉමහත් චිත්තප්‍රසාදයෙන් ප්‍රායෝගික භාවිතා කෙළේය. ඵල විශේෂ ආනිසංස ද ලැබීය.

1960. පෙබරවාරි 04. වෙනිදා පූජ්‍ය පණ්ඩිත කඩවැද්දුව මාහිමියන් වහන්සේ ප්‍රමුඛ ගරුකටයුතු සම්භාවනීය ස්වාමීන් වහන්සේලා සමග දඹදිව පූජ්‍ය සංඝ වන්දනා ගැනීමට සවස් වූහ. මාර්තු මස

මුල් යුගයේදී ලංකාවට පෙරළා වැඩම කළ සේක. දඹදිව බුද්ධගයාවෙන් සඳුන් නවගුණ වැලක් රැගෙන පැමිණ මා අතට දී මෙසේ ප්‍රකාශ කළ සේක. “ ආර්ය ධර්ම නම! මේ නවගුණ වැලෙන් ඉතිපිසෝ ගාථාවෙන් ලක්ෂ වාරයක් පුරවන්න, නිරෝගීව ශාසනික කටයුතු කරගෙන යාමට මෙයින් ශක්තියක් ලැබෙනවා ”

උඩුවැල්ලේ ශ්‍රී රෝහණ යෝගාශ්‍රම මධ්‍යස්ථානයේ වැඩ වසන එම කාලයේ විනය පිටකය ප්‍රධාන කොට අධ්‍යයනය ලබමින් දවසේ මොහොතක් වත් නොනිසිව ගතකරද්දී ද ලැබුණු ඒ නියමය අනුව බුදුගුණ ලක්ෂවාරය පිරීමට ද පටන්ගත්තේ.

එතැන්පටන් භාවනා කරමින් දිනකට 300 - සිට 400 ක් පමණ ගණිමින් නොකඩවා පුරවමින් 1964 ජූලි මාසයේ 12. වෙනිදා පමණ දිනක බුදුගුණ භාවනාවෙන් ලක්ෂ වාරය සම්පූර්ණ කෙළේය. ඒ මාසයේම 24. වෙනිදා පූජ්‍ය පණ්ඩිත කඹුරුගමුවේ ශ්‍රී විමලවංශ ස්වාමීන්ද්‍රයන් වහන්සේ අතින් කරඬුවක් සහිත ශ්‍රීමත් සර්වඥ ධාතූන් වහන්සේ නමක් මා වෙත පරිත්‍යාග කළ සේක.

නැවත එතැන් සිට පසන් ආවර්ජනා කරමින්
වසියකට ලක්ෂවාරයක් බැගින් බුදුගුණ වැඩුවෙමි.
1969. සිට වසර 1½ ක් තුළ ඉතිපි සෝ
ස්වාක්ඛාතො - සුපටිපන්නෝ යනාදි සූවිසිමහාගුණ ගාථා පාඨ
තුනෙන්ම ලක්ෂ වාරයක් පිරුවෙමි.
1971. නුවරකලාවේදී විවෘත සබයේදී සභාපතිත්වය ගාථා
පාඨයෙන් ලක්ෂවාරදෙකක් සපුරා රටට සෙත්පැතුවෙමි. නැවත
ඉතිපි සෝ ගාථා පාඨයෙන් බුදුගුණ වැඩීමට පටන්ගෙන
1973. ජනවාරි 10. වෙනිදට ලක්ෂවාර 10. ක් සම්පූර්ණ
කෙළෙමි. එවකට පෙළදුම් වූ කිවිය අප්‍රිය බැඳීමයේ
කාර්මිකයක් දෙවතාවෙ විසින් මෙසේ නියමයක් කෙරිණි.
“ මෙතැන් සිට රතන සූත්‍රයෙන් ලක්ෂවාරයක් පුරන්” ලෙසය.
ඒ නියමය අනුව එක්ම දිනයකදී රතන
සූත්‍රයේ 137 වාරය පිරුවෙමි. එදින රාත්‍රී අළුයම
පෙරකොට දෙවිකෙනෙක් මෙසේ කීය “ සමාවන්න !
තමන් ගමන් කරමින් සිටි මාර්ගයේම ගමන් කරන්න
ඒ මාර්ගයේ යමෙක් සොයන්න වනාන්තරේ සිතා න
තැනට අප ගෙන යාගත හැකි නොවේ” යනුවෙනි.
පසු දින උදයේ සිට සොයමින්
වනාන්තරේට කාරණය මතක් කොට ආචාර ගෙන
නැවතත් ඉතිපි සෝ ගාථා පාඨය වඩන්නට
පටන් ගතිමි. 1975. සැප්: 10. වෙනිදට

ඉතිපිසෝ ගාථා පාඨයෙන් 40. වෙනි ලක්ෂ වාරයත් සම්පූර්ණ
සිද්ධ අවසාන සටහනේ පූජ්‍ය විහාරාධිපතිතුමාට
මා පැමිණ එවිට කළාට පුදුමයකින් යුතුව බුද්ධ
රූපයක් පැමිණි අතර සුගන්ධවත් වූ ආලෝකයක මා
ඉදිරියට එළියක් විහිදී ගෙන බුදු දින ප්‍රාතිහාර්යයා
මෙසේ කිය "ස්වාමීනි! ස්වාමීන් වහන්සේට මෙවැනි
ආරාධනයක ඉතිපිසෝ ගාථා පාඨය සියකෙළ වාරයක්
සම්පූර්ණ කිරීමට අවශ්‍යයි" මම එය සිතින් ලියාගෙන
සතුටු විය. නැවත මෙසේද කිය " ස්වාමීනි!
ස්වාමීන් වහන්සේගේ ප්‍රාර්ථනාව ඉටුවන ඉද්ධවන කාලය
ස්වාමීන් වහන්සේ දන්නවාද" මා දන්නේ
නැති බව කී විට "1800" මේ ගණන කිය
ප්‍රාතිහාර්යයාත් අතුරුදන් විය. මමත් සටහනෝත්
ආවදි විම. එයින් පසු විස්තර ඇසූතාට
මෙලොවක් හෝ සිතක් හෝ නොවීය.

නැවතත් ඉතිපිසෝ ගාථා පාඨය පිරිම
දිගටම සිදු කෙළෙමි. ලක්ෂ වාරය සපිරෙන
ඇතැම් දිනවලදී අවසාන සටහනේ නොයෙක්
අසිරිමත් දේ දකින්නට ලැබිණි.

2002. පෙබරවාරි 20. බදාදා වනවිට
ඉතිපිසෝ ගාථා පාඨයෙන් ලක්ෂ වාර
735. ක් සපිරී ඇත. ඉදිරියේ කාලදුරටත්

බුදුගුණ වඩන්නෙමි. මෙතුවක් සියලුම කම්මට්ඨාන මාර්ගයන්
දේශනා කරන ලද්දේ සර්වඥයන් වහන්සේ විසිනි. බුදුන්ගේ
ශ්‍රාවකයාට ඕනෑම කර්මස්ථානයක් ආරම්භ නොකොට නිවැරදිව
අනුමකාර්යය නොකර දියුණු කරගැනීමට ශක්තිය ආරම්භව
සැලසෙන බැවිනි.

## පාලි භාවනා මාර්ගය.

විශුද්ධිමාර්ගය - අභිධර්ම විභංග ප්‍රකරණය
පටිසම්භිදාමග්ග පාලිය හා අට්ඨකථා ත්‍රිපිටකයේ ද
සඳහන් - විදර්ශනා භාවනා ක්‍රම දැන ගැනෙන ගැනීමට
ඉහත ආකාර නිවැරදිව ඒවා අනුගමනය කිරීමේ
දැඩි අවශ්‍යතාවයෝ ශාසනික කටයුතු අනුගමනය
කරද්දී පාලි භාවනා මාර්ගය ගැන දැනගැනීමට
ඉඩ අවසරය සපුරා ගැනීමේ මාගයය කි.

කසිණ ධ්‍යානාදි නිමිත්ත වැඩීම
ගැන ලෝකෝත්තර කෙනෙකුගේ බොහෝ වියක්
වෙති. ඕනෑම හුදු විදර්ශනාවම වඩන පුද්ගල
කෙනෙකු. විදර්ශනාවට පාදක වන ධ්‍යානවිශුද්ධිය
නම් වූ සමාධිමාර්ග අභ්‍යාසමාපත්ති ලබා එමෙන්
විදර්ශනාව පහළවන බවත් නිකෘෂ්ට ප්‍රවණ
වශයෙන බවත් සක් ප්‍රදක් මේ පැහැදිලි කරුණ.
ඒ සඳහා අවශ්‍ය වන්නේ සතසාවුම ඉතා
උපදේශයයි. එවැනි උපදෙස් දීමේ ඉතාවැදි පිළිබඳ

බුරුමයට පිවිසුණු ක්‍රමයට අයත් කෝලම්බයෙන් හා මුනිවරුන් දැනුවර අතර රටේ සිය පෙළක් යන ශ්‍රාමණයෙන් ඇ: 2 කි නම දුර පිහිටි භාවනා මධ්‍යස්ථානය හා විශ්වවිද්‍යාලය ආරම්භ කරන් පුජිතය. සිය දහම් ගෙනත් ගිහි පැවිදි යෝගීන්ට ධ්‍යාන සමාපත්ති මාර්ග ඵලාධිගමය තෙක් [illegible] විදර්ශනා කමටහන් දෙවා වදුරන පුජනීය අනාගාමී [illegible] ය. ආචාර්ය සයාඩෝ (පා ඕක් සයාඩෝ) හාමුදුරුවන් වහන්සේ උගන්වන කමටහන් කළ <u>පා ඕක් භාවනා මාර්ගය</u> නමින් හැඳින් වෙයි.

සුපිරිසිදු සීලයෙහි පිහිටා සිටින යෝගීන්ට ආනාපාන සතියෙන් පරිකර්ම - උග්ගහ - පටිභාග නිමිති පිළිවෙලින් ලබා රූප ධ්‍යාන සතර හෝ ආනාපානට ධ්‍යාන පස හෝ උපදවා ගැනීමට උපදෙස් දෙයි. ධ්‍යාන සියල්ල පසුව වශීභාවයෙන් වසඟවට පැමිණ පසු සතර පටිභාග නිමිත්ත ආලෝකයෙන් ශරීරයේ කේශා දී ලොම ආදී [illegible] කොට්ඨාස-යෝ [illegible] 32. ලබන්නට බලයි.

ආනාපානසති පටිභාග නිමිත්ත ආලෝකයෙන්ම ශරීරයේ ඇටසැකිල්ල තුළින් හිස්කබල අරමුණු කොට සුදු වර්ණය පරිකර්ම කොට ආකාශයෙන්ද හිස්කබල තබා ඉදිරියට [illegible] ගෙන සුදු පටිභාග නිමිත්ත උපදවා රූප ධ්‍යාන සියල්ල ලබන්නට උපදෙස් දෙයි. සුදු කසිණ ධ්‍යාන වශයෙන් පවත්වා එම ආලෝකයෙන්

මෛත්‍රී ධ්‍යාන 528. කරුණා ධ්‍යාන 132. මුදිතා ධ්‍යාන 132. උපේක්ෂා 132. උපදවා ගන්මටත්, එත් අනතුරුව උපචාර ධ්‍යානය තෙක් බුද්ධානුස්සතියෙන්, අවිඤ්ඤාණක උද්ධුමාතකාදී දශ අශුභ ප්‍රථම ධ්‍යාන 10.ත් උපචාර ධ්‍යානය තෙක් මරණ සතියෙන් වඩන්නාට උපදෙස් ලැබේ.

තවත නිසංගෝ අරමුණෙහි නිල කසිණය ද පීත - ඕද අරමුණෙහි පීත කසිණයද, ලෝ - මංග අරමුණෙහි ලෝහිත කසිණයත් ආධ්‍යාත්මික බාහිර වශයෙන් ගෙන වර්ණ කසිණ ධ්‍යාන සියල්ලත්, පඨවි - ආපෝ - තේජෝ - වායෝ - ආලෝක - ආකාශ නම් වූ ඉතිරි කසිණ ධ්‍යාන සියල්ලත් වඩා, ඉන් අනතුරුව ආකාශ කසිණය හැර ඉතිරි කසිණ නවයේ පටිභාග නිමිත්ත උදුරුවා ආකාසානඤ්චායතනයත්, එම විඤ්ඤාණය අරමුණු කොට විඤ්ඤාණඤ්චායතනයත්, එහි නාස්තිභාවය අරමුණු කොට ආකිඤ්චඤ්ඤායතනයත්, එම විඤ්ඤාණය අරමුණු කොට නේවසඤ්ඤානාසඤ්ඤායතනයත් ලෙස ඒ සියල්ල වසී බවට පත්කර ගැනීමට උපදෙස් ලැබේ.

සිදුත කසිණ චතුර්ථ ධ්‍යානය සහ බුද්ධානුස්සති - මෛත්‍රී - අවිඤ්ඤාණක සවිඤ්ඤාණක අසුභ මරණසති කම්ටහන් සම්පූර්ණ වීමෙන් ගෝ උත්සාහ ඇති අය නිවන් අවබෝධ සමාපත්ති සම්පූර්ණ කිරී-මෙන් පසු අනතුරුව ධාතුමනසිකාරයෙන් විදර්ශනාවට නරඹා - ආධ්‍යාත්මික බාහිර රූප පරිග්‍රහ - අරූප පරිග්‍රහ

රූපාරූප පරිච්ඡේද රූපාරූප ධර්මයන් එකින් එකට විසඳාම
පැහැදිලිව අවබෝධ වූ පසු පටිච්ච සමුප්පාදය පිළිබඳව
පඤ්චම ක්‍රමයෙන් හා නාමරූප ප්‍රථම ක්‍රමයෙන්ද අවබෝධ
කරවා, අතීත අනාගත ආත්මභාව 4-5.ක් පමණ හෝ,
නාමරූප පරිග්‍රහයෙන් දැනගැනීමෙන් අනාගතව නාමරූප එකක්
සහ ලක්ෂණ රස පච්චුපට්ඨාන පදට්ඨාන සම්මර්ශනයට
උපදෙස් ලැබේ. නවන කලාප සම්මර්ශනයෙන් විදර්ශනාව
පටන්ගෙන චත්තාළීසාකාර ධම්ම විපස්සනාවෙන් අනාගතව
රූප සප්තක - අරූප සප්තක අනුව උදයව්‍යය ඤාණ
භංගානුපස්සනා ඤාණාදී විදර්ශනා ඤාණ පරම්පරාව ඉතාමත්
පැහැදිලිව විසඳ ලෙස අවබෝධ කරගැනීමට උපදෙස්
ලැබේ. අභිධර්මය තරමක් හෝ උගත් අයට නම්
මේ විදර්ශනාව අභ්‍යාසයත් රසවත් මාර්ගයකි. අභිධර්මය
නූගත් අයට අනුපිළිවෙළින් අවබෝධය ලැබේ.
අභිධර්මයෙන් තොර විදර්ශනාවක් නැති බැවිනි.
නිදසුනක්, ස්පර්ශ අනිච්ච, සිතට
විදර්ශනාවක් නොවේ. ස්පර්ශ, යනු සම්මුතියක් පමණි.
අනිච්ච - දුක්ඛ - අනාත්ම, යන ත්‍රිලක්ෂණයෙන්
විදර්ශනාවට නගනුයේ පරමාර්ථයක් පමණි.
ස්පර්ශ කොටසේ රූප 44.ක් ඇත. කලාප 5.ක.
කලාප වශයෙන් හෝ රූප වශයෙන් දක්වමින්
ඒ ඒ රූපය "අනිච්ච - දුක්ඛ - අනාත්ම" වශයෙන්

සම්මර්ශනය කිරීම විදර්ශනාවයි. එසේ හෙයින් විදර්ශනාව පරමාර්ථ ධර්ම වෙන් වෙන්ව දැනගත යුතුව වේ. විදර්ශනාවෙන්ම සත්ව පුද්ගල සඤ්ඤාව- දිට්ඨි- චිත්ත විපල්ලාසයන් දුරුකළ හැක. කෙලෙසුන් තුනී කිරීමට කෙලෙසුන් ජය ගැනීමට මග පල නිවනට පැමිණීමට විදර්ශනාව ඒකායන මාර්ගයයි. "සමාහිතො යථා භූතං පජානාති" වදාළ ඇති බැවින් විදර්ශනාවට සමාධිය පදනම් වෙයි. මේ හෙයින් සමථ විදර්ශනා භාවනා ක්‍රම දෙකම ප්‍රගුණ කරගත යුතු වේ.

ඉහත සඳහන් බුරුම රට පාඕ භාවනා මධ්‍යස්ථානයේ විශාල පිරිසක් අර්පණා කම්ඨාන සහිත විදර්ශනා වඩා නමුත් සිත්ත විපර්යාසයකට ඉන් මානසිකාබාධයකට ඒකාන්තයෙන් පත්වූවන් ඇසෙන්නට දකින්නට නොමැත. ඒ නිසා අප ශ්‍රී ලංකාවේ ඇති අතීතයේ මෙන් නැවතත් ධ්‍යාන අභිඥා මාර්ග ඵල අධිගම ලාභීන් පහළ වීමට මෙම භාවනා මාර්ගය අනුගමනය කරනු පිණිස සසර ඇවිදි සියලු දෙනා උත්සාහවත් වෙත්වා යන පැතුමෙන් මෙසේ සටහන් කරනුයේ ශාසනාභිවෘද්ධි ප්‍රාර්ථනාවෙනි.

"භාවෙතබ්බං පනිච්චෙවං - භාවනාද්වය මුත්තමං
පටිපත්ති රසස්සාදං - පත්ථයන්තෙන සාසනෙ" ති.

(අභිධම්මත්ථ සංගහ)

# සිවුපස ප්‍රත්‍යවේක්ෂාව.

සිවුපස ප්‍රත්‍යවේක්ෂාව ප්‍රත්‍යසාධන සීලයකි. විදර්ශනා භාවනාවට ද සංසාර්දනය වෙයි. පැවිද්දෝ හා ගිහිකලෙත් ම භාවිතා කරන පිළිවෙළ මෙසේය.

චීවර ප්‍රත්‍යවේක්ෂාව:- පටිසංඛා යෝනිසෝ චීවරං පටිසෙවාමි. (.........) බුදුපසේබුදු මහරහතන් වහන්සේලාට අයත්වූ මේ චීවරය නුවණින් සලකා දරාගනිමි. මේ චීවරය ශීතලෙන් වන පීඩා වැළැක්වීම පිණිසද, උෂ්ණයෙන් වන පීඩා වැළැක්වීම පිණිසද, මැසි මදුරු අව්වැසි සුළං සියකුරු සර්පාදීන්ගේ ස්පර්ශයෙන් වන පීඩා වැළැක්වීම පිණිසද, විලිලජ්ජාවෙන් ශරීරාවයව සංවර කරගැනීම පිණිසද පරිභෝග කරමි.

මෙසේ ප්‍රත්‍යය වශයෙන් උපකාර වන්නාවූ මේ චීවරය සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් නොවූ නිස්සත්ව නිජ්ජීව ශූන්‍ය ධාතු මාත්‍රයකි. මේ චීවරය පරිහරණය කරන්නාද සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් නොවූ නිස්සත්ව වූ නිජ්ජීව වූ ශූන්‍ය වූ ධාතු මාත්‍රයකි. පරිභෝගයට ප්‍රථමයෙන් පිරිසිදු වූ ද මේ චීවරය දැන් කුණප කොට්ඨාශය වැළඳ ගත්තෙන් අතිශයින් පිළිකුල් බවට පත්වන්නේය.

පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාව:- (පාලිපාඨය)

බුදුපසේබුදු මහරහතන් වහන්සේලාට අයත්වූ මේ පිණ්ඩපාතය නුවණින් සලකා පිළිගනිමි, වළඳමි

මේ පිණ්ඩපාතය ගම්දරුවන් මෙන් ක්‍රීඩා පිණිස නොවළඳමි, මල්ලවයන් මෙන් මද වැඩීම පිණිස නොවළඳමි. වෛශ්‍යාවන් මෙන් ඇඹුකළු පිරීම පිණිස නොවළඳමි, අන්තඃපුරිකා රජ බිසෝවරුන් මෙන් ගත සැරසීම පිණිස නොවළඳමි.

චිවතේජිය පුනබැඳි රූපකායයාගේ ජීවිතය පැවැත්ම - යැපීම - පිණිස වළඳමි. කුසගිනි වේදනා නැසීම පිණිස වළඳමි. ශාසන බ්‍රහ්මචර්යාවට අනුග්‍රහ පිණිස වළඳමි. මෙසේ පැරණි කුසගිනි වේදනා නසමි. අලුත් කුසගිනි වේදනා නූපදවමි. මාගේ ජීවිත යාත්‍රාවද පවත්නේය. නිවරදි වන්නො-යද වන්නේය. පහසු විහරණයද වන්නේය යන ප්‍රයෝජන පිණිස වළඳමි.

මෙසේ ප්‍රත්‍ය වශයෙන් උපකාර වන්නා වූ මේ පිණ්ඩපාතය සත්වයෙක් නොවූ පුද්ගලයෙක් නොවූ ආත්මයක් නොවූ නිසත්ව වූ නිර්ජීව වූ ශූන්‍ය වූ ධාතු මාත්‍රයකි. මේ පිණ්ඩපාතය වළඳන්නාද සත්වයෙක් නොවූ පුද්ගලයෙක් නොවූ ආත්මයක් නොවූ නිසත්ව වූ නිර්ජීව වූ ශූන්‍ය වූ ධාතු මාත්‍රයකි.

වැළඳීමට ප්‍රථමයෙන් ප්‍රණීත වූද මේ පිණ්ඩපාත භෝජනය දෙතිස් කුණපය සමග එකතු වීමෙන් අතිශයින් පිළිකුල් බවට යන්නේය. ඒ සමගම, මේ ආහාරය අත කැවීමෙන් ඇනීමෙන් පාත්‍රයේදීම ඉදුල් බවට පත්ව පිළිකුල් වන්නේය.

හපා කොට කටේ තැබීමෙන් දතින් කැපීමෙන් දිවෙන් පෙරළීමෙන් කෙළ තැවරීමෙන් දත්මුලියවී තැවරීමෙන් කටේදීම බලුවමනයක් මෙන් පිළිකුල් වන්නේය. ගලනාලයෙන් පහළට යාමෙන්, ගවර-වළන් මෙන් අසූචි වළක් මෙන් අක්‍රමයෙන් දුර්ගන්ධ වූ ජේගුච්ඡ පටික්කූල වූ අන්ධකාර වූ ආමාශයට වැටීමෙන් ආමාශයෙහි කොදුරු ආහාර මිශ්‍ර වීමෙන් පිත් සෙම් සැරව ලේ මිශ්‍ර වීමෙන් ජඨරාග්නියෙන් තැවීමෙන් කායෝජයෙන් ඇඹරී ජීර්ණ වීමෙන් අසූචි බවට පත්වී පිළිකුල් වන්නේය.

ආමාශයට වැදි දී ඇති රස සාරයෙන් උරාගන්නා වූ රස ධාතුවෙන් ශරීරයේ කෙස් ලොම් නිය දත් සම් මස් නහර ඇට ඇටමිදුළු වකුගඩු හදවත අක්මාව දළබු කිරිය ඇලදිව පපුමස බඩවැල අතුනුබහන් කොදුරු ආහාර දිරූ ආහාරමල හිස්මොල පිත් සෙම් සැරව ලේ ඩහදිය මේදතෙල් කඳුළු වුරුණුතෙල් කෙළ සොටු සඳමිදුළු මූත්‍ර නම් වූ දෙතිස් කුණප බවට පත්වීමෙන් ද පිළිකුල් වන්නේය.

මේ ආහාරය කුඩා බඩවැලේදී මහාබඩවැලේදී පණුවන්ට ගොදුරුවීමෙන්ද පක්වාශයට මුත්‍රාශය ඇලේ මලමූත්‍ර බවට පත්වී රැස්වීමෙන්ද, කොළ සෙම් සොටු මලමූත්‍ර කට කන් කාන්තාදුර දත්මුලියවී දහඩිය වුරුණුතෙල් වශයෙන් ශරීර ස්‍රාවයන්ද බවට පත්වන බැවින් ද පිළිකුල් වන්නේය.

නිරයාංශයට පිරිස මැදි වැළලුණවත් දුගඳ වහනයෙමින් පිට වෙමිදී
ලජ්ජාවෙන් යුතුව බැහැර කළයුතු ඇවින් ද පිළිකුල් වන්නේය
යමෙක් රස කෑමෙකින් පිණ පිණ යටුපින් වැළලුණවත්
දුගඳ වහනය වෙමින් පිටවීමේදී ලජ්ජාවෙන් සැඟවී බැහැර
කළයුතු වන ඇවින් ද පිළිකුල් වන්නේය. එක දොරකින් ඇතුල්වී
දුගඳ වහනය වෙමින් නවදොරකින් පිටවන ඇවින් ද පිළිකුල්
වන්නේය. එසේ ලයක් දවාලන් ගුණුන් වීමෙන් දුර්ගන්ධ වූ
ජේලවිජ වූ ජවිත්තල වූ අශුචි මල මුත්‍ර බවට පත්වීමෙන්
ද පිළිකුල් වන්නේය. එනිසාවෙන් බොහෝ ආහාරයක්
මෙන්ද රස රෝදියට තෙල් දැමීමක් මෙන් ද කාන්තාරයේ
පුත්‍රමාංශයක් මෙන් ද නොඇලී නොබැඳී සංසාරණාර්ථය
පිණිස මේ පිණ්ඩපාතාහාරය පිළිගනිමි. වළඳිමි.

සේනාසන ප්‍රත්‍යවේක්ෂාව:- (පාලිපාඨය)

බුදු පසේබුදු මහරහතන් වහන්සේලාට අයත් වූ
මේ සේනාසනය නුවණින් සලකා පරිභෝග කරමි. මේ සේනාසනය
සීතලෙන් වන පීඩා වැළැක්ම පිණිසද උෂ්ණයෙන් වන පීඩා, වැළැක්ම පිණිසද
මැසි මදුරු සුළු මැසි සුළං අව්ව සර්පාදීන්ගේ ස්පර්ශයෙන් වන පීඩා
වැළැක්ම පිණිසද ඍතුපරිශ්‍රය හේතු පීඩාවන් දුරුකරනු පිණිසද
සමථ විදර්ශනා භාවනාවෙන් විවේකතෝෂණය පිණිසද පරිභෝග කරමි.
මෙසේ ප්‍රත්‍යය වශයෙන් උපකාර වන්නා වූ
මේ සේනාසනය සත්වයෙක් නොවූ පුද්ගලයෙක් නොවූ.-

ආත්මයක් නොවූ නිස්සත්ව වූ නිජ්ජීව වූ ශූන්‍ය වූ ධාතු මාත්‍රයකි. මේ භෝජනය පරිභෝග කරන්නා ද සත්වයෙක් නොවූ පුද්ගලයෙක් නොවූ ආත්මයක් නොවූ නිස්සත්ව වූ නිජ්ජීව වූ ශූන්‍ය වූ ධාතු මාත්‍රයකි.

මේ භෝජනය පරිභෝග කිරීමට ප්‍රථමයෙන් පිරිසිදු වූව ද දෙවනු කුණපය වැළඳ ගැනීමෙන් පසුවෙයින් පිළිකුල් බවට යන්නේය.

ගිලන්පස ප්‍රත්‍ය මීමංසාව:- (පාලිපාඨය)

බුදු හෝ බුදු මහරහතන් වහන්සේලාට අයත්වූ මේ ගිලන්පස බෙහෙත් පිරිකර නුවණින් සලකා පිළිගනිමි, වළඳමි. මේ ගිලන්පස බෙහෙත් පිරිකර ශරීරයේ උපන්නාවූ රෝගාබාධ වේදනා සන්සිඳුවා ගැනීම පිණිස ද නිරෝග බවම පිණිස ද පිළිගනිමි, වළඳමි. මෙසේ ප්‍රත්‍ය වශයෙන් උපකාරව පවත්නාවූ මේ ගිලන්පස බෙහෙත් පිරිකර සත්වයෙක් නොවූ පුද්ගලයෙක් නොවූ ආත්මයක් නොවූ නිස්සත්ව වූ නිජ්ජීව වූ ශූන්‍ය වූ ධාතු මාත්‍රයකි. මේ ගිලන්පස බෙහෙත් පිරිකර වැළඳීමට ප්‍රථමයෙන් පුස්සක වූව ද දෙවනු කුණප කොටසියෙන් සමග ඒකතු වීමෙන් අනෙකින් පිළිකුල් බවට යන්නේ ය.

සිවුපස විදර්ශනාව.

චීවර පිණ්ඩපාත භෝජන ගිලන්පස යන සිවුපසයෙහි විද්‍යමාන වන්නාවූ ආධ්‍යාත්මික

රූප සමූහය අතුරෙන් පඨවි ධාතු කර්කශ ලක්ෂණ ඇත්තේය. පතිට්ඨා කෘත්‍ය රසය ඇත්තේය, සම්පටිච්ඡන පච්චුපට්ඨාන ඇත්තේය, ආපෝ තේජෝ වායෝ ධාතුත්‍රය ආසන්න හේතුව කොට ඇත්තේය. ආපෝ ධාතුව පග්ඝරණ ලක්ෂණය ඇත්තේය, බෲහන කෘත්‍ය රසය ඇත්තේය, සංගහන පච්චුපට්ඨාන ඇත්තේය. පඨවි තේජෝ වායෝ ධාතුත්‍රය ආසන්න හේතුව කොට ඇත්තේය.

තේජෝ ධාතුව උණ්හත්ත ලක්ෂණ ඇත්තේය. පරිපාචන කෘත්‍ය රසය ඇත්තේය, මද්දවානුප්පදාන පච්චුපට්ඨාන ඇත්තේය. පඨවි ආපෝ වායෝ ධාතුත්‍රය ආසන්න හේතුව කොට ඇත්තේය. වායෝ ධාතුව විත්ථම්භන ලක්ෂණ ඇත්තේය, සමුදීරණ කෘත්‍ය රසය ඇත්තේය. අභිනීහාර පච්චුපට්ඨාන ඇත්තේය. පඨවි ආපෝ තේජෝ ධාතුත්‍රය ආසන්න හේතුව කොට ඇත්තේය,

වර්ණ රූපය චක්ඛුපටිහනන ලක්ෂණ ඇත්තේය. චක්ඛු විඥානයට විෂය වීම කෘත්‍ය රසය කොට ඇත්තේය. සියටම ගෝචර බව වැටහීම කොට ඇත්තේය, සතර මහා භූත රූප ආසන්න හේතුව කොට ඇත්තේය. ශබ්ද රූපය සෝත ලක්ෂණය ඇත්තේය, සෝත විඥානයට විෂය වීම කෘත්‍ය රසය කොට ඇත්තේය. සියටම ගෝචර බව වැටහීම කොට ඇත්තේය. සතර මහා භූත රූප ආසන්න හේතුව කොට ඇත්තේය. රස රූපය ජිව්හා පටිහනන ලක්ෂණ ඇත්තේය. ජිව්හා විඥානයට විෂය වීම කෘත්‍ය රසය කොට ඇත්තේය.

එසේම ගෝචර වන බව ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය. සකලමහා සැකරූප ආසන්න පදස්ථාන කොට ඇත්තේය. කබලිංකාර ආහාරය ඕජ ලක්ෂණ කොට ඇත්තේය. රූපාහරණය කෘත්‍ය රසය කොට ඇත්තේය. උපස්ථම්භනය ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය. අනුභව කරන ආහාරයෝ වස්තුව ආසන්න පදස්ථාන කොට ඇත්තේය.

ඖදාරිකත රූප සමූහය රූපයක්, රූපාරම්මණයක්. වර්ණය රූපායතනයක්, රූපධාතුවක්, ගන්ධය ගන්ධායතනයක්, ගන්ධ ධාතුව, රසය රසායතනයක්, රස ධාතුවක්, පඨවි තේජෝ වායෝ සංඛ්‍යාත ඵොට්ඨබ්බ ආයතනයක්, ඵොට්ඨබ්බ ධාතුවක්, ආපෝ ධාතු ආහාරරූප ධම්මායතනයක්, ධම්මධාතුවක්.

ඖදාරිකත රූප සමූහය පටිච්චසමුප්පන්නයකි. ආරම්මණ - ආරම්මණාධිපති - උපනිශ්‍රය - විප්‍රයුක්ත - අස්ති - අවිගත ප්‍රත්‍යය ද, පඨවි ආපෝ තේජෝ වායෝ මහාභූත සතර සහජාත - අඤ්ඤමඤ්ඤ - නිශ්‍රය ප්‍රත්‍යය ද, ආහාර රූපය ආහාර ප්‍රත්‍යය ද වර්ණ - ගන්ධ - රස - පඨවි - තේජෝ - වායෝ යන දෙක ආරම්මණ - පුරේජාත ප්‍රත්‍යය ද වන්නේය.

සිවුපසය පරිභෝග කරන්නේ ද නාමරූප පුද්ගලයක්, පිණ්ඩපාත පයක්, ආයතන ගෙලයක්, ධාතු ආරම්මණයක්, පටිච්ච සමුප්පාද අංග

දොළොසක්, සූවිසි ප්‍රකාරයකි. ආධ්‍යාත්මික වූද බාහිරවූද වේ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පටිච්චසමුප්පාද සූවිසි ප්‍රකාර නම් වූ පරමාර්ථ ධර්මයෝ අනිච්ච - පලෝක - චල - පභංගු - අද්ධුව විපරිණාමධම්ම - අසාරක - විභව - සංඛත - මරණධම්ම වැනි අනිත්‍යයෝය. දුක්ඛ - රෝග - ගණ්ඩ - සල්ල - අඝ - ආබාධ - ඊති - උපද්දව - භය - උපසග්ග අතාණ - අලේණ - අසරණ - ආදීනව - අඝමූලක - වධක - සාසව මාරාමිස - ජාතිධම්ම - ජරාධම්ම - ව්‍යාධිධම්ම - සෝකධම්ම - පරිදේවධම්ම උපායාසධම්ම - සංකිලේසධම්ම වැනි දුක්ඛයෝය, පර - රිත්ත - තුච්ඡ - සුඤ්ඤ - අනත්ත වැනි අනාත්මයෝය.

මෙසේ අනිත්‍ය වූද දුක්ඛවූද අනාත්ම වූද ආධ්‍යාත්මික බාහිර නාමරූප ස්කන්ධ ආයතන ධාතු පටිච්චසමුප්පාද සූවිසි ප්‍රකාර පරමාර්ථ ධර්ම සමූහය පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ ආයූහන - නිදාන - සංයෝග - පලිබෝධාර්ථයෙන් සමන්නාගත වූ ත්‍රිවිධ තෘෂ්ණාව ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

ඒ දෙකෙහි නොපැවැත්ම නම්වූ ශාන්තනිර්වාණ ධාතුව නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය. දුක්ඛය පිරිසිඳිනා - සමුදය ප්‍රහාණය කරනා - නිරෝධය සාක්ෂාත් කරනා ආර්ය අෂ්ටාංගික මාර්ගය, නිය්‍යාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ගසත්‍යය නම් වන්නේය.

මාගේ මේ සකල කුශල සම්භාර ධර්මය මෙම චතුරාර්ය සත්‍යය දුටු සේ අවබෝධ වීම පිණිසම හේතු වේවා. වාසනා වේවා. මෙම සිවුපසය පරිභෝග කරන සැමටත් එසේම වේවා.

## ප්‍රාර්ථනා ප්‍රණිධිය,

දිනපතා අසීමිත කරගන්නාවූ සකල කුශල සම්භාර ධර්මය මාහට සර්වඥතාඥාන ප්‍රත්‍යක්ෂය පිණිසම හේතු වේවා. ඒ සඳහාම පාරමිතා පූර්ණ බෝධි සම්භාරවල් පූරණය පිණිස මේ ජීවිතයේදී ත්‍රිපිටකධාරී වීමත් පසුවාසයේදී ආයු සම්පත්ති ලාභී වීමත් සංසාරභය දක්නා ඥානයෙන් විදර්ශනා ඥානයෙන් දියුණු වීමත් ඒ ධර්මයන්ගෙන් නොසිඳුණු බුද්ධශාසනයේ චිරස්ථිතිය පැවැත්වීමට ශක්තිය ලැබේවා. ඒ සඳහා කල්‍යාණ මිත්‍ර සම්පත්තියෙන් චිත්ත සම්පත්තියෙන් ශරීර සම්පත්තියෙන් ප්‍රත්‍යයෙන් ලැබේවා. කිසිම කාලෙකත් ලාභසත්කාර කීර්ති ප්‍රශංසා ආදියට මගේ සිත නොඇලේවා නොපෙළවේවා රජු නොවේවා මුලා නොවේවා. පිරිසිදු ශාසනාරක්ෂණ ධර්මයෙහිම ශාසනා පරමාර්ථය සපුරාලීමේ ශක්තිය ලැබේවා.

කිසිම කාලෙකත් අලජ්ජී දුස්සීල පාපමිත්‍රයන්ගේ ආශ්‍රයක් සේවනයක් පරිභෝජනයක් මට නොලැබේවා. ලජ්ජී සුපේශල ශික්ෂාකාමී කල්‍යාණ මිත්‍රයන්ගේම ආශ්‍රය සේවනය පරිභෝජනය සැම කල්හිම ලැබේවා, මම ලජ්ජී සුපේශල ශික්ෂාකාමී වේවා, අලජ්ජීන් ලජ්ජී ධර්මයෙහි

විනිවුවාලීමේ ශක්තියද මට ලැබේවා, කිසි කලෙක කාමකරණ ඇරඹුණොත් මගේ සිත ලෝභයෙන් නොබැඳේවා, ද්වේෂයෙන් නොගැටේවා, මෝහයෙන් මුළා නොවේවා, අභිජ්ඣා - ඡන්ද - ක්‍රෝධ - උපනාහ - මක්ඛ - පලාස - ඉස්සා - මච්ඡරිය - මායා - සාඨෙය්‍ය - ථම්භ - සාරම්භ - මාන - අතිමාන - මද - ප්‍රමාද - සක්කාය දිට්ඨි විචිකිච්ඡා - ආඝාතය - දුප්පටිනිස්සග්ගිතා - පඤ්ච නීවරණ - පඤ්ච චේතෝ ඛිල - පඤ්ච චේතසෝ විනිබන්ධ - සතර විවාද මූල ආදී පාප ක්ලේශ ධර්ම කිසි කලෙකත් මාගේ සන්තානයේ පහළ නොවේවා, සෑම අරමුණකදීම සමයක් ප්‍රඥාවෙන් යුක්ත වීමට ශක්තිය මට ලැබේවා.

ථේරයෝ මට දේශනා පවත්වයන් රකිනා පවුත්වයන් නිහතමානීව නිරහංකාරව නිකෙලෙස් නිසාන් ජීවත් වීමේ ශක්තියද ලැබේවා, මට ආයුෂයට ලැබෙන ගිහිපැවිදි සියලුදෙනා සිල්වත් ගුණවත් නැණවත් ඔබයන් ආර්ය පිරිසක් බවට පත්වේවා, මාගේ සිතවරකත් ඉරියව්වකත් රූපයකත් ශබ්දයකත් ගන්ධයකත් රසයකත් ස්පර්ශයකත් වචන මතුයකත් හුස්ම පොදකත් සිතිවිලි මාත්‍රයකත් එක් කෙනෙකුට හිංසාවක් පීඩාවක් නොවේවා, අකුසල් සිතක් පහළ නොවේවා, මා දකින මාගැන කථාකරන මාගැන සිතන සියලු දෙනාට කුසල් සිතක්ම පහළ වේවා, මාගෙන් පිටවන හුස්ම පොදත් පවා සන්තානගත කිලිටි ගති දුරිකරන වේවා, ඇතුළට ගන්න හුස්ම වාරයක් පවා බුදු පසේබුදු මහරහතන්

මහෝත්තමයන්ලාගේ ආර්ය ගුණානුභාවය සන්තානයට ඇතුල්වේවා, මගේ සන්තානය තුළින් ආවර්ජිත පිට ඉක්මී නික්මේවා, සතර සංවර සීල ගුණයෙන් ආරක්ෂා කරගෙන සදම ඉන්ද්‍රියසංවරය ප්‍රත්‍යසන්නිශ්‍රිතයන් මැද පවත්වාගෙන සතර සතිපට්ඨානයේදී සත්ත්වයේ ධර්මානුකූල බවින් දියුණු කරගැනීමට ලැබේවා. විශේෂයෙන් කායගත කාමභාවිද නොහොත් වේවා.

මගේ අසාර්ථ ආලය උපදවා ආත්ම ආත්මීයභාවත් යාතු කරදර මාරක බාධක සම්බන්ධ ශෝක අභ්‍ය විෂ නොවිවර බාධා ඇතිවන කටයුතු කෝලාහල ආශාවන් අලාභ අයස නින්දා දුක් ජීවිත කෝලාහල පරිභව අසාධ්‍ය අපකීර්ති ගර්හා කර්මා සියල්ල සහිතවූ අපර පෙර විපාක විනාශයෙන්ම නැතිවා, නිදහස්ව සාසන ප්‍රතිපත්ති පුරන්නය විවේක සර්වාරක්ෂාව ලැබේවා.

සාන්ත පියවරෙන් පාසා ගන්නා හොඳා ප්‍රාර්ථ දේලක් පසා හොඳා විනාඩියක් තත්පරයක් පාසා රත්නත්‍රය යන ආශීර්වාද ප්‍රවීස මහා ගුණයේ ශක්තිය සිව් සමිඳුන් සතර ඇට ඇටමිදුළු දක්වා විහිදි යමින් සාසන ප්‍රතිපත්ති දියුණුවට සර්වාරක්ෂාව ලැබේවා, කුසල් සිතින් සමාධි සිතින් මෙත් සිතින් ප්‍රඥා බලෙන් සිල්ගුණ බලෙන් සැමදා සැපසේ නිදායාවා සැපසේ අවදි වේවා, නපුරු සිහින නොපෙනේවා, දෙවියන්ගේ ප්‍රසාදය ලැබේවා, සැදැ-
දුන්ගේ ප්‍රසාදය ලැබේවා, මනුෂ්‍යයන්ගේ ප්‍රසාදය ලැබේවා, අමනුෂ්‍යයන්ගේ ප්‍රසාදය ලැබේවා, දෙවියන්ගේ ආරක්ෂාව ලැබේවා. රජුන්ගෙන් සොරුන්ගෙන් සතුරන්ගෙන් ගින්නෙන්

ජලයෙන් මනුෂ්‍යයන්ගෙන් අමනුෂ්‍යයන්ගෙන් වස විසෙන් අවි ආවුධයෙන් කඩිසර් ගත සතුරන්ගෙන් සීතලෙන් උෂ්ණයෙන් බඩගින්නෙන් පිපාසයෙන් මැසි මදුරුවන්ගෙන්, අව්ව වැසි සුළං විසකුරු සර්පාදීන්ගෙන්, වාතෙන් පිතෙන් සෙමෙන් තුන්දොසින් රෝගයෙන් ද්වේශයෙන් මෝහයෙන් උපක්ලේශයන්ගෙන් උපපීළක උපච්ඡේදක අකුසල විපාකයන්ගෙන් වියත් කැණගැටීමක් අන්තරාවක් සන්ත්‍රාසයක් රෝමෝද්ගමනයක් තිගැස්මක් පීඩාවක් ආයාසයක් විපතක් සිදුනොවී එක් කොට දී ගාථා ප්‍රත්‍යක්ෂ පිරිමේ ඵලදීය ආරක්ෂාව සැලසේවා. කාය චිත්ත පීඩාවක් නොවී කායික මානසික සුවාසිල්ලේ පරම පාරිහාර ලබ්ධිකර පූජිමට ශක්තිය ලැබේවා.

ලාභ අලාභ යස අයස නින්දා ප්‍රශංසා දුක සැප යන අටලෝ දහමින් කම්පා නොවන චිත්ත බලය චිත්ත ධෛර්යය චිත්ත සමාධිය චිත්ත ඒකාග්‍රතාව චිත්ත ධෛර්යය චිත්ත ශක්තිය ඇතිව බෝධි පාරිහාර පූජාවට ශක්තිය ලැබේවා.

දශ කසිණ සමාපත්ති දශ අසුභ සමාපත්ති ආනාපානසති සමාපත්ති කායගතාසති සමාපත්ති බ්‍රහ්මවිහාර සමාපත්ති අරූප සමාපත්ති දශාකාර උපචාර කර්මස්ථාන, චුද්දසාකාර චිත්ත පරිදමන අෂ්ට බල [illegible], සංඛාරුපෙක්ඛා ඥානය තෙක් විදර්ශනා ඥාන පෙළ ප්‍රගුණ කරගැනීමටත් [illegible] බුදුනටම පත්වී [illegible] [illegible] ගෙයන අශ්වමුඛ සලයවීන් බෝධි පාරිහාර පූජා ගැනීමේ ශක්තියත් ලැබේවා.

ශ්‍රද්ධාවෙන් ධන ශාසනයෙන් සම ඉසුරින් යුතු වර්ණයෙන් ආයුවර්ණ ශරීරබල ප්‍රඥාවෙන් ඉද්ධියෙන් ශීලයෙන් ශූරභාවයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් තේජසින් ධෛර්යයෙන් බහුශ්‍රැතභාවයෙන් පරාක්‍රම වීර්යයෙන් විමංසයෙන් ප්‍රඥාවෙන් ධ්‍යානයෙන් කළගුණ සැලකීමෙන් කෘතඥතා කෘතවේදීතාවේ මවුපිය උපාස්ථානයෙන් ත්‍රිවිධ පූජා ක්‍රියාවෙන් දශවිධ පූජා ක්‍රියා වස්තුවෙන් දශ කුසල සමාදානයෙන් සතර සතිපට්ඨානයෙන් සතර සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් සතර ඍද්ධිපාදයෙන් පඤ්ච ඉන්ද්‍රියෙන් පඤ්ච බලයෙන් සප්ත බොජ්ඣංගයෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් සතුටුබව විදර්ශනයෙන් සතර සංග්‍රහ වස්තුවෙන් දශ පාරමිතාවෙන් දශ උපපාරමිතාවෙන් දශ පරමාර්ථ පාරමිතාවෙන් ත්‍රිවිධ අර්ථ චර්යාවෙන් පඤ්චමහා පරිත්‍යාගයෙන් කරණීය ධර්මයන්ගෙන් මහා මංගල ධර්මයන්ගෙන් සියලු බුද්ධ කාරක ධර්මයන්ගෙන් පූර්වභාගයේ බුදු මණ්ඩලය මෙන් අනවම දීප්තිය පත්වීමට ලැබේවා.

ධර්මකාමාභිලාෂ රත්නයකින් මෙන් කල්පවෘක්ෂයකින් මෙන් සිතූ පැතයකින් මෙන් පූර්ණ චන්ද්‍රයාමෙන් සමස්ත ප්‍රාර්ථනා සියල්ල මගේ සිතේ සැණින් ම සමෘද්ධිමත් වේවා. මේ ජීවිතයේ ආයු ආරක්ෂාවෙන් අතරක් නැර ආරක්ෂිතව උතුර ලොව උත්කෘෂ්ට ලොව උත්කෘෂ්ටතර ලොව මෙලොව ජයග්‍රහණය පරලොව ජයග්‍රහණය සසර ජයග්‍රහණය නිර්වාණ ජයග්‍රහණය ආත්ම විජයග්‍රහණය සියලු

බෝධිසත්වකුමාර වඩින් ගර්භයේ ගතකළ දෙවිසිය විසිය ආරක්ෂාව ආශ්චර්යය රත්නත්‍රයානුභාව බලයෙන් ලැබේවා. මාගේ එක මෙවැනි මහපොළොවක් වුව වේවා. මෙවැනි පර්වතයක් වුව වේවා. මෙවැනි ආලෝකයක් වුව වේවා. මෙවැනි මහවනයක් වුව වේවා. මෙවැනි ගංගාවක් වුව වේවා. මෙවැනි සමුදුරක් වුව වේවා. මෙවැනි මහමෙරක් වුව වේවා. මෙවැනි අවකාශයක් වුව වේවා. මෙවැනි ඉරුමඩලක් වුව වේවා. මෙවැනි සඳමඩලක් වුව වේවා. සිවුමහ විනාශයට මඩකලයක් වුව වේවා. සියලු ලදාකාරණ වඩියන්ට මහපොළොව මෙන් ප්‍රත්‍යක්ෂකාර වේවා.

සසර වසන තුරු නරකාදි සතර අපායෝත්පත්තියෙන් ද ත්‍රිවිධ සත්ව විනාශයෙන් ද අසූ දෙසූ රෝගයෙන් ද පඤ්චවිධ අන්තරායන් ද සදහටම අහෝසි වී පාරමී පුරාගැනීමට ජාති ජාතීන් ලැබේවා. ස්ත්‍රී පණ්ඩකාදි භාවයෙන් ද අහේතුක ද්විහේතුක ප්‍රතිසන්ධියෙන් ද අසඤ්ඤතල අරූපතල උත්පත්තියෙන් ද සිව සත්වල උත්පත්තියෙන් ද පවිත්‍රර්ශයෙන් සදහටම අහෝසි කරවී ඉතා පාරමී පුරාගැනීමට ලැබේවා.

සසර වසන තුරු සක්විති රාජ්‍යය කරවමින් ද සිවුපස දුක් නැති කුසලයෙන් ද බත්පැන් සුර පානයෙන් ද බත් ගංග භාග්‍යයෙන් ද භාවිත සම්පත්තියෙන් ද භවතේජෝ සම්පත්තියෙන් ද භව දීර්ඝායු සම්පත්තියෙන් ද භව ශ්‍රී සම්පත්තියෙන් ද භව පුණ්‍ය සම්පත්තියෙන් ද

සම්පූර්ණයෙන් සදහටම අත්හැරදී පාරමී පුරා ගැනීමට ලැබේවා.
කාමරාග කාමච්ඡන්ද කාමාශා කාමක්ලේශ කාමතෘෂ්ණා කාම පිපාසා
කාමසන්තාප කාමපරිදාහයන්ගෙන්ද සම්පූර්ණයෙන් සදහටම අත්හැරදී
පාරමී පුරාගැනීමට ලැබේවා. අසංඛ්‍යා විශාල ක්‍රෝධ උපනාහ
මක්ඛ පලාස ඊර්ෂ්‍යා මාත්සර්ය මායා සාඨෙය්‍ය ථම්භ සාරම්භ
මාන අතිමාන මද ප්‍රමාද සන්දිට්ඨි පරාමාස ආදානගාහ දුප්පටි-
නිස්සග්ගිතා පඤ්ච නීවරණ පඤ්ච චේතොඛිල පඤ්චචේතසො
විනිබන්ධ සමිච්ඡාද ඛිලාදී පාපධර්මයන්ගෙන් බාධාවක්
නොවී පාරමී පුරාගැනීමට ලැබේවා.

ක්ලේශ මාර ස්කන්ධමාර අභිසංස්කාරමාර
දේවපුත්‍රමාර මච්චුමාර නම් වූ පඤ්චමාර බලවේගයන්ගේ බාධාවක්
නොවී පාරමී පුරාගැනීමට ලැබේවා. පණ්ඩක නපුංසක
උභතෝව්‍යඤ්ජනක අංගවිකල ආදී බව බූස උත්පත්තිකාක
මෙබඳු දුෂ්කර අසාමාන්‍ය කාලවල සම්පූර්ණයෙන් අත්හැරදී
පාරමී පුරාගැනීමට ලැබේවා.

සසර වසන තුළ සිදු ආත්මභාවයකට පමණක්
උතුම් පුද්ගලාත්මභාවයෙහිම සිටිමින් නොවී ලබමින් පුරා ගැනීමට ලැබේවා.
ත්‍රිරත්න ප්‍රසාදයන්ගෙන් ඉතිහාසියට කුශලය සම්බන්ධ දර්ශනීය ඇසුර
උපදිමින්, සත්පුරුෂ සංසේවනය සද්ධර්මශ්‍රවණය යෝනිසෝමනසි-
කාරය ධර්මානුධර්ම ප්‍රතිපත්ති ඇසුර සම්බන්ධ භාෂා ආයුෂ්මත්
සතර බල පුහුණුවෙන් ද, ශ්‍රද්ධාශීල ශූර කාරුණික කුසල් කරන ඵලකම්ව
බහුශ්‍රැත භාව පරාක්‍රම වීර්ය ඒකාන්ත පුණ්‍ය බලසම්පන්නයන්ගෙන්ද

කළගුණ සැලකීම මවුපිය උපස්ථාන ත්‍රිවිධ පුණ්‍යක්‍රියා දශපුණ්‍යක්‍රියා
දශ කුසල සමාදානයෙන් ද සතර සතිපට්ඨාන සතර සම්‍යක්ප්‍රධාන වීර්‍යය
සතර සෘද්ධිපාද පංචඉන්ද්‍රිය පංචබල සප්ත බොජ්ඣංග ආර්ය අෂ්ට-
ාංගික මාර්ග ධර්මයන්ගෙන් ද සතර බඹ විහරණයෙන් ද සතර
සංග්‍රහ වස්තූන්ගෙන් ද දශපාරමිතා දශ උපපාරමිතා දශ පරමත්ථ
පාරමිතාවන්ගෙන් ද ත්‍රිවිධ [illegible] පංචමහා පරිත්‍යාග කරමින්
ධර්ම මහාමංගල ධර්ම සියලු බුද්ධකාරක ධර්මයන්ගෙන් ද
පෙරුම් පදම් මේ දියුණුවීමට ලැබේවා.

මතු බුදුවන මෛත්‍රී බුදුන් [illegible] කාලයේ දී
මනුලොව කේතුමතී රාජධානියෙහි ඉපිද ප්‍රථම [illegible] බුදු සසුනට
උතුර ලොව [illegible] සංග්‍රහ කොට පැවිදි උපසම්පදා ලබා
ත්‍රිපිටකධාරීව [illegible] සමාපත්ති ලබා මතු බුදුවනවට
නියත විවරණ ලබාගැනීමට වාසනා වේවා. [illegible]
ලොව පහළවන තාක් බුදුවරුන් [illegible]
[illegible] උපයෝග [illegible]
පැවිදි උපසම්පදා ලබා නියත විවරණ ලබාගැනීමට [illegible]
වාසනා වේවා.

ඉමිනා පුඤ්ඤකම්මේන - යාව පප්පෝමි නිබ්බුතිං,
තාව සද්ධාදි සම්පන්නෝ - අලීන විරියෝ සදා,

මේ කුසල කර්මයෙන් යම් දිනක නිවන් සුවයට පත් වන්නේ ද ඒ තාක් සැම කල්හි මන්දෝත්සාහී නොවී ශ්‍රද්ධා වීර්ය ගුණෙන් යුතු වේවා!

ඉත්ථි භාවා විනිමුත්තො - අට්ඨ දුට්ඨක්ඛණෙහි ච,
භාවෙය්‍යාහං අප්පමත්තො - සත්තවීස මදෙහි ච,

ස්ත්‍රී ආත්ම භාවයන් ගෙන් ද කුසල් දම් වැඩීමට අවකාශ නැති අෂ්ට දුෂ්ටක්ෂණයෙන් ද විසිහත් වැදෑරුම් මදයන්ගෙන් ද මිදී සැම විට අප්‍රමාදී වෙම්වා!

න කරෙය්‍යං න කාරෙය්‍යං - න චින්තෙය්‍යං කුදාචිපි,
පාපකං අප්පමත්තම්පි - දුක්ඛං වා සබ්බපාණිනං.

සියලු ප්‍රාණීන්ට කිසිකලෙක අල්ප මාත්‍ර පවක් හෝ දුකක් හෝ නොකරමි. නොකරවන්නෙමි. නොසිතන්නෙමි.

පාපමිත්තෙ න සෙවෙය්‍යං - සෙවෙය්‍යං සප්පුරිසෙ සදා,
රාගදෝසාදයෝ දෝසා - තනුභූතා භවන්තු මෙ.

පාප මිත්‍රයන් සේවනය නොකෙරෙම්වා! සත්පුරුෂ උතුමන් සැමද සේවනය කෙරෙම්වා! මාගේ සියලු රාග ද්වේශ ආදී කෙලෙස් තුනී වෙත්වා!

සක්කෙය්‍යං බොද්ධුං බොධෙතුං - ධම්මං බුද්ධෙන දෙසිතං,
සද්ධ ජාතිස්සරං ඤාණං - ලභෙය්‍යං ජාති ජාතියං,

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර වදාළ අවබෝධ කළ යුතු ධර්මය අවබෝධ කරගැනීමට අන්‍යයන්ට අවබෝධ කරවීමට සමත් වෙම්වා! ජාති ජාතිත් අතීත අනාගත ජාතිස්මරණඥානය ලබම්වා!

යදාච ලොකෙ මෙත්තෙය්‍යො - සබ්බඤ්ඤුප්පත්ති භව තදා,

සක්කරිත්වා පූජයිත්වා - සසද්ධම්මං සසාවකං,

යම් කලෙක මෛත්‍රී සර්වඥරාජයන් වහන්සේ ලෝකයේ පහළවෙත් ද එකල ඒ බුදුරජාණන් වහන්සේට ද ධර්ම රත්නයට ද සංඝ රත්නයට ද පූජා සත්කාර කොට,

බුද්ධත්ත කාරකෙ ධම්මෙ - සම්පූරෙත්වා අසෙසතො,

අහම්පි සම්මා සම්බුද්ධො - භවිස්සාමි අනාගතෙ.

බුද්ධකාරක ධර්ම ඉතිරියක් නැතිව සම්පූර්ණ කොට මම ද අනාගතයෙහි සම්මා සම්බුද්ධත්වයට පත් වෙමි.

තාව භවෙ සංසරන්තො - යාව නිබ්බාන පත්තියා,

ජාතිස්සරඤ් ඤාණෙන - තිහෙතු පටිසන්ධිකො.

නිවන් දක්නා තුරු යම් තාක් භවයක් භවයක් පාසා සසර සැරිසරන්නේ වේද ඒ හැම කල්හි ත්‍රිහේතුක ප්‍රතිසන්ධියෙන් යුතු වූයේ ද ජාතිස්මරණඥානයෙන් යුතු වූයේ ද වෙම්වා!

උප්පන්නුප්පන්න බුද්ධෙසු - පූරෙත්වා සබ්බ පාරමී,

දීපංකරො විය සම්බුද්ධො - භවිතා ලොකනායකො,

පහළ වන සියලු බුදුරජාණන් වහන්සේලා කෙරෙහි සියලු පාරමී පුරා දීපංකර බුදුරජාණන් වහන්සේ මෙන් ලෝක නායකයන් වහන්සේ නමක් වී,

සංසාරේ සංසරන්තානං - සත්තානං හිතමාවහං,

ධම්මනාවාය තෙ නෙත්වා - තාරයිස්සං භවණ්ණවා.

සසර සැරිසරන සත්වයන්ට යහපත සලසමින්, ඔවුන් දහම් නැවෙන් ගෙන ගොස් සසර සාගරයෙන් එතෙර කරවන්නෙමි.

බුද්ධානං බොධයිස්සාමි - මුත්තානං මොචයෙ පරෙ,

තිණ්ණානං තාරයිස්සාමි - සංසාරොඝා මහබ්භයා.

—

මම චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්නෙමි, අන්‍යයන්ටද අවබෝධ කරවන්නෙමි.

මම සියළු පාපයන්ගෙන්ද සියලු දුකින්ද මිදෙන්නෙමි අන්‍යයන් ද සියලු පාපයන්ගෙන් සියලු දුකින් මුදවන්නෙමි

මම භයජනක සංසාර සාගරයෙන් එතරවන්නෙමි අන්‍යයන් ද භයජනක සංසාර සාගරයෙන් එතරකරවන්නෙමි

ආත්මය දමනය කළාවූ සැම දෙනා අතුරෙන් මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ අග්‍රය ශ්‍රේෂ්ඨය උත්තමය.

ජීවිත පරිත්‍යාග කළාවූ පරිත්‍යාගීන් සැමදෙනා අතුරෙන් ද ලොව ඇත්තවූ අවබෝධ කළාවූ මහා ප්‍රාඥයන් සැමදෙනා අතුරෙන්ද මාගේ ස්වාමිවූ බුදුරජාණන් වහන්සේ අග්‍රය ශ්‍රේෂ්ඨය උත්තමය.

දෙවියන් සහිත ලෝකවාසීන් පුදුමවීන් වන්දනාවට පත් කළාවූ මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේගේ ඒ උතුම් බුද්ධාලෝකයෙන් මාගේ සිත ආලෝක වේවා.

කරුණාවෙන් සීතලවූ ළයක් ඇති මාගේ ජීවිතය වූ බුදුරජාණන් වහන්සේගේ ඒ උතුම් සිල් සෙවනෙහි ජීවත් වීමේ භාග්‍යය මටත් ලැබේවා.

දසබිම්බරක් මාර සේනාව පරාජය කළා වූ මාගේ ජීවිතය වූ බුදුරජාණන් වහන්සේගේ ඒ උතුම් බලය මාගේ හිත පුරාවටම වත් කෙරේවා.

දෙවියන් සහිත සකල ලෝක වාසීන්ගේ යහපත සඳහා ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කළාවූ මාගේ ජීවිතය වූ බුදුරජාණන් වහන්සේගේ ඒ උතුම් පරිත්‍යාගය මටත් ලැබේවා.

සියලු ලොවේ යහපත සලසා වදාළ මාගේ ජීවිතය වූ බුදුරජාණන් වහන්සේට මාගේ ජීවිතය පූජා කරමි. පූජා වේවා.

මම නිදුක් වෙම්වා, නිරෝග වෙම්වා, සුවපත් වෙම්වා. මා මෙන් සියලු සත්වයෝ ද නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා.

කිසිවෙකු, කිසිවෙකුට වෛර නොකෙරේවා. ක්‍රෝධ නොකෙරේවා. හිංසා නොකෙරේවා. සියලු දෙනාම සියලු දෙනාගේ සුවයට කැමති වෙත්.

සියලු දෙනාම පරම ශ්‍රේෂ්ඨ ශාන්ත ලක්ෂණ වූ නිර්වාණ සම්පත්තිය ලැබේවා.

සාධු! සාධු! සාධු!

(ලියා තබනු දිනය 2002. 03. 01.)

කල්තොට සුසිරිද සෝමවංශ හිමියන් ජිනාලය කොටිආරාමයේ මහානායකන්ගේ කාරුණික ආරාධනය පරිදි මෙය ලියා තැබීමි.

අනගොපයෝජිත කොරවූ මේ ජීවිත සටහන් පෙළ මාගේ ආත්ම කථනයකි. මෙහි සටහන් නොවූ තවත් බොහෝ කරුණු ඇතත් ඇතැම් ආබාධයන් ඇතිව අපහසුතාවයන් සිටත් ලියා ලූ මේ සටහන් පෙළ බොහෝ දවසක් තිස්සේ ටිකෙන් ටික ලියා ඇත. තවත් ඉදිරියට අවශ්‍ය වුවහොත් ලිවීමට ඉඩ තබාගනිමි.

මේ ප්‍රාර්ථනාව මා ජීවත්ව සිටින තුරු පවතීවා නොකරන ලෙස ජිනවත් සැමට මෙයින් ආරාධනා කරමි.

බුදු ප්‍රාර්ථනාවක් වන මෙය කියවන සැමටද මා රැස්කළ විවිධාකාර පුණ්‍ය සම්භාරයෙ අනුමෝදේවා. මෙවැනි පුණ්‍ය චාරිකාවක් වුවත් අවශ්‍ය කරන විවේකයට හාස්‍යයට ලක්කරන කොතෙක් අවතොත් ඒ සැමටත් සමත්මග පිළිවෙත් මෙන් නිවන සම්පත් කරවී.

මා හඳුනාගත් ඥාතීන් මිතුරු දෙදෙනාට මතු බුදු බවට අත් වේවා.

මාගේ ආචාර්ය උපාධ්‍යායාදී කල්‍යාණමිත්‍ර මහණ්‍ ... මෙන් මේ ලෝකට මතු බුදුසිව අත් වේවා.

මාගේ සබ්‍රහ්මචාරීන් වහන්සේලාට, සහෝදර සහෝදරියන් සහ සහලේ ඥාතීනට, හිතෛෂී දායක දායිකා මවුපිය දූදරුවනට, ලෝක ශාසන ආරක්ෂක සියලු දෙවියන්ට, සතොසත මුදුනත් සියලු ලෝවැසියනට පැතූ උතුම් බෝධියෙන් අමාමහ නිවන් සුව අත්වේවා.

"ඉදං මේ පුඤ්ඤකම්මං ආසවක්ඛයාවහං හෝතු සබ්බ දුක්ඛා පමුච්චතු."



පූජනීය නා උයනේ අප මාහිමිපාණන් වහන්සේ තම සාසනික ජීවිත ගමන පිළිබඳ ලියන ලද විස්තරය නිමාවට පත් වෙනවා. එම සටහන් පෙළ කියවීමේ පහසුව සඳහා අපැහැදිලි තැන් සකස් කර එය නා උයනේ මාහිමිපාණන් වහන්සේ සටහන් කර ඇති පරිදි දක්වෙනවා. 2002 සිට 2012 දක්වා වූ කාලය තුළ සාසනික කටයුතු පිළිබඳ තවත් සංක්ෂිප්ත විස්තරයක් "අභිනව සටහන්" නමින් ද එම ලිඛිත සටහන් අතර දක්වා තිබෙනවා.

එසේම බුරුම රට වැඩ සිටිමින් පා ඕ භාවනා මාර්ගය ප්‍රගුණ කළ අවස්ථාවන්හිදී කරන ලද සුවිශේෂ සටහන් පෙළක් ද මාහිමිපාණන් වහන්සේගේ අත් අකුරින් ම තිබෙනවා. ඒ 1996 - 1997 - 2001 - 2010 යන වසර වලදී බුරුමයේ පා ඕ ආරණ්‍යයේ වැඩ සිටි වාර 5 තුළයි. වස් කාල 3 ක් සමගින් වූ එම වාර 5 තුළදීම ඉතාමත් ගැඹුරු ලෙස මෙම භාවනා මාර්ගය දියුණු කර තිබෙනවා. එසේ වඩන ලද භාවනා මාර්ගය පිළිබඳව කරන ලද සටහන් තුළින් ඒ ඒ භාවනාවන්ට අදාළ තෝරාගත් උධෘතයන් ඉදිරිපත් කරමින් එම භාවනා අත්දැකීම් පිළිබඳව කෙටි - සරල විස්තරයක් ද මෙහි දක්වෙනවා.

පූජනීය අප ආචාර්යෝත්තම මාහිමිපාණන් වහන්සේගේ මෙම චරිත විස්තරය අති දුර්ලභ වූවක්. මෙබඳු ජීවිත පිළිබඳව ඇසීමට ලැබීම සුලභ දෙයක් නොවේ. පූජනීය මාහිමිපාණන් වහන්සේ ආරාධනාවකට අනුව හෝ තම ජීවන තොරතුරු මෙසේ සටහන් කර තැබීම බොහෝ පැවිදි - ගිහි පිරිසකගේ යහපත පිණිස උපකාරයක් වී තිබෙනවා. වත්මනෙහි මාහිමිපාණන් වහන්සේගේ ජීවිතය පරමාදර්ශී පැවිදි ජීවිතයක් සම්බුද්ධ සාසනයක් ඇසුරු

කරගනිමින් ඉන් නියම ප්‍රතිඵල ලබාගෙන සැනසීම උදාකරගන්නා ආකාරය මෙමගින් මනාව ඉස්මතුව පෙනෙනවා. ඒ වෙනුවෙන් උත්සුක වන ඕනෑම කෙනෙකුන් හට මේ උතුම් ජීවිත ගමනක පියසටහන ද උපයෝගී කරගන්න පුළුවන්. ඒ සඳහායි මාහිමිපාණන් වහන්සේ ද මේ වටිනා තොරතුරු සටහන් කර ඇත්තේ.

ඉහතින් සඳහන් කළ භාවනා විස්තරය මෙතැන් සිට ඉදිරිපත් කෙරෙනවා. ඒ පූජනීය මාහිමිපාණන් වහන්සේ එා ඔෟ භාවනා මාර්ගය ප්‍රගුණ කළ ආකාරයත්, එහිදී ලැබූ විවිධ අත්දැකීම් පිළිබඳවත් වූ තොරතුරු ය. ඒ සමගම මාහිමිපාණන් වහන්සේගේ ජීවිතයේ අප දුටු විශේෂ කරුණු කීපයක් ද එක් කොට තිබෙනවා.

**"ලංකාවෙන් පැමිණි භාවනා යෝගීන් අතරින් මා දන්නා සියලු භාවනා එපරිද්දෙන්ම ප්‍රගුණ කළ හැකි වූ එකම කෙනා නා උයනේ අරියධම්ම ස්ථවිරයෝ පමණි."**

**(බුරුම රට මොලමියන් නුවර එා ඔෟ භාවනා මධ්‍යස්ථානාධිපති, අග්ගමහා පණ්ඩිත, අග්ගමහාකම්මට්ඨානාචාරිය අතිපූජනීය එා ඔෟ ආචිණ්ණ සෙයාඩෝ මහා ස්වාමීන් වහන්සේ.)**

# පෙරුම්දම් සලකුණු

අනවරාග්‍ර වූ සසර ගමන තුළ චතුරාර්ය සත්‍ය, පටිච්ච සමුප්පාද ධර්මය පිරිසිඳ අවබෝධ නොකිරීම හේතුවෙන් මා මෙන් සියලු සත්වයාත් අපමණ කලක් සසර ඇවිද්ද බව බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළහ. ජාති ආදී වූ අනන්ත දුක් විඳිමින් අපමණ කලක් සසර ඇවිදීමට හේතුව ඉන් පැහැදිලි වෙනවා. සසර දුක නිවාලීමට නම් මේ ධර්මය අවබෝධ කරගන්න ඕන.

අපහට සිතීමටවත් නොහැකි තරම් වූ අපමණ දුක් විඳ සමතිංසත් පාරමී සපුරා සම්මා සම්බුද්ධත්වයට පත් වූ මහාකාරුණික වූ බුදුරජාණන් වහන්සේලා ඉතා දුර්ලභව පහළ වෙලා සිදුකරන අතිඋතුම්ම දේ සසර දුක නිවාලන සැබෑ ධර්ම මාර්ගය ලෝකයට පෙන්වා දීම. ඒ මාර්ගය පෙන්වාදීල සත්වයාගෙන් බලාපොරොත්තු වන්නේ ඒ තිලෝගුරු බුදුරජාණන් වහන්සේලා වෙනුවෙන් නානාවිධ වූ පූජා සත්කාර සම්මාන සිදු කිරීම නොවෙයි. පිරූ අනන්ත පාරමී නිසා ලැබෙන ඒ අනන්ත පූජා සත්කාර කාටවත් වළක්වන්න බෑ. ඒත් සර්වඥයන් වහන්සේලාගේ අභිලාෂය වන්නේ ඒ අතිදුර්ලභව ලැබුනු ධර්මය අනුගමනය කරලා සත්වයෝ වහ වහා සසර දුකින් එතෙර වෙනවා දැකීම. ධම්මාරාම මහ රහතන් වහන්සේගේ කථා පුවතින් මෙන්ම බුදුරජාණන් වහන්සේගේ උතුම් දින චරියාව තුළින් ද එය හොඳට පැහැදිලි වෙනවා. ඒ නිසා අපි නිවන් දකින අරමුණෙන් ම ධර්මය අනුගමනය කරන්න, ධර්මයෙහි හැසිරෙන්න ඕන.

දෙව් ලොව ඉපදුණ ද - මනුලොව ඉපදුණ ද හැම සත්වයාට ම, හැම කල්හි ම එම ධර්මය ඇසීමට, පුරුදු පුහුණු කිරීමට ඉඩ ප්‍රස්ථාව වගේම උතුම් ධර්මය ද ලැබෙන්නේ නෑ. ඒ සඳහා හේතු සම්පත් තියෙන්නත් ඕන. සත්වයාගේ අකුසල කර්ම ශක්තියෙහි බලවත් බව හේතුවෙන් විටෙක දුලබ වූ ශාසන සම්පත්තිය ලැබුවත් ඉන් ඵල නෙලා ගැනීමේ අවස්ථාව ද අහිමි වෙනවා.

පූජනීය නා උයනේ මාහිමිපාණන් වහන්සේ දුර - ඈත සංසාරයෙහි පටන් ප්‍රාර්ථනා සහිතව පාරමී ධර්ම මුදුන්පත් කරමින් පැමිණෙන මහෝත්තම ජීවිතයක්. පුණ්‍ය ජීවිතයක්. මෙත් - කරුණා - මුදිතා - උපේක්ෂා සිව් බ්‍රහ්ම විහාරයන්ගෙන් සුපෝෂිත වූ ජීවිතයක්. තමන් වහන්සේත් ලෝක සත්වයාත් අතර වෙනසක් නොවූ තරමේ සමානාත්මතාවයෙන්, කරුණාවෙන්, උපේක්ෂාවෙන් පිරි බෝසත් ජීවිතයක්. උතුම් ධර්මය අනුගමනය කරන උතුමන් අතර බුදු බව පතන මෙබඳු බෝසතාණන් වහන්සේලා ම ප්‍රධාන වෙනවා.

- ☸ නෙක්ඛම්මයෙහි අදහස් ඇති බෝධිසත්වයෝ පස්කම් සැප සහිත ගෘහ වාසයෙහි දෙස් දකිනවා.
- ☸ අලෝභ අදහස් ඇති බෝධිසත්වයෝ ලෝභයෙහි දෙස් දකිනවා.
- ☸ අද්වේශ අදහස් ඇති බෝධිසත්වයෝ ද්වේශයෙහි දෙස් දකිනවා.
- ☸ අමෝහ අදහස් ඇති බෝධිසත්වයෝ මෝහයෙහි දෙස් දකිනවා.
- ☸ උතුම් විවේකයෙහි අදහස් ඇති බෝධිසත්වයෝ නිතර පිරිස් හා එක්ව වාසය කිරීමෙහි දෙස් දකිනවා.

☸ සියල්ලෙන් මිදීමේ අදහස් ඇති බෝධිසත්වයෝ ත්‍රිවිධ භවයන්හි පස් ආකාර ගතීන්හි  දෙස් දකිනවා.

මේ වගේ අධ්‍යාශ සයකින් යුතුවයි ලෝකෝත්තර මාර්ගයෙහි පාරමී මුදුන්පත් කරමින් බෝධිසත්වයන් වහන්සේලා ගමන් කරන්නේ. පූජනීය මාහිමිපාණන් වහන්සේත් එම උතුම් අධ්‍යාශයන්ට අනුව තම පාරමී ධර්ම සම්භාරය සැබෑ ලෙස ම පරිපූර්ණ කළා.

පෙර සසරෙහි දී කරන ලද බලවත් පුරුදු පුහුණුව හේතුවෙන් ම පූජනීය ස්වාමීන් වහන්සේට ඇසූ - දුටුවන් මවිත කරවන ධාරණ ශක්තියක් තිබුණා. ත්‍රිපිටකය කටපාඩමින් දරමින් අනෙකුත් සංගෘහිත ග්‍රන්ථයන් පිළිබඳ හසළ අවබෝධයකින් ද යුතුව පර්යාප්ති ධර්මයෙහි මුදුන් මල්කඩ ලෙස වැජඹුණා. ළදරු අවදියේ තම නිවසේදී ම බ්‍රහ්මචරිය ආජීව අෂ්ටමක සීලය සමාදන් ව මෛත්‍රී භාවනාව වැඩීමෙන් ඇරඹූ උතුම් ප්‍රතිපත්ති මාර්ගය ඉහළට ම ප්‍රගුණ කිරීමෙන් ලොව්තුරු දහමෙහි වූ සාන්දෘෂ්ටික ගුණය වත්මනෙහි ද සැබෑ ම බව ලෝකයා වෙත මනාව පෙන්වා දුන්නා.

පූජනීය මාහිමිපාණන් වහන්සේ  ප්‍රගුණ කළ එම භාවනා ප්‍රතිපත්ති මාර්ගය පිළිබඳව අප මාහිමිපාණන් වහන්සේම පහත පරිදි විස්තර කර තිබෙනවා.





# මාහිමිපාණන් වහන්සේ වැඩූ භාවනා ක්‍රම

## ☸ බුදුගුණ භාවනාව

"භාවනා ගැන කියන්න තියෙනවා ගොඩාක් කරුණු. ඒ සියල්ලම විස්තර කරන්න කාලය මදි. මම මගේ වයස නවයෙදිනෙ සිල් සමාදන් වෙන්න පටන් ගත්තෙ. තුනේ පංතියේදි. ඒ කාලයේ මගේ අම්මගෙ අම්මා - කිරි අම්මා කියලා දුන්නා 'ඉතිපි සෝ' පාඨය නිතර කියවන්න. තේරුම මුකුත් දන්නෙ නෑ. මම ඉතින් 'ඉතිපි සො' පාඨය පුරවනවා. මට නව ගුණ වැලකුත් දුන්නා. ගණන් කරන්න කියලා. ඒ පුරුද්ද අද දක්වා ම තියෙනවා.

මම උපසම්පදා වී දෙවෙනි අවුරුද්දේ, එනම් 1960 පෙබරවාරි 4 වෙනිදා මහෝපාධ්‍යාය ස්වාමීන් වහන්සේ, පණ්ඩිත ස්වාමීන් වහන්සේ ප්‍රධාන සංඝ පිතෘන් වහන්සේලා දස නමක් පමණ දඹදිව වැඩියා. ආපසු වඩින ගමනේ දී බුද්ධගයාවෙන් සඳුන් හරයෙන් හැදුව නව ගුණ වැල් අප වැනි සිසු දරුවන්ට ගෙනාවා. ඒ කාලයේ මාතර පුහුල්වැල්ලේ රෝහණ යෝගාශ්‍රම මධ්‍යස්ථානයෙහි ඉගෙනීමේ යෙදී සිටි නවක උපසම්පන්න පැවිද්දෙකු වූ මට පණ්ඩිත ස්වාමීන් වහන්සේ සඳුන් නව ගුණ වැලක් දුන්නා. 'ඉතිපි සෝ පාඨයෙන් ලක්ෂ වාරයක් පුරවන්න' කියලා අනුශාසනා කළා. දිනපතා තුන්සියයක් පමණ බුදුගුණ වාර පුරවමින් ඉගෙනීමේ යෙදී සිටි මම 1964 ජූලි 4 වෙනිදා බුදුගුණ ලක්ෂ වාරය පුරවා නිම කළා. 1961 දී නිමලව ආරණ්‍යයේ දී මහා පිංකමක් තිබුණා. යෝගාශ්‍රම සංස්ථාවට දස වස් පිරීම නිමිත්තෙන්. ඒ පිංකමට වැඩි රුවන්ගිරියේ

ලොකු ස්වාමීන් වහන්සේට ආසන පනවා තිබුණේ මහ ගල්ලෙනෙහි. ඒ ඇඳ ළඟ ම මම සිටි බැවින් භාවනා ගැන වටිනා උපදෙස් අසා දැන ගත්තා. විශේෂයෙන් 'ඉතිපි සො' පාඨය භාවනාවට නගන ආකාරය අසා ගත්තා.

### ☸ මෛත්‍රී භාවනාව

දැන් නැවත කුඩා කාලයට හැරෙමු. නා උයන ආරණ්‍යය බිහි වුනාට පස්සේ අපට ලැබුණනේ භාවනා පොත්. බුද්ධ ජයන්තියට ආසන්න කාලයේ ලැබුණා අතුලවංස කියන ස්වාමීන් වහන්සේ ලියපු මෛත්‍රී භාවනා පොතක්. සම්පූර්ණයෙන් පාළියෙන් තිබුණේ. දස දිශාවට, සියලු සත්ව කොට්ඨාශ වලට මෛත්‍රී කරන හැටි. ඒක මම පාඩම් කරගත්තා. ඒ කාලයේ මම නා උයන ආරණ්‍යයට ගිහිල්ලා පොහොයට අටසිල් සමාදන් වෙන්න පුරුදු වුනාට පස්සේ බ්‍රහ්මචර්‍ය්‍යා ආජීව අෂ්ටමක ශීලය නිත්‍ය වශයෙන් ම සමාදන් වුණා. මම වයස 15 දී පමණ බද්ධ පර්යංකයෙන් වාඩිවෙන්න පුරුදු වුණා. මහෝපාධ්‍යාය මාතර ස්වාමීන් වහන්සේගේ භාවනා පොතකින් තමයි බද්ධ පර්යංකය පුරුදු වුණේ. පැය භාගයක් මට බද්ධ පර්යංකයෙන් ඉන්න පුළුවන් වුණා. ඉතින් මම හැමදම රාත්‍රී කෑමෙන් පස්සේ පාඩම් කරලා, නිදා ගන්නේ වෙනම කාමරයක. කාමරයේ ඇඳේ බද්ධ පර්යංකයෙන් වාඩිවෙලා බ්‍රහ්මචර්‍ය්‍යා ආජීව අෂ්ටමක ශීලය සමාදන් වෙලා කරණීය මෙත්ත සූත්‍රය කියලා අර පොතේ තියෙන මෛත්‍රී භාවනාව කළා. විනාඩි 10 ක් 15 ක් යනකොට මම ඉතින් අහසේ ඉන්නවා වගේ.

ඇඳේ ඉන්නවා කියලා දැනෙන්නේ නෑ. ඇහැ පියාගෙන ඉන්නේ වටේට හඳ එළිය වගේ. ඉතින් ඒක

කරලා දන්නෙත් එච්චරයි. පැය භාගයෙන් පසු නිදා ගන්නවා. පාන්දර 5.00 ට අවදි වෙන්න මම හැමදාම ඔරලෝසුවේ සීනුව තියා ගන්නවා. 5.00 ට සීනුව වදින්න ළං වෙනකොට මට ඉබේම අවදි වෙනවා. අතක් පයක් වත් හෙලවිලා නෑ. දඟලන වයසනෙ. නමුත් එහෙම නෑ. ඇඳේ ඇතිරිල්ලවත් වෙනස් වෙලා නෑ. ඉතින් පසුවදා හරිම ප්‍රීතිමත් විදියට ගත කරනවා. ඔය විදියට කුඩා කාලයේ භාවනා පුහුණු වුණා. මෛත්‍රී භාවනාව තමයි එදා භාවනා වශයෙන් කෙරුණේ. අනික් වෙලාවට කරණීය මෙත්ත සූත්‍රය සජ්ඣායනා කරනවා. පිරිත් පොතේ පාඩම් තියෙන පිරිත් කියවනවා. ධම්ම පදයේ ගාථා කියවනවා. <u>පියතුමා භාවිතා කරන පොත්පත් ඉඳහිට බලනවා. එතුමා භාවිතා කරනවා විශුද්ධි මාර්ගය, උපාසක ජනාලංකාරය, විදර්ශනා භාවනා පොත</u>. එහිදී විශුද්ධි මාර්ගය කියවන කොට, පියතුමා ඒ ගැන කරන සාකච්ඡා අහගෙන ඉන්න කොට මට හිතුනා, මේවා අපට කරන්න පුළුවන්නේ කියලා. එහෙම ඉන්න අතරේ තමයි භාවනා ආනිසංස දැකලා පැවිදි වීමේ ඡන්දය මතු වුණේ. ඉතින් ඒ කාලයේ පහළ වුණු අදහස ස්ථාවර වුණා.

## ☸ මහා සී භාවනා ක්‍රමය, ආනාපාන සතිය

අනතුරුව පැවිද්දට යොමුවී පණ්ඩුපලාස උපාසක කාලයේ හිටියේ බෝධිරක්ඛිත ස්වාමීන් වහන්සේගේ ගමේනෙ. එහිදී මහා සී භාවනා ක්‍රමයත් (උදරය පිම්බීම - හැකිළීම පිළිබඳ සිහිය පිහිටුවීම), ආනාපාන සතියත් පුහුණු වුණා. හොඳට සිහිය පිහිටුවා ගන්න හැකි වුණා. ඒ භාවනා ක්‍රම දෙක ම පුරුදු වෙලා පැයක් විතර සමාධියෙන් ඉන්න

පුළුවන් වුණා. සමූහ භාවනා පැයේ දී බෝධිරක්ඛිත ස්වාමීන් වහන්සේ වෙලාව බලාගෙන ඉන්නවා. භාවනාව අවසන් කරන්න ස්වාමීන් වහන්සේ දැන්වීමට කලින් මම ඇස් ඇර බලනවා. බලන කොට වෙලාව හරි. ස්වාමීන් වහන්සේ මගෙන් අහනවා 'කොහොමද වෙලාව බලාගත්තේ කියලා'. මම කිව්වා 'මට හිතුණා' කියලා. ඒ පණ්ඩුපලාස කාලයේ දී විගොඩ අපි සිටි තැන බණක් කියන්න ඕනෙ කිව්වා. සැන්දෑවේ රැස් වූ පිරිසට ඉරියව්වවත් මාරු නොකර එක හඬින් පැයක් බණ කිව්වා. හැමෝම ස්තුති කළා. ඒ දුරුතු පෝය දවසක. තව දවසක් දසසිල් කාලයේ මත්තේගොඩ සුමනාරාමයේ පැවිදි පිංකමක් බලන්න ගියා. දින දෙකක් විතර නැවතිලා හිටියා. එතැන දී පොහොයක් දවසක බණක් කියන්න කිව්වා. එතැන ද පැයක් බණ කිව්වා සමාධිගත සිතින් ම. ඔය විදියට ඒ කාලයේ භාවනා සම්බන්ධ පුහුණුවක් ලැබුණා. සතිය හොඳට පුරුදු කරන්න ලැබුණා. පැයක් ම චිත්ත සමාධියෙන් ඉන්නවා. ධ්‍යාන ගැන තේරුමක් නෑ. සමාධියෙන් ඉන්නවා. ශරීරය නොදැනී ආලෝකයක් තියෙනවා. එච්චරයි දැනෙන්නේ. මම ඉගෙන ගන්න කාලයේ දීර්ඝ කාලයක් ඒ ගතිය පුරුදු කළා. ඒක ඉගෙනීමට බොහෝ ප්‍රයෝජන වුණා. පාඩම් මතක හිටිනවා හොඳට. ධර්ම දේශනා කරන විට ඇහැ පියාගෙන සමාධියෙන් වගේ තමයි ධර්ම දේශනා කරන්නේ. ඒ විදියට පුහුණු වුණා.

## ☸ සමසතළිස් කර්මස්ථාන

ගල්දූවේ ඉන්න කාලයේ ශිෂ්‍ය පිරිසත් සමග සමසතළිස් කර්මස්ථාන ම පුරුදු කළා. වෙන ගුරු ඇසුරක් නෑ. විශුද්ධි මාර්ගය කියවමින් ඒ උපදෙස් දන්න හැටියට තෝරාගෙන තමයි කළේ. එයිනුත් අභ්‍යාසයක් ලැබුණා. දස කසිණය ම කළා. 1963 දී මැල්ලගල දී මහෝපාධ්‍යාය ස්වාමීන් වහන්සේගේ උපදෙස් ඇතිව මහා සී ක්‍රමය මාස එකහමාරක් පුහුණු කළා, දෙල්ගහ කුටිය කියන ගල්ලෙනේ. මම බද්ධ පර්යංකයෙන් පැය හයක් එක දිගටම භාවනා කරනවා. හවස 5.00 සිට රාත්‍රී 11.00 වන තුරු කිසිම අපහසුවකින් තොරව භාවනා කරනවා. ඉතින් හිත බඹ තලය දක්වා යනවා වගේ දැනෙනවා. ඊට වඩා දන්නේ නෑ. මහා සී ක්‍රමයෙහි ධ්‍යාන වැඩීමක් කියන්නෙ නැනේ.

කෙසේ නමුත් ඒ විදියට පුහුණු වන කාලයේ තමයි භාවනා වැඩසටහන් වලට යොමු වුණේ. මීරිගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ ගුරුවරුන්ට බුද්ධානුස්සති - මෛත්‍රී - අසුභ - මරණ සති යන සතර කමටහන් හා ආනාපාන සතිය තමයි දෙන්න නියම වුණේ. දිනක් භාවනා පංති පවත්වන අවස්ථාවේ මඩිහේ පඤ්ඤාසීහ මහා නායක ස්වාමීන් වහන්සේ වැඩලා බොහෝම ප්‍රශංසා කළා. 'හරියට හරි, මේක තමයි නියම පිළිවෙළ' කියලා. පසුව කොළඹ භාවනා පංති වලත් සියලු කමටහන් පුරුදු කරවූවා.

ඔය අතරේ තමයි බුරුම ගමන යෙදුනේ. මුලදී දවස් දහයක් පමණ මහා සී භාවනා මධ්‍යස්ථානයට යමින් එමින් භාවනා කළා. කලින් ඉතින් කරල තියෙන ක්‍රමය.

අනතුරුව එා ඔෟ භාවනා මධ්‍යස්ථානයට ගොස් තමයි සමථ - විදර්ශනා භාවනා පිළිවෙළට වැඩුවේ. ඒවා ගැන වැඩි විස්තර කියන්න මම සතුටු වෙන්නේ නෑ. එහිදී බොහොම හොඳට කටයුතු කරගෙන තමයි ආවේ."

යනුවෙන් කුඩා අවදියෙහි සිට බුරුම රට එා ඔෟ භාවනා මධ්‍යස්ථානයට වැඩම කිරීම දක්වා වූ කාලය තුළ වඩන ලද උතුම් භාවනා ප්‍රතිපත්තිය පිළිබඳව අප මාහිමිපාණන් වහන්සේ විසින් "වැඩූ කමටහන්" යන මාතෘකාව යටතේ ලියා ඇති, වඩන ලද භාවනා තොරතුරු වලට වඩා තරමක විස්තරයක් මෙහි දී ඉදිරිපත් කෙරෙනවා. ඊට අමතරව එා ඔෟ ආරණ්‍යයට වැඩම කර ඉතා හොඳින් භාවනා වැඩූ බවත් ඒ පිළිබඳව කරුණු ප්‍රකාශ කිරීමට සතුටු නොවන බවත් මෙහි දක්වා තිබෙනවා. පූජනීය ස්වාමීන් වහන්සේ එහිදී ප්‍රකාශ නොකළ තම භාවනා අත්දැකීම් පිළිබඳව ලියා තබා තිබූ කරුණු හා බුරුමයේ දී පුගුණ කළ එම එා ඔෟ භාවනා ක්‍රමය පිළිබඳව ලෝකාර්ථය පිණිස කෙටියෙන් මෙහි දී විස්තර කෙරෙනවා.

"මම ප්‍රිය කරන භාවනා ක්‍රමය එා ඔෟ ආරණ්‍යයේ දී පුහුණු කළ සමථ පූර්වාංගම විපස්සනාවයි. සමථ පූර්වාංගම විපස්සනාව සැප දයකයි. ශුද්ධ විපස්සනා කරන කොට බොහෝ වේදනා විඳිමින් කරන්න සිද්ධ වෙනවා. කාට වුනත්. මට වුනත් එහෙමයි. මේ ක්‍රමය එහෙම නොවෙයි. සමථ භාවනාව කරන කොට කයයි, සිතයි දෙක ම සංසිඳෙනවා. ඒ නිසා ඒ ක්‍රමය පහසුයි." ඒ එා ඔෟ භාවනා මාර්ගය පිළිබඳව පූජනීය මාහිමිපාණන් වහන්සේගේ අදහසයි.

එා ඖ භාවනා මාර්ගය බුරුම රට වැඩ සිටින අග්ග මහා කම්මට්ඨානාචරිය පූජනීය ආචිණ්ණ (සයාඩෝ) මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් පෙන්වා දෙන ලද්දක්. පෙළ අටුවා හා විශුද්ධි මාර්ග ආදී සංගෘහිත ග්‍රන්ථයන්ගෙන් ද පර්යාප්තිය පිළිබඳ ලැබූ හසළ දැනුමකින් ද විසි වසරකටත් අධික වනගතව ප්‍රතිපත්ති පූරණ අත්දැකීමෙන් ද යුතුව ලෝකයා වෙත මීට දශක කීපයකට පෙර දයාද කළ මේ භාවනා මාර්ගය ක්‍රමානුකූලව, පිළිවෙළට තිවන් මාර්ගය වඩන අයුරු පෙන්වා දෙන නිසාම ලෝකය තුළ වේගයෙන් ප්‍රචලිත වුණා. එම භාවනා මාර්ගය අප මාහිමිපාණන් වහන්සේ ද අඛණ්ඩව ප්‍රගුණ කළා. ඒ භාවනා මාර්ගය මාහිමිපාණන් වහන්සේ විස්තර කළ අයුරු පහත දක්වෙනවා.

## ☸ එා ඖ භාවනා මාර්ගය

"එහිදී මූල කර්මස්ථානය හැටියට බුරුම රට පූජනීය ආචිණ්ණ (සයාඩෝ) මාහිමිපාණන් වහන්සේ දෙන්නේ <u>ආනාපාන සතිය</u>යි. ආනාපාන සතියෙන් ධ්‍යාන 4 ක් ලබාගත්තට පස්සේ <u>**ද්වත්තිංසාකාරය**</u> දෙනවා වඩන්න. තමන්ගේ ශරීරයේ ද්වත්තිංසාකාරයෙහි කොටස් 32ට ධ්‍යාන 32 ක් උපදවන්න සලස්වනවා. ඊළඟට දෙනවා <u>**අට්ඨික ඕදාතය.**</u> මේ ශරීරයෙහි තිබෙන ඇටසැකිල්ල ඉදිරියට ගන්නවා. විශේෂයෙන් හිස් කබල තමයි ගන්නේ. ජීවත්ව ඇති හෝ නැති හෝ අයගේ හිස් කබල් 8 ක් 10 ක් හිතින් ගන්න ඕන. හිතින් ගෙන අට්ඨික සඤ්ඤාව හැර ඕදාත මනසිකාරය හෙවත් ඕදාත ආලෝකය ගන්නවා. ආනාපාන ධ්‍යානලාභී අයට එය අපහසු නෑ. ආනාපාන චතුර්ථ

ධ්‍යානයෙන් නැගීසිටලයි මේවා කරන්නේ. එවිට ඒ ආලෝකයෙන් බලාගෙන ඉන්න කොට උග්ගහ නිමිති, පටිභාග නිමිති පහළ වෙනවා. ඒකෙන් ධ්‍යාන 4 ක් උපදවනවා.

ඉන් අනතුරුව මෛත්‍රී ධ්‍යාන වලට හැරෙනවා. මෛත්‍රී කර්මස්ථාන වශයෙන් පුහුණු කරනවා. මුලින් ම උපකාරක හිතෛෂී උතුමන් දහ දෙනෙකුට පමණ. ඊළඟට මධ්‍යස්ථ අයට, අහිතවන්තයන්ට, සීමාසම්භේද කරලා. ඊළඟට ස්ථාන වශයෙන් තමන් ඉන්න කුටිය, අවට පරිසරය, ගම, නගරය, රට, ලෝකය, භවාග්‍රය දක්වා ම මුළු ලොවම බලාගෙන මෛත්‍රී ධ්‍යාන වඩන්න ඕනෙ. ඊළඟට දස දිශාවටම හැරෙනවා. දස දිශාවේ සත්ව කොට්ඨාශ දොළහටම සිත යොමු කරනවා. සත්ව කොට්ඨාශ දොළහ දොළහ බැගින් දස දිශාවටම වශයෙන් ධ්‍යාන 528 ක් වඩනවා. ඉන් පසු පුහුණු කරනවා කරුණා ධ්‍යාන 132 ක්, මුදිතා ධ්‍යාන 132 ක්, උපෙක්ඛා ධ්‍යාන 132 ක් වඩනවා. ඒවට ගන්නේ එක එක වචනය නිසා.

ඊළඟට යොමු කරනවා අවිඤ්ඤාණක අසුභයට. ඕදාත කසිණාලෝකය විහිදුවා තමන් දුටු විරූ මෘත ශරීරයක් මනසින් ඉදිරියට අරගෙන එහි අවස්ථා දහය හඳුගන්නවා. හඳුගෙන දස අසුභය වඩා වෙන වෙනම ධ්‍යාන උපදවනවා. බුද්ධානුස්සතිය, මරණ සතිය යන දෙකෙන් උපචාර සමාධි උපදවනවා. බුද්ධානුස්සතියෙහි නවගුණයට උපචාර සමාධි නවයක්, මරණ සතියටත් වාර ගණනක් උපචාර සමාධි උපදවනවා.

ඒවා කරලා ඉතිරි වර්ණ කසිණ වලට හැරෙනවා. වර්ණ කසිණ වශයෙන් නීල කසිණ, පීත කසිණ, ලෝහිත

කසිණ තුනෙන් රූප ධ්‍යාන හතර හතර වඩනවා. පසුව **පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආලෝක, ආකාස කසිණ** 6ත් වඩනවා. ඒවට නිමිති ගන්න ඕනේ වෙන වෙනම. ආලෝකයෙන් මවා ගන්න බෑ. බිම තියෙන තැනක් බලාගෙන නැත්නම් කසිණ මණ්ඩලයක් හදාගෙන 'පඨවි'. භාජනයකට වතුර තියාගෙන 'ආපෝ'. පහනක් දල්වගෙන පහන බලාගෙන 'තේජෝ'. ඊළඟට සෙලවෙන දෙයක් බලාගෙන 'වායෝ'. ඊළඟට පහන් ආලෝකය වැනි සහනාලෝකයක් බලාගෙන 'ආලෝක'. සිදුරකින් අහස බලා 'ආකාස'. ඔය කසිණ සියල්ලෙන් රූප ධ්‍යාන හතර හතර වඩලා ඊළඟට ආකාස කසිණය හැර ඉතිරි කසිණ එකින් එකට අරූප ධ්‍යාන උපදවන්න සලසනවා.

දැන් පඨවි කසිණය නම් චතුර්ථ ධ්‍යානයට වඩලා එයින් චතුර්ථ ධ්‍යානයට පත්වෙලා පසුව රූපයේ ආදීනව සලකනවා. මේ රූපස්කන්ධයට බොහෝ විපත්ති වැඩියි. නොයෙක් රෝග හැදෙනවා. තුවාල වෙනවා. කලකෝලාහල වලට ලක්වෙනවා. රූපය නිසා බොහෝ රාගාදී කෙලෙස් වැඩෙනවා, ප්‍රාණඝාතාදී බොහෝ අකුසල් වැඩෙනවා. ඒ නිසා බොහෝ අන්තරාදයක යැයි රූපයට නින්ද කරල එහි ආදීනව සලකලා රූපයෙන් තොරවූ අරූපී කර්මස්ථාන, අරූපී ධ්‍යාන මීට වඩා ශාන්තයි ප්‍රණීතයි කියලා උඩ - යට - සරස අනන්ත ලෝක ධාතුවට විහිදවපු ඕදාත කසිණාලෝකය ආකාස කසිණ කියලා හිතාගන්නවා අනන්ත අවකාශය කියල. ඉතින් 'අනන්තෝ ආකාසෝ' කියලා ඒකත් භාවනාවට නගනවා. එසේ වඩන කොට රූපී චතුත්ථ ධ්‍යානය හා සමාන උපෙක්ඛා, ඒකග්ගතා ධ්‍යානය අර්පණා බවට පත් වෙනවා. ඒක වශී කරගන්නවා. ඒ ආකාසානඤ්චායතන අරූප ධ්‍යානයයි.

එම ධ්‍යානය වශී කරගෙන <u>**විඤ්ඤාණඤ්චායතන**</u> සමාපත්තිය උපදවනවා විඤ්ඤාණය අරමුණු කරගෙන. 'අනන්තං විඤ්ඤාණං, විඤ්ඤාණං අනන්තං' යනුවෙන් භාවනාවට නගනවා. අනතුරුව දෙවැනි අරූප ධ්‍යානය වන විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය උපදවනවා. ඒකත් වශී කරගන්නවා.

ඉන් පසු විඤ්ඤාණයෙහි අගක් මුලක් ඇත්තේ නෑ. එය නැතිවෙලා ගියා. 'නත්ථි කිඤ්චි නත්ථි කිඤ්චි' කියලා නාස්තිභාව ප්‍රඥප්තිය මෙනෙහි කරලා අරූප තුන්වෙනි ධ්‍යානය වන <u>**ආකිඤ්චඤ්ඤායතනය**</u> උපදවනවා.

ඒකත් වශී කරගෙන ඉන් පසු නාස්තිභාවයත් අරමුණු කරගත්ත, මේ ධ්‍යාන චිත්තය බොහෝම ශාන්තයි ප්‍රණීතයි 'ඒතං සන්තං, ඒතං පණීතං' යනුවෙන් මෙනෙහි කරලා හතර වෙනි අරූප ධ්‍යානය වන <u>**නේවසඤ්ඤානාසඤ්ඤායතන**</u> ධ්‍යානය උපදවලා ඒක වශී කර ගන්නවා. එක එක කසිණයකින් ඔය අරූප සමාපත්ති 04 ම උපදවනවා. ආකාස කසිණයෙන් අරූප ධ්‍යාන උපදවන්න බෑ. අනෙක් කසිණ නවයෙන් පුළුවන්.

ඔය විදියට සියලු කමටහන් වඩලා තමයි විදර්ශනාවට හරවන්නේ උසස් යෝගාවචරයන්. සමහර යෝගාවචරයන්ට කසිණ වඩන්න අපහසු වෙනවා. එහෙම ඇත්තන්ට ආනාපාන සති චතුර්ථ ධ්‍යානයෙන් පසුව හෝ විදර්ශනාවට හරවනවා. හැබැයි සතර කමටහන් වන බුදුගුණ, මෛත්‍රිය, අසුභ, මරණ සති අනිවාර්යයෙන් වඩවනවා.

අභිඤ්ඤා උපදවන්නේ විපස්සනාව කරලා දෙවනුව තමයි. විපස්සනා කරන්නේ නැතුව අභිඥාවට හරවන්නේ නෑ. මොකද කාරණය අභිඥා කියන්නේ අන්තරාදයක දෙයක්. දැන් දිබ්බචක්ඛු ඤාණය එහෙම ලබාගත්තාම දකින අනවශ්‍ය රූප නිසා නැති කෙලෙස් ඇති වෙනවා. භය ඇති වෙන්න පුළුවන්. තැති ගැනීම්, රාගාදිය ඇතිවෙන්න පුළුවන්. විපස්සනාව වැඩූ යෝගාවචරයෙකුට පමණයි අභිඥා උපදවන්න පුළුවන්. ඒ යෝගාවචරයා එවිට අතරමං වන්නේ නෑ. විපස්සනාව වැඩීමනෙ බලාපොරොත්තු වන්නේ. මාර්ග ඵල ලබන්න මිසක් අභිඥා ලබන්න නෙවෙයිනේ. ඉතින් අභිඥා ගැන අපේක්ෂාව හැර විපස්සනාවට හැරෙනවා.

විපස්සනාව ආරම්භ කරන්නේ <u>ධාතු කර්මස්ථානයෙන්</u>. පඨවි, ආපෝ, තේජෝ, වායෝ මුලින් ගෙන එහි ලක්ෂණ 12 වෙන් වශයෙන් ආවර්ජනා කරනවා. පස්සේ ශුද්ධාෂ්ටක රූප අරමුණු කරන්න සමර්ථ වෙනවා. ඔක්කොම අර ඕදාත කසිණාලෝකය විහිදුවල බලන්නේ. ඊළඟට වස්තු රූප වල කර්මජ රූප කලාප, චිත්තජ රූප කලාප 8 බලනවා. ඍතුජ රූප කලාප 4, ආහාරජ රූප කලාප 4 බලනවා. අනතුරුව කේසා, ලෝමාදී ධාතු කොටස් 32 හි රූප කලාප බලනවා. ඔය විදිහට අභ්‍යන්තර රූප කලාප සියල්ල බලන්න ඕන. තවම විපස්සනාව කරන්නේ නෑ. විපස්සනාවට රූප පරිච්ඡේද කරනවා පමණයි.

ඉන් පසු <u>නාම ධර්මයන්ට</u> හැරෙනවා. තමා ලබාගත් ධ්‍යාන තියෙනවා නම් ධ්‍යානයට සමවැදිලා ධ්‍යානයේ තියෙන ධ්‍යාන අංගයි, සියලු සම්ප්‍රයුක්ත ධර්මයි නාම

පරිච්ඡේදයට හරවනවා. ඉන් පසු තමා ලබාගත්ත ධ්‍යාන සියල්ල තුළ ඇති නාම ධර්මයන් පරිච්ඡේද කරනවා. සදෙරින් ලැබුණු කුසල චිත්ත වීථි, අකුසල චිත්ත වීථි වල නාම ධර්මයන් පිරිසිඳිනවා. තමන්ට මතකනෙ කුසලාකුසල සිත් පහළ වුණු අවස්ථා මනෝ ද්වාරයෙන්, ඉතිරි දෙරටු පහෙන්. ඒවායේ චිත්ත - චෛතසික ධර්ම වෙන් කර ගන්නවා. මෙසේ අභ්‍යන්තර නාම - රූප පිරිසිඳීම සම්පූර්ණ කරලා බාහිර රූප කලාප ගන්නවා. තමා පරිභෝග කරන පරිෂ්කාර, වාඩිවී සිටින ආසන, ඉන්න කුටි සෙනසුන්, ඒවායේ තියෙන උපකරණ, බාහිර ගස්වැල් ආදී අවිඤ්ඤාණක රූප බලලා, සවිඤ්ඤාණක රූප බලනවා. එය අනුමාන කරල බලන්නේ. මේ විදියට සත්ව පුද්ගල සන්තාන තුළ රූප ධර්මයන් සන්සන්දනය කරනවා. ඊළඟට නාම ධර්මයන් ද ඒ විදියටම බලනවා. ආධ්‍යාත්මික - බාහිර නාම - රූප සියල්ලම පිරිසිඳ බලාගෙන පසුව නාම - රූපයන්ගේ <u>ලක්ෂණ - රස - පච්චුපට්ඨාන - පදට්ඨාන</u> නැවත වෙන වෙනම පිරිසිඳිනවා. දීර්ඝ වැඩසටහනක්. සියලුම නාම - රූපයන්ගේ ලක්ෂණාදී කාරණා අරමුණු කරන්න තියෙනවා.

අනතුරුව <u>පූර්ව භවයක</u> භාවනා කරලා තියෙනවද? විපස්සනා කරලා තියෙනවද? කියලා බලන්න අතීත නාම - රූපයන්ට හිත යොමු කරනවා නාම - රූප පරම්පරාවටම. දැන් අද නාම - රූප, ඊයේ නාම - රූප, පෙරේද නාම - රූප සතියට - මාසෙට - අවුරුද්දට ගොස් මව් කුස පිළිසිඳ ගන්න අවස්ථාව වන තුරුම නාම - රූප පරම්පරාව අරමුණු කරනවා. අරමුණු කරලා ඕදාත කසිණ චතුර්ථ ධ්‍යානයට සමවැදිලා අධිෂ්ඨාන කරනවා පූර්ව භවයේ චුතිය පෙනේවා කියලා. මුලින් නොපෙනුනොත් නැවත

අධිෂ්ඨාන කරනවා. එවිට චුතිය පෙනෙනවා. ඉන් පසු චුතියට හේතු වුණු, චුතියට අරමුණු වුණු කර්මය හොයනවා. චුතියට පෙර පහළ වූ ජවන්හි කර්ම - කර්ම නිමිති - ගති නිමිති බලනවා. ඉන් පසු ඒ භවයේ නාම - රූප පරම්පරාව මුලට මුලට ගෙනියනවා. ඒ භවයේ පටිසන්ධිය දක්වා බලනවා. බලන කොට යම්කිසි කාලෙක තමන් වැඩූ භාවනාවක් ගැන අරමුණු වෙනවා. විපස්සනා වැඩුවා නම් ස්කන්ධ වශයෙන් හෝ ධාතු වශයෙන් හෝ ආයතන වශයෙන් කියන කවර ආකාරයකින්ද වඩලා තියෙන්නේ කියලා සොයනවා. තමා පෙර භවයේ විපස්සනාව කවර ආකාරයෙන්ද වඩලා තියෙන්නේ කියලා බලන්නයි පෙර භව පරම්පරාව බලන්නේ. අභිඥා උපදවන්න නොවේ. සමහරු ආත්ම භාව 30 - 40 බලනවා. බුරුම රට පූජනීය ආචිණ්ණ (සයාඩෝ) මාහිමිපාණන් වහන්සෙත් ඒවගේ කෙනෙක්.

එහෙම බලලා ඉන් පසු <u>අනාගතයටත්</u> හැරෙනවා. අද නාම - රූප, හෙට නාම - රූප, අනිද්දා නාම - රූප ඔහොම මරණාසන්නේ දක්වා බලනවා. ඊට පස්සේ චුතිය බලනවා. ඊළඟට ලැබෙන පටිසන්ධිය බලනවා. එසේ ආත්ම භාව ගණනාවක් බලන්න දෙනවා. එහෙම බලලා නිවන දක්වා ම බලන්න දෙනවා. සමහරුන්ට නිවන් දකින ජාතිය අරමුණු වෙන්නේ නෑ. එතරම් දීර්ඝයි. කෙටි කාලයකින් නිවන් දකිනවා නම් ඒ ජාතිය අරමුණු වෙනවා. ඒ විදියට අතීත - අනාගත - වර්තමාන නාම - රූප පරම්පරාව අරමුණු කරලා කවර හේතුවකින් මේ නාම - රූප මෙසේ පැමිණියාද කියලා බලනවා.

පූර්ව භවයෙහි අවිජ්ජා - තණ්හා - උපාදාන - කර්ම - සංස්කාර කියන කරුණු 5 නිසා මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වුණු ආකාරය <u>පටිච්ච සමුප්පාදයෙන්</u> බලනවා. පටිසන්ධි විඤ්ඤාණයෙන් අනතුරුව නාම - රූප, ආයතන, ස්පර්ශ, වේදනා, තණ්හා, උපාදාන, ජාති, ජරා - මරණ පේළියට ආ හැටි බලනවා. බලල හේතු - ඵල පරම්පරාව දැකීමෙන් කංඛාවිතරණ විශුද්ධිය ඇතිවෙනවා. එය සම්පූර්ණ කරලයි සම්මර්ශන ඥාණයට බසින්නේ.

ඒ සඳහා ගන්නවා <u>චත්තාළීසාකාර විපස්සනාව</u>. ඒ විපස්සනාවේ අනිත්‍ය ලක්ෂණ 10, දුක්ඛ ලක්ෂණ 25, අනත්ත ලක්ෂණ 05 කියන මේ 40 එක එක රූපයක් - එක එක නාමයක් ගණනේ හරවනවා. සමථ භාවනාවෙන් සමාධි ශක්ති නැති කෙනෙකුට මෙය අපහසු වෙනවා. සමාධි ශක්තිය තියෙන කෙනෙකුට පහසු වෙනවා. එකින් එකට පීර පීරා බලන්නා වාගේ, කෙස් ගහෙන් කෙස් ගහට බලන්නා වාගේ බලන්න තියෙනවා. ඔය නාම - රූප පරිච්ඡේදය තමයි සම්මර්ශන ඥාණය. එසේ කරන කොට තමයි උදය වය ඥාණය ලැබෙන්නේ. <u>උදය වය</u> ඥාණය සමපණස් ආකාරයෙන් වඩන්න තියෙනවා. <u>රූප සත්තක - අරූප සත්තක</u> වශයෙන් වඩන්න තියෙනවා. ඒ ටික වඩාගෙන යනකොට <u>භංගානුපස්සනාවට</u> අවස්ථාව ලැබෙනවා.

භංගානුපස්සනාව පෙරට වඩා තීක්ෂණ ලෙස වඩන්න තියෙනවා. එක එක නාමයක් ගණනෙ එක එක රූපයක් ගණනෙ වඩනවා. ඒක කරගෙන යනකොට <u>ආදීනව ඥාණය, නිබ්බිද ඥාණය, මුඤ්චිතුකම්‍යතා ඥාණය, පටිසංඛානුපස්සනා ඥාණය, සංඛාරුපෙක්ඛා ඥාණය</u>

පිළිවෙළට වැඩෙනවා. අමුතුවෙන් යෝග නොකළත් ඒ ඥාණ පේළියට වැඩෙන්න පටන් ගන්නවා.

සංඛාරුපෙක්ඛා ඥාණය ලැබූ යෝගාවචරයා කවුරු නමුත් චතුර්ථ ධ්‍යානයට සමවදිනවා වගේ ඉන්නවා. බොහොම දැඩි සමාධියකට පත් වෙනවා. ඒ යෝගාවචරයාට තව කරන්න විපස්සනාවක් ඇත්තේ නෑ. විපස්සනා කරලා සියල්ල සම්පූර්ණයි. දැන් උපේක්ෂකව ඉන්න අවස්ථාව තමයි සංඛාරුපෙක්ඛා අවස්ථාව කියලා හඳුන්වන්නේ. හේතු සම්පත් ඇති අය ඉදිරියට ගොස් මාර්ග ඵල ලබන්න සමර්ථ වෙනවා. නැති අය නැවත නැවත උදය වය ඥාණයේ ඉඳලා විදර්ශනා වඩන්න ඕන. බොහෝ වාරයක් වඩන්න ඕන. එතකොට තමයි ඉන්ද්‍රිය, බල, බොජ්ඣංග ශක්තිමත් වෙන්නේ. උසස් ප්‍රාර්ථනා තියෙන යෝගාවචරයන් සංඛාරුපෙක්ඛාවෙන් නවතිනවා. එතැනින් නැවති නැවතී විදර්ශනා සුවය ඇති කර ගන්නවා. ඔය ක්‍රමය තමයි බුරුම රට පූජනීය ආචිණ්ණ (සයාඩෝ) මාහිමිපාණන් වහන්සේ පුහුණු කරවන්නේ. බොහෝ දෙනෙක් එයින් ප්‍රයෝජන ලැබුවා."

මේ පූජනීය නා උයනේ මාහිමිපාණන් වහන්සේ, තමන් වහන්සේ වඩන ලද භාවනා මාර්ගය විස්තර කළ ආකාරය මෙපමණකින් නිමා වෙනවා.

එා ඔා භාවනා මාර්ගය මාහිමිපාණන් වහන්සේ පුහුණු කිරීමට ඇරඹි පළමු අවස්ථාවෙහිදී ම ඉතා පහසු ලෙසත්, සීඝ්‍ර ලෙසත් වැඩුවා. එනිසාම බුරුම රට පූජනීය ආචිණ්ණ (සයාඩෝ) මාහිමිපාණන් වහන්සේගේ ද විශේෂ ප්‍රශංසනීය ආශීර්වාදය හිමි වුණා. පූජනීය අප මාහිමිපාණන් වහන්සේ අනන්ත කාලයක් පුරා සසරෙහි උතුම් වූ සම්මා

සම්බුද්ධත්ව ප්‍රතිලාභ ප්‍රාර්ථනාවෙන් යුතුව පාරමී ධර්ම සම්භාර පුරමින් වැඩම කරන නිසාත් මේ අත් බැව්හි ද එතෙක් දියුණු කළ පර්යාප්ති, ප්‍රතිපත්ති ශක්තීන් නිසාත් මේ භාවනා මාර්ගය එසේ පහසුවෙන් දියුණු කළා.

මේ භාවනා මාර්ගය ප්‍රගුණ කිරීම අප මාහිමිපාණන් වහන්සේට විශේෂත්වයක් ගෙන දුන්නා. ඒ වගේම ඒ භාවනා වැඩූ ආකාරය, අත්දැකීම් ගැන මාහිමිපාණන් වහන්සේ සටහන් කර තැබීමත් ලෝකයාට විශාල සම්පතක්. ඒ කරුණු තුළින් අපි දකින්නේ මාහිමිපාණන් වහන්සේගේ මේ ජීවිතය ගැන පමණක් නොවෙයි. සංසාර ගමනක් තුළ දක්නට ලැබෙන ආශ්චර්යවත් ගමන පිළිබඳවත් තවත් බොහෝ වැදගත් දේත් ඒ තුළ තිබෙනවා. ලෝ දනන් හට පහන් සිත් උපදවා කුසල් දම් වඩන්නට ඒ අමිල සටහන් පෙළ උපකාර වෙනවා.

පූජනීය මාහිමිපාණන් වහන්සේගේ මේ විශේෂ අත්දැකීම් පාදක කොට වඩන ලද භාවනා කමටහන් සාකච්ඡාවේදී අප මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යවර අතිපූජනීය අඟුල්ගමුවේ අරියනන්ද මාහිමිපාණන් වහන්සේ විසින් සියලු පරිවර්තන කටයුතු සිදු කළත් නා උයනේ මාහිමිපාණන් වහන්සේගේ අදහස පරිදි ම පූජනීය අප ස්වාමීන් වහන්සේ ද නිසි කල් උදවන තුරු ඒ සියලු තොරතුරු ස්වසන්තානයේ නිධන් ගතකොට සිටියා. පූජනීය නා උයනේ මාහිමිපාණන් වහන්සේ එා ඔෟ භාවනාව වැඩූ ආකාරය හා එම භාවනාවන් වැඩීමේ දී ලද අත්දැකීම් පිළිබඳව විශේෂයෙන් සටහන් කර තිබෙනවා. එසේ ලියූ සටහනින් ම එම තොරතුරු ඉදිරිපත් කිරීම කියවන සැමගේ ශ්‍රද්ධා සිතුවිලි මහත් කරන නිසා එම අත්

අකුරු සටහන් තරමක් අපැහැදිලි වුනත් හැකි පමණ එලෙසම මෙහි ඉදිරිපත් කෙරෙනවා. එම උපුටා ගන්නා කොටස් කියවීමේ පහසුව සඳහා අත්අකුරු සටහනට අමතරව නැවත පරිගණක අකුරින් ද දක්වා ඇත.

අප මාහිමිපාණන් වහන්සේ වඩන ලද භාවනාවන්ද ඉන් ලැබූ විශේෂ අත්දැකීම් ගැන ලියවී ඇති කරුණු හා තම උතුම් පාරමී ගමන ගැන හමු වූ සුළු ප්‍රමාණයක් තොරතුරු මෙතැන් සිට ඉදිරිපත් කෙරෙන අතර එහිදී භාවනාවන් පිළිබඳව දීර්ඝ විස්තර විවරණ කිරීමක් නොකෙරේ.

**"සම්බුදු පියාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ව්‍යක්ත - විනීත - විශාරද - බහුශ්‍රැත - ධර්මධර මේ ටික උත්සාහවත් අයට කරගන්න පුළුවන් නමුත් ධම්මානුධම්ම පටිපන්නො විහරතී කියන මේ පාඨය පමණක් බොහෝ දෙනෙකුට සම්පූර්ණ කරගන්න අමාරු බව පෙනෙනවා. විශේෂයෙන්ම අරියධම්ම අනුනායක ස්ථවිරපාදයන් වහන්සේ, අර ධම්මානුධම්ම පටිපන්න විහරණයෙන් උන්වහන්සේගේ ජීවිතය ගත කරා"**

**(අග්ග මහා පණ්ඩිත, විනයාචාර්‍ය, විනය විශාරද, රාජකීය පණ්ඩිත, අතිපූජ්‍ය නාපාන පෙමසිරි අභිධාන, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ.)**



# සමාහිත සිතක්


කැලඹුණුබව, නොසන්සුන්බව, අසමාහිතබව කියන්නේ ලෝකයේ පවතින ස්වභාවයන්ය. සත්ව සන්තානයන් ද බොහෝ සෙයින් මේ ස්වභාවයෙන් ම පවතින නිසා මහා කාරුණිකයාණන් වහන්සේලා පෙන්වා දෙන සැබෑව - සත්‍යය වැටහෙන්නෙ නෑ. පෙනෙන්නෙ නෑ. තේරුම් ගන්න බෑ. කැලඹුණ ලෝකයත් සමග එකටම නොසන්සුන්ව වික්ෂිප්තව නොපැවතී ඊට විරුද්ධ වූ සංවර - ශාන්ත - සමාහිත බවක් සිත තුළ ගොඩනගා ගත්තොත් මේ ලෝකයේ සැබෑව, යථාභූත ඥාණය පහළ කරගන්න පුළුවන්.


නිවන් මග තුළ කය - වචනයේ සංවරයෙන් පසුව මේ හිතේ සමාහිත බවයි ප්‍රධාන දෙය. එහි ඉහළ අවස්ථාව "ධ්‍යාන" ලෙස හඳුන්වනවා. ආනාපාන ආදී අරමුණක් තුළ සිත වඩන කොට, නැවත නැවත වඩන කොට ඒ හිතේ සමාධිමත් බවක් ඇති වෙනවා. එහෙම සමාධිමත් වුන හිතේ උග්ගහ නිමිති ආලෝක පහළ වෙනවා. ඒ ඇතිවෙන ආලෝකය වඩාත් ප්‍රභාස්වර බවට පත් වෙලා තමයි පටිභාග නිමිත්ත පහළ වෙන්නේ. ඒ පටිභාග අරමුණ තුළ සිත බොහෝ සේ පුරුදු කිරීම, සමාධි කිරීම මගින් ඒ සිත තුළ නීවරණ ධර්ම ක්‍රමයෙන් දුරු වෙනවා. සිතක වැඩීම,

දියුණුව මකාලන, නිවන් මග වසාලන එම නීවරණ ධර්ම 5 දුරු කිරීමෙන් ධ්‍යාන අංග පහකින් සමන්විත පළමු අර්පණා ධ්‍යානයට පත් වෙනවා. එය නැවත නැවත වශී කිරීම මගින් ඊට වඩා දියුණු රූපාවචර දෙවන, තෙවන, සිව්වන ධ්‍යාන වලට පත්වෙනවා. ඒ සමාහිත සිතේ වූ රූපාවචර ධ්‍යාන අවස්ථාවයි.


එා ඔෟ භාවනා මාර්ගයෙහි නිර්මාතෘවර බුරුම රට පූජනීය ආචිණ්ණ (සයාඩෝ) මාහිමිපාණන් වහන්සේ මෙම ධ්‍යාන උපදවා ගැනීමට මනා ලෙස මාර්ගය පෙන්වා දෙනවා. ආනාපාන සතියට අනුව රූපාවචර ධ්‍යාන 4 උපදවා ගත් පසු දෙතිස් කොට්ඨාස භාවනාව, අට්ඨික - ඕදාත භාවනාව, මෛත්‍රී, බුද්ධානුස්සති, දස අසුභ, මරණසති, දස කසිණ යන කර්මස්ථාන තුළින් ඊට අදළ ධ්‍යාන උපදවා ධ්‍යාන 4 ශක්තිමත් බවට පත් කරවනවා.

අපගේ පූජනීය මාහිමිපාණන් වහන්සේ මෙම කර්මස්ථාන සියල්ල වඩා ලද අත්දැකීම් වලින් කීපයක් මෙහි දක්වෙනවා.



[illegible]
[illegible] 3.40. පර්යංකයෙන්
ආනාපාන සතිය, වෙනදට වඩා අවබෝධයෙන් සමාධිය
පැවතිනි. ප්‍රථම ධ්‍යාන [illegible] පත්විය. 5.15 [illegible]
[illegible] 6.00 [illegible] 6.45 පර්යංකය, 8.30 තෙක්, සතර
[illegible]
[illegible] 8.30 [illegible]
[illegible] 9.00 [illegible] 9.30 [illegible]
[illegible] අද දින [illegible]


නැවත නැවත පුගුණ කිරීමට අවසර ලැබුණ. 10.00. ලිවීම. 10.30. දවල් දානය. 11.30. සක්මන්. 12.00. බුද්ධවන්දනා. විවේකය. 1.00. පර්යංකය. 2.15. පර්යංකය. 4.00. තෙක්, සතර වැනි අර්පණාව බොහෝ වාරයක් පුගුණ කෙළෙමි. 4.15. සක්මන්. 5.00. - 7.00. පර්යංකය. සතර වැනි අර්පණාව තෙක්, 7.00. ලිවීම. පාදසම්බාහනය, 8.45. සක්මන් පිරිත්, බුද්ධවන්දනාදිය නිමවා 9.30. විශ්‍රාමය.


02. දින අළුයම 3.00. අවදිව සිරුර පිළිදැගුම් නිමවා ධම්මචක්ක සූත්‍ර සජ්ඣායනා 3.40. පර්යංකයෙන් ආනාපාන සතිය, වෙනදට වඩා ප්‍රබෝධයෙන් සමාධිය පැවතිණ. ප්‍රථම ධ්‍යාන අර්පණාවට පත්විය. 5.15. සටහන්, හීල්දනය. 6.00. සක්මන්, 6.45. පර්යංකය, 8.30. තෙක්, සතර වැනි අර්පණාවට කෙළින්ම පත්විය, නැවත පළමු වැන්න සිට අනුපිළිවෙළින් සතර වැන්නට පත්විය හැකිවිය. 8.30. සිවුරු සෝද පැන් පහසු වීම. 9.00. සක්මන් බුදුගුණ. 9.30. සෙයාඩෝ නාහිමියන් වහන්සේ පැමිණ කමටහන් සාකච්ඡාව, අද දින සතර වැනි අර්පණාවම නැවත නැවත පුගුණ කිරීමට අවසර ලැබුණා. 10.00. ලිවීම. 10.30. දවල් දනය. 11.30. සක්මන්. 12.00. බුද්ධ වන්දනා. විවේකය. 1.00. පර්යංකය. 2.15. පර්යංකය 4.00 තෙක්, සතර වැනි අර්පණාව බොහෝ වාරයක් පුගුණ කෙළෙමි. 4.15. සක්මන්. 5.00. 7.00. පර්යංකය සතර වැනි අර්පණාව තෙක්. 7.00. ලිවීම, පාද සම්බාහනය, 8.45. සක්මන්, පිරිත්, බුද්ධ වන්දනාදිය නිමවා 9.30. විශ්‍රාමය.




5.00. සිට 7.00. නෙක් පර්යංකය. ආනාපාන සතර වැනි අර්පණාවෙන් පසු දෙතිස් කොටසට අනුලෝම අර්පණා 32 ක්, ප්‍රතිලෝම අජ්ඣත්ත බහිද්ධා අර්පණා 27.ක් සමෘද්ධ විය.



5.15. පර්යංකය ආනාපාන චතුර්ථ ධ්‍යානය නිමවා අට්ඨික ඕදාත කසිණ චතුර්ථ ධ්‍යානය දක්වා වැඩීමි. බලවත් ආලෝකයක් - ශ්‍රද්ධාවක් ද ඇතිවිය.



(අද දින ආනාපාන / ඕදාත - නීල - පීත - ලෝහිත, අර්පණා සියල්ල සමෘද්ධ විය. ආවාසයේ සිට අනන්ත ලෝකධාතු වෙත ආලෝක විහිදුවන්නට හැකිවිය.)



5.10. පර්යංකය. ආනාපාන 4 (ධ්‍යාන සතර), ඕදාත 4 (ධ්‍යාන සතර), නීල - පීත - ලෝහිත - පඨවි - ආපෝ - තේජෝ - වායෝ - ආලෝක 4 (ධ්‍යාන සතර) බැගින් නිමවා ආකාස කසිණයෙන් පළමු වරට චතුර්ථ ධ්‍යානය දක්වා පැමිණියෙමි.

5.15. පර්යංකය. බුදුගුණ - ආනාපාන - ඕදාත නිමවා - විහාරය - ගම - නගරය - ස්වර්ණද්වීපය (බුරුමය) - ලංකාද්වීපය - ජම්බුද්වීපය හා මේ චක්‍රවාටය අරමුණු කොට මෛත්‍රී අර්පණා 84 ක් සපිරීමි.

2.10 පර්යංකය. ආනාපාන ඕදාත නිමවා විසිතුරු ලෙස බුද්ධානුස්සතිය වැඩුණා.

දස අසුභය වැඩීමි. එකක් පාසා ප්‍රථම ධ්‍යානයට පත්වීමි. අවසානයේ දී ඒ දසයටම සසඳමින් තමන්ගේ මරණින් මතු ලැබෙන දස අසුභය උපචාර සමාධියෙන් බැලීමි.

4.00 පර්යංකය, අනුස්සති, ආනාපාන - ඕදාත 8. සැණෙකින්ම අර්පණා ලැබිණ. ඉන් අනතුරුව විශුද්ධි මාර්ගයේ එන මරණානුස්සතියට අනුව මාතෘකා අටටම මරණ සතිය විසිතුරුව වැඩීමි.

පූජනීය මාහිමිපාණන් වහන්සේ ඉතා පුණ්‍යවන්ත ලෙස රූපාවචර ධ්‍යාන 4 ක්‍රමයෙන් උපදවා ගෙන ඒ ඒ කර්මස්ථානයන්ට අනුව ඒ ධ්‍යාන වඩාත් ප්‍රගුණ කළා. එමගින් විශේෂ අත්දැකීම් බොහොමයක් ද ලබා තිබෙනවා. එම තොරතුරු සරලව මාහිමිපාණන් වහන්සේම සටහන් කර ඇති අයුරින් ඉහතින් දක්වා තිබෙනවා. එම භාවනාවන් පිළිබඳ වඩාත් විස්තර මෙහිදී ඉදිරිපත් නොකරන අතර එම විස්තර තරමක් දුරට "මාහිමිපාණන් වහන්සේ වැඩූ භාවනා ක්‍රම" යන මාතෘකාව යටතේ දක්වෙනවා. යම් කෙනෙකුන් හට එම තොරතුරු වලට අමතර තවත් විස්තරයක් අවශ්‍ය වන්නේ නම් එා ඔෟ භාවනා කමටහන් ග්‍රන්ථයන් පරිශීලනය කළ හැකිය.

මෙලෙස ඉතා පහසුවෙන් රූපාවචර ධ්‍යාන 4 උපදවා ගෙන මනාසේ ප්‍රගුණ කරගත් අප මාහිමිපාණන් වහන්සේ අරූපාවචර ධ්‍යානයන් ද උපදවා ගැනීමට උපදෙස් අනුව පරිකර්ම කළා.



# සිතට නිවාඩුවක්

සිත වහා පරිවර්තනයන්ට පත් වෙනවා. සුළු කාලයක් තුළ සිත තුළ පැන නැගෙන සිතුවිලි ප්‍රමාණය ඉතා විශාලයි. සිත යම් යම් අරමුණු සිතමින් ඉන්න බොහොම කැමතියි. මේ ආකාරයට අඛණ්ඩව නොයෙක් සිතිවිලි ඔස්සේ දුවන සිතින් අපිට ධර්මයක් වඩාගන්න අමාරුයි. ඒ දුවන සිතේ අරමුණු අඩු කරල ටික ටික සංවර, තැන්පත් බවක් සිතිවිලි වල සීමා සහිත බවක් හදාගන්න ඕන. එතකොට අරමුණු අඩුවෙලා අපේ ධර්ම අරමුණ තුළ, කමටහන් අරමුණ තුළ සිත වැඩි කාලයක් රැදෙනවා.

ඒකට මුලදී අපි අතරක් නැතුව හිතට වැඩ දෙන්න ඕන. හැබැයි හිතට ඕන දේවල් නෙවෙයි. අපිට ඕන අරමුණු. සිත කැමති කෙලෙස් අරමුණු වලට. අපි ඊට විරුද්ධ භාවනා අරමුණකින්, ධර්ම අරමුණකින් අතරක් නැර හිතට වැඩක් ලබා දෙන්න ඕන. එතකොට එක එක අරමුණේ අතරක් නැර පැන පැන දුවපු හිත අපි ගත්ත අරමුණ තුළ නැවත නැවත යෙදවීම තුළ අපිට අවශ්‍ය මානසික ස්වභාවය හැදෙනවා. විනාඩියකදී දහස් ගණන් අරමුණු සොය සොයා දුවපු ස්වභාවය නැවතිලා අරමුණු කීපයක් තුළ ඒ සිත රැදෙනවා. අපේ භාවනා අරමුණ, කුසල් අරමුණ තුළ රැදී ඉන්නවා. ඒ සිත තුළින් ලොකු ධර්මයක් වඩාගන්න පුළුවන්. ඒ සිතයි නිවනට උපකාර වන්නේ.

පූජනීය අප මාහිමිපාණන් වහන්සේ මේ සඳහා පුංචිම අවදියේ දී තම කිරි අම්මගේ (ආත්තම්මාගේ) අවවාදයක් අනුව ක්‍රියාත්මක වුණා. තමන්ට දුන් නව ගුණ වැලෙන් ඉතිපි සෝ ගාථා පාඨය කිය කියා කාලය ගෙව්වා. පැවිදි ජීවිතයෙත් එය අඛණ්ඩ කරගත්තා. හිතට අනවශ්‍ය සිතුවිලි එන්න නොදී හිත පුරුදු දේවල් තුළ යන්න නොදී අපට අවශ්‍ය විදියට ඒ

බුදුගුණ මනසිකාරයේ යෙදෙව්වා. එතකොට අනෙකුත් කමටහන් වඩන කාලය හැර ගමන් බිමන් යන, වත් පිළිවෙත් කරන විට ආදී වූ අනෙකුත් සෑම විටම ඒ බුදුගුණ මනසිකාරයෙන් හිතට වැඩක් දුන්නා. නිකරුණේ තිබ්බෙ නෑ. ප්‍රධාන කමටහනින් තොරවූ විටත්, ඉගෙන ගන්න කාලය, ධර්ම දේශනා කරන විට ආදී වෙලාවල් හැර අනෙක් සියලු කාලය මේ "ඉතිපි සෝ" ගාථා පාඨයෙන් බුදුගුණ වැඩුවා. ඒ තුළින් වහ වහා සිතේ පරිවර්තනයක් ඇතිවෙනවා. සිත තැන්පත් වෙනවා. චංචල, වහ වහා නොයෙක් කෙලෙස් ඔස්සේ දුවන ස්වභාවය නැවතිලා. කාර්ය බහුල හිතට දැන් නිවාඩුවක් ලැබිලා වගේ. දැන් සන්සුන්ව කුසල් අරමුණේ, භාවනා අරමුණේ පවතිනවා.

එහෙම සංවර වූ හිතට මොන කමටහන දුන්නත් එය ග්‍රහණය කරගන්නවා. සමථ වුනත් විපස්සනා භාවනාවක් වුනත් එහෙමයි. අපේ මාහිමිපාණන් වහන්සේ ඒ විධියටයි පුංචි කාලෙ ඉඳල ධර්ම මාර්ගයේ ක්‍රියාත්මක වුණේ. මෙහි ප්‍රතිඵල ලෙස,

- ☸ සිතේ සන්සුන් බව,
- ☸ ශ්‍රද්ධාව වර්ධනය,
- ☸ ඕනෑම කමටහනක් පහසුවෙන් වැඩීමට ශක්තිය ඇතිවීම,
- ☸ ධර්මය කෙරෙහි වූ අවබෝධය පුළුල් වීම,
- ☸ නොසිතූ ලෙස තමන් නොදත් ධර්ම කරුණු පවා ඉතා පැහැදිලි ලෙස සිතට ගලාගෙන ඒම,
- ☸ කුසල් ආරම්මණයෙන් සිටීමට හැකිවීම,
- ☸ නිවන් මගේ අප්‍රමාදී වීම.

මේ වගේ ගොඩාක් ප්‍රතිඵල ඒ තුළින් අපිට ලැබෙනවා.

මේ බුදුගුණ වැඩීම නා උයනේ මාහිමිපාණන් වහන්සේ අඛණ්ඩව ප්‍රගුණ කළා. මුළු ජීවිත කාලය පුරාම ක්‍රියාත්මක කළා. විදර්ශනාව වඩමින් තම ජීවිතය උතුම් භාවනා කමටහනින් නිතර පවත්වා ගත්තා. ඒ මුල් කමටහනින් බැහැරව ගතවන කාලය, හිඩැස, අතර පියවීමට මාහිමිපාණන් වහන්සේ ඉතිපි සෝ පාඨයෙන් බුදුගුණ භාවනාව අඛණ්ඩව වැඩුවා. නව ගුණ වැල අතෙහි තිබුණත් නැතත් හිතේ හිඩැසක් වෙන්න නොදී මෙය ක්‍රියාත්මක කළා.

පසු කාලයේදී මේ ඉතිපි සෝ ගාථා පාඨයෙන් වඩන වාර ගණන සටහන් කර තබා ගත්තා. අවසන් වරට සටහන් කර ඇත්තේ 2002 පමණය. ඒ වන විට බුදුගුණ ගාථා පාඨයෙන් වාර ලක්ෂ 735 ක් (හත්කෝටි තිස්පස් ලක්ෂයක්) පමණ වඩා තිබෙනවා. ඒ ගණන් කර මතකයේ තබා, සටහන් කර තැබූ ප්‍රමාණය පමණි. මුළු ප්‍රමාණය ඊට වඩා ඉතා විශාල සංඛ්‍යාවක් විය හැකියි.

බුදුගුණ වගේම තෙරුවන් වදින ගාථාපාඨ 3ත් බොහෝ වාර ගණනක් ද වඩා තිබෙනවා. මේ බුදුගුණ වැඩීම නිසා විවිධ අත්දැකීම් ද ලබා තිබෙනවා. සමහර අවස්ථා වල දෙවිවරු පැමිණ යම් යම් අදහස් පවසා තිබෙනවා. ඒ විස්තර පෙර දක්වා තිබෙනවා.

"1970 වසරේ මම ගල්දූවේ ශිෂ්‍ය පිරිසට අභිධර්මය උගන්වන අවස්ථාවක සිදුවීමක්. ඒ බුදුගුණ වැඩීමේ ආශ්චර්යයක්. අභිධර්මයේ නිදානය බුදුරජාණන් වහන්සේ තව්තිසා දිව්‍ය භවනේ දේශනා කළ අභිධර්ම දේශනාවනෙ. මනුෂ්‍ය ගණනින් මාස 03 යි බුදුරජාණන් වහන්සේ දේශනාව කළේ. මම ශිෂ්‍ය භික්ෂූන්ගෙන් ප්‍රශ්ණයක් ඇසුවා. 'ඒ මාස 03 දිව්‍ය වර්ෂ ගණනින් කොපමණද' කියලා. මෙහෙ අවුරුදු 100 ක් එහේ එක දවසයිනේ. නමුත් ඒ ප්‍රශ්ණයට පිළිතුරු මමවත් පෙර හිතලා තිබුණෙ නෑ. ශිෂ්‍ය

භික්ෂූන්ට පිළිතුරු දෙන්න නොහැකි වුණා. ඉතින් මම ගුරුවරයා වශයෙන් පිළිතුරු දිය යුතුයි. මම ඇහැ පියාගෙන ඉතිපි සෝ පාඨය සිහි කළා. පුදුමයක්, එක සැණින් හිතට පිළිතුරු ආවා විනාඩි 09 යි කියලා. ඒ පිළිතුර ශිෂ්‍ය භික්ෂූන්ට කියල පසුව ගණනය කළා. නිවැරදියි. ඒ වන විට මම බුදුගුණ බොහෝ වාර ගණනක් පුරවා තිබුණා." යනුවෙන් අප මාහිමිපාණන් වහන්සේ බුදුගුණ භාවනාව වැඩීමෙන් ලැබූ විශේෂ අත්දැකීමක් මෙසේ දක්වා තිබෙන අතර තවත් මෙබඳු අසිරිමත් බොහෝ දේද අත්විඳ තිබෙනවා.

අපේ ජීවිත වලටත් මෙම උතුම් භාවනාව එක් කර ගැනීම ඉතාම වටිනවා. අපි මේ සිතේ තිබෙන සාමාන්‍ය ස්වභාවය වෙනස් කරගන්න ඕන. සදෙරින් එන අරමුණු හරහා අතරක් නැතිව දුවන්න, කිසිම වැඩකට නැති දේවල් සොය සොයා විමස විමසා ඔහේ කාලය ගෙවන්න සිත හරි කැමතියි. අපි සිතේ පවතින මේ තත්ත්වය වෙනස් කරගන්න ඕන. නැත්නම් අපිට මේ බුද්ධ සාසනයෙනුත් නිසි ඵලයක් ලබාගන්න බැරි වෙනවා. රැකී රක්ෂා සමාජ කටයුතු ආදී හැම දේ තුළින්ම කාර්ය බහුල ජීවිතයක වුනත් අපි උනන්දු වෙනවා නම් මෙය අනුගමනය කරලා ප්‍රතිඵල ලබාගන්න බැරිවෙන්නෙ නෑ.

අප ආචාර්යෝත්තමයන් වහන්සේ ඉතා අසනීප තත්ත්වයෙන් රෝහල් ගතව සිටින විට පවා, බුදුගුණ වඩන විට නව ගුණ වැලෙන් ගණන් කරන ආකාරයෙන් ඇඟිලි ක්‍රියාත්මක වෙනවා. කායිකව ඉතා දුර්වල වුනත් බහුල ලෙස පුරුදු කළ ඒ භාවනා මනසිකාරය, ඒ බුදුගුණ වැඩීම මනස තුළ ක්‍රියාත්මක වෙනවා. එවන් අපහසු අවස්ථාවේදීත් මානසික වශයෙන් දුර්වල නොවී සිටීමට බහුල ලෙස වැඩූ මේ උතුම් භාවනාවන්, වැඩූ ධර්මය තමයි උපකාරය පිණිස පිහිට පිණිස පවතින්නේ. ඒ නිසා අපි මේ ධර්මයට වඩ වඩාත් ළං වෙමු. වඩ වඩාත් ධර්මය ජීවිතයට එකතු කර ගනිමු.




# අරූපතල සමාධි සිත

රූපාවචර ධ්‍යාන වල ඇති කරගත් ශක්තිමත් බවත් සමග අරූපාවචර ධ්‍යාන වලට යොමුවෙනවා. දස කසිණ වලින් ආකාස හැර අන් කසිණ අරමුණකින් සතර වන ධ්‍යානය දක්වා වඩා ඉන් නැගීසිට රූපයන්ගේ ආදීනවත් අරූප සමාපත්ති ආනිසංසත් මෙනෙහි කරනවා. එසේ මෙනෙහි කර කසිණ පටිභාගය උගුළුවා අනන්ත ආකාසය අරමුණු කරමින් ආකාසානඤ්චායතන පළමු අරූප ධ්‍යානය උපදවනවා.


ඒ අනන්ත ආකාසයේ සමාධිය ප්‍රබල වීමෙන් පසු ඒ සමාධියේ ම විඤ්ඤාණය අනන්ත බව අරමුණු කරමින් විඤ්ඤාණඤ්චායතන දෙවන අරූප ධ්‍යානයත්,

ඒ විඤ්ඤාණයෙහි කිසිවක් නැති බව, හිස් බව අරමුණු කරමින් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයත්,


එම ආකිඤ්චඤ්ඤායතන සමාධියෙහි ශාන්ත බව, ප්‍රණීත බව අරමුණු කිරීමෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතන සිව්වන අරූප ධ්‍යානයත් උපදවනවා. මේ අරූප ධ්‍යාන 4 සමග අෂ්ට සමාපත්ති උපදවා ගත් බවට පත් වෙනවා.



2.15. ආනාපාන / ඕදාත පඨවි කසිණ ධ්‍යාන 4 බැගින් නිමවා ආකාසානඤ්චායතනයට ද සමවැදී විඤ්ඤාණඤ්චායතනයට පත්වීම්. ඉතා පහසුවෙන් සිදු කළ හැකි විය.



2.15. පර්යංකය. ආනාපාන / ඕදාත, පඨවි 4 (ධ්‍යාන සතර) බැගිනි. අරූප ධ්‍යාන තුනට ම පහසුවෙන් පත්වීම්.



2.05. පර්යංකය. ආනාපාන / ඕදාත - පඨවි නිමවා අරූප සමාපත්ති තුනට අනතුරුව සතර වැනි අරූප සමාපත්තිය පළමු කොට ලැබීම.

ඉහත දක්වෙන්නේ පූජනීය අප මාහිමිපාණන් වහන්සේ මෙම අරූප ධ්‍යාන ප්‍රගුණ කළ ආකාරය ගැන ලියපු සටහන්. මෙම රූපාවචර ධ්‍යාන 4 හා අරූපාවචර ධ්‍යාන 4 (අෂ්ට සමාපත්ති) උපදවා ගත් මාහිමිපාණන් වහන්සේ එම ධ්‍යාන නැවත නැවත වඩමින්, වශී කරමින් ඇතිකරගත් ධ්‍යාන සිත නිසා ලෝක සත්වයාට, සාසනයට අත්වූයේ විශාල පිහිටක්.

මෙවැනි ධ්‍යාන සමාධීන් උපදවා ගැනීම වත්මන් ජනසමාජයෙහි තරමක් අසීරු කරුණක්. ඒකට හේතුව විශේෂයෙන්ම සත්ව සන්තානයන් එන්න එන්නම ඉතා භයානක කෙලෙසුන්ගෙන් ගහන වීමයි. සන්තානගත කෙලෙස් රුදුරු ලෙස ඉහළ යන්න යන්න ලෝකයේ ගුණ ධර්ම පිරිහී යනවා. ධර්මය දියුණු කරගන්න තියෙන පරිසරය ක්‍රමයෙන් අඩුවෙලා යනවා.

එදා සැවැත්නුවර සිටි හත් කෝටියක් ජනතාව අතරින් කෝටි පහක් ම ජනතාව මාර්ග ඵලලාභී උතුමන් පිරිසක් වුණා. ඒ වගේම ලංකාවෙත් පෙර රජ සමයේ ස්වාමීන් වහන්සේලා අතර මේ ස්වාමීන් වහන්සේ මාර්ග ඵලලාභී උතුමන් වහන්සේ නමක් නොවෙයි කියලා පෙන්විය නොහැකි තරමට වැඩ සිටි සඟ රුවන රහතන් වහන්සේලා, මාර්ග ඵලලාභී උතුමන් වහන්සේලා බවට පත් වුණා. වර්තමානය වෙනකොට ඒ තත්වය හාත්පසින්ම වෙනස් වෙලා. ඒත් ඡන්දය - චිත්තය - විරිය - වීමංසාව ඇතිකරගත් ජීවිතයකට වර්තමානයේ වුනත් පවතින බාධා ජයගෙන මේ උතුම් ධර්ම මාර්ගයේ ඉහළට යන්න පුළුවන්. ඒ බව අපේ මාහිමිපාණන් වහන්සේගේ ජීවිතයෙන් හොඳට පැහැදිලි වෙනවා.

සසර මහා කුසල ශක්තියකට හිමිකම් ඇති නමුත් මාහිමිපාණන් වහන්සේටත් මේ ශක්තිය නිකම්ම ලැබුණක් නොවෙයි. ළදරු වයසේ ඉඳලාම කරන ලද පූර්ණ කැප කිරීමක, අඛණ්ඩ උත්සාහයක, වීර්‍යවන්ත භාවයක ප්‍රතිඵලයක්. ඒ බව මාහිමිපාණන් වහන්සේගේ අත් අකුරින් ම මෙහි තබපු සටහන් තුළින් ඕනෑම කෙනෙකුට පැහැදිලියි. මෙවන් අසීරු යුගයකත් අප්‍රමාදීව ධර්මය වැඩීම

හේතුවෙන් එහි උතුම් ප්‍රතිඵල සාන්දෘෂ්ටිකව ලැබීමේ භාග්‍ය මාහිමිපාණන් වහන්සේ සතු වුණා. මුළු දවස පුරාම ඇතිකරගත් ධ්‍යාන සමාධියෙන් යුතුව වාසය කිරීමේ හැකියාව වගේම ආයූෂ් දිව්‍ය, බ්‍රහ්ම සන්තානගත ගුණ විශේෂයන් තම සන්තානයෙන් ස්පර්ශ කරමින් ආයූෂ් දිව්‍ය රාජයෙක්, බ්‍රහ්ම රාජයෙක් වගේ පරිශුද්ධ සන්තානයකින් යුතුව වැඩ සිටියා. එසේ දියුණු කරගත් ශක්තිය නිසා ආත්මාර්ථය මෙන්ම ලෝක සත්වයාගේ යහපත, සුභසිද්ධිය, ත්‍රිවර්ග සැප පිණිසත් උපකාරී වෙමින් එමගින් ම සාසනයේ දිගු පැවැත්ම වෙනුවෙන් ද ජීවය ශක්තිය ලබා දුන්නා. ඒ තුළින් පැහැදිලිව සනාථ වන කරුණක් නම් සර්වඥරාජයාණන් වහන්සේ දේශනා කළ මේ ප්‍රතිපත්තිය තුළින් යම් ජීවිතයක් දියුණුවට පත් කර ගත්තා නම් ඒ ශක්තිය තමන්ට පමණක් නොවෙයි. තුන් ලෝකයටම ඒ ධර්ම ශක්තිය, ඒ ගුණය, ඒ බල මහිමය විහිදී යනවා. සියල්ලන්ටම ඉන් සෙතක් අත් වෙනවා.


මාහිමිපාණන් වහන්සේ වගේම නොවුනත් අපි කාටත් යම් පමණකට හෝ සමාහිත සිතක්, නීවරණ ක්‍රියාත්මක නොවන සිතක් ඇතිකර ගැනීමට උත්සාහ කිරීම ඉතාම වටිනවා. ඒක තමයි මෙවන් උත්තම චරිත දිහා බලලා, ගුණ ජීවිත දිහා බලලා ඒ ගුණ හඳුනාගෙන අපිට කරන්නට තියෙන දෙය. ඒක උන්වහන්සේලාට නොවෙයි. තම තමන්ටමයි. විශේෂයෙන් භික්ෂූන් වහන්සේ නමක් වගේම ඕනෑම ගිහි කෙනෙක් වුනත් අඛණ්ඩව කැපවීමෙන් උත්සාහ කරලා මෙවන් භාවනාවන් ප්‍රගුණ කිරීම තුළින් සමාධිමත් හිතක් ගොඩනගා ගත්තොත් එමගින් ජීවිතයේ ඇතිවන්නා වූ වෙනස තම තමන්ට මෙලොවදීම අත්විඳින්න පුළුවන්.

ධර්මයේ සැබෑ හරය තියෙන්නේ තව ගොඩක් ඈත. ඒ හරය දැක ගන්න, ඒ උතුම් ධර්ම රසය අත්විඳින්න පිවිසීමක් විතරයි මේ තුළින් අපට ලැබෙන්නේ. නීවරණ ක්‍රියාත්මක නොවන මෙවන් සමාධියක් වඩාගත් සිතක වටිනාකම, ඒ හිතේ සුවය අපිට මෙතරම් දැනෙනවා නම් සැබෑ ධර්ම රසය ජීවිතයට අත්විඳගන්න ලැබුණොත් ඒක මොනතරම් සුවයක් ද කියලා හිතෙනවා. අප ආචාර්යෝත්තම මාහිමිපාණන් වහන්සේටත් කුඩා දරුවා කාලේ එහෙම ආපු සිතිවිල්ල තමයි පැවිදි බවටත් පත් වෙලා, සීලයෙන් වගේම උත්තරි මනුෂ්‍ය ධර්ම කියලා හඳුන්වන, උතුම් දිව්‍ය, බ්‍රහ්ම ලෝක වල උපත පවා හිමි කරලා දෙන්න සමත්වෙන මෙවන් සමාධි ධ්‍යානයන් ඉහළට ම වඩලා ඒ තුළින් ධර්මයේ ගැඹුරට ම බැහැලා උතුම් ධර්ම සුවය විඳි මහා පුණ්‍යවන්ත ජීවිතයක් ඇති කළේ.

මෙවැනි කාලයකදී වුනත් මන්දෝත්සාහී නොවී ශ්‍රද්ධාවෙන් මේ දහමට එළඹිලා, විශ්වාසයෙන් වීර්‍යයෙන් ඒ ධර්මය වැඩීම තුළින් අපිටත් කෙලෙස් බරිත, වික්ෂිප්ත, කැලඹුණ හිතක් වෙනුවට නීවරණ නැති, ශාන්ත, සමාහිත එකඟ වූ සමාධි සිතක් ඇති කරගන්න හැකි වෙනවා.

**"මේ අරියධම්ම නම අපට වඳින්න පුදන්න එනකොට මේ නමට අපෙත් හිස පාත්වෙනවා."**

**(කුරුණෑගල මාස්පොත නාථගණ ආරණ්‍ය සෙනසුන්පතිව වැඩසිටි ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රමයේ සභාපති ධුරය හෙබවූ, රාජකීය පණ්ඩිත අතිපූජනීය ගැටමාන්නේ විමලවංස නාහිමිපාණන් වහන්සේ.)**





# බෝසත් ධර්මතා

බුද්ධකාරක ධර්ම සම්පූර්ණ කරන්නා වූ බෝධිසත්වයන් වහන්සේලා කුමන අත් බැවක් ලැබුවද එහි සුවිශේෂී භාවයකින් යුතුව කටයුතු කරනවා. නායක වෙනවා - ප්‍රධාන වෙනවා. බලවත් වෙනවා. හැකියාවන්ගෙන් යුතු වෙනවා. උසස් ගුණයන්ගෙන් යුතු වෙනවා. බුදුසසුන පවතින කාලයක මනුලොව උපන්නේ නම් පැවිදි බව ලබා ධර්මය දරමින්, පිළිවෙත් මග වඩා සාසනයේ උන්නතිය වෙනුවෙන් මූලිකත්වයෙන් කටයුතු කරනවා.

එවන් බුද්ධාංකුර වූ නා උයනේ මහා ස්වාමීන් වහන්සේ ද මෙබඳු බෝධිසත්ව ලක්ෂණයන්ගෙන් යුතු වුණා.

- ශ්‍රමණ ධර්මයේ උතුම් ඵල වූ සීල - සමාධි - ප්‍රඥා ඉහළින් වැඩුවා.
- ත්‍රිපිටකධාරී වුණා. සංඛාරුපෙක්ඛා ඤාණය තෙක් ධර්ම මාර්ගය සපිරුවා.
- දස පාරමී ගුණ උතුම් සේ සපිරුවා.
- කල්‍යාණ මිත්‍රත්වයෙන් උපරිම සේවය සිව් පිරිස වෙත සලසා දුන්නා. එහිදී බොහෝ ස්වාමීන් වහන්සේලා, විවිධ අය "ස්වාමීන් වහන්ස අපිට ස්වාමීන් වහන්සේගේ උතුම් කල්‍යාණ මිත්‍රත්වය නිවන් දකින තුරු ලැබේවා" යි කී විට "ඒක එහෙම වෙන්න ඕන" යනුවෙන් කරුණාවෙන් අනුමත කර සිටිනවා. එය බෝධිසත්වයන් වහන්සේ නමක් ලෙස තම ශක්තිය පිළිබඳ අවබෝධයෙන් කළ ප්‍රකාශයක් ලෙසයි අපිට වැටහෙන්නේ. එහෙම නොවන කෙනෙකුන් හට ඒ අදහස දක්වන්න අමාරුයි.
- සියල්ලන්ටම උතුම් නායකත්වය, මාර්ගෝපදේශකත්වය ලබා දුන්නා.

- ඕනෑම ගැටළුවකට ත්‍රිපිටක ධර්මාගත බුදු මගට අනුකූලව ධර්ම ඥානයෙන් ද ලෝකාවබෝධ ඥානයෙන් ද යුතුව විසඳුම් ලබා දී බොහෝ ශ්‍රාවකයන් හරිමග, නිසිමග යැවීම සෑමවිටම සිදු කළා.
- අපමණ ලාභ සත්කාර, කීර්ති පැසසුම්, ගෞරව තනතුරු වගේම චෝදනා අපකීර්ති, කරදර බාධක සෑම හමුවේ උපේක්ෂාවෙන් පිරී නොසැලෙන ඉන්ද්‍රඛීලයක් සේ ධර්මය මතම පිහිටා කටයුතු කළා.

මෙලෙස බොහෝ කරුණු වලින් පිරී ඒ දිවිය සැබෑ බෝධිසත්ව ජීවිතයක්. මාහිමිපාණන් වහන්සේ ඊට ගැළපෙන ලෙස තම දිවිය ගත කළා. බෝසත් ජීවිත කථා, බුද්ධ චරිතය අපමණ ගෞරවයෙන්, ශ්‍රද්ධාවෙන් කැමැත්තෙන් දේශනා කරන අයුරු දක්නට ලැබුණා.

මාහිමිපාණන් වහන්සේගේ ඉහත බෝසත් චරිත ලක්ෂණ පෙන්නුම් කරන සාධක බොහෝ ප්‍රමාණයක් තිබෙනවා.

- විවිධ අවස්ථාවන්හිදී අඥාන ජනයාගේ දෝෂාරෝපණයන්ට ලක්වීම
- තම ආචාර්ය පණ්ඩිත මාහිමිපාණන් වහන්සේගේ හා දෙස් විදෙස් උතුමන්ගේ නොයෙක් පැසසුම්
- යෝගාශ්‍රම සංඝයාට ම වඩා පූජනීය ස්වාමීන් වහන්සේගේ ගුණය ම මහත්බව තම ඇදුරු මහෝත්තමයන් වහන්සේ ම දැක්වීම
- දෙස් - විදෙස් වලින් ලැබූ අපමණ ලාභ සත්කාර
- වැඩිහිටි උතුමන් සිටියදී ම යෝගාශ්‍රම අනුශාසකත්වය ලැබීම
- මඩිහේ මහා නාහිමි ආදී සම්භාවනීය උගත් පැවිදි උතුමන් වහන්සේලා විසින් ලක්දිව ප්‍රධානම කමටහන් ගුරුවරයා ලෙස දැක්වීම හා වර්ණනා, ප්‍රශංසා කිරීම

- "මහෝපාධ්‍යාය", රාමඤ්ඤ මහා නිකායේ "අනුනායක" හා බුරුම රටින් පුදන ලද "මහා කම්මට්ඨානාචාර්‍ය්‍ය" පදවිය ආදී විවිධ තනතුරු සම්මාන වලින් පිදුම් ලැබීම

මෙබඳු තම ජීවිතයේ බොහෝ දේ මාහිමිපාණන් වහන්සේ ධර්මතාවන් ලෙසින් සලකා උපේක්ෂාවෙන් යුතුව ඊට මුහුණ දුන්නා. සැබෑ බෝසත් ගුණය ඒම සියලු කරුණු තුළින් පැහැදිලි වෙනවා.

ඒ ගුණයන් නිසා ලෝකයාට සිදුවූ අර්ථය අසීමිතය. අප ස්වාමීන් වහන්සේ ද ඒ සියලු විදියේ කරුණු හමුවේ තම උතුම් පාරමී ධර්ම සම්භාරය සපුරා ගත්තා. කුමන අවස්ථාවකවත් ධර්මය ඉක්මවා නොයා දහමට නිසිසේ සාසනයේ උන්නතිය වෙනුවෙන් මූලිකත්වය, නායකත්වය දරමින් බෝධිසත්ව ධර්මතාවක් ලෙස සැබෑ සසුන් සේවාව මනාව ඉටු කළා. මේ සියලු කරුණු අප මහෝත්තම මාහිමි චරිතයේ බෝධිසත්ව ධර්මතා ප්‍රකට කරනවා.





# මොහඳුරින් වැසුණු සැබෑව


සත්ව, පුද්ගල, වස්තු ස්වභාවය තුළින් මේ ලෝකය දිහා බැලීම, මෝහය නිසා වැරදි ලෙස ලෝකය දැකීමක්. යථා ස්වභාවය වහලා මෝහය තුළින් දකින ඒ දැකීම ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා අනුදැන වදාළ දැකීම නොවෙයි. ලෝකයා දකින ඒ සාමාන්‍ය දැකීම මත කල්ප අසංඛ්‍ය ගණන් ජීවත්වුනත් ඒ දැක්ම තුළ විශේෂ ඤාණයක් පහළ කරගන්න බෑ. සත්ව - පුද්ගල - වස්තු ලෙස ඇති කරගත් දැක්ම බුදු දහමේ පෙන්වා දෙන විශේෂ දැක්මක් (විදර්ශනා ඤාණ) ඇති කරගැනීමට අදාළ වන ප්‍රස්තුතය නොවෙයි. ඒ සඳහා එකම මග වන්නේ ලොව සජීවී අජීවී වූ ද සත්ව, පුද්ගල, ද්‍රව්‍ය - සංකල්පමය වූ ද සියලු දේ "රූප - නාම" වශයෙන් සැබෑ ලෙස අවබෝධ කර ගැනීමයි. දැක ගැනීමයි. උතුම් සත්‍යාවබෝධයට නම් ඒ විශේෂ දැක්ම ඇතිකරගත යුතුම වෙනවා.

## රූප


ලොව ජීවී - අජීවී, සත්ව - පුද්ගල වස්තු ද්‍රව්‍ය සියල්ල නිර්මාණය වී ඇති සැබෑම මූල (ද්‍රව්‍ය) ය වන්නේ "රූප" යි. එහි නොබෙදිය හැකි ඉතාම සූක්ෂම කොටස ශුද්ධාෂ්ටකයයි. පඨවි - ආපෝ - තේජෝ - වායෝ යන

මහා භූත රූප 4 හා වර්ණ - ගන්ධ - රස - ඕජා යන උපාදාය රූප 4 ක් වශයෙන් 8 ක් එහි තියෙනවා. එය රූප කලාපයක් ලෙස හඳුන්වනවා. එබඳු කලාප වර්ග කිහිපයක් තියෙනවා. ඒ සියල්ල තුළම තියෙන්නේ රූප 28 යි. ඒ රූප 28 හේතුවෙන් තමයි සත්ව - පුද්ගල - ද්‍රව්‍ය සියල්ල හැදිලා තියෙන්නේ ඒ වගේම අලුතෙන් හැදෙන්නෙත්.


"මම" කියන මේ බඹයක් තරම් වූ ලෝකයේ ඇති හිත - කය (පංචස්කන්ධ) දෙකෙන් කය කියන්නේ මේ වගේ රූප ගොඩකටයි කියලා මේ "රූප" භාවනා වඩලා පළමුව අවබෝධ කරගන්නවා. එහෙම තම කය පිළිබඳව "රූප" භාවනා වඩලා ඇති කරගත් විසිතුරු අවබෝධයෙන් බාහිර ලෝකයත් දකලා "රූප" පිළිබඳ "රූප පරිච්ඡේද ඤාණය" පහළ කරගන්නවා. මේ ඤාණය ඇති කරගැනීම නිවන් මගට අවශ්‍යමයි.




**2.15 පර්යංකය, ආනාපාන - ඕදාත - ධාතු. දඬිව මෙනෙහි කරමින් සමාධියෙන් ධාතු බැලීමි. කය නොපෙනී සුදක් පෙනේ, ඒ තුළ සියුම් ලෙස සතර ධාතු බැලීමි.**



**2.15. පර්යංකය. ආනාපාන - නිමවා ධාතු කර්මස්ථානය කොටස් 42 ම සවිස්තරව සතර ධාතු හා රූප කලාප අහුලමින් ඉතා හොඳින් වැඩුවෙමි.**



අද දින රූප පරිග්ගහණය සම්පූර්ණ කළා. (රූප ධර්ම වෙන් වෙන්ව මනා සේ පරීක්ෂා කර අවබෝධ කරගැනීම.)



10 දින පර්යංක වාර පහේදිම කර්මස්ථාන සාර්ථක විය. ආනාපාන ධ්‍යාන සතර, ඕදාත අෂ්ට සමාපත්ති, ආධ්‍යාත්මික රූප පරිග්‍රහණය සම්පූර්ණයි.

පූජනීය අප මාහිමිපාණන් වහන්සේ මෙම රූප පරිච්ඡේද ඤාණය සපුරා ගත් අයුරු ඉහත සටහන් තුළින් පැහැදිලි වෙනවා. එසේ ඇතිකරගත් ඤාණය නිසාම මාහිමිපාණන් වහන්සේ තම කය මෙන්ම ලෝකය පිළිබඳව ද පෘථුල අවබෝධයකින් වැඩසිටි බව ඒ අවික්ෂිප්ත, උපේක්ෂා ජීවිතයෙන් දක්නට ලැබුණා. ලෙඩ - රෝග ආදී වූ කායිකාබාධ වලදී කයට සිදුවන දේ දකිමින් නුවණින් වටහා ගනිමින් ඉවසීමෙන්, උපේක්ෂාවෙන් කටයුතු කළා මෙන්ම වෛද්‍ය - ශිෂ්‍ය අදහස් වලට ද අවනත වෙමින් සියල්ල තුළ ධර්මානුකූලභාවය පෙන්නුම් කළා.

මෙම ධර්ම ශක්තිය මාහිමිපාණන් වහන්සේට පමණක් විශේෂ වූවක් නොවේ. ඕනෑම කෙනෙක් හට මෙම භාවනා වඩලා ඒ වැඩීම අනුව ප්‍රතිඵල, ධර්ම ශක්තීන්, ධර්මය පිළිබඳ, ජීවිතය - ලෝකය පිළිබඳ නිවැරදි වැටහීම් අවබෝධයන් ලබා ගන්න පුළුවන්. ඒක ධර්මයේ තියෙන ගුණයක්. ධර්මය තිබූ පමණින් ප්‍රතිඵල නොලැබෙන බව

පැහැදිලියි. අපි එහි යෙදුනොත් අනුගමනය කළොත් ප්‍රතිඵල ලැබෙනවා.

අපි මේ කය දිහා මෝහයෙන් යුතුව බලලා ඇති කරගත්ත වැරදි වැටහීම නිසා කය හේතු කොටගෙන කය සරසන්න, කය පිනවන්න යාමෙන් බොහෝ අකුසල් සිදුකර ගන්නවා. ඉන් සිදුවන්නේ කය නිසා ද අනේක දුක් විඳිමින් සිටින ගමන් තව තව දුක් රැස් කරගන්න එක. ඒත් අපි සැබෑ ලෙස ධර්මයට යොමුවෙලා මේ "රූප" භාවනාවන් වඩලා මෝහය වෙනුවට ඥාණාන්විතව මේ කයේ ස්වභාවය වටහා ගත්තොත් එදට අපි කය නිසා අකුසල් රැස් කරනවා වෙනුවට මේ කයේ උරුමකමත් සහමුලින් තුරන් කර ගන්නටයි උත්සාහ ගන්නේ.

## නාම

සම්මුති ලෙස අපි දකින සත්වයා තුළ ඉහත කී රූප කය හැරුණු කොට පවතින හිත තමයි "නාම" කියන්නේ. ඊට සිත හා 52 ක් පමණ වූ චෛතසික අයත් වෙනවා. සියලු භූමිවල වසන සියලු සත්වයන්ට මේ සිත හා කය හෙවත් රූප - නාම යන කොටස් 2 ම හෝ එක් කොටසක් හෝ තියෙනවා. මේ හැර වෙනත් යමක් සත්වයන් තුළ නැහැ. ඉහතින් දක්වුණු "රූප ධර්ම" හැරුණු කොට මේ "නාම ධර්ම" පිළිබඳව යථාවබෝධය ඇතිකර ගැනීම විදර්ශනාවට මූලික වූ දෙවැනි කරුණ වෙනවා. ඊට හේතුව "චිත්ත - චෛතසික" ලෙස කියවෙන පරමාර්ථ ධර්ම කියන්නේ මේ "නාම ධර්මයන්" වන බැවිනුත් එය ඉහළ ඥාණ දර්ශණයන් ඇති කරගැනීමට ප්‍රස්තුතය වන නිසාත් ය.

මේ "නාම" කර්මස්ථානය වැඩීමේදී තමන් වැඩූ ධ්‍යාන භාවනාවන් තුළ මෙන්ම ද්වාර හය අනුව ඇති වන කුසල - අකුසල සිත් තුළත් පවතින නාම ධර්ම වෙන් වෙන්ව පරීක්ෂා කර මනාව හඳුනා ගැනීම (පරිග්ගහ) කිරීම සිදු කරනවා. සදෙර මූලිකව පහළ වන සියලු සිත් - චිත්ත වීථි ක්‍රියාත්මකවීම මෙම නාම කර්මස්ථානයට අනුව විශද කරගනිමින් මේ රටාවට දිගින් දිගටම භාවනාව වඩනවා.


30 ද නාම පරිග්ගහණය පටන් ගත්තා. අද දින නාම පරිග්‍රහණය සම්පූර්ණ කෙළෙමි.

12 දින පර්යංක වාර පහ ඉතා හොඳින් සම්පූර්ණ විය. බ්‍රහ්ම විහාර ධ්‍යාන සියල්ලෙහි ද බුද්ධානුස්සති - අවිඤ්ඤාණක දස අසුභ ධ්‍යාන - මරණ සති - නීල කසිණ සමාපත්ති අටෙහි ද නාම පරිග්‍රහණය සපුරණ ලදි.


2.15. පර්යංකය. ආනාපාන - ඕදාත - මෙත්තා - කරුණා - මුදිතා - අට්ඨික - දස අසුභ ඒ ඒ කමටහනට නියමිත අර්පණා සම වැදී නාම රූප පරිච්ඡේද කරන ලදි. 4.40. සක්මන්. බුදුගුණ. 5.20.

**පර්යංකය, ආනාපාන - මෙත්තා - කරුණා - මුදිතා - උපේක්ෂා දිසාඵරණ වශයෙන් (දස දිසාවන්ට පැතිරීම වශයෙන්) ධ්‍යාන සමවැදී නාම රූප පරිච්ඡේද කරන ලදී.**


ඉහත අයුරින් රූප ධර්මත් නාම ධර්මත් පරීක්ෂා කර අවබෝධ කර ගැනීම "රූප පරිග්ගහ, නාම පරිග්ගහ" නිමවීමෙන් අනතුරුව රූප - නාම ධර්ම එකටම පරීක්ෂා කර වටහා ගන්නවා. ඒ "රූප - අරූප (රූප - නාම) පරිග්ගහ,"යයි. රූප - නාම ධර්ම එකින් එක වෙන් කරමින් පරීක්ෂා කිරීම, අවබෝධ කර ගැනීම නම් වූ "රූප අරූප වවත්ථාපනය" ද වඩමින් නාම - රූප පිළිබඳව ඉතා පුළුල් අවබෝධයක්, ඥාණයක් ඇති කරගන්නවා.




**5.15. පර්යංකය. රූපාරූප පරිග්ගහ වශයෙන් මුල සිට නාම රූප බැලීම. විශේෂත්වයක් වශයෙන් ශක්තිමත් චිත්ත ඒකාග්‍රතාව පහළ විය.**



**31.ද රූප අරූප පරිග්‍රහණයත් රූප අරූප වවත්ථානයත් පැවැත්වීමට අවසර ලැබුණා. අද දින ඒ සියල්ල ඉතාමත් හොඳින් සම්පූර්ණ කළා.**



15 දින පර්යංක වාර පහම සපිරිණි. හදය රූපාදී ඉතිරි සියලු රූපයන් අනුවද කුශල නාම වීථින්, ද්වාර සයේම සියලු අකුශල නාම වීථින් අනුව අරූප පරිග්‍රහණය නිමවා බාහිර නාම රූප පරිග්‍රහණය සපිරිණි. අජ්ඣත්ත බහිද්ධා නාම රූප, අනන්ත ලෝක ධාතු, දස දිශා සියලු තැන පරිග්‍රහණය කිරීමේදී චිත්ත සමාධිය දැඩි සේ පහළ විය.


2.20. පර්යංකය.
අජ්ඣත්ත බහිද්ධා රූප - අරූප - පරිග්‍රහණය හා වවත්ථානය මැනවින් කෙරේණි.

**2.20. පර්යංකය. අජ්ඣත්ත බහිද්ධා රූප - අරූප - පරිග්‍රහණය හා වවත්ථානය මැනවින් කෙරේණි.**

මාහිමිපාණන් වහන්සේ ඉහත සියලු කමටහන් ඉතා පහසුවෙන් සපුරා ඇති ආකාරය පැහැදිලි ය.

සාමාන්‍ය මනසක ස්වරූපය මේ කය - සිත පිළිබඳව අවබෝධයක් නැතිකම. එයට මෝහය, මුලාව කියලා කියනවා. ඒ මෝහය දුරු කරගෙන යථාවබෝධය ඇතිකරගන්නයි මේ නාම - රූප පිළිබඳව පිරිසිඳ දැකීමට මේ උතුම් භාවනා කමටහන් ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළේ. ත්‍රිපිටක දහමේ එන ආකාරයෙන් බුරුම රට පූජනීය ආචිණ්ණ (සයාඩෝ) මාහිමිපාණන් වහන්සේ පැහැදිලිව එය විස්තර කරලා දෙනවා. ඒ ක්‍රමයයි මාහිමිපාණන් වහන්සේ අනුගමනය කළේ.

මෙම භාවනා පුහුණුවීමේදී සමාධි ආලෝකය පාදක කරගෙන සැබෑ නාම - රූප සම්මර්ශනය කරනවා. ඒ සැබෑ නාම - රූප සම්මර්ශනය කිරීමේදී සම්මුතියෙන් අපි දකින මේ කය - හිත ගැන ඊට වඩා ගැඹුරෙන්, යථා

ස්වභාවයෙන්ම දකින්න පුළුවන්වෙන නුවණක් මතු වෙනවා. ඒ තමයි "නාම - රූප පරිච්ඡේද ඥානය".

මේ යථා ස්වභාවය නොදන්න, නොදකිනකම හේතුවෙන් සත්වයෝ අපමණ අකුසල් රැස්කරමින් දුකටම වැටෙනවා. ඒත් අපි යම් තරමින් හෝ මේ වටිනා අවබෝධය ජීවිත තුළ ඇති කරගත්තොත් එදාට අපිට වැටහෙනවා නාම - රූප පමණක් ඇති තැනක "මම, මගේ" ආදී ලෙස අවිද්‍යාවෙන් සංකල්ප මවාගෙන සිදු කරන වැරැද්ද මොනතරම් බරපතලද කියලා. එවිට අපි උත්සාහ කරන්නේ ඒ මාර්ගයෙන් ඉවත් වෙන්න. ඒ වගේම ඒ වැරදි ජීවිතය ගැන කලකිරෙනවා. එය පිළිකුල් කරනවා. එහි නො ඇලෙනවා. ඉන් මිදෙනවා. අපි මේ නාම - රූප භාවනාවන් වඩලා යම් පමණ හෝ අවබෝධයක්, ඥානයක් ඇතිකර ගත්තොත් එය නිවන් මගට ලොකු පිටුවහලක් වෙනවා. මේ නාම - රූප පිළිබඳව යථාවබෝධය ඇතිකර ගැනීම නිවන් මග තුළ විශේෂ සන්ධිස්ථානයක් වෙනවා.

පූජනීය මාහිමිපාණන් වහන්සේ මෙතරම් සුවිශේෂිතව, සුපූජනීයව සඟතලය ශෝභමාන කරමින් වැඩසිටීමටත්, ලෝවැසි දනන් මනෝනන්දනයට පත් කරමින් දහම් මග සනසවන්නටත් මෙවන් ධර්ම ඥානයෙන් මෙන්ම මෙවන් භාවනා ඥානයෙන් ද සුපෝෂිතවීම බෙහෙවින්ම ඉවහල් වූ බව පැහැදිලි කරුණක්. අපිත් ඒ මග යාමටත්, එවන් ජීවිත අවබෝධයන් ධර්ම ඥානයන් ඇතිකර ගැනීමටත් මේ භාවනා මාර්ගයන් පුරුදු පුහුණු කිරීමට උත්සුකවීම ඉතා වටිනවා.



# සතිමත් බව

ධර්මතාවන් වැඩෙන්නේ ද ධර්මතාවන් දුර්වලව පවතින්නේ ද සිත තුළ ය. සිත තුළ පහළ වන, ක්‍රියාත්මක වන ධර්මයන් අතර සමහර ධර්ම සිතෙහි පැවතීම, වැඩීම හොඳ ය. තවත් ධර්ම දුරු කිරීම මුලිනුපුටා දැමීම ද කළ යුතුය. ඒ අතර සමහර ධර්ම අඩු - වැඩි නො කරමින් ද පවත්වා ගැනීම නිවන් මග තුළ වඩා ප්‍රතිඵල ගෙන දෙනවා. සිහිය, සතිමත් බව ඊට විශේෂ වනවා. එය අතරක් නැර හැම විටම, හැම ක්‍රියාවක් තුළම ඉහළින්ම පවත්වා ගත යුතු වෙනවා. සිහිය නොමැතිකම හේතුවෙන් යම්තාක් සිදුවන අතපසු වීම්, වැරදි, අකුසල් සියල්ල තුළින් බොහෝ සෙයින්ම මිදීමට සිහිය නම් ධර්මතාවය බලවත් අනුග්‍රහයක් ලබා දෙනවා.

අභ්‍යන්තරයෙහි පවතින ගුණයන්ගේ මහත්වය නිසිසේ දැකගත නොහැකි වුවත් මාහිමිපාණන් වහන්සේ සතුව තිබූ බලවත් සතිමත් භාවයට මවිත වෙමින් බොහෝ පිරිස ශ්‍රද්ධාව වඩාත් දියුණුකර ගත්තේය. එනිසාම යම් යම් අදහස් ද පලකළේය. "මෙතරම් සතිමත් බවින් යුත් උතුමන් වහන්සේ නමක් වෙන කොතැනකදීවත් අපි දැකලා නෑ. මා හිතන්නේ මේ බුද්ධ සාසනේ මේ වගේ සතිමත් බවකින් යුතු අවසාන ස්වාමීන් වහන්සේ වෙන්න පුළුවන්. මේ තරම් සතියෙන් යුතු තවත් ස්වාමීන් වහන්සේ නමක් දකින්න ලැබෙන එකක් නෑ." යනුවෙන් බුරුම රටදී මාහිමිපාණන් වහන්සේ සක්මන් භාවනාවෙහි නිරත වූ අයුරු දැක එක් විදේශීය ස්වාමීන් වහන්සේ නමක් විසින් කරන ලද ප්‍රකාශය ඊට එක් උදාහරණයක්.

කුඩා කාලයේ පටන් සතිපට්ඨානය පුරුදු කිරීමට මාහිමිපාණන් වහන්සේ උනන්දු වුණා. සතිය දියුණු කරන්නට නම් මුල් අවදියේ අධිෂ්ඨාන පූර්වකව ඉතා ඕනෑකමින්, වීර්යයෙන් ටිකෙන් ටික එය හුරු කරන්න ඕන. එක පාරට අඛණ්ඩව පැවැත්විය හැකි සතියක් ඇතිවෙන්නේ නෑ මෙතරම්

ශක්තිමත් යැයි විශේෂ ලෙස අද අප පවසන ඒ සතිමත්බව . නා උයනේ මාහිමිපාණන් වහන්සේ ද ක්‍රමානුකූලව සකස් කරගත්තක් වෙනවා. මුල් කාලයේ කැපවීමෙන් සිහිය පිහිටුවන්නට භාවනා වඩමින් පුහුණුවීම් කර ඇත. ඒ ප්‍රවුජ්‍යාවේ මුල්ම අවදියේ පටන්ම ය.

පූජනීය අප මාහිමිපාණන් වහන්සේ සාමණේර අවදිය නාඋගණ ආරණ්‍යයේ ගත කරද්දී දිනක් රාත්‍රියෙහි තම කුටියට වඩින අතරමගදී විශාල නයෙකු හමුවී තිබෙනවා. ඒ වෙලාවේ ඒ නයාට පාරෙන් මාරු වී ඉවතට යාමට මාහිමිපාණන් වහන්සේ හෙමින් පසු පසට වී ඇත. ඒ "පස්සට යනවා, පස්සට යනවා" යි සිහිකරමින් සිහියෙන් යුතුවම ය. එසේ පස්සට යන විට බිම වැටී ඇත. වැටෙන විටද සිහියෙහි වෙනසක් නොවී "වැටෙනවා, වැටෙනවා" යි සිහියෙන් යුතු මනසිකාරයෙන්ම බිම වැටී ඇත. සතිමත්භාවය පුරුදු කළ ඒ මුල් යුගයේදී මාහිමිපාණන් වහන්සේ එතරම් සතිමත්ව කටයුතු කර ඇත.

සතිය දියුණු වන ලෙසට කාලසටහනට අනුව තම ජීවිතය පවත්වාගෙන ආවා. දිනපතාම තම කටයුතු සටහන් කළා. ඒ කාලයේ ත්‍රිපිටකය පාඩම් දීම් සිදු කළා. දවසකට විශාල කොටසක් පාඩම් දෙනවා. නමුත් පාඩම් කරන්නේ පැයක කාලයක් විතරයි. හොඳ ධාරණ ශක්තියක් මාහිමිපාණන් වහන්සේ සතුව තිබුණා. ඊට හේතුව වූයේ භාවිත සතියයි. "සතිය පුරුදු කිරීමෙන් තමයි කෙටි වෙලාවකින් වැඩි ප්‍රමාණයක් පාඩම් හිටින්නේ" යනුවෙන් භාවිත සතිමත්බව හේතුවෙන් තම ධාරණ ශක්තියද දියුණු කරගත් අයුරු විටෙක පවසා සිටියා. සතිය දියුණු කර ගැනීම තුළ මහත් වූ අර්ථ සිද්ධියම සිදුවෙනවා.

මනා සතිමත්භාවය තුළ සිතට එන අරමුණු හරහා කෙලෙස් ඉපදීමට පෙර ඒ අරමුණ ව්‍යවස්ථාපනයේදී ම අකුසලින් මුදවා කුසලයට යොමු කර ගැනීමට ශක්තිය ඇති වෙනවා. එමගින් ගෙවන නිමේෂය නිවන්

මග තුළ කුසල් දහමින් හිස් නොවී ඒ ඒ අරමුණු හරහා කුසල් වැඩෙන සේ අර්ථවත් සේ නොසිස් සේ කාලය ගෙවන්න හැකි වෙනවා. මාහිමිපාණන් වහන්සේ අකුරටම ක්‍රියාත්මක කළ මේ නොසිස් වැඩපිළිවෙළට පූර්වාංගම වූයේ භාවිත වූ බහුලීකෘත වූ සතියයි. එනිසාම අප හට නිතර ආදර්ශයෙන් නොනැවතී දෙන අවවාදයක් තිබුණා. "මම මේ ප්‍රතිපත්ති මග තුළ නොසිස්ව කාලය ගෙවනවා. මේ ආයුෂ්මතුන් වහන්සේලත් තම කාලය නොසිස්ව ගෙවන්න උත්සාහ ගන්න ඕන." යනු ඒ ඔවදනයි.

එහි තවත් උතුම් අවස්ථාවක් ගැන මාහිමිපාණන් වහන්සේ කරන ලද ප්‍රකාශයක් තිබුණා. ඒ වස් කාලයක් පුරාවට එකදු කෙලෙස් සිතක් හෝ ඇති නොකර ගනිමින් වැඩ වාසය කිරීම පිළිබඳවයි. මේ ධර්මයේ ශක්තියයි. ධර්මය වැඩීමේ ශක්තියයි. පූජනීය මාහිමිපාණන් වහන්සේ ධර්මයේ වටිනාකම පෙන්වා දෙනවා. එය වැඩීමේ අගය පෙන්වා දෙනවා. ඒ සඳහා දිරිමත් කිරීමට තම ජීවිතයේ දහස් ගණන් සුවිශේෂී දේ තිබුණත් ඉතා කලාතුරකින් මෙවන් දෙයක් ද උදාහරණ කොට ගෙන පෙන්වා දෙනවා.


මතක ශක්තිය, සතිමත්බව නිසාම දියුණු වන්නක් බව අප ස්වාමීන් වහන්සේ ද ප්‍රකාශ කරනවා. එය ප්‍රත්‍යක්ෂය. සිහියෙන් යුතුව වාසය කළ කාලය තුළ අපිට ද බොහෝ දේ මතකය. ඒත් ඒ අවධානයෙන් තොරව ගෙවූ කාලයේ බොහෝ දේ මතක නැත. ඒ අනුව මාහිමිපාණන් වහන්සේගේ මේ සතිමත්බව පිළිබඳව තවදුරටත් අවබෝධ කරගත හැකි වන්නේ ලෝකයට විවෘත වන මතක ශක්තිය පිළිබඳව විමසීමෙන්ය. තම ජීවිතය පිළිබඳව සලකා බලද්දී මාහිමිපාණන් වහන්සේට අතදරු අවදියේ පටන් සියල්ල දින - වකවානු, නම් - ගම් සහිතව මතකය . එනිසාම "මගේ ජීවිතයේ ගෙවුණු කාලය මට අද වගේ මතකයි. ඒ සියල්ල ආවර්ජනා කරන්න පුළුවන්." යන්න අප මාහිමිපාණන් වහන්සේ බොහෝ විට පවසන කරුණක්.

මෙහි උච්චතම අවස්ථාව වන්නේ ධර්මය පිළිබඳව සලකා බලන විටය. ත්‍රිපිටකය හා විශුද්ධි මාර්ගය ආදී තව බොහෝ ග්‍රන්ථයන් ද මතකයෙන් දරා සිටින්නට කෙතරම් බලවත් සතියක් ඉවහල් වන්නට ඇත්දැයි සිතේ. එහි ද විශේෂ අවස්ථාවක් වනවා. ත්‍රිපිටකයේ යමක් ගැන පැහැදිලි කරන විට පෙළ - අටුවාවන්හි තිබෙන ස්ථානය, පිටුව පවා බොහෝ සෙයින්ම ප්‍රකාශ කිරීමට මාහිමිපාණන් වහන්සේ සමත්ව සිටියා.

මේ ගැන ස්වාමීන් වහන්සේ නමක් තම අත්දැකීමක් ප්‍රකාශ කළා. උන්වහන්සේ කිසියම් කරුණක් දැන ගැනීමට මාහිමිපාණන් වහන්සේ වෙත ගොස් විමසා තිබෙනවා. එය මනාව විස්තර කර එම විස්තර පෙළ - අටුවා ග්‍රන්ථ වල ස්ථාන වෙන වෙනම පිටු සමග පවසා තිබෙනවා. "මට සැකයක් ඇති වුනා නා උයනේ ස්වාමීන් වහන්සේ අභිශ්‍රද්ධාවෙන් ද මෙහෙම කියන්නේ කියලා." යැයි පැවසූ එම ස්වාමීන් වහන්සේට එලෙස සිත්වී තිබෙනවා.

කුමන සාසනික කටයුත්තක්, වෙනයම් පිංකමකට සම්බන්ධ කරුණක් හෝ එදිනෙදා අසන්නට, දැනගන්නට ලැබෙන නම් - ගම් - දිනයන් පිළිබඳව වුනත් එක වරක් ඇසුවද අප ස්වාමීන්ද්‍රයන් වහන්සේ නැවත ඕනෑම වේලාවක ඒ නම - ගම - දිනය ආදිය නිවැරදිව ප්‍රකාශ කරනවා. ඒ මාහිමිපාණන් වහන්සේ සැමවිට පුරුදු කළ භාවිත කළ සතිමත්බව හේතුවෙන් ඒ ඒ මොහොතක් ගානේ තම කටයුතු හා සබැඳි දේ ගැන පිහිටන මනා මතකයයි.

අපිට සමහර දේ අමතක වෙනවා. තවත් විට මට දැන් වයසයි, ඒ ගැන දැන් මතක නෑ යනුවෙන් පවසනවා. ඒත් මාහිමිපාණන් වහන්සේගේ සතිමත්බවටත්, ඒ මතකයටත් එබන්දක් සිදුවුණේ නැත. අවසන් මොහොත තෙක්ම බලවත් සතිමත්බවින් වැඩසිටියා. මතකයද එලෙසම ය. වාර්ෂිකව තම ජීවිතයේ සුවිශේෂිත අවස්ථාවන් එලෙසම සිහියට නංවනවා ඊට උදාහරණ බොහෝ තිබෙනවා.



මා පැවිදි වීම පිණිස අරණ්‍යයට පැමිණියේ 1956. 10. 27 - සනි (දින).
පැවිදි වූයේ 1957. 03. 27. බුද (දින),
උපසම්පද වූයේ 1959. 07. 15. බුද (දින),
අදට මා පැමිණ වර්ෂ 40 කි. මාස වශයෙන් 480 කි. සති වශයෙන් 2085 කි. දින වශයෙන් (14600 කි) දහතරදහස් හය සියයකි. උපාසක දින 150 කි. සාමණේර 850. උපසම්පද වීමට දින 1000. දැනට උපසම්පදවෙන් දින 13,600 කි.
බුදුගුණ ලක්ෂ වාර 555 කි.

*බුරුමයේ වැඩ සිටින අවස්ථා වලදී පවා එබඳු විශේෂ දින කීපයක්ම සිහිපත් කරමින් සංඝ පූජාවන් ආදී විශේෂ කුසල කර්මයන්ද සිදු කර ඇති අතර ඉන් එක දිනකදී කරන ලද සටහනක් මෙහි දැක්වෙනවා.*

*දිනක් අප ස්වාමීන්ද්‍රයන් වහන්සේ නිමලව ආරණ්‍ය බලා වැඩම කරන අතරතුර හදිසියේ අසනීප වී සිහිනැති තත්වයට පත්ව ඇත. ප්‍රතිකාරයක් සඳහා තිස්සමහාරාම රෝහල වෙත යමින් සිටි අතරතුර මාහිම්පාණන් වහන්සේගේ සිහිය යථා තත්වයට පත්වී ඇත. සිහිය පැමිණි විටම ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රකාශ කර ඇත්තේ "මේ නිමලව යන පාර නෙවෙයිනෙ" යනුවෙනි. රෝගාතුරව ප්‍රතිකාර ලබමින් වේදනාබරිතව සිටි බොහෝ අවස්ථාවන් වලදී ද මනා සතියෙන් යුතුව වැඩ සිටියා.*

# අවසන් සිහිය

රෝගාබාධයන්ගේ උත්සන්නබව සමගින් පූජනීය මාහිමිපාණන් වහන්සේ රෝහල් ගත කරන ලදි. එහිදීද සතිය හැකි උපරිමයෙන් පවත්වා ගනිමින් සියලු දේ පිළිබඳව උපේක්ෂාවෙන් වැඩසිටියා. අවබෝධයෙන් යුතුව වැඩසිටියා. අවසාන අවස්ථාවෙහිත් සිහියෙන් වැඩසිටි මාහිමිපාණන් වහන්සේ අසල සිටි තම ශිෂ්‍යවරයන් වහන්සේලා හට කථා කොට "ආයුෂ්මතුන් මේ විදියට ජීවත්වන එක තේරුමක් නෑ. මම දැන් මේ කය අතහරින්නයි කල්පනාව" යනුවෙන් ප්‍රකාශ කර තිබෙනවා.

මේ ආකාරයෙන් විමසන විටදී අප මහා ස්වාමීන්ද්‍ර උත්තම ජීවිතය තුළ නොයෙක් ධර්මතාවන් ඇති කර ගත්තා. වැඩුවා. භාවිත බහුලීකෘත කළා. ඒ අතර සියල්ලටම උපකාරක ධර්මයක් වශයෙන් ද පවතිමින්, බහුලව පවත්වන ලද, අඛණ්ඩ කොට පවත්වන ලද, සැම තැන්හිදීම පවත්වන ලද, පූර්වාංගම කොට පවත්වන ලද යම් ධර්මයක් වේ නම් ඒ මේ "සතිය" නම් වූ ධර්මතාවයම වන්නට ඇතැයි සිතේ.

මාහිමිපාණන් වහන්සේගේ ඒ සතිමත් ජීවිතය කාහට වුව මහත් ආදර්ශයක්ම වෙනවා. සතිය උපදවාගත්, පිහිටුවාගත්, දියුණු කරගත්, භාවිත කරගත්, බහුලීකෘත කරගත් හිත ඒකාන්තයෙන් නිවන් මග තුළම ගමන් කරනවා. ඒ මගටම පොලඹවනවා. ප්‍රව්‍රජ්‍යාවට සුවිශේෂී වෙනවා සේම ගිහි ජීවිතයක ද සිදුවන අකුසල් දැකීමට, දැක ඒ අකුසල් අඩුකර ගැනීමටත්, කුසලය හඳුනාගෙන ඒවා වැඩීමටත් මේ සති ධර්මතාවය උපයෝගී කරගත යුතු වෙනවා.





# බිඳෙන දේ තුළ නොබිඳෙන ගමන් මග

විශ්වය නිර්මාණය වීම තුළ දෘශ්‍යමාන හා අදෘශ්‍යමාන ශක්ති විශේෂ දෙකක් එක්ව තිබෙනවා. තවත් විදියකට ඒ කොටස් දෙක ජීවී - අජීවී කියල දක්වන්නත් පුළුවන්. පෘථිවිය, ඉර, හඳ, තාරකා වැනි දේ දෘශ්‍යමාන විශාල වස්තු. ඒවා අදෘශ්‍යමාන ශක්තියකුත් එක්කයි පවතින්නේ. එහෙම නැතුව පවතින්න බැහැ. පෘථිවිය වුනත්, එය භ්‍රමණය වෙමින් ආලෝක ශක්තියකුත් එක්කයි තියෙන්නෙ. ඒ වගේ මනුෂ්‍ය සත්ව ජීවිතයක් වුනත් මේ දෙකත් එක්ක තමයි තියෙන්නේ. මේ ගුණාංගවලට යම් අළුත් ශක්තියක් එක් වුනාම කිසියම් පරිවර්තනයක් වෙනවා.

සත්ව ජීවිතයක් සලකා බලද්දී යම් ශරීරයකට අලුත් ශක්තියක් එක් වුනාම ඒ ශරීරයේ කිසියම් පරිවර්තනයක් වෙනවා. ඒ වගේ කෙනෙකුගේ හිතක් ගැන බැලුවත් හිතකට ශක්තියක් ආවාම ඒ හිත තුළත් පරිවර්තනයක් වෙනවා. මේ තමයි හේතු. ශරීරයකට ආහාර අවශ්‍ය විට ආහාරයක් දුන්නම පරිවර්තනය වෙනවා. ශක්තිමත්

ශරීරයක් වෙනවා. ශරීරයට ආහාරයක් නැති වෙලාවට එය ආහාර නැති වීම හේතුවෙන් දුබල ශරීරයක් බවට පරිවර්තනය වෙනවා. නැවත ආහාරයක් ලැබුණ ගමන් ශක්තිමත් වෙනවා. ඒවගේ හිතටත් ශක්තියක් එකතු වුනාම ශක්තිමත් හිතක්. ශක්තිය අඩු වුනාම දුබල හිතක්. නැවතත් ශක්තිමත් හිතක්. මේ හේතු සම්පාදනය තමයි හේතු - ඵල ධර්ම වශයෙන් වටහා ගැනීම අවශ්‍ය වෙන්නේ.

මේ දෘශ්‍යමාන අදෘශ්‍යමාන දෙකටම යම් බඳු හේතුවක් උඩ ශක්තිමත් භාවය හෝ දුබල භාවය හැදෙනවා. එය සම්මුති වශයෙන් හා පරමාර්ථ වශයෙන් අවබෝධ කරගැනීමට දරන උත්සාහය තමයි පටිච්ච සමුප්පාදය, හේතු - ඵල දහම කියලා කියන්නේ. ඒ දහම සම්මුතියෙන් මෙලෙස වටහා ගන්න පුළුවන්. පරමාර්ථ වශයෙන් කුඩා රූප කලාපයටත් මේ සිද්ධාන්තය වෙනවා. කුඩා රූප කලාපයටත් යම් රූපයක ශක්තියක් ලැබුනම එය ශක්තිමත් වෙනවා. යම් රූපයක ශක්තියක් නැති වෙලාවට දුබල වෙනවා. ඒ වගේම කුඩා සිතුවිල්ලටත් එහෙමයි. කුඩාම චිත්තක්ෂණයටත් අලුත් චිත්තක්ෂණයක් ඇවිත් ශක්තියක් දුන්නහම ඒ සිත ශක්තිමත් වෙනවා. එය නැති වුනාම ඒ සිත දුබල බවට පත් වෙනවා. ඒ වගේ විශ්වයේ තියෙන හැම එකක්ම නිර්මාණය වෙලා තියෙන්නේ හේතුත් එක්ක වෙනස් වෙවී පවතින ධර්මතා ගොඩක් වශයෙන්. එය අවබෝධ කරගන්න ආකාරය පටිච්ච සමුප්පාද සම්මර්ශනය යි.

මීට පෙර නාම - රූප පිළිබඳව මනා අවබෝධයක් ලබාගත්තා. ජීවිතයක්, භව ගමනක් කියන්නේ අඛණ්ඩව පැවතෙන මේ නාම - රූපයන්ගේ ප්‍රවාහයක් කියන පිරිසිදු

දක්ම ඇති කර ගත්තා. එම නාමරූප ඇතිවෙන්නත් බලපාන හේතු මොනවාද? ඒ ඒ හේතූන්ට අනුව ලැබෙන ඵලයන් මොනවාද? යන්න පටිච්ච සමුප්පාද පංචස්කන්ධ හා පටිච්ච සමුප්පාද පළමු ක්‍රමයන්ට අනුව භාවනා වඩනවා. මේ පටිච්ච සමුප්පාදය තුන් කාලයට සම්බන්ධ කරමින් භාවනා වැඩීමෙන් හේතු ඵල පිළිබඳව යථාවබෝධය ලැබෙනවා. එමගින් කංඛාවිතරණ විශුද්ධිය සම්පූර්ණ වෙනවා. එම හේතු ඵල පිළිබඳ වූ මනා අවබෝධයට අතීත අනාගත ආත්ම භාව කිහිපයක් අවම වශයෙන් පිරිසිදුව දැක ගැනීම අවශ්‍ය වෙනවා.

## ආත්ම භාව පරීක්ෂාව

මහා බෝසතාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය පිණිස බෝ මුල අරා වැඩහිඳිමින් පළමුව සත්වයන්ගේ පෙර විසූ කඳ පිළිවෙළ ඥාණය අවබෝධ කරගැනීම හේතුවෙන්ද ඉන්පසුව සත්වයන්ගේ චුති - උත්පත්තිය අවබෝධ කරගැනීමෙන් ද සංසාරය පිළිබඳව මනා වැටහීම, අවබෝධ ඥාණය පහළකර ගත්තා. අනතුරුව සංස්කාර පටිච්ච සමුප්පාදයට නංවා ලොව්තුරා සම්මා සම්බුද්ධත්වයට පත්වුනා. මේ කරුණු පාදක කොට ගනිමින් බුරුම රට පූජනීය ආචිණ්ණ (සයාඩෝ) මාහිමිපාණන් වහන්සේ ද මෙම භාවනා දියුණු කරන යෝගීන්ගේ පෙර භවයන් පිළිබඳව තොරතුරු මනා ලෙස අවබෝධ කරගෙන ඒවා විපස්සනාවට නංවා ගන්නා ක්‍රමය පැහැදිලිව පෙන්නුම් කරලා දෙනවා. අතීත - වර්තමාන - අනාගත තුන් කාලයම විපස්සනාවට ගෝචර කරගන්න ඕන. ඒ පැහැදිලි අවබෝධය ලැබීම සඳහා පළමුවෙන් අතීත භවයන් පිරික්සීම සිදු කරනවා.

## ☸ අතීත භව පරීක්ෂාව

වර්තමානයේ සිට නාම - රූප ඔස්සේ ක්‍රමයෙන් අතීතයට ගමන් කර චුති - පටිසන්ධි වටහා ගනිමින් අතීත භව කිහිපයක්ම බලනවා. ඒ භව පිළිවෙළට මෙන්ම තැනින් තැන ලෙසද බලන්න පුළුවන්. එම ආත්ම වලදී තමන් කළ භාවනා වැඩීම් ආදී වූ කුසල කර්ම විමසා බලා වර්තමාන භවය හා එම භව අතර පවතින සම්බන්ධය අවබෝධ කරගන්නවා. මෙලෙස භාවනා වැඩීමෙන් අතීතය ගැන සැක දුරුකරගැනීම සිදු වෙනවා. මේ අනුව භාවනාව ප්‍රගුණ කළ පූජනීය අප මාහිමිපාණන් වහන්සේ යෝගියෙකු විසින් ලද හැකි උතුම් වූ ශ්‍රේෂ්ඨම වූ අත්දැකීම් සම්භාරයක් එමගින් ලබා ගැනීමට භාග්‍යවන්ත වී ඇති බව මාහිමිපාණන් වහන්සේගේ භාවනා වැඩීම පිළිබඳ සටහන් වලින් මනාව දකින්න පුළුවන්.


## ☸ අනාගත භව ගමන හා නාම රූප නිරෝධය

මේ ආකාරයටම අනාගතය පිළිබඳවත් අවධානය යොමු කරනවා. අනාගතය පිළිබඳවත් හේතු - ඵල ධර්මයන්ට අනුව මේ තත්වය අවබෝධ කරගන්නවා. එමගින් අනාගතය පිළිබඳ වූ සැකයන් දුරුවීම සිදුවෙනවා. එසේ අනාගතයට නාම - රූප ඔස්සේ ගමන් කරමින් නාම - රූප නිරෝධය දකින්න පුළුවන් වෙනවා. ඒ නාම - රූප අවසානය හෙවත් නිර්වාණය සාක්ෂාත් කිරීම භවයකින් දෙකකින් හෝ දීර්ඝ ගමනකින් පසුව වෙන්නත් පුළුවන්. එය කෙතරම් කලකින් - කුමන අයුරකින් සිදු වෙනවාද කියලා අවබෝධ කරගන්න හැකිවෙනවා. එහෙම ඒ නාම - රූප භව ගමන හෙවත් ඒ දක්වා වූ කාල පරිච්ඡේදය


විපස්සනාවට නගමින් හේතු ඵල සම්බන්ධය පිළිබඳ වූ මනා අවබෝධය වැඩිදියුණු කර ගන්නවා. ඒ සඳහායි මේ අතීත, අනාගත භවයන් පරිග්‍රහ කිරීම අවශ්‍ය වන්නේ.

පූජනීය අප මාහිමිපාණන් වහන්සේ ද එම භාවනා මාර්ගයට අනුව අතීත මෙන්ම අනාගත භවයන්ද දීඝී ලෙස පරිග්‍රහ කර ඇත. එම පරීක්ෂාව තුළින් ඉතාම අසිරිමත් වූ අතීත - අනාගත බෝසත් බුදුමග භව ගමනක් පිළිබඳව අවබෝධ කරගත් තොරතුරු සටහන් කර තිබුණා. එම කරුණු පහත දැක්වෙනවා.

### ☸ අතීත භව පරීක්ෂා කිරීම හා පටිච්ච සමුප්පාදය වැඩීම.



7.05. පර්යංකය. රූප - අරූප. අජ්ඣත්ත බහිද්ධා - චුතිපටිසන්ධි බැලීම. ඉතා පැහැදිලිව ප්‍රතිසන්ධිය දිටිමි. පටිසන්ධි භවාංග අරමුණ රුවන්වැලි මහා සෑය, පූර්ව භවය එහි ආරක්ෂක දේවතාවකි. නම මෛත්‍රී. ඊට පූර්වයෙහි තාපස කෙනෙකි. මෙහි ප්‍රතිසන්ධිය සෝමනස්ස ත්‍රිහේතුකයි.




2.15. පර්යංකය. ප්‍රතිසන්ධි උපාදනස්කන්ධයේ අතීත වර්තමාන හේතු සියල්ල පට්ඨාන නය ක්‍රමයෙන්ම බැලීමි.

9.30. උපදෙස් (නාම රූප මුලින් මුලට බලමින් චුති පටිසන්ධි සහ පූර්ව භවයන්ද චුති පටිසන්ධි අනුව බලා පටිච්ච සමුප්පාදයත්, ඒ ඒ භවයෙහි කුසල අකුසල චිත්ත වීථින් විදර්ශනාවට නගන්න)


12.45. පර්යංකය. මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ඛා සමාපත්ති සියල්ලට අනතුරුව නාම රූප අනුව පටිසන්ධියත් පූර්ව භවයෙහි දේවත්වයත්, ඉන් පෙර බ්‍රහ්මත්වයත්, ඊටත් පෙර දඹදිව වනගත තවුස් ජීවිතයත් අරමුණු කෙළෙමි. 1.30. සක්මන්. බුදුගුණ.

7.00. පර්යංකය. ආනාපාන ධ්‍යාන සතරට හා පූර්ව භව තුනක් බැලීම. දේව - බ්‍රහ්ම - මඛාදේව පෙළේ රාජඍෂි, සිව්බඹ විහරණ අනිච්ච සඤ්ඤා වැඩූ බව.

5.10. පර්යංකය. ආනාපාන - බ්‍රහ්මවිහාර - නාමරූප විදර්ශනා. පූර්ව භව පෙළියට බැලීම. දේව - බ්‍රහ්ම - රාජ ඍෂි - දේව - කසුප් බුදු සසුනේ පැවිද්ද, ත්‍රිපිටක ධර්ම, ධ්‍යාන සංඛාරුපෙක්ඛා නෙක් විපස්සනා වඩා ඇති බව දක්කෙමි.




7.00. පර්යංකය. පූර්ව භව පෙළියට බලා කසුප් බුදු සසුනේ පැවිද්දම් පුරාගත් ජීවිතය පිළිබඳ ස්කන්ධාදී වශයෙන් බෙදමින් පටිච්ච සමුප්පාද විදර්ශනාව.




16. ද බිනර පොහෝ දිනයයි. මෙදින අළුයම පරියංකයේදී අතීතභව පරම්පරාව පටිච්ච සමුප්පාදය අනුව විදර්ශනාවට නැගීමේදී කාශ්‍යප බුද්ධ සාසනය නෙක් ආත්ම භාව 14 ක් පෙළියට ගතහැකි වූ අතර දීපංකර බුදු සසුනේ සිට නියතව ආ ගමනක් ගැන තදින් අරමුණු විය. ඒ අවස්ථාවේ අනිත්‍ය අරමුණු වෙමින් ආශ්වාස ප්‍රශ්වාස නැවතී සෑහෙන වේලාවක් දැඩි සමාධියට පත්විමි.

## ☸ අනාගත භව පරීක්ෂාව හා පටිච්ච සමුප්පාදය වැඩීම.



9.30. උපදෙස් (නාමරූප ව්‍යවස්ථාන කොට අනාගතයට බලමින් චුතියත් මතු ප්‍රතිසන්ධියත්, අවිද්‍යාදී හේතු ඵල සම්බන්ධතාවත් බලන්න.)


5.15. පර්යංකය. ආනාපාන - බ්‍රහ්ම විහාර, නාම රූප විදර්ශනා මතු චුති පටිසන්ධියත්, ඕදාත කසිණ ප්‍රථම ධ්‍යානයෙන් මහා බ්‍රහ්ම තල උපතත්, අවිද්‍යාදී හේතු ඵල සම්බන්ධයත් විදර්ශනා කිරීම.



9.30. උපදෙස් (මතු භව පෙළටම බලා නාම රූප අවසන් වන ආත්ම භාවය තෙක්ම විදර්ශනා වඩන්න)

5.15. පර්යංකය. ආනාපාන - බ්‍රහ්ම විහාර, මතු භව පරම්පරාව බලමින් නාම රූප විදර්ශනාව, මින් මතු මහා බ්‍රහ්ම

තලයෙන් නැවත මෙත් බුදු සසුනේ පැවිද්දන් - මතු 1800. ආත්ම භාව කෙළවර බුදු බවට පැමිණීමත් අරමුණු විය.)



මෙදින උදයේ පර්යංකයේදී අනාගත භවයන් පරම්පරාවම
පටිච්චසමුප්පාද ත්‍රිලක්ෂණයට විදර්ශනා වැඩීමේදී ඈත අනාගතයේ අවුරුදු
ලක්ෂයකට ආයු ඇති කලෙක සම්බුද්ධත්වයට පැමිණ අවිද්‍යාදීන්ගේ
නිරෝධයට පත්වන සැටි පෙනී බලවත් චිත්ත සමාධියක් ඇතිවිය.

මෙදින උදයේ පර්යංකයේදී අනාගත භවයන් පරම්පරාවම පටිච්ච සමුප්පාද ත්‍රිලක්ෂණයට විදර්ශනා වැඩීමේදී ඈත අනාගතයේ අවුරුදු ලක්ෂයකට ආයු ඇති කලෙක සම්බුද්ධත්වයට පැමිණ අවිද්‍යාදීන්ගේ නිරෝධයට පත්වන සැටි පෙනී බලවත් චිත්ත සමාධියක් ඇති විය.

☸ අතීත භව පරීක්ෂාව හා පටිච්ච සමුප්පාදය වැඩීම පිළිබඳ විස්තරය.

පටිච්ච සමුප්පාදය වැඩීම සඳහා අතීත භවයන් පරීක්ෂා කරද්දී මින් පෙර ආත්ම භාවයේ මාහිමිපාණන් වහන්සේගේ අවසන් සිතට අරමුණු වී ඇත්තේ ස්වර්ණමාලි චෛත්‍ය රාජයාණන් වහන්සේ ය. ඒ කුසල් අරමුණ හේතුවෙන් සෝමනස්ස සහගත ත්‍රිහේතුක ප්‍රතිසන්ධියකින් මේ ආත්ම භාවය ලබා ඇත. විශේෂයෙන් මේ ආත්ම භාවය සඳහා රුවන්මැලි සෑ රදුන් අරමුණු වී ඇත්තේ ගිය ආත්ම භාවයෙහි එම රුවන්මැලි සෑ රදුන්ගේ ආරක්ෂක "මෛත්‍රී" නම් වූ දෙවියෙකු වශයෙන් ඊට අධිගෘහිතව වැඩ සිට ඇති නිසා ද විය හැකිය. ඒ මීට පෙර ආත්ම භාවයයි.

එම දිව්‍ය ආත්ම භාවයට පෙර බඹ ලොව බ්‍රහ්ම ආත්ම භාවයක් ලබා ඇත.

ඒ බ්‍රහ්ම ආත්මයට පෙර "මඛාදේව" නම් පෙළපතෙහි රාජ ඍෂිවරයෙකු වශයෙන් දඹදිව සිට ඇත. ඒ තාපස ආත්ම භාවයේ ද සිව්බඹ විහරණ හා අනිත්‍ය සඤ්ඤාව ද වඩමින් භාවනාවන් ප්‍රගුණ කර ඇත.

ඒ ඍෂිවරයෙකු (පැවිදි තාපසවරයෙකු) ලෙස සිටි මීට පෙර තුන්වන ආත්මයට ද පෙර වූ හතර වැනි ආත්මය නැවතත් දේව ආත්ම භාවයක්.

ඊටත් පෙර කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ සාසනය තුළ පැවිදි භික්ෂූන් වහන්සේ නමක් ලෙස උතුම් පැවිදි දම් පිරූ බව අරමුණු වී තිබෙනවා.

ඒ පැවිදි ජීවිතයත් මේ ආත්ම භාවය වගේ ඉතා උසස් ප්‍රව්‍රජ්‍යා ජීවිතයක්. ඒ පැවිදි ජීවිතයේ ද ත්‍රිපිටක ධර්මය ඉගෙන ගෙන ධාරණය කරගනිමින් ද භාවනා මාර්ගය වැඩීම ද සිදුකර ඇත. මේ ජීවිතයේ මෙන් ධ්‍යාන භාවනාවන් දියුණු කර සංඛාරුපෙක්ඛා ඥාණය දක්වා විදර්ශනා භාවනාව ද ප්‍රගුණ කර තිබෙනවා. ඒ ජීවිතයෙනුත් මාහිමිපාණන් වහන්සේගේ සම්බුද්ධත්ව ප්‍රතිලාභ ප්‍රාර්ථනාව ගැන පැහැදිලි වෙනවා.

කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ සාසනය තෙක් පිළිවෙළටම අතීත ආත්ම පරීක්ෂා කිරීමේදී ඒ දක්වා මාහිමිපාණන් වහන්සේට ආත්ම භාව 14 ක් අරමුණු වී තිබෙනවා. එම කාලය පරීක්ෂා කොට ඇත්තේ එක පෙළට නිසා අප මාහිමිපාණන් වහන්සේගේ අසිරිමත් පාරමී ගමන

ඉන් පැහැදිලි වෙනවා. ඒ බුද්ධාන්තරයක් වූ කාලය උතුම් සේ පාරමී සපුරමින් ආත්ම භාව 14 කින් අවසන් කර තිබෙනවා.

මේ අසිරිමත් වූ බෝසත් ආගමනය සිදුවන්නේ "දීපංකර භාග්‍යවතුන් වහන්සේගේ" පාද මූලයෙහි මතු ලොව්තුරා බුද්ධත්ව ප්‍රතිලාභය වෙනුවෙන් පාරමී ධර්ම සම්පූර්ණ කිරීමට නියතව විවරණ ලබා ගනිමින් ඒ උතුම් සර්වඥතාඥාන ප්‍රතිලාභය වෙනුවෙන් පාරමී ධර්ම කිස සම්පූර්ණ කරමින් වැඩම කරනා පිවිතුරු ගමනක් ලෙසින් බවද පූජනීය අප මාහිමිපාණන් වහන්සේට අරමුණු වී තිබෙනවා. ඒ අනුව,

- ☸ පූජනීය අප මාහිමිපාණන් වහන්සේ සතර පද ගාථාවක් අසා ශ්‍රාවක බෝධියෙන් නිර්වාණ ප්‍රතිලාභය කිරීමට තරම් උතුම් පුණ්‍ය භාග්‍යයකින් යුතු වූයේ දීපංකර ශ්‍රී සර්වඥරාජයාණන් වහන්සේ හමුවේය.
- ☸ එහිදීම පංච අභිඥා අෂ්ටසමාපත්ති ලාභීත්වයෙන් යුතු වූයේ ය.
- ☸ අෂ්ටාංග සමෝධානයෙන් යුතු වූයේ ය.
- ☸ අෂ්ට ධර්මයන්ගෙන් යුතු උතුම් ප්‍රාර්ථනාවන්ගෙන් යුතු වූයේ ය.
- ☸ අභිනීහාර පිණිස වූ බල සතරකින් ද
- ☸ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම සතරකින් ද
- ☸ බුද්ධ භූමි ධර්ම සතරකින් ද
- ☸ පාරමිතා පිළිබඳ අධ්‍යාශ දහයකින් ද
- ☸ පාරමී පූරණය පිණිස පවතින අධ්‍යාශ හයකින් ද

යනාදී වූ මහ බෝසත් ගුණාංග ධර්ම රාශිය අප මාහිමිපාණන් වහන්සේ වැඩම කළ මේ අඛණ්ඩ වූ නාම - රූප භව ගමන තුළ මුල් බැස ගත්තේ ඒ උතුම් දීපංකර සර්වඥයන් වහන්සේ හමුවෙහිදී බව එම කරුණු අනුව පැහැදිලි වෙනවා. එවන් වූ උතුම් බෝධිසත්වවරයන් වහන්සේ නමක් ලෙසයි අප මාහිමිපාණන් වහන්සේ මේ ආත්ම භාවයෙහිත් මෙබඳු උත්කෘෂ්ට ලෙස භාවනා මාර්ගයන්ද පුරුදු පුහුණු කරමින් අපමණ වූ ගුණ සම්භාරයකින් යුතුව වැඩසිටියේ.

මෙලෙස අතීත භවයන් පේළියට බලමින් ඒ ඒ ජීවිත ස්කන්ධ ආදී වශයෙන් බෙද බෙදා ඒවායෙහි හේතු - ඵල සම්මර්ශනය ගැඹුරින් සිදුකර තිබෙනවා. නාම - රූප ඔස්සේ අතීතයට ක්‍රමයෙන් බලමින් පෙර ආත්ම භාවයන් ගැන දක්වා ඇති විස්තරය තුළින් මාහිමිපාණන් වහන්සේගේ ඒ විශේෂ ශක්තිය ප්‍රකට වෙනවා. සසර තුළ බොහෝ වාර වලදී පුරුදු කළ ශක්තියත් ඊට උපකාර වන්නට ඇති. මේ හේතු ඵල සම්මර්ශනය තුළදීම ඒවා විදර්ශනාවට නැඟීමද සිදුකර තිබෙනවා.

☸ **අනාගත භව පරීක්ෂාව හා පටිච්ච සමුප්පාදය වැඩීම පිළිබඳ විස්තරය.**

රූපාවචර - අරූපාවචර ධ්‍යාන සියල්ල ඉතාමත් විශිෂ්ට ලෙස අප මාහිමිපාණන් වහන්සේ ප්‍රගුණ කළා. චුති චිත්තයටද එසේ උපදවාගත් ඕදාත කසිණ පළමු ධ්‍යාන සිත හේතු වෙනවා. එම පළමු ධ්‍යාන සිතට අනුව මහාබ්‍රහ්ම තලයෙහි මතු ප්‍රතිසන්ධිය ලබනවා.

අනාගතය ද බලමින් අනාගත භව දිගින් දිගට පරීක්ෂා කර මෛත්‍රී භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සර්වඥ සාසනය පවතින කාලය අරමුණු කිරීමේ දී එකල ද එම බුදු සසුනේ පැවිදි බවට පත්ව උතුම් ප්‍රව්‍රජ්‍යා ජීවිතයක් ලැබීම පිළිබඳ අරමුණු වී තිබෙනවා.

ඒ ආකාරයට අනාගතයේ නාම - රූප නිරෝධය දක්වා අරමුණු කිරීමේ දී මේ පාරමී ගමන දිගට ගොස් තවත් ආත්ම භාව 1800 ක් අවසන් කර ලෝකයේ මනුෂ්‍ය ආයුෂ අවුරුදු ලක්ෂයක් පවතින කාලයේ උතුම් වූ සම්මා සම්බුද්ධත්වයට පත්වන ආකාරය අරමුණු වී ඇත. එම අවස්ථාවේදී අවිද්‍යාදී සියලු ක්ලේෂයන්ගේ නිරෝධය - විනාශය සිදුවන ආකාරය දක්නට ලැබී තිබෙනවා. සියලු කෙලෙසුන්ගේ නිරෝධය දැක බලවත් වූ චිත්ත සමාධියක් පහළ වී ඇත.

මෙය විශ්වය තුළ අසන්නට ලැබෙන අසිරිමත්ම සිදුවීමක්. මෙතරම් උතුම්, වටිනා යමක් මේ විශ්වය තුළ ඇසීමට වෙනත් නැත. අනාගතයෙහි බුදු වන මෛත්‍රී සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගැන අනාගතවංශ ආදියෙන් අප අසා කියවා තිබෙනවා. ඉන් ඈතට ද බුදුරජාණන් වහන්සේලා පහළ වන බව සැබෑ ය. ඒත් ඒ උත්තම බුද්ධ බෝසතාණන් වහන්සේලාගේ යම් විස්තර කථනයක් අද අපි අසනවා නම් ඒ මේ පිවිතුරු චරිතය නොවන්නේද ?

මේ සියල්ල මාහිමිපාණන් වහන්සේ මනාව ප්‍රගුණ කර, බොහෝවර ප්‍රගුණ කර පිරිසිදු භාවනා මාර්ගය තුළින් ප්‍රකට කර ගත්තා. අතීත අනාගත භව සියල්ල පිවිතුරුව දකිමින් හේතු - ඵල සම්මර්ශනය කළා. විදර්ශනාවට

නැගුවා. සසර වූ පුණ්‍ය භාග්‍යයත්, බොහෝ සේ සම්පූර්ණ කොට ඇති සමතිංශත් පාරමී ධර්ම සම්භාරයත් නිසාම මේ සියලු කරුණු පැහැදිලිව අවබෝධ කර ගත්තා. දැක ගත්තා.

මේ වනාහි ධර්මයේ සත්‍යයයි. බුදුරජාණන් වහන්සේලා පවා ගුරු තැන්හි තබා ගන්නේ මේ පිවිතුරු ධර්මයයි. ඒ නිසා සියල්ලන්ටම පිහිට ධර්මයයි. සියල්ලෝම මාහිමිපාණන් වහන්සේ වැනි බුද්ධාංකුරයාණන් වහන්සේ නමක් ඇසුරේ ලැබූ ධර්ම දයාදය සිය දහස් ගුණෙන් වඩත්වා! පැතුම් සපිරෙන තුරු නොකඩ කොට වැඩුමට අදිටන් පිහිටුවා ඒ මගම යෙත්වා! ඒ සඳහා මේ මාහිමිපාණන් වහන්සේගේ ජීවිත සටහන් පෙළ ද උපනිශ්‍රයව පවතීවා!



# ඡා ඣ භාවනාවට පෙර

අප ස්වාමීන්ද්‍රයන් වහන්සේ උතුම් භාවනා ප්‍රතිපත්ති මාර්ගය මුළු ජීවිතය පුරාවට අඛණ්ඩව ප්‍රගුණ කළා. පැවිදි දිවියට එළඹීමටත් පෙර සිටම භාවනාවට ඇති කරගත් දැඩි කැමැත්ත, ඡන්දය අඛණ්ඩව පවත්වා ගත්තා. අඛණ්ඩව එහි යෙදුණා. එමගින් ඒ මුල් අවදියේම ලැබූ ප්‍රතිඵල ගැන මාහිමිපාණන් වහන්සේ ම මෙසේ සටහන් කර ඇත.

"පිළිවෙළින් මාස 2 ක් පමණ ආනාපාන සතිය වැඩීමෙන් චිත්ත සමාධිය දැඩිසේම පහළ විය. සක්මනේදීත් සිටීමේදීත් චිත්ත සමාධිය ඇති විය. නැවත මහා සී භාවනා මාර්ගය වඩන ලදි. එයින් ද දැඩි සේ සිත සමාධිගත විය. සමහර විට කය නොදැනී ඉතා කුඩා දිය බිංදුවක් මෙන් සිත ඉහළට ගොස් භවාග්‍රය දක්වා ගිය තරමට සියුම්ව පැවතිණ." ප්‍රව්‍රජ්‍යාවට පෙරම ඇති කර ගත් මේ ශක්තිය දිනෙන් දිනම දියුණුවට පත් කර ගත්තා. මෙහෙම භාවනාවෙන් ලැබූ ශක්තිය ඉතා ඉහළයි.

ඡා ඣ භාවනාව ප්‍රගුණ කිරීමට පෙර ද සමථ - විපස්සනා භාවනාවන් හි ලැබූ මනා පරිචයකින් යුතුවයි මාහිමිපාණන් වහන්සේ කටයුතු කළේ. දිනක් ස්වාමීන් වහන්සේ නමක් ඒ පිළිබඳ යම් අවබෝධයක් ලැබීමේ අදහසින් "ස්වාමීන් වහන්ස ඇති වන අරමුණු රූප ධර්ම ලෙස මෙනෙහි කරනවා. පසුව එහි ධාතු ශූන්‍යතාවයට නගන කොට සිතට සැහැනයක් දැනෙනවා" යි පූජනීය ස්වාමීන් වහන්සේට ප්‍රකාශ කර තිබෙනවා. එවිට "ඒක හොඳයි. මම ඊටත් වඩා දෙයක් කරනවා. රූප ධර්මයන් එහෙම බලලා ඊට පස්සේ චිත්ත - චෛතසික ධර්ම බලනවා. ඒ අරමුණ තුළ තියෙන නාම ධර්ම අහුලනවා. විදර්ශනා කරනවා. එතකොට ඒ අරමුණු හිස් වෙලා යනවා." යනුවෙන් එකල තමන් අනුගමනය කළ විපස්සනා භාවනාවන්ට අනුව එය වඩාත් සම්පූර්ණව වඩන ආකාරය නා

උයනේ මාහිමිපාණන් වහන්සේ පෙන්වාදී තිබෙනවා. මුල් අවදියේ සිටම සමථ - විපස්සනා භාවනාවන් දියුණු කරමින් තම ජීවිතය එම භාවනා මගට අනුව ප්‍රායෝගිකව ගෙවමින් කටයුතු කළ ආකාරය මෙම කරුණු වලින් වගේම ස්වාමීන් වහන්සේගේ ජීවිතයෙන් පැහැදිලි වෙනවා.





# සංස්කාර විශ්ලේෂණය

ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන යන සතර ආකාරයන්ට සියලු රූප හා නාම ධර්මයන් හේතු ඵල සියලු සංස්කාර බෙද බෙද දක්වමින් සියුම් ලෙස අවබෝධ කර ගැනීම ලක්ඛණ රස භාවනාවෙහිදී සිදු වෙනවා.

2.25. පර්යං
කය. වස්තු රූප සයෙහිම රූපයන්ගේ ලක්ෂණ රසාදිය අජ්ඣත්ත බහිද්ධා වශයෙන් විදර්ශනා කිරීම,

**2.25. පර්යංකය. වස්තු රූප සයෙහිම රූපයන්ගේ ලක්ෂණ රසාදිය අජ්ඣත්ත බහිද්ධා වශයෙන් විදර්ශනා කිරීම.**

අළුයම 3.00. අවදිවීම. පර්යංකය. පඤ්චද්වාරයෙහි (ආධ්‍යාත්මික බාහිර) කුසල නාමයන්ගේ ලක්ෂණ රසාදිය විදර්ශනාව.

**අළුයම 3.00. අවදිවීම. පර්යංකය. පඤ්චද්වාරයෙහි (ආධ්‍යාත්මික බාහිර) කුසල නාමයන්ගේ ලක්ෂණ රසාදිය විදර්ශනාව.**

(21) සිකුරාදා. පර්යංක වාර එකම සපිරිනි. අජ්ඣත්ත බහිද්ධා රූපයන්ගේ ලක්ෂණාදිය සම්පූර්ණයෙන් ද, කුසල චෛතසික සියල්ල ද ලක්ෂණාදි වශයෙන් සම්මර්ශනය කරන ලදි.

(22) සෙනසුරාදා පර්යංක වාර සතම සපිරිනි. චිත්තයන් සියල්ලද, කුසල අකුසල චෛතසික සියල්ලද, පටිච්ච සමුප්පාද අංග සියල්ලද සම්බන්ධ ලක්ෂණ රස පච්චුපට්ඨාන ප්‍රගුණ කරමින් සම්මර්ශනය කරන ලදි.

(23) ඉරුදින පර්යංක වාර එක මැනවින් සපිරිනි. ලක්ෂණ රසාදි සියල්ල සපුරා සම්මර්ශනය කරන ලදි.

21 කිවි දින - පර්යංක වාර පහම සපිරිණි. අජ්ඣත්ත බහිද්ධා රූපයන්ගේ ලක්ෂණාදිය සම්පූර්ණයෙන්ද, කුසල චෛතසික සියල්ලද ලක්ෂණාදී වශයෙන් සම්මර්ශනය කරන ලදි.

22 සනි දින පර්යංක වාර පහම සපිරිණි. විඤ්ඤාණ සියල්ලද - කුසල අකුසල චෛතසික සියල්ලද පටිච්ච සමුප්පාද අංග සියල්ලද සම්බන්ධ ලක්ෂණ රස පච්චුපට්ඨාන පදට්ඨාන ප්‍රගුණ කරමින් සම්මර්ශනය කරන ලදි.

23 ඉරු දින පර්යංක වාර පහ මැනවින් සපිරිණි. ලක්ෂණ රසාදී සියල්ල සපුරා සම්මර්ශනය කරන ලදි.

පූජනීය මාහිමිපාණන් වහන්සේ මේ ආකාරයට සියලු ආධ්‍යාත්ම - බාහිර රූපයන්ගේ, කුසල අකුසල නාමයන්ගේ, ධ්‍යාන නාමයන්ගේ හා පටිච්ච සමුප්පාද අංග සියල්ලෙහිද ආදී වශයෙන් සම්පූර්ණ ලෙස ලක්ෂණ - රස සම්මර්ශනය සිදුකර තිබෙනවා. පෙර වඩා ඇති පුරුදුතාවය නිසාම ඉතා වේගවත්ව එය ප්‍රගුණ කළ අප මාහිමිපාණන් වහන්සේ බොහෝ විට එම ලක්ෂණ ආදිය සම්මර්ශනය කරමින් විදර්ශනාවටද නංවා තිබෙනවා.

විදර්ශනා වැඩීමේදී රූප ධර්ම ඒ ඒ සිත් පිළිබඳව, චෛතසික ධර්ම පටිච්ච සමුප්පාදංග ආදී වූ සියලු කොටස් පිළිබඳව නිරවුල් වූ ද මනාව නුවණට වැටහෙන්නා වූ ද අවබෝධයක් තියෙන්න ඕන. එම ධර්මයන් මේ ලක්ෂණාදී ආකාර 4 ට අනුව විග්‍රහ කරමින් සිතට කාවද්ද ගැනීමෙන් ඒ අවබෝධය, වැටහීම ඇති වෙනවා. එපමණක් නොව ඒ නාම - රූප, හේතු - ඵල ධර්මාදිය මෙලෙස සතරාකාරව බෙද අවබෝධ කර ගැනීමෙන් ඒ ධර්මයන් තුළ පවා ඇති


වන "ඝන සඤ්ඤාව" ආදිය දුරු වෙනවා. එතකොට "පඨවි" කියන්නේ, "ආපෝ" කියන්නේ, එහෙම නැත්නම් "ඵස්ස" කියන්නේ "වේදනා" කියන්නේ මෙන්න මේ දේටයි. ඉන් එහා යමක් ඒ රූපය තුළ ඒ නාමය තුළ නෑ නේද කියලා ඒ ඒ සංස්කාර ගැන වැටහීම ඇති වෙනවා. මේ වගේ නාම - රූප, හේතු - ඵල හැර, කුමන නම් සත්වයෙක්ද කියලා ඤාණයෙන්ම අවබෝධ වෙනවා. තව දුරටත් මෙම ලක්ෂණයන් ඔස්සේ නාම - රූප, හේතු - ඵලාදිය විදර්ශනාවට නගමින් විපස්සනා ඤාණයන් ද ඇතිකර ගන්නවා.

ඒ පිරිසිදු නිර්වාණ මාර්ගය අදත් අප සතුව තිබෙනවා. එහි යෙදීමෙන් මිස, නැවත නැවත යෙදීමෙන් මිස එම ධර්මයේ ප්‍රතිඵල ලබාගන්න වෙන මාර්ගයක් නෑ.







# සතළිස් ආකාර විදර්ශනාව


(7) 'චතු සමුට්ඨාන රූප කලාප සියල්ලත්, ශරීර ධාතු කොට්ඨාස 42. සම්බන්ධ රූප කලාපත්, පටිසන්ධි නාමරූප සිට චුතිය තෙක් මනෝද්වාරික - පඤ්චද්වාරික කුසල අකුසල චිත්තවීථි අනුව සියලු නාමධර්මත්, සියලු ධ්‍යාන චිත්ත වීථි අනුව ධ්‍යාන නාමධර්මත්, එකින් එකට චත්තාලීසාකාර මහා විපස්සනාවට නංවා සම්මර්ශනය කළයුතුය'


07 චතු සමුට්ඨාන රූප කලාප සියල්ලත්, ශරීර ධාතු කොට්ඨාස 42. සම්බන්ධ රූප කලාපත්, පටිසන්ධි නාම රූප සිට චුතිය තෙක් මනෝද්වාරික - පඤ්චද්වාරික කුසල අකුසල චිත්ත වීථි අනුව සියලු නාම ධර්මත්, සියලු ධ්‍යාන චිත්ත වීථි අනුව ධ්‍යාන නාම ධර්මත්, එකින් එකට චත්තාලීසාකාර මහා විපස්සනාවට නංවා සම්මර්ශනය කළ යුතුය.


(08) [illegible] පර්යංක [illegible] ශූන්‍ය නොදී [illegible] චත්තාලීසාකාර [illegible] නිලක්ෂණය [illegible]


(09) සඳුදින පර්යංක පහේදිම - නාමරූප - ප්‍රත්‍යය - අතීත අනාගත පච්චුප්පන්න - අධ්‍යාත්ම බහිද්ධා සියල්ල චත්තාලීසාකාර මහා විපස්සනාවට අනුව ශූන්‍ය නොදී නිලක්ෂණ සම්මර්ශනය පැවැත්වීමි.

30 ඉරුදින. පර්යංක වාර පහම ඉතා හොඳින් සාර්ථකව සපිරිණි. චත්තාළීසාකාර වශයෙන් පඤ්චස්කන්ධ එකින් එක වෙන වෙනම ත්‍රිලක්ෂණයට නැගීමේදී දැඩි ලෙස චිත්ත සමාධිය පහළ විය.

01 සඳුදින පර්යංක පහේදීම - නාමරූප - ස්කන්ධ - අතීත අනාගත පච්චුප්පන්න - අජ්ඣත්ත - බහිද්ධා සියල්ල චත්තාළීසාකාර මහා විපස්සනාවට අනුව ඉතා හොඳින් ත්‍රිලක්ෂණ සම්මර්ශනය පැවැත්විණි.



7.15 . පර්යංකය. අතීත වර්තමාන අනාගත කාලික උපාදනස්කන්ධ චත්තාළීසාකාර මහා විපස්සනාව.

අනිත්‍ය - දුක්ඛ - අනාත්ම ත්‍රිලක්ෂණයන් භාවනාවට නැගීමේදී සැබෑ ලෙසම අනිත්‍යාදී එම ලක්ෂණයන් මනසට කාවැදී අවබෝධ වී තියෙන්න ඕන. ඒ අර්ථ මනසෙහි කාවැදී ඇති තරමට, පුළුල්ව අර්ථය ඤාණයෙන් වටහා ගෙන ඇති තරමට භාවනාවෙහි ප්‍රතිඵල ලැබෙනවා. නියම ලෙස භාවනාව වැඩෙනවා. නිර්වාණ අවබෝධය කිරීම කියන්නේ ද මේ ත්‍රිලක්ෂණයෙන් එක් ධර්මතාවයක් තුළ ඒ මොහොතෙහි මෙහෙයවූ සර්වසම්පූර්ණ වූ අවබෝධය, ඤාණදර්ශනය වෙනවා. ඒ ආකාරයට නිවන් මගෙහි පුළුල්ව ප්‍රගුණ කළ යුතු මේ ත්‍රිලක්ෂණයන් විවිධ ආකාරයෙහි උපමා, ලක්ෂණ, ස්වභාවයන්, ක්‍රියාත්මක වන ආකාරයන් හරහා තරයේ හිතට කාවද්ද ගැනීම චත්තාළීසාකාර විපස්සනාව මගින් සිදු කෙරෙනවා.

අනිත්‍ය ලක්ෂණ 10 කටත්, දුක්ඛ ලක්ෂණ 25 කටත්, අනත්ත ලක්ෂණ 5 කටත් ලෙස ඒ කොටස් හතළිහ බෙදී යනවා. මේ හතළිස් ආකාරයන් තුළින් ත්‍රිලක්ෂණය සම්මර්ශනය කිරීමෙන් පැතිරුණු අවබෝධයක්, ඥාණයක් ඇති වෙනවා. ඒ ඥාණය ඇති කරගන්න මේ ආකාර 40 ට අනුව ත්‍රිලක්ෂණය සම්මර්ශනය කරන්න ඕන. නාම - රූප, ස්කන්ධ, හේතු - ඵල ඒ ඒ ලක්ෂණ අනුව විදර්ශනාවට නැංවීමේදී බලවත් සමාධියකින් යුතු වෙනවා මෙන්ම ඒ ඒ ලක්ෂණ විදර්ශනාවට අනුව ඥාණයද ප්‍රබල බවට පත් වෙනවා.

පූජනීය මාහිමිපාණන් වහන්සේ ද මේ චත්තාළීසාකාර විදර්ශනා භාවනාව මැනවින් ප්‍රගුණ කළ අතර එහිදී දැඩි ලෙස චිත්ත සමාධිය පහළ වූ බවද දක්වා තිබෙනවා.

**"මේ අරියධම්ම නම අපි බ්‍රහ්මලෝකයෙන් ගෙන්වා ගත්තේ ආරාධනා කරලා බුදු සසුන රකින්න, අරියධම්ම නමට මමත් වදිනවා, අරියධම්ම මටත් ඉස්සර වෙන්න හදන්නේ, මේ යෝගාශ්‍රම සංස්ථාවේ මිණිපහන අරියධම්ම නම."**

**(ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහෝපාධ්‍යාය, ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක හා යෝගාශ්‍රමාධිපතිව වැඩසිටි රාජකීය පණ්ඩිත අතිපූජනීය කඩවැද්දුවේ ජිනවංස මාහිමිපාණන් වහන්සේ.)**


# මාහිමිපාණන් වහන්සේගේ දින චරියාව

ජීවිතයක ලෞකික මෙන්ම ලෝකෝත්තර වශයෙන් ද අභිවෘද්ධියට, දියුණුවට සාර්ථකත්වයට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස අඛණ්ඩ දින චරියාව විශේෂයෙන් පෙන්වාදිය හැකිය. එනම් තම ජීවිතය නියමිත කාලසටහනකට අනුව, සැලසුමකට අනුව පවත්වාගෙන යාමයි. බුද්ධකාරක ධර්ම සම්පූර්ණ කරන බෝධිසත්වයන් වහන්සේලා ද දවසක් දවසක් පාසා තම පාරමී ධර්ම සිහිගන්වමින් ඒ ඒ දිනයෙහි කෙතරම් වූ පාරමී ධර්ම ප්‍රමාණයක් සපුරාගත්තේදැයි ආවර්ජනා කරමින් මොහොතක් පාසා තම පාරමී ධර්ම සම්භාරය මුදුන්පත් වනසේ නොසිස්ලෙස දවස් ගෙවනවා. ඒක බෝසතාණන් වහන්සේලාගේ උතුම් බෝසත් දිවිය ක්‍රියාත්මක වන ආකාරයයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා පවා තම උත්තම බුදුකිස දින චරියාවකට අනුව පවත්වනවා. තම ශ්‍රාවක පිරිස කෙරෙහිද කරුණාවෙන් අර්ථ පූර්ණ ජීවිතයක් සඳහා නිවැරදිව දිනයේ කටයුතු කරන ආකාරය දේශනා කර වදාළා. එය සාමඤ්ඤඵල සූත්‍රය ආදී තැන්වල විස්තර කෙරෙනවා. ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවෙහි ද දින චරියාවට අනුව යෝගීන් තම කටයුතු අඛණ්ඩව පැවැත්විය යුතු වෙනවා. එය කතිකාවතෙහි ද වෙසෙසින් දක්වා තිබෙනවා. එමෙන්ම එදිනෙදා කටයුතු ලියා තැබීමත් තම සතිය දියුණුවට වගේම ජීවිතයේ නොසිස් බවට ද බලපාන දෙයක්.

නා උයනේ මහාස්වාමීන් වහන්සේ ද කුඩා අවදියේ පටන් තම ජීවිතය ගුණවත් මව්පිය, වැඩිහිටි සැම සමගින් ඉතා නිවැරදිව ක්‍රමානුකූලව පවත්වාගෙන ආවා. පසුව ආරණ්‍යයට පැමිණ "පණ්ඩුපලාස සමය" හෙවත් පඬුපෙවූ (ගුරුපාට) වත් හැඳ දසසිල් සමාදන්ව පැවිද්ද පිණිස උගත යුතු බණ දහම් හා වත් පිළිවෙත්හි පුහුණු වන සමය තුළදී ඉතා මැනවින් දින චරියාවට අනුව අති පූජනීය විගොඩ ශ්‍රී බෝධිරක්ඛිත මහා ස්වාමීන්

*වහන්සේ ඇසුරෙහි කාලය අර්ථාන්විතව ගෙව්වා. ඒ දින චරියාව පහත දැක්වෙනවා.*

අළුයම 3.50. අවදිව මුව දෙවා, 4.පෙ. සිට
5.පෙ. තෙක් යෝගාසන ප්‍රගුණවත් භාවනාවක්, 5.පෙ.සිට
6.පෙ. තෙක් බුද්ධවන්දනා වතාපිළිවෙත් කිරීම විනාඩි 15. ක
පද්මාසනයෙන් භාවනාක් වශ දවසේ ආරම්භය
සිදුවිය. 6.පෙ. සිට 7.පෙ. තෙක් වතාවත් සපුරා
සිල් දානය ලැබුණු පසු බුද්ධපූජා පවත්වා දානය
වළඳා වතාවත් සපුරා 8.පෙ. සිට 9.පෙ. තෙක්
පොත් පාඩම් කොට, 9.පෙ. දැන් පහසුව. 10.පෙ.ට
නිත්‍යවන චරියාව පවත්වයි. 11.පෙ. ආපසු කුටියට
පැමිණ වී බුද්ධපූජාව පවත්වා දන් වළඳා වතාවත්
සපුරා 12.පෙ. බුද්ධවන්දනාව වතාපිළිවෙත් කිරීම
විනාඩි 15. ක් පද්මාසනයෙන් භාවනා වැඩීම සිදුවිය.
ඉන් අනතුරුව සිහින් දවල් විවේකකාල - වේලාවේ
තමන්ගේ වහන්සේ විසින් දේශනා කළ ධර්මය ම
ලොකටම අප විසින් දේශනා කිරීම සිදුවිය. ඉන්
අනතුරුව කුටි තුළේම පැදුර කොට මගල්
ඇඳිරිලි ආදිය අවිගයිව කුටිවත කිරීම දවල්
1.පෙ. සිට 4.පෙ. තෙක් පොත් කියවා ගැනීම සිදුවිය.
පාලි පරිවර්තනය - පාලිභාෂාවතරණය ද එක එක
පාඩමක් දිනපතා කටපාඩම් වනතුරුම උගෙනීම සිදුවිය.
සමහර දිනවල සවස විශ්‍රාමික විදුහල්පතිතුමා



රත්මලානා කරුණාරත්න (ස්වාමීන් වහන්සේගේ නැන්දනිය - දෙරණෑ
ගොඩ) බැතිමතියගෙන් සතරබඹවර අර්ථ ඇසුවා ගත්තෙමි.
උදෑසන 4.00. සිට 5.00. තෙක් සක්මන් භාවනාව. 5.00. සිට
6.00. තෙක් වත්පිළිවෙත් 6.00. සිට 7.00. තෙක් බුද්ධවන්දනා
වත්පිරිත. විනාඩි 15. පර්යංක භාවනාව, සතියකට වරක්
විනාඩි 05. බැගින් පර්යංක කාලය වැඩි කරමින් [illegible]
7.00. සිට 8.00. තෙක් බුද්ධ පර්යංකයෙන් ආනාපාන
සතිය වැඩීමට පුරුදු වීමි. රාත්‍රී 8.00. සිට 9.00
පමණ තෙක් [illegible] නිද්‍රාව ලැබීමට
පිළියම් විනය. දවසේ දිනචරියාව සටහන් කරමින්
ඒ අතර සිදුවේ.

අළුයම 3.50. අවදිව මුව දෙවා, 4.00. සිට 5.00. තෙක් යෝගාසන පුහුණු වත් භාවනාවත්, 5.00. සිට 6.00. තෙක් බුද්ධ වන්දනා වත පිරිත නිමවා විනාඩි 15 ක පද්මාසනයෙන් භාවනාත් වඩා දවසේ ආරම්භය සිදු විය. 6.00 සිට 7.00 තෙක් වතාවත් සපුරා හීල් දනය ලැබුණු පසු බුද්ධ පූජා පවත්වා දනය වළඳ වතාවත් සපුරා 8.00. සිට 9.00 තෙක් පොත් පාඩම් කොට, 9.00. පැන් පහසුවී. 10.00. ට පිණ්ඩපාත චරියාව පැවතිණි. 11.00. ආපසු කුටියට සැපත්වී බුද්ධ පූජාව පවත්වා දන් වළඳ වතාවත් සපුරා 12.00. බුද්ධ වන්දනාව වත පිරිත නිමවා විනාඩි 15.ක් පද්මාසනයෙන් භාවනාව වැඩීම සිදුවිය. ඉන් අනතුරුව එදින දවල් පිණ්ඩපාත වෙලාවේ ස්වාමීන් වහන්සේ විසින් දේශනා කළ ධර්මය ඒ ලෙසටම අප විසින් දේශනා කිරීම සිදු විය. ඉන් අනතුරුව කුටි තුනේම පැදුරු කොට්ට මාගල් ඇතිරිලි ආදිය අව්ගස්වා කුටි වත නිමවා දවල්

1.00. සිට 4.00. තෙක් පොත් කියවා ගැනීම සිදුවිය. පාළි පාඨමංජරිය - පාළි භාෂාවතරණයද එක එක පාඩමක් දින පතා කටපාඩම් වන තුරුම උගෙනීම සිදුවිය.

සමහර දිනවල සවස විශ්‍රාමික විදුහල්පතිනී හේමලතා කරුණාරත්න (ස්වාමීන් වහන්සේගේ නැන්දණීය - දෙරණෑගොඩ) මැණියන්ගෙන් සතර බණවර අර්ථ අස්වා ගතිමි. සවස 4.00. සිට 5.00. තෙක් සක්මන් භාවනාව. 5.00. සිට 6.00. තෙක් වත් පිළිවෙත් 6.00. සිට 7.00. තෙක් බුද්ධ වන්දනා වත පිරිත. විනාඩි 15. පර්යංක භාවනාව, සතියකට වරක් විනාඩි 05. බැගින් පර්යංක කාලය වැඩි කරමින් ගොස් 7.00. සිට 8.00. තෙක් බද්ධ පර්යංකයෙන් ආනාපාන සතිය වැඩීමට පුරුදුවිමි. රාත්‍රී 8.00. සිට 9.00. පමණ තෙක් පාඩම් හදරා විශ්‍රාම ගැනීමට නියමිතය. දවසේ දින චරියාව සටහන් කිරීමත් ඒ අතර සිදුවේ.

*මෙම පණ්ඩුපලාස කාලය පුරාවට කල්‍යාණ මිත්‍ර උතුම් ගුරු ඇසුරෙන් යුතුව අඛණ්ඩ දින චරියාව තුළ අර්ථාන්විතව යෙදී පර්යාප්තිමය වූ ද උතුම් ප්‍රතිපත්තිමය වූ ද සාසන ධර්මයන් හි ලත් මනා ප්‍රාගුණ්‍යය හේතුවෙන්ම ආධ්‍යාත්මික අත්දැකීම් වලින් පවා තම දිවිය ඔපවත් වූ අයුරු පූජනීය ස්වාමීන් වහන්සේ ම සටහන් කර තිබුණා.*



සමහරවිට කය නොදැනී ඉතා තුනී දිය කර්දුවන්
මෙන් සිත ඉහළට ගොස් ශාන්තය දක්වා ගිය තරමට
සැපුම්ව පවතී. පුරා මාස 4. ක් අඛණ්ඩව ඉතා
පැහැසර දිනචරියාව අනුව මූලික ප්‍රඥාව ලැබීම ජීවිතයේ
අමතක නොවන මෙන්ම නොවන පදනමක් අත්දැකීමක්
සම්ප්‍රදායක් වැනි වීමට පත්විය.

සමහරවිට කය නොදනී ඉතා කුඩා දිය බින්දුවක් මෙන් සිත ඉහළට ගොස් භවාග්‍රය දක්වා ගිය තරමට සියුම්ව පැවතිණ. පුරා මාස 4 ක් අඛණ්ඩව ඉහත සඳහන් දින චරියාව අනුව මූලික පුහුණුව ලැබීම ජීවිතයේ අමතක නොවන වෙනස් නොවන පදනමක් අත්තිවාරමක් ඍද්ධිපාදයක් වැනි බවට පත්විය.

*යනු එම දින චරියාවෙහි අගය පිළිබඳ කළ සටහනයි.*

*මෙලෙස අඛණ්ඩව කාලසටහනට අනුව දින චර්යාව පැවැත්වීම නිසා ඉන් පරිබාහිර වූ යම් කටයුත්තක් හෝ යම් දෙයක් ගැන සිතීමටවත් ඉඩක් නොවන බව විටෙක මාහිමිපාණන් වහන්සේ වදාළහ. එසේ අනවශ්‍ය දෙයින් තොරව ඉතා අර්ථාන්විත ජීවිතයක් ගොඩනගා ගැනීමට අර්ථවත් දින චරියාවකට, අර්ථවත් කාලසටහනකට අනුව තම ජීවිතය පවත්වා ගැනීම මහත් සේ උපකාර වෙනවා.*


*තවද මාහිමිපාණන් වහන්සේ ප්‍රව්‍රජ්‍යා භූමියට ද පත්ව එලෙසම ගුරු උතුමන් වහන්සේලා යටතේ දින චරියාවෙහි නොසිඝ්ව කාලය ගෙව්වා.*




අළුයම 3.50. අවදිවීම. පර්යංක භාවනා. 5.30. බුද්ධ වන්දනා - වත පිරිත - භාවනා. 6.15. වතාවත්. 7.00. හීල්දනය. 8.00. පාඩම් කිරීම. 10.00. පිණ්ඩපාත වත - පැන්පහසුව 11.00. දවල් පිඬුකිස. 12.00. දිවා වන්දනා - වත පිරිත. 1.00. සිට 5.00. තෙක් අර්ථ හැදෑරීම. පාඩම් දීම - පොත් කියවීම - ලිවීමාදී අධ්‍යයන කටයුතු. 5.00. වතාවත් 6.00. සන්ධ්‍යා බුද්ධ වන්දනා - වත පිරිත - භාවනා - වත් බණ. 7.30. සිට 9.30. තෙක් කුටියේම පර්යංක භාවනාව 10.00. විවේක ගැනීම. (රාත්‍රී දෙපැයේ පර්යංකයේදී සිංහල විශුද්ධි මාර්ගයේ බුද්ධානුස්සතිය සම්පූර්ණයෙන් ධාරණයෙන් අනුස්සති වඩන ලදි.)

*ඉන් පසුව ඒළඹියේ පූජනීය මාහිමිපාණන් වහන්සේ පර්යාප්ති - ප්‍රතිපත්ති ධර්මයන් උගැන්වීමෙහි යෙදෙමින් ආචාර්යවරයෙකු වශයෙන්ද කටයුතු කළ අවදිය යි. එම කාලයෙන් මාහිමිපාණන් වහන්සේ පහත දැක්වෙන දින චරියාවට අනුව තම උතුම් සසුන් දිවිය අර්ථාන්විත කළා.*

*අලුයම 3.30 පිබිදීම, සිරුර පිළිදැගුම්, ප්‍රත්‍යවේක්ෂා - පෙ.ව. 4.00 පර්යංක භාවනාව - පෙ.ව. 5.00 බුද්ධ වන්දනාව, වත පිරිත්, මෛත්‍රී භාවනාව - පෙ.ව. 6.00 වත් පිළිවෙත් - පෙ.ව. 7.00 හීල් දන්කිස - පෙ.ව. 8.00 වත පොත් කිරීම, පාඩම් දීම - පෙ.ව. 9.30 පිණ්ඩපාත චර්යාව - පෙ.ව. 11.00 පිඬු කිස - ප.ව. 12.00 බුද්ධ වන්දනාව, වත පිරිත - ප.ව. 12.30 අර්ථ හැදෑරීම - ප.ව. 01.00 ඉගැන්වීම් කටයුතු - ප.ව. 05.00 වත් පිළිවෙත් - ප.ව. 06.00 බුද්ධ වන්දනා, වත පිරිත, බුදුගුණ භාවනා, වත් බණ, වෘද්ධාපචායනය - ප.ව. 07.30 ගිලන්පස - ප.ව. 08.00 භාවනා - සජ්ඣායනා - සිව්පස ප්‍රත්‍යවේක්ෂාව - ප.ව. 10.00 විශ්‍රාමය.*






වශයෙන් පරිකර්ම කෙළෙමි. අන් අයටද කියාදුනිමි.
ථේර - මහාථේර සමයේදී වඩාත් ප්‍රගුණ කෙළෙමි.
උපසම්පදාවෙන් 38. වෙනි වර්ෂයේ සිට
පාඖ භාවනා මධ්‍යස්ථානයට පත්වීමෙන්...

උපසම්පන්න නවක සමයේදී මහා සී සතිපට්ඨාන භාවනාව වැඩියෙන් වැඩිදියුණු කෙළෙමි. මධ්‍යම සමයේදී අරූප ධ්‍යාන හැර සියලුම සමථ භාවනා පෙරහුරුවීම් වශයෙන් පරිකර්ම කෙළෙමි. අන් අයටද කියා දුනිමි. ථේර - මහා ථේර සමයේදී වඩාත් ප්‍රගුණ කෙළෙමි.

උපසම්පදාවෙන් 38 වැනි වර්ෂයේ සිට පා ඖ භාවනා මධ්‍යස්ථානයට පත්වීමෙන්...

*යනුවෙන් සටහන් කර ඇති පරිදි, මාහිමිපාණන් වහන්සේ ආගමික, සාසනික දෙස් - විදෙස් මෙහෙවරක නියැලුණ ද භාරදූර වගකීම් දැරුව ද පරාර්ථය වෙනුවෙන්ද කෙතරම් මෙහෙයක් ඉටුකළද තම ජීවිතය ඒ ඒ කාලයන්හි නිසි ක්‍රමයකට, පිළිවෙළකට අනුවම ක්‍රියාත්මක කළා. කුඩා කල සිටම පවත්වාගෙන ආ දින චරියාව කාලීනව සුදුසු වෙනස්කම් සහිතව ජීවිතය පුරා අඛණ්ඩව පවත්වාගෙන ගිය අයුරු මෙමගින් මනාව පැහැදිලි වෙනවා.*

*බුරුමයෙහි පා ඖ ආරණ්‍යයේ වැඩසිටි අවදියෙහි ස්වාමීන් වහන්සේගේ දින චරියාව ගෙවුන ආකාරය හරි අසිරිමත්. මුළු දිනයම ඒ කාලය පුරාවට අඛණ්ඩ ප්‍රතිපත්තිය තුළයි ගතවී තියෙන්නේ. හැම දිනයේම තම කාලසටහන ලියා තිබෙනවා. ඒ දිනචරියාව ද පහත දැක්වෙනවා.*



16 දින අළුයම 3.00. අවදිව සිරුර පිළිදැගුම් ධම්මචක්ක (සූත්‍ර දේශනාව සජ්ඣායනය), 4.40. පර්යංකය. ආනාපාන 4 (ධ්‍යාන 4ට සමවැදීම), තේජෝ කසිණ 5.00. වතාවත්, ලිවීම්, 5.30. හීල් දනය 6.00. සක්මන්, පිළිසඳර, සටහන් ලිවීම, 6.40. පර්යංකය. ආනාපාන ඕදාත 4 (ධ්‍යාන 4ට සමවැදීම) - තේජෝ කසිණ පටිභාග නිමිත්ත ලැබිණ. 8.30. සක්මන් බුදුගුණ. 9.10. උණු පැන්පහසුව 9.30. උපදෙස් ලැබීම. තේජෝ කසිණයම ගැන. පෙර දක පුරුදු ගින්නක් අරමුණු කොටද තේජෝ කසිණ නිමිත්ත ලැබිය හැකි බව. 10.00. ලිවීම. 10.30. දවල් දනය. 11.15 බුද්ධ වන්දනාව. විවේකය. 12.20. සක්මන්. බුදුගුණ. 12.50. පර්යංකය. ආනාපාන 4 (ධ්‍යාන 4ට සමවැදීම). ඕදාත 4 (ධ්‍යාන 4ට සමවැදීම). 1.30. සක්මන්. බුදුගුණ. 2.00. පර්යංකය. ආනාපාන 4. ඕදාත 4. නීල 4. පීත 4. ලෝහිත 4. (ධ්‍යාන 4ට සමවැදීම). 4.00. සක්මන්. බුදුගුණ. ඉතිපි සෝ ගාථාවෙන් 547. වැනි ලක්ෂවාරය පිරිණි. (4.40.) 5.10. පර්යංකය. ආනාපාන 4 ඕදාත 4 නිමවා තේජෝ කසිණයෙන් වාර 3 බැගින් ධ්‍යාන හතරට

පැමිණියා. අවසානයේ සතරවැනි අර්පණාව කීප වාරයක් පැවැත්වූවා. 7.00. වතාවත්, සටහන් ලිවීම, ගිලන්පස, සම්බාහනාදිය. 8.45. සක්මන්, විදර්ශනා පිරිත්. මෙත් වැඩීම් ආදිය. 9.30. විශ්‍රාමය.

*පූජනීය මාහිමිපාණන් වහන්සේ ගිහි ජීවිතයෙහි පටන්මත් පැවිදි දිවිය තුළ මුල්කාලයේ සිටත් නොයෙක් නිලතල, භාරදූර වගකීම් දරමින් ද සාසනික මෙන්ම නොයෙක් පරාර්ථ චර්යාවෙහි යෙදෙමින්ද රෝගී භාවයට පත්ව වැඩසිටිමින්ද තම ජීවිතය දින චර්යාවට අනුව ක්‍රමවත්ව, නොසිස්ව, අප්‍රමාදීව ගෙවමින් පරමාදර්ශී වුණා. මුළු ජීවිතයම අඛණ්ඩව එලෙස පවත්වා ගැනීමෙන් ලැබූ ප්‍රතිඵල සම්භාරයක් වූ අතර මාහිමිපාණන් වහන්සේ ආධ්‍යාත්මිකව ලැබූ අත්දැකීම් වලට පවා එය ඉවහල් වූ අයුරු තම ජීවිතයෙන් පෙන්නුම් කළා.*

*මෙතරම් වටිනාකමක් ඇති දෙයක් තමයි නිවැරදි ක්‍රමයකට, රටාවකට, නිසි වෙලාවට අඛණ්ඩව තම දවසේ කටයුතු පවත්වාගෙන යෑම කියන්නේ. ඒ ඒ වෙලාවට කරන්න නිසි දෙයක් නැතිවුනාම අපි වැරදි, පව් වැඩවලට යොමුවෙනවා. ඒක සිදුවෙන දෙයක්. ඒත් අපි වෙලාවට නිසි කටයුත්තක යොමු වුනොත් අපිට ඒ වැරදි කරන්න කාලයක් එළඹෙන්නෙ නෑ. ඒ නිසා ජීවිතේ යහපත්, නිවැරදි කරගන්න අපිත් මේ වටින පුරුද්ද ඇතිකර ගනිමු. ක්‍රියාත්මක කරමු. අඛණ්ඩව කරමු.*

"ලංකාවේ මෙකල වාසයකරන කර්මස්ථානාචාර්යන් වහන්සේලා අතර මා අග්‍රගණ්‍ය කොට සලකන්නේ නා උයනේ අරියධම්ම ස්ථවිරයෝ ය."

(ශ්‍රී ලංකා අමරපුර සම සංඝසභාවේ උත්තරීතර මහානායකව වැඩසිටි අග්ගමහාපණ්ඩිත අතිපූජනීය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමිපාණන් වහන්සේ.)



# සත් ආකාර නාම - රූප විදර්ශනාව

## රූප සත්තක විදර්ශනාව


රූප ධර්ම ආකාර 7 කට බෙදගෙන ඒ අනුව විදර්ශනාව වැඩීම රූප සත්තක විදර්ශනාව වෙනවා. එහි විශේෂත්වය වන්නේ තමන් ගෙවන මේ ජීවිතයේ,

I. ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා පවතින රූප,
II. වයස්ගත වීමෙන් රූප බිඳෙන ආකාරය,
III. ආහාරයෙන් හටගත් රූපයන්ගේ බිඳීම,
IV. ඍතුවෙන් හටගන්නා රූපයන්ගේ බිඳීම,
V. කර්මයෙන් හටගත් රූපයන්ගේ බිඳීම,
VI. චිත්තයෙන් හටගන්නා වූ රූපයන්ගේ බිඳීම,
VII. ධර්මතා රූපයන්ගේ බිඳීම,

යන මේ සත් ආකාරයට රූපයන් විදර්ශනා කිරීමයි. ඒ ඒ අවස්ථාවන්හි පැවති එම රූප අන් අවස්ථාවන්ට නොපැමිණ එහිදීම විනාශ වන ආකාරය මනාව දකිමින් ඒ අනුව රූප විදර්ශනා කිරීම රූප සත්තක විදර්ශනාව වෙනවා.

1.00. පර්යංකය. [illegible] විදර්ශනාව. 1.30.
[illegible]. 2.30. පර්යංකය. [illegible]
[illegible] විදර්ශනාව. 4.00. [illegible] 4.30 [illegible]
5.15. පර්යංකය. [illegible]
විදර්ශනාව.

1.00. පර්යංකය. ආදන නික්ඛේප විදර්ශනාව. 1.30. සක්මන්. බුදුගුණ. 2.30. පර්යංකය. වයෝවුද්ධත්ථගාමිණී - වර්ෂ සියය තුනට දහයට විස්සට පනහට සියයට බෙදමින් විදර්ශනාව. 4.00. සක්මන්. බුදුගුණ. 4.30. ලිවීම 5.15. පර්යංකය. වයෝවුද්ධත්ථගාමිණී, වර්ෂ සියය - දෙසීයට, හාරසීයයට බෙදමින් විදර්ශනාව. (තම ජීවිතය වසර 100 ක් සේ සලකා එම අවුරුදු සියයක ජීවිතය මාස 06 බැගින් කොටස් 200ට, මාස 03 බැගින් කොටස් 400ට බෙදමින් එම එක එක කොටසක පැවති රූප ඉහත ක්‍රම 7 ට අනුව විදර්ශනා කිරීම)



02 කුජ්දින පර්යංක වාර පහේදිම රූප සත්තක ක්‍රමයට විදර්ශනාව පැවැත්විණි. ආදන නික්ඛේපන - වයෝවුද්ධත්ථගාමී වශයෙනි. දශක 10×10, 5×20, 4×25, 3×33, 2×50, 1×100, ඍතු 3ද අනුව පැවැත්විණි. (තම ජීවිත කාලය අවුරුදු 100 ක් සේ සලකා එම අවුරුදු 100 දහයේ කොටස් දහයකට ආදී ලෙස කොටස්වලට බෙද ඒ එක් එක් කොටසක පැවති රූප මෙම ක්‍රම 7 ඔස්සේ විපස්සනා කිරීම.)

04 ගුරු(දින) පර්යංක වාර පහේදිම සාර්ථකව විදර්ශනාව පැවතිණ. රූප සත්තකයේ ඉතිරි ධම්මතා රූප නිමවා අරූප සත්තකය පැවැත්විණි. කලාපතො - යමකතො - ඛණතො නිමවා පටිපාටිතො කොටසක්ද සපිරිණි.

## අරූප සත්තක විදර්ශනාව

ඉහත රූප වැඩූ ආකාරයට මෙන්ම නාම ධර්මයන්ද ආකාර සතකට බෙදා විදර්ශනාවට නැගීම අරූප සත්තක විදර්ශනාවයි. "කලාපතෝ, යමකතෝ..." ලෙස ඒ ක්‍රම 7 දක්වා ඇත.

I. අනිත්‍යාදී වශයෙන් විදර්ශනා භාවනා වඩන විට ඇති වූ (ඵස්ස) ස්පර්ශය ආදී වූ නාම ධර්ම සමූහය බිඳීගිය ආකාරය විදර්ශනා කිරීම,

II. රූප ධර්ම අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කළ සිත වෙනත් සිතකින් ද ඒ සිත තවත් සිතකින් ද වශයෙන් විදර්ශනා කිරීම,


III. මෙසේ විදර්ශනාවට නැගූ සිත නැවත තව තවත් සිත් වලින් විදර්ශනා කිරීම් වශයෙන් සතර වන වරට විදර්ශනා කළ සිත පස්වන සිත තුළින් විදර්ශනා කිරීම,

IV. ඒ අයුරින්ම 10 වන අවස්ථාව දක්වා විදර්ශනා කර ඒ සිත 11 වන සිතෙන් විදර්ශනා කිරීම,

V. මෙම නාම - රූප විදර්ශනා කිරීමෙන් මම යනුවෙන් ගත් වැරදි දැක්ම ඉවත්වන ලෙස විදර්ශනා කිරීම,

VI. ඒ දිට්ඨිය ඉවත් වන ලෙස විදර්ශනා කිරීමෙන් සත්ව, පුද්ගල, ආත්ම ලෙස මැනීම දුරුවන සේ විදර්ශනා කිරීම,

VII. ඒ දිට්ඨි - මානයන් ද දුරු වන ලෙස විදර්ශනා වැඩීමෙන් ඇති වන නිකාන්තිය හෙවත් ඒ කෙරෙහි ඇලීම ද නැතිවන සේ විදර්ශනා වැඩීම නම් වූ මේ ආකාර 7 ට අනුව නාම විදර්ශනා කරනවා.


2. ද අරූප සත්තක විදර්ශනාවේ කලාපතො - යමකතො
දෙකොටස සවිස්තරව ත්‍රිලක්ෂණය වැඩුවෙමි.
3. ද බණතො කොටස් සවිස්තරවත් පටිපාටිතො
කොටසින් ස්වල්පයක් ද සවිස්තරව ත්‍රිලක්ෂණයට නැගිමි.
4. ද පටිපාටිතො සවිස්තරව විදර්ශනා කෙළෙමි.
5. ද උදය වරුවේදී අරූප සත්තකය සම්පූර්ණ ලෙස
නිම කෙළෙමි. (පටිපාටිතො - දිට්ඨි උග්ඝාටනා - මාන සමුග්ඝාතන
නිකන්ති පරියාදන වශයෙනි.)

**2. ද අරූප සත්තක විදර්ශනාවේ කලාපතො - යමකතො දෙකොටස සවිස්තරව ත්‍රිලක්ෂණය වැඩුවෙමි. 3. ද බණතො කොටස් සවිස්තරවත් පටිපාටිතො කොටසින් ස්වල්පයක් ද සවිස්තරව ත්‍රිලක්ෂණයට නැගිමි. 4. ද පටිපාටිතො සවිස්තරව විදර්ශනා කෙළෙමි. 5. ද උදය වරුවේදී අරූප සත්තකය සම්පූර්ණ ලෙස නිම කෙළෙමි. (පටිපාටිතො - දිට්ඨි උග්ඝාටනා - මාන සමුග්ඝාතන නිකන්ති පරියාදන වශයෙනි.)**

මේ රූප සත්තක භාවනාව රූප ධර්ම විදර්ශනාවට නගමින් භාවනා වැඩීමේ ක්‍රම 7 ක් ලෙසත්, අරූප සත්තක විදර්ශනාව නාම ධර්ම විදර්ශනාවට නගමින් භාවනා වඩන ක්‍රම 7 ක් ලෙසත් පැහැදිලි වෙනවා. ජීවිතයක් තුළ ඇති නාම - රූප ධර්ම හඳුනාගෙන ඒවා මෙලෙස විවිධ ආකාරයන්ට බෙද - බෙදා විදර්ශනාවට නගමින් නැවත නැවත එහි යෙදීම මගින් දිට්ඨි - මාන - තණ්හා දුරු කරමින් සැබෑ ඤාණ දර්ශනය පහළ කරගැනීමට උත්සාහ වෙනවා. මෙලෙසින් සංස්කාර ධර්ම නැවත නැවත බෙද බෙදා බැලීම, විමසීම, විශ්ලේෂණය කිරීම ධර්මයෙහි පවතින ලක්ෂණයක්. එය ඤාණ දර්ශනය පහළ කරගන්න උපයෝගී වෙනවා. පූජනීය අප මාහිමිපාණන් වහන්සේ මෙන්ම මේ

ධර්මයෙහි නිවැරදිව යෙදෙන, උත්සාහයෙන් යෙදෙන කාහටත් මෙමගින් උතුම් ප්‍රතිඵල ලැබෙනවා. එම ප්‍රතිඵල අඩු වැඩි වෙන්න පුළුවන්. ඒ ප්‍රතිඵල කෙරෙහිත් ආශාව, ඇලීම නොදක්වා එහි උත්සාහවත් වීමයි කළයුතු වන්නේ.


**"සුපටිපන්නාදි සඟ ගුණයන්ට නිසි සාධාරණය එකැතින්ම ඉටු කළ, ඉතා ව්‍යක්ත වූද, ලෝක ප්‍රකට වූද, ලෝක පූජිත වූද, නිවන් මග පමණක් අනුගමනය කරන, අනුගමනය කළ අසහාය ථෙරපාණන් කෙනෙකු ලෙසයි මා අරියධම්ම හාමුදුරුවෝ හඳුන්වන්නේ."**

**(ශ්‍රී ලංකා පාලි බෞද්ධ විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යාය ජ්‍යේෂ්ඨ මහාචාර්ය පූජනීය වෑගම පියරතන නාහිමිපාණන් වහන්සේ.)**






# අසුභ භාවනාව



9.30. උපදෙස් (ආධ්‍යාත්මික වස්තු රූප සය අනුව
නාම රූප හා පඤ්චස්කන්ධය වර්තමාන අතීත අනාගත තුන් කාලයටම බලමින්
ත්‍රිලක්ෂණයට නංවන්න. නැවත අවිඤ්ඤාණක අසුභ දසය බලමින් තමන්ට
සංසන්දනය කොට අසුභ සංඥවත්, ධාතු සංඥවත් වඩා ත්‍රිලක්ෂණයට
නගන්න. ධාතු වශයෙන් බලා නැවත උතුජ රූප වශයෙන් අවිඤ්ඤාණක අසුභ
බලා තමන්ට සංසන්දනය කරන්න. නැවත තමන්ගේ සිරුරෙහි කුණප
දෙතිස බලමින් බාහිර සවිඤ්ඤාණක සන්තානවල ද කුණප දෙතිස බලා
ධාතු වශයෙන් ත්‍රිලක්ෂණයට නගන්න. නැවත පරමත්ථ රූප වශයෙන් ද
ත්‍රිලක්ෂණය නගන්න. නැවත ආධ්‍යාත්මික බාහිරික සන්තානවල
කුණප [illegible] අසුභ - අසුචි - ජරා [illegible] මරණ, බලමින්
ත්‍රිලක්ෂණයට නගන්න.)

9.30. උපදෙස් (ආධ්‍යාත්මික වස්තු රූප සය අනුව නාම රූප හා පඤ්චස්කන්ධය වර්තමාන අතීත අනාගත තුන් කාලයටම බලමින් ත්‍රිලක්ෂණයට නංවන්න. නැවත අවිඤ්ඤාණක අසුභ දසය බලමින් තමන්ට සංසන්දනය කොට අසුභ සංඥවත්, ධාතු සංඥවත් වඩා ත්‍රිලක්ෂණයට නගන්න. ධාතු වශයෙන් බලා නැවත උතුජ රූප වශයෙන් අවිඤ්ඤාණක අසුභ බලා තමන්ට සංසන්දනය කරන්න. නැවත තමන්ගේ සිරුරෙහි කුණප දෙතිස බලමින් බාහිර සවිඤ්ඤාණක සන්තානවල ද කුණප දෙතිස බලා ධාතු වශයෙන් ත්‍රිලක්ෂණයට නගන්න. නැවත පරමත්ථ රූප වශයෙන්ද

ත්‍රිලක්ෂණයට නගන්න. නැවත ආධ්‍යාත්මික බාහිරික සන්තාන වල කුණප පණු කැළ ගැන සලකා අසුභ - අසුචි - ජරා ව්‍යාධි මරණ බලමින් ත්‍රිලක්ෂණයට නංවන්න.)




7.15. පර්යංකය. ආධ්‍යාත්මික බාහිර රූප කය අසුභ අසුචි ජරා ව්‍යාධි මරණ වශයෙන් විදර්ශනාවට නැගීම. චිත්ත සමාධිය, ප්‍රීති, පස්සද්ධි තදින් ඇතිවිය. ආලෝකය, අරමුණු කරන සන්තාන බිඳි බිඳී යන ආකාරය, පණු රැසක් වැනිව පැවැත්ම, සත්ව පුද්ගලතාව නැතිවී අහෝසි වීම දැකීමට ලැබිණ.

මෙම එා ඔා භාවනා මාර්ගය තුළ විදර්ශනාව වඩන අතරතුරදී අසුභ භාවනාව වෙතද යෝගීන් යොමු කිරීම, ඉන් පසුව සිදුකරනවා. යෝගීන් පිළිබඳවත් - මේ භාවනා මාර්ගය පිළිබඳවත් හසළ අවබෝධයක් ඇති බුරුම රට පූජනීය ආචිණ්ණ (සයාඩෝ) මාහිමිපාණන් වහන්සේ මෙකල ලෝකයේ වැඩසිටින උසස්ම කර්මස්ථාන ආචායර්‍යවරයන් වහන්සේ ලෙස අපි දකිනවා. සියලු ආකාරයෙන්ම අතිදක්ෂභාවය, පරිපූර්ණභාවය ඊට හේතුවී තිබෙනවා.

විදර්ශනාව වඩන අතරතුරම යෝගීන් අසුභ කමටහනෙහි ද යොදවනවා. එසේ ලබාදෙන අසුභ කමටහන අප මාහිමිපාණන් වහන්සේ ද සටහන් කරගත්

ආකාරයට ඉහත දැක්වෙනවා. ඒ වගේම ඒ කමටහන වඩා ලබා ගත් අත්දැකීම ද ඊට පහතින් දක්වා තිබෙනවා.

නාම - රූපයන් ත්‍රිලක්ෂණ විදර්ශනාවට නංවා එහි අගට අසුභ භාවනාව වැඩීමේදී දැඩි ලෙස චිත්ත සමාධිය පහළවීමේ අත්දැකීමක් ද අප මාහිමිපාණන් වහන්සේ තවත් අවස්ථාවක දක්වා තිබෙනවා.



**ත්‍රිලක්ෂණ අගට අශුභ මනසිකාරයේදී දැඩි ලෙස චිත්ත සමාධිය පහළ විය.**

දෙතිස් කොට්ඨාශ, දස අසුභ අජ්ඣත්ත - බහිද්ධා, සවිඤ්ඤාණක - අවිඤ්ඤාණක ලෙසින් භාවනාවට නංවනවා. ඒ දුර්ගන්ධ - අසුචි - ව්‍යාධි - ජරා - මරණ යන පස් ආකාරයට ය. මෙම අසුභ භාවනාව මුල් අවස්ථාවේදී වැඩූ ආකාරයට වඩා විශේෂත්වයකින් යුතුව වඩමින් විපස්සනාවට ලක් කරනවා.

**"නා උයනේ අරියධම්ම හාමුදුරුවෝ වගේ තව කෙනෙක් ලෝකයේ වෙන රටවල ඉන්නවද කියලා අපි දන්නේ නැති නමුත් ලංකාවේ නම් මේ හාමුදුරුවෝ වැනි කෙනෙක් තවත් නෑ."**

**(කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි අධ්‍යයන අංශයේ අංශාධිපති ජ්‍යේෂ්ඨ මහාචාර්යය පූජනීය නාබිරිත්තන්කඩවර ඤාණරතන නාහිමිපාණන් වහන්සේ.)**

# භාවනාවට බාධක

අපි යම් හොඳ දෙයක් කරද්දී, භාවනාවක් වඩන කොට, යම් පිළිවෙතක නිරත වෙන කොට කිසියම් බාධාවක් ආවොත් කලබල වෙනවා. ඒ වෙනුවෙන් ප්‍රතිවිරුද්ධ ක්‍රියාමාර්ග වල යෙදෙනවා. සමහර විට ඇති වූ ඒ බාධක තුළ තම ඒ හොඳ ක්‍රියාව, භාවනාව, ප්‍රතිපත්තිය අතහැර දමනවා. එය ධර්මානුකූල දෙයක් නොවෙයි.

පාරමී පුරන බෝසතාණන් වහන්සේලාටත් එය සාධාරණ වූවක්. අපේ මාහිමිපාණන් වහන්සේටත් එබඳු බාධක තිබුණා. ලෙඩ රෝග - අසනීප තත්වයන් කලින් කල පැමිණියා. එමගින් භාවනාවට බාධා වී තිබෙනවා. දින චරියාව අතරතුර ඒ අපහසුතා හේතුවෙන් භාවනාව නොවැඩුණු බව සටහන් කර තිබෙනවා. තවත් සමහර අවස්ථා වල ඉතා දුර ගමන් ගොස් වෙහෙසට පත්වීම නිසා තම ධ්‍යාන සමාපත්ති නිසි සේ වඩා ගැනීමට නොහැකි වූ අවස්ථාවන් ද  දක්වා තිබෙනවා. සාමාන්‍ය ජීවිතය තුළ වුනත් මාහිමිපාණන් වහන්සේ යම් යම් කරදර වලටත් මුහුණපා තිබෙනවා.

මේ සෑම දේම ධර්මතාවන්. අපි ඊට අනුව ක්‍රියාත්මක වෙන්න ඕන. භාරගන්න ඕන. ඒවා මගහැර අපිට මේ ගමන යන්න නොහැකියි.  ඒ නිසා එවැනි දෙයින් අපගේ යහපත් ක්‍රියා, ප්‍රතිපත්ති අතහැරීම වෙනුවට අප ස්වාමීන් වහන්සේ වගේ වීර්යයෙන්, අධිෂ්ඨානයෙන් අපිත් ඒ බාධක හමුවේ ක්‍රියාත්මක වෙන්න ඕන. එවිට අපේ අභිමතාර්ථ සඵල කරගන්න හැකි වෙනවා.



# හට ගැන්ම හා විනාශය දැකීම

සංස්කාර ධර්මයන්ගේ හට ගැන්ම හා විනාශය හෙවත් උදය - වය ඉන් අනතුරුව අනුපස්සනාවට ලක්කෙරෙනවා. නිර්වාණගාමිණී මාර්ගයේ එක් සන්ධිස්ථානයක් ලෙස මේ අවස්ථාව දක්වන්න පුළුවන්. මේ උදය - වය අනුපස්සනාව දියුණු කිරීමේදී මාර්ගය - අමාර්ගය පිළිබඳව පිරිසිදු ඤාණ දර්ශනය පහළ කර ගැනීමේ භාග්‍ය උදාවෙනවා. එය නිවන් මගට විශේෂයි. එතැන් සිට ඒ හිත බලවත්ව කැප වන්නේ, උත්සාහ ගන්නේ තමා මනාව වටහා ගත් නිවැරදි මාර්ගය තුළ තම උතුම් ප්‍රතිපදාව ක්‍රියාත්මක කිරීමට ය. ආධ්‍යාත්ම වූ ද බාහිර වූ ද කිසිඳු ප්‍රතිපත්ති බාධක ධර්මයකට වසඟ නොවී, මුළා නොවී ඒකායන වූ නිර්වාණ ප්‍රතිපත්තිය කෙරෙහි අවබෝධයෙන් කැපවීමට ය. ඒ නිවැරදි මාර්ගයේ මේ උදය - වය අනුපස්සනාවේ දියුණුව කරා ගියාට පසුව කෙලෙස් තවන, ඒ නිකෙලෙස් බව පිණිස වන සැබෑම ප්‍රතිපදා ඤාණදර්ශනය පහළකර ගැනීමට අවශ්‍ය පිවිසුම සැකසෙනවා. තවදුරටත් විමසන විට මේ උදය වය ඤාණය ඵල සමවතට සමවැදීමේදී ද පාදක වන බවත් විදර්ශනා ඤාණ වීථිය හඳුන්වන්නේ ද මේ උදය වය ඤාණයේ සිට බවත්, පෙන්වා දෙනවා. මේ නිසා මේ උදය වය අනුපස්සනාව සුවිශේෂ වෙනවා.

මේ උදය - වය අනුපස්සනාවේදී සියුම්ව සංස්කාර ධර්ම හට ගැන්ම දිගට බලමින් පළමුව 'උදය' අනුපස්සනා කරනවා. එය අනිත්‍යත්වයේ ආරම්භය ද වෙනවා. පවතින (ඨිති) අවස්ථාව මුලදී තරමක් අප්‍රකට විය හැකි වුනත් එයද භාවනාව වඩන විට ක්‍රමයෙන් දැක ගන්නවා. දෙවනුව භාවනා වඩන්නේ (ඨිති) පවතින අවස්ථාවෙන් පසුව ඇතිවන නිරෝධය, විනාෂය වන (වය) අනුපස්සනාවයි. එයද දිගට අරමුණු කරමින් විදර්ශනා කරනවා. එය අනිත්‍යතාවයේ අන්තය වෙනවා. තුන්වෙනුව මේ දෙකම එකට ගෙන උත්පාද - නිරෝධය, ඇති වීම - නැතිවීම වශයෙන් අනුපස්සනා කරනවා.

- ☸ උප්පාදය - ඇතිවීම බැලීම (උදය)
- ☸ නිරෝධය - නැතිවීම බැලීම (වය)
- ☸ උප්පාද - නිරෝධ එකටම බැලීම (උදය - වය)

යන ආකාරයට රූප - නාම - පටිච්ච සමුප්පාද සංස්කාරයන් අනිත්‍ය - දුක්ඛ - අනාත්ම ලෙස විදර්ශනාවට නංවනවා.

මේ උදය වය "ප්‍රත්‍යුත්පන්න ස්කන්ධ ධර්මයන්ගේ විපරිණාමය දැකීමෙහි ප්‍රඥව" ලෙස පෙන්වා දෙනවා. උදය වය අනුපස්සනාවේදී සංස්කාර වර්තමානව දකිමින් භාවනාවට නංවනවා. තුන් කාලයේම සංස්කාරයන්ගේ එම යථා ස්වභාවය භාවනාවක් ලෙස වැඩීමට යෝගියා දක්ෂ වෙනවා. සංස්කාර වල විපරිණාමයද දකිනවා. වර්තමානව උදය දකිමින් - වය දකිමින් විපස්සනාව කරනවා.

මේ සංස්කාර අතරක් නැර ඉපිද - නිරුද්ධ වෙනවා. එයද වර්තමානව උදය හා වය ලෙස ඤාණයෙන් දැක

විදර්ශනා කිරීම සිදු කරනවා. ක්‍ෂණ වශයෙන් දැකීම ලෙස එය දක්වා ඇත. හේතු ප්‍රත්‍ය වීමෙන් ඉපිද - නිරුද්ධ වන සංස්කාරයනුත් එලෙස වර්තමානව උදය - වය ලෙස වඩනවා. පටිච්ච සමුප්පාදයේදී මේ ආත්ම භාවය හා සම්බන්ධ වන කොටස් පමණක් නොව අතීත, අනාගත භවයන් හා සම්බන්ධ සියලු සංස්කාර ධර්මයන් ද උදය - වය ලෙස වර්තමානව අරමුණු කරගනිමින් භාවනා වඩනවා.


මෙලෙස භාවනා වඩමින් උත්පාද - නිරෝධය මෙන්ම අනුප්පාද නිරෝධයත් විපරිණාම නිරෝධයත් වටහා ගන්නවා. උදය වය දියුණු කරගත් යෝගාවචරයා හට තමන් වඩන භාවනා අරමුණ ඉතා හොඳින් පෙනෙනවා. ඇතිවීම ද නැතිවීම ද පෙනෙන අතර විටෙක ඨිති ක්‍ෂණය නොපෙනී යනවා. විටෙක මුල හා මැද නොපෙනී අග මනාව දර්ශනය වෙනවා. ඒ ඒ අරමුණු තුළ අනුපස්සනාවට ගන්නා ධර්ම ස්වභාවයම විටෙක මනාව දර්ශනය වෙනවා. උදය හෝ වය ද නැතහොත් ඒ දෙකම ද වශයෙන් ඒ ඒ ස්වභාවයෙහි සිත මනාව පිහිටා ගන්නවා.

මෙලෙස සංස්කාරයන්හි උදය - වය මනාලෙස අවබෝධ කර ගැනීමෙන් සංස්කාර ස්වභාවයන් පිළිබඳව වැටහීම මෙන්ම ධර්ම ඤාණය ද පුළුල්ව වැඩෙනවා. ඒ අතර චතුරාර්‍ය සත්‍යය පිළිබඳ වූ අවබෝධය ද වැඩෙනවා.

සංස්කාර ධර්මයන්හි පහළවීම් ලෙස ජාති දුක සංස්කාර වියෝව දකිමින් මරණ දුක ආදී වූ දුක්ඛ සත්‍යය වැටහෙනවා. හේතු ධර්ම ඇති නිසා ඵල පහළ වන ආකාරයෙන් ජනක හේතු ධර්මයද දක්නා නිසා සමුදය සත්‍යය ප්‍රකට වෙනවා. හේතු ධර්ම ප්‍රකටව ඇති වීමට


පහළ විය හැකි ඵල ධර්ම වල අනුප්පාද වියෝව ද දැකගන්නා නිසා නිරෝධ සත්‍යය පිළිබඳ අවබෝධය ඇති වෙනවා. හේතු - ඵල ආදී සංස්කාරයන්ගේ උදය - වය සැබෑ ලෙස දැකීම ආදී වශයෙන් පහළ වන සම්මා දිට්ඨික ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග ප්‍රඥාව නිසා මාර්ග සත්‍යය පිළිබඳව වැටහීම පහළ වෙනවා. මේ චතුරාර්‍ය්‍ය සත්‍යය පිළිබඳව මෙන්ම ප්‍රතිපද මාර්ගයෙහි බොහෝ ධර්මයන් පිළිබඳ වැටහීම, දියුණු කළ උදය - වය ඤාණය තුළදී ඇති වෙනවා. ඒ උතුම් ඤාණ දර්ශනය පූජනීය අප මාහිමිපාණන් වහන්සේ සුවිශදව පසක් කර ගත්තා.

## උදය



9.30
උපදෙස් (අවිජ්ජා හේතුවෙන් පටිසන්ධි රූප - තණ්හා උපාදාන සංඛාර කම්ම
හේතුවෙන් පටිසන්ධි රූප - වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන උපාදාන
ස්කන්ධයන්ගේ උදය = හටගැනීම බලන්න. වස්තු ද්වාර හයේම බලන්න.
කසිණ ධ්‍යානාදීන්ගේ ද හේතුවෙන් හටගැනෙන හැටි බලන්න. ඔවුන්ට වස්තු
ආරම්මණ ඵස්ස හේතු වන සැටි ද බලන්න. ඉන් පසු අතීත භව අනාගත
භවයන් හිද උපාදානස්කන්ධ පඤ්චකයේ අතීත හේතු වර්තමාන හේතු වශයෙන්
උදය බලන්න)

9.30. උපදෙස් (අවිජ්ජා හේතුවෙන් පටිසන්ධි රූප - තණ්හා - උපාදාන - සංඛාර - කම්ම හේතුවෙන් පටිසන්ධි රූප - වේදනා - සඤ්ඤා - සංස්කාර - විඤ්ඤාණ යන උපාදානස්කන්ධයන්ගේ උදය = හට ගැනීම බලන්න. වස්තු ද්වාර හයේම බලන්න. කසිණ ධ්‍යානාදීන්ගේ ද හේතුවෙන් හටගැනෙන හැටි බලන්න. ඔවුන්ට වස්තු ආරම්මණ ඵස්ස හේතු වන සැටි ද බලන්න. ඉන් පසු අතීත


භව අනාගත භවයන්හිද උපාදනස්කන්ධ පඤ්චකයේ අතීත හේතු ක්ෂණ හේතු වශයෙන් උදය බලන්න.)


12.50. පර්යංකය ; පටිසන්ධි භවංග පඤ්චවිඤ්ඤාණයන්ගේ, අවිද්‍යාදී සමුදය
පස අනුව උදය බැලීම

12.50. පර්යංකය. පටිසන්ධි භවංග පඤ්ච විඤ්ඤාණයන්ගේ අවිද්‍යා ආදී සමුදය පස අනුව උදය බැලීම. (අවිජ්ජා, තණ්හා, උපාදන, සංඛාර, කම්ම යන සමුදය 5 අනුව උදය බැලීම.)


7.15 පර්යංකය. වර්තමාන
අතීත අනාගත ත්‍රිභවයෙහි පඤ්චස්කන්ධයන්ගේ උදය බැලීම.

7.15.පර්යංකය. වර්තමාන අතීත අනාගත ත්‍රිභවයෙහි පඤ්චස්කන්ධයන්ගේ උදය බැලීම.


20. ද පටිච්ච සමුප්පාදය ප්‍රථම ක්‍රමයට අනුව සමුදය වාරය
අජ්ඣත්ත බහිද්ධා අතීතානාගත වර්තමාන තුන් කාලයටම ත්‍රිලක්ෂණ
විදර්ශනාවට නංවන්නට අවසර ලැබිණ. එසේම සම්පූර්ණ කෙළෙමි.

20 ද පටිච්ච සමුප්පාදය ප්‍රථම ක්‍රමයට අනුව සමුදය වාරය අජ්ඣත්ත බහිද්ධා අතීතානාගත වර්තමාන තුන් කාලයටම ත්‍රිලක්ෂණ විදර්ශනාවට නංවන්නට අවසර ලැබිණ. එසේම සම්පූර්ණ කෙළෙමි.

වය

9.35. උපදෙස් (ප්‍රතිසන්ධියේ සිට සියලුම උපාදනස්කන්ධයන්ගේ නිරෝධය බලන්න. අවිජ්ජා තණ්හා උපාදන සංස්කාර කර්ම යන හේතූන්ගේ අනුත්පාද නිරෝධයෙන් ස්කන්ධයන්ගේ අනුත්පාද නිරෝධයත්, විපරිණාම නිරෝධයත් අජ්ඣත්ත බහිද්ධා වශයෙනුත් අතීත අනාගත වර්තමාන කාලත්‍රය වශයෙනුත් බලන්න.)

5.15. පර්යංකය. සියලු චිත්ත වීථි ද අතීතානාගත භවයන්හිද උපාදනස්කන්ධ නිරෝධ විදර්ශනාව.

21. ද පටිච්ච සමුප්පාදය ප්‍රථම නය ක්‍රමයේ නිරෝධවාරය. පෙරදින සේම ත්‍රිලක්ෂණ විදර්ශනාවට නංවන ලෙස අවසර ලැබිණි. එසේම සම්පූර්ණ කෙළෙමි. ඒ වාර දෙකේදීම විදර්ශනා සමාධිය ඉතාමත් දැඩි ලෙස පැවතිණි.

## උදය - වය

12.40. පර්යංකය. ස්කන්ධයන්ගේ උදය වය දුක්ඛ ලක්ෂණ විදර්ශනාව 1.30. සක්මන්. බුදුගුණ. 2.20. පර්යංකය. පටිසන්ධියේ සිට ද්වාර සයෙහි ස්කන්ධයන්ගේ උදය වය දුක්ඛ ලක්ෂණ විදර්ශනාව. වීථි වශයෙන් විදර්ශනාවේදී ආලෝක ප්‍රීති පස්සද්ධි තදින් ඇති විය.

7.20. පර්යංකය. වස්තු රූප - ද්වාර වීථි අජ්ඣත්ත බහිද්ධා අතීතානාගත ස්කන්ධයන්ගේ උදය වය අනාත්ත ලක්ෂණ විදර්ශනාව.

07 රවිදින පච්චුප්පන්න - අතීත කාලික පටිච්ච සමුප්පාදය පඤ්චක - ප්‍රථම ක්‍රම දෙකට අනුව උදය - වය දෙක ත්‍රිලක්ෂණයට නංවා සාර්ථකව අනුපස්සනා කරන ලදි.

පූජනීය මාහිමිපාණන් වහන්සේ ද උදය - වය භාවනාවන් වැඩූ ආකාරය මේ කමටහන් සටහන් තුළින්

දක්නට ලැබෙනවා. ඉන් අවස්ථා කිහිපයක සටහන් ඉහතින් දක්වෙනවා. එලෙස භාවනා වඩනවිට ඒ ඒ පර්යංක වලදී ලැබූ විශේෂත්වයන් ලෙස "සමාධි - ආලෝක, ප්‍රීති, පස්සද්ධීන් තදින්, ඉතාමත් දැඩි ලෙස පැවතිණ." යනුවෙන් ඒ ගැන කරුණු දක්වා තිබෙනවා. මෙම උදය වය අනුපස්සනාව ද මාහිමිපාණන් වහන්සේ සුවිශේෂ ලෙස වඩා ඇති බව අපගේ වැටහීමයි.

මෙම විශේෂත්වයන් ලැබෙන විට ඒවාට නිසිලෙස ක්‍රියාත්මක විය යුතු වෙනවා. ඒ සඳහා බුරුම රට පූජනීය ආචිණ්ණ (සයාඩෝ) මාහිමිපාණන් වහන්සේ ද ධර්මයට අනුව උපදෙස් ලබා දෙනවා. ආලෝකය බලවත්ව ඇතිවන විට එයට නොඇලී ඒ ඕභාසයද විපස්සනාවට ලක්කරන ලෙස පෙන්වා දෙනවා. එසේ ඕභාසයක් බලවත්ව ඇතිවූ විට අභ්‍යන්තර චිත්තජ, උතුජ රූපත් බාහිර උතුජ රූපත්, බලන ලෙස උපදෙස් ලබා දෙනවා. තවත් විටෙක විපස්සනා කළ සිත තව සිතකින් නැවත විපස්සනා කරන ලෙස පැහැදිලි කරනවා.

මේ ආකාරයට ඇතිවන ධර්මතාවන් භාවනාවට බාධාවක් නොකර ගනිමින් උදය - වය ගැඹුරින් දියුණු කර ගන්නවා. එසේ දියුණුවට පත් යෝගීන්ට මාර්ගය - අමාර්ගය පිළිබඳව මනා අවබෝධයක් ඇතිවෙනවා. එසේ මාර්ගය පිළිබඳව නොමුළාව ඤාණදර්ශන විශුද්ධිය ඇතිකර ගැනීමෙන් පසුව සැබෑ ප්‍රතිපදාව පිළිබඳ වූ ඤාණදර්ශනය ද පහළ කර ගැනීමේ මාවතට ක්‍රමයෙන් යොමුවීමේ භාග්‍ය උදා වෙනවා.

# සුවිශේෂත්වයක විශේෂය

යම් පුද්ගලයෙකුගේ, යම් දෙයක දක්නට ලැබෙන සාමාන්‍ය තත්වයට වඩා එහා ගිය වෙනස්කම, විශේෂබව සුවිශේෂත්වය වෙනවා. එය විවිධ ආකාරයන්ගෙන් ඇති වෙන්න පුළුවන්. පූජනීය අපගේ ආචාර්යෝත්තමයන් වහන්සේ ද එබඳු වූ සුවිශේෂත්වයකින් යුතු වූ බුද්ධාංකුර සංඝපිතෘවරයාණන් වහන්සේ නමක්. මාහිමිපාණන් වහන්සේගේ ඒ සුවිශේෂත්වය තුළ විශේෂ බවක් ද තිබෙනවා. කෙනෙකුගේ හෝ යම් දෙයක තිබෙන සුවිශේෂත්වය කාලයකට හෝ එක අංශයකට සීමා වුවක් වෙන්න පුළුවන්. අප මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සුවිශේෂත්වයේ ඇති විශේෂය වන්නේ ළදරු කල පටන් මුළු ජීවිතය පුරාවටත්, හැම අංශයක් ඔස්සේමත් එය විහිදී පැතිරී අඛණ්ඩව පැවතීමයි.

පූජනීය අප මාහිමිගේ මව්-පිය දෙපළ සැලකුව ද සුවිශේෂී ය. උපත සුවිශේෂී ය. ළදරු අවදිය සුවිශේෂී ය. ඉගෙනීම, ඉගැන්වීම, ස්මරණ ශක්තිය, දේශනා හැකියාව, සීලය, සමාධිය, ප්‍රඥාව, පර්යාප්ති දැනීම, ප්‍රතිපත්ති වැඩීම, ලැබීම්, පරිත්‍යාග කිරීම්, සතිය, ඉවසීම, උපේක්ෂාව මෙබඳු වූ බොහෝ කරුණු හෙවත් මුළු ජීවිතයම සැබෑවටම සුවිශේෂී ය. ඒ සුවිශේෂීබව මුළු ජීවිතය පුරාම දක්නට තිබුණා. එය සුවිශේෂීබවේ ඇති විශේෂත්වය වෙනවා.

භාවනා මග පිළිබඳ වූ සුවිශේෂත්වය සලකා බලද්දී එය තවත් පැහැදිලි වෙනවා.

- කුඩාම අවදියෙන් ඇරඹි භාවනා පිළිවෙත් වැඩීම අවසාන කාල වකවානුව දක්වාම අත්දැකීම් ලබමින් ඉතා ඉහළට ප්‍රගුණ කළා.
- පර්යංක - සක්මන් භාවනාවන් මගින්, බුදුගුණ වැඩීම මගින් නොසිස් ලෙස මුළු දවසම ගෙව්වා.

- දවස පුරා සතිමත් බවින් යුතුව කටයුතු කළා.
- කෙටි කලකින් ඒ ඛෟ භාවනා මාර්ගය සම්පූර්ණව දියුණු කළා.
- කමටහන් ලබාදීමේදී බුරුම රට පූජනීය ආචිණ්ණ (සයාඩෝ) මාහිමිපාණන් වහන්සේ සාමාන්‍ය යෝගියෙකුට වඩා විශේෂ අයුරින් කමටහන් ලබාදී තිබෙනවා. ඒ නා උයනේ ස්වාමීන් වහන්සේ ඉතා පහසුවෙන්, දක්ෂ ලෙස, ඉක්මනින් තමන්ට ලබා දෙන කමටහන් ප්‍රගුණ කළ නිසාය. ඒ බව කමටහන් සටහන් තුළින් ද පැහැදිලි වෙනවා.
- විවෙක ලබා දී ඇති කමටහනට අමතරව ද මාහිමිපාණන් වහන්සේ භාවනාව ප්‍රගුණ කළා.
- දවසේ ප්‍රධාන කමටහනට අමතරව "ඉතිපි සෝ ගාථා පාඨයෙන්" බුදුගුණ වඩා දින අටකින් පමණ ලක්ෂවාරය සම්පූර්ණ කළා.
- ඒ ඒ භාවනා කොටස් විශේෂ වූ අත්දැකීම් ලබමින් ප්‍රගුණ කර තිබෙනවා.
- පැය දෙකක පමණ පර්යංකයක් තුළ බොහෝ විට ඉතා පුළුල්, විශාල කර්මස්ථාන ප්‍රමාණයක් වැඩීමට, ප්‍රගුණ කිරීමට සමත්ව තිබෙනවා.

මෙලෙස භාවනා පිළිවෙත් මග වැඩීම ගැන අප දන්නා කරුණු මෙන්ම නොදන්නා වූ ද බොහෝ කරුණු වන්නට පුළුවන්. ඒ අතර ඉහත දැක්වෙන කරුණු අනුව ද නා උයනේ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ භාවනා වැඩීම් පිළිබඳ වූ සුවිශේෂත්වය පැහැදිලි වෙනවා. එම තත්ත්වය අඛණ්ඩව, ජීවිතය පුරාම පවත්වා ගැනීම එම සුවිශේෂත්වයෙහි ඇති විශේෂය ලෙස දක්වන්න පුළුවන්. මේ එක කරුණක් පමණයි. මීට අමතරව ජීවිතයේ බොහෝ කරුණු සලකා බැලුවද සුවිශේෂත්වයෙහි ඒ විශේෂය පූජනීය මාහිමිපාණන් වහන්සේගේ ජීවිතයෙන් මනාව පැහැදිලි වෙනවා.








# බිඳීම දැකීම

උදය - වය අනුපස්සනාවෙහි ක්‍රමික වැඩීමත් සමග සංස්කාරයන්ගේ බිඳි බිඳීයාම, නිරෝධයම දැකීම් වශයෙන් භංගානුපස්සනාව වඩනවා. මෙය උදය වය අනුපස්සනාවේදී ද තරමක් පුරුදු කළා. උදය - වය අනුපස්සනාව වඩන විට එහි දියුණුවට පත්වූ අවස්ථාවේදී හෝ යම් අවස්ථාවක යෝගියාගේ අනුපස්සනාව උදයට වඩා දිගින් දිගටම භංගය වෙත යොමුවන්න පටන් ගන්නවා. භංගයෙහිම උනන්දු වන ස්වභාවයක් සිත තුළ පැන නගිනවා. මෙසේ භාවනාවෙන්ම සිදුවන යොමුවීමක් ලෙස හෝ උදය වය භාවනාවෙන් අනතුරුව භංගය, සංස්කාරයන්ගේ බිඳීම ම, නිරෝධයම දැකීමට සිත පුරුදු වෙනවා.

මේ අවස්ථාව නිර්වාණ මාර්ගයේ ප්‍රධානම අංගය වන ප්‍රඥාව දියුණු කරමින්, විපස්සනා ඤාණයන් වැඩෙමින් පවතින විශේෂ කාලය වෙනවා. සියලු සංස්කාරයන්හි ඉපදීම - පැවතීම - විනාශ වීම යන අවස්ථා තුනෙන් විනාශ වීම පමණක් ම අනුපස්සනා කරනවා. එය අනිත්‍යය පිළිබඳ අන්තිම කෙළවර ය. භංග ඤාණයේ පටන් ඉහළ විදර්ශනා ඤාණ වලට පෙනෙන්නේ සංස්කාරයන්ගේ වය, නිරෝධය පමණයි. විදර්ශනාව, සංස්කාරයන්හි උත්පාදය -


පැවතීම - නිමිති - හේතු ඵල යන කිසිවක් තුළ නොව මේ වය හෙවත් නිරෝධය තුළම පිහිටන බව දක්වා තිබෙනවා. එසේ අතීත - අනාගත - වර්තමාන තුන් කාලයෙහි ආධ්‍යාත්ම හෝ බාහිර වශයෙන් ද කවර ආකාර නාම - රූප, හේතු - ඵල ධර්මයක් විදර්ශනා වඩන විට වුනත් දක්නට ලැබෙන්නේ මේ නිරෝධ - භංග ස්වභාවයයි. එනිසා අරමුණු කරන සියලු සංස්කාරයන් බිඳි බිඳී යන ස්වභාවයම මනාව දකිනවා.

මේ භංගානුපස්සනාවේදී භංග ලෙස බිඳීම අනුපස්සනා කරන විට එසේ විදර්ශනා කරන සිත ද පෙනීමට පටන් ගන්නවා. ඒ අනුව විපස්සනා කළ හිත හෙවත් ඒ භාවනා ඤාණයත් නැවත විපස්සනාවට යොමු කරමින් දිගින් දිගටම භාවනා වඩනවා. මේ ආකාරයට සංස්කාර ධර්මයන්ගේ භංගයම අරමුණු කරමින් ත්‍රිලක්ෂණයන්ට නගමින් විදර්ශනා කරන විටදී සංස්කාර ධර්මයන්ගේ භංග ස්වභාවය වේගවත් වෙන්න පුළුවන්. එහිදී උපදෙස් අනුව ක්‍රමානුකූලව තවදුරටත් දියුණුවට වැඩීමෙන් භය - ආදීනව - නිබ්බිද ආදී ඤාණයන් පහළ කර ගනිමින් අඛණ්ඩව භාවනා මාර්ගයෙහි ඉදිරියට ගමන් කරනවා.



2.30. පර්යංකය. පටිච්චසමුප්පාද නිරෝධය කාලත්‍රයට හා අජ්ඣත්ත බහිද්ධා පටිවිපස්සනාවට නැගීම,
2.31. පර්යංකය.

2.30. පර්යංකය. පටිච්ච සමුප්පාද නිරෝධය කාලත්‍රයට හා අජ්ඣත්ත, බහිද්ධා අනුව පටිවිපස්සනාවට නැගීම,


5.15. පර්යංකය. පෙර සේම විදර්ශනාව. ආරම්භයේ සිට අවසානය තෙක් උසස්ම චිත්ත සමාධියෙන් ආලෝකයෙන් පැවතිණ.




5.15. පර්යංකය. ස්කන්ධ වශයෙන් භංගානුපස්සනාවේදී චතුර්ථ ධ්‍යාන සම්මර්ශනය කරද්දී ඒ චතුර්ථ ධ්‍යානයට සමානවූ ම චිත්ත සමාධියට පත්විමි. සියල්ල භංගයට යන සැටි දකිමින් විනාඩි 25 ක් පමණ එක සේ ආලෝකවත් චිත්ත සමාධිය පැවතිනි.




පඨවි කසිණ ධ්‍යාන ධර්ම අනත්ත වශයෙන් සම්මර්ශනය කෙළෙමි. සතරවන ධ්‍යානයේ ධර්ම සම්මර්ශනයේදී අනත්ත අරමුණු කොට පැය භාගයක් පමණ දැඩි ලෙස සමාධිය පැවතිණ. විශාල ආලෝකයද ඇතිවිය. සියලු සංස්කාර අනාත්ම යැයි ද නිර්වාණය පරමාර්ථ යැයි ද සිත් පහළ විය.





28. ද අළුයම ආනාපාන චතුර්ථ ධ්‍යානය තෙක් සමවැදී ඉන් අනතුරුව ධ්‍යාන ධර්ම පේළියට සම්මර්ශනය කෙළෙමි. පෙර සේම විදර්ශනා සමාධිය දැඩි ලෙස පහළ විය. උදය පර්යංකයේදී ප්‍රථම ධ්‍යාන ධර්ම සම්මර්ශනයේදීම ඉතා දැඩි විදර්ශනා සමාධිය පහළ විය. සියලු ධ්‍යාන ධර්ම සම්මර්ශනය අවසානේදී මහත් ආලෝකයෙන් අවීචියේ සිට භවාග්‍රය තෙක් ද දස දහසක් සක්වළද අනන්ත අපරිමාණ සක්වළද නොයෙකුත් සත්ව කොටියාශද අනන්ත ලක්ෂණ වශයෙන් ඉතා සීඝ්‍රයෙන් ඉබේම සිතට වැටහෙන්නට විය. ඒ සැම විටම චිත්ත සමාධිය බලවත්ව පැවතිණි. අද දවසේ මේ ලෙසම සම්මර්ශනය කරන ලෙස අවසර එවා ඇත. දිගටම ඒ පිළිවෙළට විදර්ශනා කෙළෙමි.



13 සනි දින පර්යංක වාර සතරකදී අතීත අනාගත වර්තමාන - අජ්ඣත්ත බහිද්ධා - රූප සන්තක අරූප සන්තක - චත්තාළීසාකාර ද අනුව භංගානුපස්සනාව වඩන ලදි. අනන්ත වශයෙන් පටිවිපස්සනාව වඩද්දී දැඩි සේ සිත සමාධි ගත විය.

මාහිමිපාණන් වහන්සේ භංගානුපස්සනාව වැඩූ අයුරු ඉහත ආකාරයට සටහන් කර තිබෙනවා. භංගානුපස්සනාව ද අත්දැකීම් සේ විශේෂ ආලෝක, සමාධි

තත්ත්වයන් ඇති කර ගනිමින් මෙන්ම විශේෂ නුවණ පහළ වන ආකාරයෙනුත් වැඩූ බව එම විස්තරවල දක්වෙනවා.



# ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකයාණන් වහන්සේ

යමෙක් ලෝකයේ ඉතාම වටිනා දෙයක් නිෂ්පාදනය කරනවා. පසුව එය ලෝකයට බෙදා හරිනවා. ඒත් ඒ නිෂ්පාදනය අපි අරගෙන ක්‍රියාත්මක කළොත් පමණයි අපිට ඉන් ලැබෙන උසස් ඵලය ලබන්න පුළුවන් වෙන්නේ. නිෂ්පාදනය කළත් ලෝකයේ එම භාණ්ඩය තිබුණත් අපි එය අරගෙන ක්‍රියාත්මක නොකරනතාක්, පරිහරණය නොකරන තෙක් ඉන් ලබාගත හැකි ප්‍රතිඵලය අපිට ලැබෙන්නේ නෑ. මේ උතුම් ධර්මයත් ඒ වගේ අසංඛ්‍ය ගණන් පාරමී පුරා බෝසතාණන් වහන්සේලා අපමණ සත්ව කරුණාවෙන් සතපාවබෝධය කරලා යථාර්ථය ලෝකයාට පෙන්වා දෙනවා. ඒ උත්තම ධර්මය තම තමන්ගේ ජීවිත වලට ගළපා ගන්නේ නැතිව, ඒ ධර්මය අහල ඒ අනුව ක්‍රියාත්මක නොවී හිටියොත් බෝසතාණන් වහන්සේලා අවබෝධ කළ පමණින් ලොවටම දේශනා කළ පමණින් අපිට ඵලයක් ලබන්න බෑ. ඒත් ඒ ධර්මයේ සැබෑම වටිනාකම දන්න ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මුල්ම රහතන් වහන්සේලා හැටනම අමතා වදාළේ ලෝකයාට මේ ධර්ම දායාදය ලබාදෙන්න කියලා.

අප ආචාර්යෝත්තම නා උයනේ මහෝත්තමයාණන් වහන්සේ උතුම් බුද්ධ අවවාදය මත පිහිටා අඳුරේ ගිලීගත් ලෝ දනන් නෙත් පාදන්න අනභිභවනීය ධර්ම සේවාවක් සිදු කළා. සැබෑ ධර්ම මාර්ගය ලෝකයේ හැමදාම නෑ. ඒ සැබෑ ධර්ම මාර්ගය පෙන්වා දෙන උතුමනුත් ලෝකයේ හැමදාම නෑ. ඒත් බෝසතාණන් වහන්සේලා බුද්ධ සාසනය පවතින කල මනුලොව උපත ලැබුවොත් පැවිදිව ඉතා ඉහළින් ආත්මාර්ථ, පරාර්ථ සසුන් මෙහෙවර ඉටු කරනවා. ඒක සිදුවන දෙයක්. එය එලෙසම අප මහෝත්තමයාණන් වහන්සේ ද ශ්‍රේෂ්ඨ ධර්ම මාර්ගෝපදේශකයන් වහන්සේ නමක් ලෙස ලෝකයාට ඉෂ්ට කළා.

කුඩා කල පාසල් අවදියේ ඉතාම දක්ෂම ශිෂ්‍යයා වුණා. ඒ දක්ෂතා නිසා 3 වසරේ සිට 5 වසරට පාස් වුනා. ඒ වගේම ගුරුවරයෙක්

නැති පන්තිවලට ඉගැන්වීම ද කළා. දක්ෂ ගුරුවරයෙක් වෙලා අපිට උගන්වන්න එන්න කියා අනිත් ළමයි කී විට මාහිමිපාණන් වහන්සේ "නෑ මම උගන්වන්න එන්නේ නෑ, මම මහණ වෙනවා." කියලා තම උතුම් අදහස ගැන කියා සිටියා. පුංචි කාලෙ ඒ දක්ෂතා නිසාම පැවිදි වෙලත් ඉතා ඉක්මනින් ධර්ම අධ්‍යාපනය ලබලා විශාල සඟ පිරිසකට ත්‍රිපිටක ධර්මය, භාවනා මාර්ගය ආදී නිර්වාණ මාර්ගයට අනුයාත ඉගැන්වීම් තුළින් සැබෑ මාර්ගෝපදේශකත්වය ලබා දුන්නා. ලෝකයේ තෙවලා දහම, සැබෑ ධර්මය තව විශාල කාලයක් හෝ සසුන පවතින කල් පරම්පරානුගතව පැවතීමට ශක්තිමත් සංඝ පරම්පරාවකට අවශ්‍ය ධර්ම දායාදය ලබා දුන්නා. ත්‍රිපිටක දැනුම ලබා දුන්නා. භාවනා දැනීම ලබා දුන්නා.

වත පිළිවෙත ඉගැන්වූවා. වන්දනාවන් කරන අයුරු, පිරිත්, ප්‍රාතිමෝක්ෂය, විනය කර්ම වාක්‍ය ආදිය දේශනා කරන ආකාරය, ධර්ම දේශනා පවත්වන ආකාරය පෙන්නුම් කරල දුන්නා. විනය තුළ හික්මිලා ධර්මයෙන් පෝෂණය වෙලා භාවනා මාර්ගය වඩා සීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන් පෝෂණය වූ පැවිදි ජීවිතයක් මනාව සකස් කර ගන්න ආකාරය එමගින් පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ ත්‍රිවිධ සාසන ප්‍රතිෂ්ඨාපනය සඳහා වූ පූර්ණ මාර්ගෝපදේශකත්වය අවවාදයෙන්, ඉගැන්වීමෙන්, අනුශාසනාවෙන් මෙන්ම ආදර්ශයෙන් විශාල සඟ පිරිසකට මෙන්ම සමස්ත සංඝ සමාජයටම පෙන්වා දුන්නා. ඒ පැවිදි පිරිස අරමුණු කර ගෙනයි. එමගින් ගෞතම ශ්‍රී සම්බුද්ධ සාසනයට ශක්තිමත් සඟ පරපුරක් දීර්ඝ කාලීනව හෝ පරම්පරානුයාතව සම්මා සම්බුද්ධ සාසනය අන්තර්ධාන වන තෙක් නොසිඳී පැවතෙන ශක්තිමත් සඟ පරපුරක් වෙනුවෙන් වූ උතුම් මාර්ගෝපදේශකත්වය එලෙස ලබා දුන්නා. ඒ බෝසත් සිරිත අනුගමනය කරමින් ය.

එතැනින් නොනැවතුණු අප මහෝත්තමයාණන් වහන්සේ සකල ගිහි සැදැහැ ජනයා වෙනුවෙන්ද මහත් වෙහෙසක් පරිශ්‍රමයක් දරා ශ්‍රද්ධාවෙන් තුනුරුවනට ළංවෙන මග, ළංවී දහම දෙස බලන අයුරු, බලා දහමට අනුගත වන අයුරු, අනුගතව දහමින් සැනසෙන මග සරලව සුගමව

කරුණාවෙන් හදවත් වලට ළං කළා. ටිකක් ගැඹුරින් සිතන්න පුළුවන් දහම් අවබෝධයෙන් යුත් ජනයාට සමථ - විපස්සනා භාවනාව සරලව කියා දුන්නා. සීලය - සමාධිය - ප්‍රඥාව වඩන සැබෑ ධර්ම මාර්ගය කියා දුන්නා. සම්බුදු සසුනක පිහිටා ත්‍රිවර්ග සැප සාද ගන්නා ආකාරය මනාව පෙන්වා දුන්නා. මෙලෙසින් අපායේ ගිනි දැල් දැක දැක සිටි සත්වයන් හට ත්‍රිවර්ග සැපතින් සැනසෙන මග කියා දුන්නා. දෙව් ලොව - මනු ලොව දොරටු විවර කර දුන්නා. සතර අපායෙන් සදහටම මිදෙන මගට යොමු කර වූවා. මෙසේ සම්බුදු දහමට නැඹුරු වූ සැබෑ බුද්ධ ශ්‍රාවක පිරිසක් වෙනුවෙන් උතුම් මාර්ගෝපදේශකත්වය සිදු කළා. සසුන පවතින තෙක් පරම්පරාගතව සසුන තුළින් ධර්මාර්ථය වෙනුවෙන් කටයුතු කරන ගිහි සැදැහැ පිරිසක් වෙනුවෙන් වූ මාර්ගය පෙන්වා දීමේ බෝසත් ක්‍රියා පිළිවෙළ එසේ අනුගමනය කළා.

- අසිරිමත් වූ බුද්ධ පූජා පිංකම් පැවැත්වීම. (රුවන්මැලි සෑ ආදී)
- දෙස් - විදෙස් ධර්ම දේශනා, සාකච්ඡා දහස් ගණන් පැවැත්වීම.
- සීල - භාවනා වැඩසටහන් පැවැත්වීම.
- භාවනා පංති පැවැත්වීම. (අවුරුදු 28 ක් පමණ කොළඹ රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ භාවනා පංතිය ආදී ලෙස)
- දෙස් විදෙස් සිය ගණනින් පිරිස පැවිදි උපසම්පදා කරවීම.
- කර්මස්ථාන ලබාදීම.
- ධර්ම ග්‍රන්ථ, භාවනා ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් සම්පාදනය කිරීම.

යනාදී වශයෙන් අතිමහත් සේවාවක් ඒ අතර විශේෂයෙන් ගිහි පිරිස අරමුණු කරමින් සිදු කළා.

මෙලෙස සිව් පිරිස වෙනුවෙන් ම තම ජීවිතය ආත්මාර්ථයෙන් සැනසෙන ගමන් පරාර්ථ ලෙස මහත් වූ කැපවීමෙන් සිදු කළ මාර්ග උපදේශකත්වය, ශ්‍රේෂ්ඨ නායකත්වය අද්විතීයයි. සැබෑවටම බෝධිසත්වවරයෙකු වශයෙන් ඒ මෙහෙය මේ ගෞතම ශ්‍රී සර්වඥ සම්බුද්ධ සාසනය තුළ පමණක් සිදුකළක් නොවේ. පෙරත් බොහෝ වාර වල කරන ලද්දක්. මතුවටත් එය එලෙසම සිදුකරාවි. අපි ඒ උතුම් බෝසත් කිස සසුන්

*මෙහෙවර තුළ ඒ මාර්ගෝපදේශකත්වය තුළ මේ ධර්ම අනුග්‍රහය ලබන්න වාසනාවන්ත වුනා.*

*ඒත් ඒ ලාභයෙන්ම සැනසීමට පත්නොවී මග ඵල නිවන තෙක්ම අපරාජිතව මේ ගමන යා යුතු වෙනවා. ඒ සඳහා උත්සාහ කළ යුතු වෙනවා. දිවිහිමියෙන් අප මාහිමිපාණන් වහන්සේ ශ්‍රී සද්ධර්මයට අනුයාතව පෙන්වා දුන් උතුම් දහම් මගෙහි අප දිවි නොකඩ කොට පැවැත්වීම කරන්න ඕන. එයයි අප කාගේත් බෝධිසත්ව ගුරු උතුමාණන් වහන්සේට කළ හැකි ගෞරවය, සැලකීම වන්නේ. උතුම් බුද්ධ අභිලාෂය ඉටු කිරීම වන්නේ ද එයයි. ඒ සඳහා සැමට ඡන්දය පහළ වේවා! චිත්තය පහළ වේවා! විරිය පහළ වේවා! වීමංසාව පහළ වේවා!*

"මාගේ ශාසනික ජීවිත කාලයේදී මා නෙතින් දුටු, ත්‍රිපිටකය විස්තර කරනට සමත් සැරියුත් තෙරණුවෝ, අටුවා විස්තර කරනට සමත් බුද්ධඝෝෂ තෙරණුවෝ, ටීකා විස්තර කරනට සමත් දිඹුලාගලින් පහළ වූ ටීකාචාර්යන් වහන්සේ, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක ධූරය හෙබවූ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාධිපති, මහෝපාධ්‍යාය, ත්‍රිපිටක වාගීශ්වරාචරිය, මහා කම්මට්ඨානාචරිය පරම පූජනීය නා උයනේ අරියධම්ම මහාස්වාමීන් වහන්සේ වෙති."


(මීරිගම මිණිඔළුව විද්‍යාවාස පිරිවෙන්පති, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අධිකරණ නායක, ශාස්ත්‍රපති පණ්ඩිත මකුලෑවේ විමල මාහිමිපාණන් වහන්සේ.)



# සංස්කාර කෙරෙහි වූ උපේක්ෂාව

බුද්ධත්වයට පත්වන බෝධිසත්වෝත්තමයන් වහන්සේලා සත්වයන් කෙරෙහි වූ අපමණ මෛත්‍රියකින්, උපේක්ෂාවකින් කටයුතු කරනවා. ලෝක සත්වයා දුකින් මුදවා ගැනීමට උතුම් අධ්‍යාශයන් ඇති කරගෙන ඒ සඳහා පාරමී මුදුන්පත් කරනවා. උතුම් සම්මා සම්බුද්ධත්වය පිණිස වූ නියත ගමනක යෙදී ඇති නිසාම සර්වඥතා ඤාණය ලබන තෙක් සංඛාරුපෙක්ඛා ඤාණය දක්වා ප්‍රතිපද මාර්ගය ද වඩනවා. බොහෝ ආත්ම භාව වලදී මේ පුහුණුව සිදු කරනවා. පූජනීය අපගේ මාහිමිපාණන් වහන්සේ ද එබඳු වූ උතුමන් වහන්සේ නමක් ලෙසින් ප්‍රතිපත්ති මාර්ගයෙහි ඉහළට ම වැඩම කළා.

ඉහතින් දක්වන ලද භංගානුපස්සනාවෙන් පසුවද අප මාහිමිපාණන් වහන්සේ අඛණ්ඩව භාවනා මාර්ගය වැඩුවා. එහිදී ක්‍රමයෙන් දියුණුවන භය - ආදීනව - නිබ්බිද ආදී විපස්සනා ඤාණයන් ක්‍රමයෙන් උපදවා ගනිමින් සංඛාරුපෙක්ඛා ඤාණයද පිරිසිදුව පැහැදිලි කරගත් අයුරු පහත දක්වෙනවා.



3. ද අළුයම ආකාස කසිණ සමාපත්ති හතර. ධ්‍යාන ධර්ම සම්මර්ශනය කෙළෙමි. උදය නැවත ආලෝක කසිණ ප්‍රථම ධ්‍යානයට සමවැදී ඉන්පසු එහි ධ්‍යාන ධර්ම සම්මර්ශනය කරද්දී විනාඩි 45 ක් තරම් දිගට දඩි සේ විදර්ශනා සමාධියන් නිරෝධාරම්මණයන් පැවතිණි. මෙම අවස්ථාව

"මුඤ්චිතුකමයතා පටිසංඛා සන්තිට්ඨනා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං" යන අවස්ථාව බව අසා පැහැදිලි කර ගතිමි.

සියලු සංස්කාර ධර්ම මුදහරින්නට කැමති වූ ද ප්‍රත්‍යවේක්ෂාවෙන් යුතු හා අපේක්ෂා හැරීම් ලෙස මැදහත් වූ ඤාණය සංඛාරුපේක්ෂාවයි. උත්පාද ආදිය සංස්කාරයෝ ය. ඒ සංස්කාරයන් කෙරෙහි මැදහත්ව පැවතීම මෙහිදී සිදුවේ. සංස්කාර ධර්මයන්ගේ භංගය හොඳින් දකිනවා. සංස්කාරයන්ගෙන් මිදීමට කැමති සිත වශයෙන් සංස්කාරයන්ගේ භංගය ත්‍රිලක්ෂණයට නංවමින් භාවනා කරනවා. එමගින් සංස්කාර ගැන බිය වන අන්තය දුරු කරනවා. මම - මගේ යැයි වරදවා ගැනීමට සුදුසු කිසිඳු සංස්කාරයක් නොදකින නිසා සංස්කාරයන් ගැන කැමති

වන නන්දිය නම් වූ අන්තයද දුරු කරනවා. මේ අන්තයන්ට නොවැටී සංස්කාරයන් පිළිබඳව පවතින යථාවබෝධය නිසා ඇති කරගත් මධ්‍යස්ථ ස්වභාවය, උපේක්ෂා ස්වභාවය සංඛාරුපෙක්ඛා ඤාණය උපදවා ගැනීම තුළ ගොඩනැගෙනවා. සම්මා සම්බුද්ධත්වය පතන බෝසත් උතුමන් වහන්සේලා මෙන් පූජනීය අප මාහිමිපාණන් වහන්සේද ඒ උතුම් සම්බුද්ධත්වයට පත්වන තෙක් මේ සංස්කාරයන්ගේ උපේක්ෂාව පිළිබඳ වූ ඤාණය දක්වා නැවත නැවත ඤාණය ප්‍රගුණ කරනවා.

මාහිමිපාණන් වහන්සේ තම ජීවිතය සංස්කාර වශයෙන් දකිමින් ඒ සංස්කාර කෙරෙහි ඇති කරගත් උපේක්ෂාවෙන් යුතුව වාසය කළා. මෙය සසර ගමනක් තුළ ඉතාම සුවිශේෂී අවස්ථාවක්. මේ උතුම් තත්වය ඇති කර ගනිමින් ක්‍රමයෙන් මග ඵල නිර්වාණය පසක් කර ගැනීමටයි මේ දුර්ලභ ධර්ම ලාභය ලැබූ අප විසින්ද අප්‍රමාදීව උත්සාහ කළ යුතු වන්නේ.






# චුද්දස වශිය

සමාධි භාවනාව තුළ ශක්තිමත්භාවයට පැමිණීමෙන් විශේෂ අනුසස් ලැබීමට හැකිවේ. ඒ සමාධි භාවනාවෙහි ශක්තිමත් බවින් ලබන විශේෂම හා වටිනාම ආනිසංසය වන්නේ විදර්ශනා භාවනාවන් වැඩීමේ පහසුව ඇති කර ගැනීමයි.

සමාධි භාවනාවෙහි ඉහළ ප්‍රගුණ කිරීම ලෙස දහතර ආකාර වූ චිත්ත පරිදමනය දක්විය හැකිය. දස කසිණයන්ගෙන් ආලෝක හා ආකාස හැර ඉතිරි කසිණ 8 තුළින් උපදවාගත් සමාපත්ති අට මීට පාදක වෙනවා. එම කසිණ 8 ත් - රූප - අරූප ධ්‍යාන 8 ත් ආකාර 14 කට වශී කිරීම මෙහිදී සිදු කරනවා. එම කසිණ 8 මෙන්ම සමවත් 8 අනුලෝම, ප්‍රතිලෝම, එකක් හැර එකක් ආදී වශයෙන් එම 14 ආකාරයට හුරු වෙනවා. කසිණය, ධ්‍යානය, ධ්‍යානාංග ආදිය මෙම 14 ආකාරය තුළ හසුරුවනවා.

8. 3. [illegible] සහ උඩ කසිණුක්කන්තික පාඨම [illegible] කෙරෙමි. (කසිණුක්කන්තික [illegible] ලෙස උපදෙස් ලැබිණ. [illegible] කසිණයෙහි 1-3-5-7. ද 2-4-6-8. පිළිවෙළට, නැවත ඉතිරි කසිණයන්ගෙන් [illegible].) [illegible] කසිණ [illegible] කසිණුක්කන්තික [illegible] කෙරෙමි.


9. දා ඣානුක්කන්තික පාඩම් නිම කෙළෙමි. (ඣාන කසිණුක්කන්තික පාඩමට අවසර ලැබිණ, පඨවි කසිණයෙන් 1. තේජෝ 3. නීල 5. ලෝහිත 7. නැවත ආපෝ 2 වායෝ 4, පීත 6. ඕදාත 8. නැවත පඨවි 2. තේජෝ 4. නීල 6. ලෝහිත 8. නැවත ආපෝ 1. වායෝ 3. පීත 5. ඕදාත 7. වශයෙනි.) අද සවස මේ පාඩම සම්පූර්ණ කෙළෙමි. අද දින ඉතිපි සෝ ගාථා පාඨයෙන් 591. වෙනි ලක්ෂවාරයද සම්පූර්ණ විය. දින 8. යි.

8. ද අලුයම හා උදේ කසිණුක්කන්තික පාඩම සම්පූර්ණ කෙළෙමි. (ඣානුක්කන්තික වඩන ලෙස උපදෙස් ලැබිණ. පඨවි කසිණයෙහි 1 - 3 - 5 -7 , 2 - 4 - 6 - 8 පිළිවෙළට, නැවත ඉතිරි කසිණයන්ගෙන්ද එසේම ය.) අද සවස කසිණ සතරකින් ඣානුක්කන්තික සම්පූර්ණ කෙළෙමි. (පිළිවෙළට නැතිව එකින් එක මගහැර ධ්‍යානයන්ට සමවැදීම මෙහිදී සිදුකරයි.)

9.ද ඣානුක්කන්තික පාඩම් නිම කෙළෙමි. (ඣානකසිණුක්කන්තික පාඩමට අවසර ලැබිණ. පඨවි කසිණයෙන් 1, තේජෝ 3, නීල 5, ලෝහිත 7. නැවත ආපෝ 2, වායෝ 4, පීත 6, ඕදාත 8. නැවත පඨවි 2, තේජෝ 4, නීල 6, ලෝහිත 8. නැවත ආපෝ 1, වායෝ 3, පීත 5, ඕදාත 7 වශයෙනි.) අද සවස මේ පාඩම සම්පූර්ණ කෙළෙමි. අද දින ඉතිපි සො ගාථා පාඨයෙන් 591 වැනි ලක්ෂවාරයද සම්පූර්ණ විය. දින 8 යි. (මෙහිදී පඨවි කසිණයෙන් පළමු ධ්‍යානය, නැවත තේජෝ කසිණයෙන් තුන්වන ධ්‍යානය ආදී ලෙස කසිණ හා ධ්‍යාන යන 2 ම එකක් හැර එකකට සමවැදීම සිදුකරයි.)

මෙමෙ දහතර ආකාර චිත්ත වශීභාවය තුළින් ඇතිකරගන්නා බලවත් චිත්ත සමාධි ශක්තියෙන් පඤ්ච

අභිඥාවන් උපදවා ගන්න හැකියාව තිබෙනවා. එම අභිඥා ලෞකික දේ වුවත් ඒවා ලෝකෝත්තර මාර්ගයට, නිවන් මගට, විදර්ශනාවට පාදක කර ගැනීමට යෝගියා බුද්ධිමත්ව කටයුතු කළ යුතු වෙනවා. පූජනීය අප මාහිමිපාණන් වහන්සේ ද මේ චුද්දස වශිය ප්‍රගුණ කළා. මාහිමිපාණන් වහන්සේගේ ඉතා දියුණු ලෙස වඩන ලද භාවනා මාර්ගය වෙනුවෙන් එම චුද්දස ආකාර චිත්ත පරිදමනය ද ඉවහල් වන්නට ඇත.

* * * * * *

ඉහත ආකාරයට පූජනීය නා උයනේ මාහිමිපාණන් වහන්සේ තම වටිනා ජීවිතය උතුම් ලෙස දහමට අනුගතව ගෙව්වා. සීල, සමාධි, ප්‍රඥා තුළින් පරියත්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ සාසන ධර්මයන් තුළින් තම ජීවිතය මනාව පෝෂණය කර ගත්තා.

එබඳු වටිනා ජීවිතයක් වූ නිසා ජාති - දේශ - ආගම් භේද වලින් තොරව මිනිසුන්ගෙන් මෙන්ම දෙව් - බඹ ආදීන්ගේ පවා වන්දනාවට පාත්‍ර වුණා. අපමණ පුද සත්කාර සැලකිලි ලැබුවා. පූජනීය මාහිමිපාණන් වහන්සේ අතහැර දමූ කයටත් අසිරිමත් පූජෝපහාර ලැබුණා. මල් වරුසා වැස්සා. සුවඳ මලින් මංජුසාව පිරුණා. සඳුන් දර වලින් දැවුනා. භෂ්මාවශේෂ දිනපතා වන්දනාවට පූජාවට පාත්‍ර වෙනවා. ඒ ශ්‍රී නාමයට ආරාම - චෛත්‍ය ගොඩ නැගුණා. පිළිරූ ඉදිවුණා.

මනුලොව ඉපදී මෙතරම් අසිරිමත් පුද සැලකිලි ලබන්න පුළුවන් වෙන්නේ එතරම්ම මහත් ගුණයෙන් යුතු උතුමෙකුටම විතරයි. ඒ ධර්මයේ තිබෙන උතුම් ශක්තියයි.

ධර්මයේ බල මහිමයයි. ඒ ධර්මානුකූල ජීවිතයක් බුදුමග තුළ අසිරිමත් ජීවිතයක් ගොඩනගා ගැනීමෙන් ලැබූ උතුම් ශක්තියයි. අපේ ජීවිත වලත් ගුණයන් ආරෝපණයට අනුකරණය, අනුගමනය, ආදර්ශය කර ගැනීමට වටිනා ජීවිතයක් ලෙස අප මාහිමිපාණන් වහන්සේගේ ජීවිතය සුවිශේෂ වෙනවා.

මනසක නිරවුල් බව, සමාහිත බව, සමාධි ධ්‍යාන ඇතිකර ගැනීම තරමක් අසීරු කාර්යයක් වුවත් ජීවිතයක සැබෑ වටිනාකම ඇතිකර ගන්න හැකි වන්නේ ඒ මානසික වෙනස තුළින්. පැවිදි ජීවිතයක් තුළ මෙය විශේෂයි. යම් භික්ෂුවක් පර්යාප්තියෙන් යුතු වේද, එය වටිනා ජීවිතයක්. ඒ සමග යම් භික්ෂුවක් තම පැවිදි ජීවිතයේ මූලික ගුණාංග ද ආරක්ෂා කරගන්නේ වේද, එය ඊටත් වඩා වටින ජීවිතයක්. යම් භික්ෂුවක් ඒ සමගම හොඳින් සීලයත් ආරක්ෂා කරගනී ද, යම් භික්ෂුවක් මෛත්‍රී චේතනාව දියුණු කරමින් සීලය ආදී ගුණ සුරක්ෂිත කරගනී ද, යම් භික්ෂුවක් සීලාදී ගුණයෙන්, මෛත්‍රියෙන් යුතු එකඟ වූ සිතක් ඇති කරගනී ද, යම් භික්ෂුවක් සමාධි - ධ්‍යාන උපදවා ගනී ද, යම් භික්ෂුවක් රූප - නාම - පටිච්ච සමුප්පාද ආදී ධර්ම තුළින් ජීවිතයේ සැබෑ අවබෝධය ඇතිකරගනී ද, විපස්සනා ඤාණ ඇතිකරගනී ද, සංඛාරුපෙක්ඛා ඤාණය දක්වා හෝ මාර්ග ඵල නිවන අවබෝධ කරගනී ද ඒ අතර වටිනාම ශක්තිය පවතින්නේ මේ සියල්ලෙන් පරිපූර්ණ වූ භික්ෂු ජීවිතයක් තුළයි. සීල - සමාධි - ප්‍රඥා, පර්යාප්ති - ප්‍රතිපත්ති - ප්‍රතිවේධ තුළින් ශක්තිමත් භික්ෂු ජීවිතය තුළ යි.

මෑත කාලයේ මනුලොව පහළ ව ඉතා පුණ්‍යවන්ත අයුරින් තම බෝසත් ජීවිතය සීලයෙන් පරිපූර්ණ ව ඇතුළත පිටත සර්වාකාරයෙන් පිරිසිදු වූ සකක් මෙන් සීල ප්‍රතිපත්තියෙන් බැබළෙමින් ද මනාව පුරුදු පුහුණු කළ නැවත නැවත වශී කරන ලද සමාධි සමාපත්ති හේතුවෙන් සුපිරිසිදු සන්තානයෙන් යුතු වූ බලවත් සමාධියෙන් යුතු වූ ද පර්යාප්ති ධර්ම ආදියෙන් සුතමය, චින්තාමය, භාවනාමය වූ ප්‍රබල ඥානයෙන් යුතු ව වැඩුණා වූ මහත් ප්‍රඥා සම්පත්තියෙන් ද යුතු ව දෙවියන් බඹුන්ගෙන් පවා තම සීල - සමාධි - ප්‍රඥා තේජස හේතුවෙන් ලබන ලද අභිවන්දනාවෙන් යුතු වූ උතුම් සම්බුද්ධාංකුර වූ සුපූජනීය අපගේ ආචාර්යෝත්තම නා උයනේ ශ්‍රී අරියධම්මාභිධාන මාහිමිපාණන් වහන්සේ මෙබඳු වූ පතළ ගුණ සමුදයකින් පිරි මහෝතුමන් වහන්සේ නමකි. ඒ උතුම් ජීවිතයේ පිරි ගුණ සමුදය ශක්ති ප්‍රවාහය සපුරා පවසන්නට අපි අසමර්ථ වුවත් මේ සටහන් පෙළ ලෝකයාගේ හස්තයට දයාද කිරීමට මෙවන් කෙටි විස්තරයක් සමග ඉදිරිපත් කර ඇත. අප හට ලද ස්වල්ප වූ තොරතුරු අනුව ඒ බුද්ධාංකුර වූ අප මාහිමිපාණන් වහන්සේගේ පාරමී ධර්ම පූරණයත් සමගින් සිදුවන අසිරිමත් සම්බුද්ධත්වය පිළිබඳ වූ පහත "අනාගත වංශය" සටහන ද තබන්නේ ලෝදනන් සැදෑ සිත් වැඩී දම් මගට වඩාත් සිත් නතු වීමටත්, ඒ උතුම් සර්වඥරාජෝත්තමයන් වහන්සේට උතුම් පූජෝපහාරයක් ම වේවා! යන ගෞරව සම්ප්‍රයුක්ත ප්‍රාර්ථනාව පෙරදැරිවත් ය.




# අනාගත වංශය

සකල ලෝක සත්වයා කෙරෙහි පතළ මහා කරුණාවෙන් යුතුව තමන් ලද මෝක්ෂ සැපත සත වෙත කැප කොට සෝළසාසංඛ්‍යාදී කල්ප ලක්ෂ ගණන් පාරමී පුරමින් තව බොහෝ දුර ගමනක් යා යුතු ඝෝර - කටුක - රුදුරු සසර ගමන ගැන නොතකා සත්වයා කෙරෙහි ඇතිකරගත් මහත් කරුණාවෙන් "කෙදිනක හෝ මමත් ලොව්තුරු සම්බුද්ධත්වයට පත්වෙමි" යි යන වීර - වික්‍රම් - තේජ - බලැති උත්තම අදිටන ඇතිව ලොව දුර්ලභව පහළ වන බුද්ධාංකුර බෝධිසත්ව උත්තමයන් වහන්සේලා සැමද ආශ්චර්යමත් උත්තමයෝ ය. එවන් උතුමන් වහන්සේලා කෙරෙහි පැහැද ඒ ගුණයට නතුව ආශ්‍රය - නිශ්‍රය - භජනය - පයිරුපාසනය කරන්නට ලැබීම මහත් වූ අර්ථයක් සලසා දෙනවා. ඒ උත්තමයන් වහන්සේලා අතර මෙකල පහළව වැඩ සිටි අපගේ ආචාර්යෝත්තම නා උයනේ ශ්‍රී අරියධම්මාභිධාන මාහිමිපාණන් වහන්සේ ද එබඳු වූ ලෝසතට අපමණ යහපත සිදුකරන බුද්ධාංකුරයාණන් වහන්සේ නමක් වෙනවා.

අපි ඒ උත්තමයන් වහන්සේ දැක ගත්තා. වන්දනා කළා. ධර්මය ඇසුවා. කල්‍යාණ මිත්‍රත්වයෙන් ආශ්‍රය කළා. සේවනය කළා. ඒත් විටෙක ඒ සැබෑ ගුණ කඳ දැනගෙන නොවෙයි. ඒත් අපි මහත් ධර්ම ලාභයක් ධර්මාර්ථයක් ලැබුවා. ඒ අපි දුටු ගුණයන් නිසා කරන ලද ධර්ම ආශ්‍රය තුළින් ය. අද අපිට ඒ උතුම් ගුණ කඳ කෙතරම්ද කියලා තවත් තරමක් හෝ දුරට අවබෝධ කරගන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ ගැන මේ කෙටි විස්තරය ද කෙරෙනවා.

## නියත විවරණ ලැබීම

අපගේ මාහිමිපාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය පිණිස බුද්ධකාරක ධර්මයන් සම්පූර්ණ කරමින් ඉතා ඈත අතීතයෙහි සිට පැමිණෙන බව අපගේ හැඟීමයි. සමහර විට දීපංකර බුදුරජාණන් වහන්සේටත් පෙර සිටම එසේ නියත විවරණ ලබමින් ම එනවා වෙන්න පුළුවන්. මාහිමිපාණන් වහන්සේ අතීත භව පරිග්‍රහ කර බැලීම සාර්ථකව ධර්ම මාර්ගයට අනුව සිදු කළා. ඒ කරුණු පෙර දැක්වූවා. එහි දීපංකර බුදුරජාණන් වහන්සේගේ කාලයේ පටන් නියතව එන ගමනක් ලෙස දැඩිව භාවනා ක්ෂණයට අරමුණු වූ බව ප්‍රකාශ කර තිබෙනවා. ඒ අනුව මෙම අසිරිමත් වූ බුදුමග පියසටහන් පෙළෙහි ඇරඹුම එතරම් දිගු කලකට දිව යනවා.



දීපංකර බුදු සසුනේ සිට නියතව ආ ගමනක් ගැන තදින් අරමුණු විය. ඒ අවස්ථාවේ අනිත්‍ය අරමුණු වෙමින් ආශ්වාස ප්‍රශ්වාස නැවතී සෑහෙන වේලාවක් දැඩි සමාධියට පත්වීමි.

*මාහිමිපාණන් වහන්සේගේ ම එම අදහසට අනුව නියත විවරණ ශ්‍රී ලබා ගනිමින්ද නියත වූ බෝසතාණන් වහන්සේ නමක් ලෙස උතුම් පාරමී ධර්ම පූරණය කරමින් පැමිණෙන අසිරිමත් බුදුමග ගමන ඇරඹී ඇත්තේ උතුම් දීපංකර බුදුරජාණන් වහන්සේ සම්මුඛ වීමත් සමගය.*

## *අතීත භව පෙළ*

*අතීතයෙහි සිට පාරමී පුරමින් ආ ගමන පිළිබඳව සැලකීමේදී සියලු බෝසතාණන් වහන්සේලා නියත විවරණ ශ්‍රී ලැබීමත් සමගින් එම අධිෂ්ඨානයට අනුකූලව අඛණ්ඩ ගමනක යෙදී සිටිනවා. ඒ අනුව අප මාහිමිපාණන් වහන්සේ ද විවිධ වූ ආත්ම භාව පරිහරණයෙන් පාරමී සපිරීම සිදු කරමින් එනවා. ඒ අතර ලබන සෑම ආත්ම භාවයක්ම දිව්‍ය - මනුෂ්‍ය ආදී සුඛිත ආත්ම වන්නේ යැයි නියතයක් නැතත් එවන් ආත්මද ලබමින් බොහෝ සේ පාරමී පුරා ගැනීම සිදු කරනවා.*

*මාහිමිපාණන් වහන්සේ අතීත භව පෙළ පරිග්‍රහ කිරීමේදී කාශ්‍යප බුද්ධ ශාසනය තෙක් අතීත භව පෙළ පරිග්‍රහ කිරීම පිරික්සීම සිදු කළා.*

### ☸ *අතීත පළමු ආත්මය*

*ඒ අනුව අතීත පළමු ආත්ම භාවය හෙවත් මීට පෙර අත්භවය දිව්‍යාත්ම භාවයක් වෙනවා. ඒ ස්වර්ණමාලි චෛත්‍යරාජයාණන් වහන්සේගේ ආරක්ෂක දේවතාවෙකු වශයෙනි. නම "මෛත්‍රී" ලෙස*

මාහිමිපාණන් වහන්සේට අරමුණු වී ඇත. මෙසේ ගිය අත් බැව දිව්‍ය රාජයකුව එසේ පාරමී ධර්ම පූර්ණය සිදු කර තිබෙනවා.

මේ ආත්ම භාවය ලැබීම පිළිබඳව මාහිමිපාණන් වහන්සේගේ පියතුමාට රුවන්මැලි සෑ මලුවේදී ලැබුණු පිංබර කුමාර උපත පිළිබඳ දෙවියකුගේ පණිවිඩය ඊට සම්බන්ධකම් පවතිනවා. ඒ අනුව ගිය ආත්ම භාවය දිව්‍ය රාජයෙකු වශයෙන් ගත කර තිබෙනවා.

### ☸ අතීත දෙවන ආත්ම භාවය

මේ ආත්ම භාවයට පෙර අතීතයෙහි වූ දෙවන ආත්ම භාවය බ්‍රහ්ම රාජයෙකු වශයෙන් බ්‍රහ්ම තලයෙහි ගත කර ඇත.

### ☸ අතීත තුන් වන ආත්ම භාවය


මින් පෙර වූ තුන්වන ආත්ම භාවය ඍෂි ආත්ම භාවයකි. එම ඍෂි (තාපස) ආත්ම භාවය පිළිබඳව මාහිමිපාණන් වහන්සේ දක්වා ඇති කරුණු වලට අනුව ඒ වනගත තවුස් දිවිය ගතකර ඇත්තේ "දඹදිව"ය. "රාජ ඍෂිවරයෙක්" වශයෙන් එසේ තවුස් ජීවිතය ගතකර ඇත. පෙළපත හැටියට "මඛාදේව" පෙළපතට අයත් බව මාහිමිපාණන් වහන්සේ සටහන් කර තිබෙනවා.

ගෞතම සර්වඥරාජයාණන් වහන්සේ බෝසත් කිස පුරණා අතර පළමු මහා සම්මත රජුව පහළව අසංඛෙය්‍යක් ආයුෂ ඇති කළ ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් ධ්‍යාන වඩා බඹ ලොව ගියේය. එම පෙළපත ක්‍රමයෙන් ගොස් වර්ණයෙන් - ආයුෂයෙන් පිරිහුණු යුගයේ "සගර" රජු පුත් "මඛාදේව" රජු "මියුලු" නුවරෙහි රාජ්‍යයට පත් විය. එකල අවුරුදු 3,36,000 ක් පමණ ආයුෂ විය. ඒ මඛාදේව රජු වසර 2,52,000 ක් රාජ්‍ය කළ කල්හි පළමු නර


කෙස පැහළ විය. පසුව මහණව 84,000 ක් අවුරුදු තපස් රැක බ්‍රහ්ම ලෝකයෙහි උපන්නේය. එතැන් පටන් එම රාජ වංශය "මඛාදේව" රාජ වංශය විය.

එම මඛාදේව වංශයෙහි 84,000 ක් රජවරු පළමු රජ සේම පැසුණු කෙස් දුටු කළ රාජ්‍ය හැර ගොස් මහණ වී බඹ ලොව ඉපදුණා. අවුරුදු 3,36,000 ක් බැගින් ඒ සියලු රජවරු ආයුෂ වැළඳුවා. මේ මඛාදේව වංශය පිළිබඳ එන විස්තරයයි.

මාහිමිපාණන් වහන්සේගේ ඒ පිළිබඳ සටහන පහත දැක්වෙනවා.



12.45. පර්යංකය. මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා සමාපත්ති සියල්ලට අනතුරුව නාම රූප අනුව පටිසන්ධියන් පූර්ව භවයෙහි දේවත්වයත් ඉන් පෙර බ්‍රහ්මත්වයත් ඊටත් පෙර දඹදිව වනගත තවුස් ජීවිතයත් අරමුණු කෙළෙමි.



7.00. පර්යංකය. ආනාපාන ධ්‍යාන සතරට පසු පූර්ව භව තුනක් බැලීමි. දේව - බ්‍රහ්ම - මඛාදේව පෙළේ රාජ ඍෂි, සිව්බඹ විහරණ අනිච්ච සඤ්ඤා වැඩූ බව.

රාජ ඍෂි යනු රජකම හැරදමා තවුස් ජීවිතයට එක් වූ තාපසයන් බව දැක්වෙනවා. මඛාදේව පෙළපතද මේ භද්‍ර කල්පයෙහි මහා සම්මත පෙළපතින් පසු ඇති වූ දෙවැනි රජ පෙළපතයි. ඒ අනුව මාහිමිපාණන් වහන්සේ සටහන් කර ඇති එම මඛාදේව පෙළපතේ තාපස ආත්මය මෙම පෙළපත වන්නේ නම් එම මඛාදේව රාජ්‍ය පෙළපතේ රාජ්‍යව සිට රජකම හැරදමා පැවිදිව තපස් රකිමින් භාවනා වඩමින් සිට ඇත. එම ආත්මයේදී ද සිව්බඹ විහරණ හා අනිත්‍ය භාවනාව දියුණු කර තිබෙනවා.

## ☸ අතීත හතර වන ආත්ම භාවය

තපස් ජීවිතයට පෙර වූ අතීත හතරවන ආත්ම භාවය ද දේවත්වය ලබා තිබෙනවා.

## ☸ කාශ්‍යප සර්වඥ ශාසනයේදී

එමෙන් අතීතයෙහි කාශ්‍යප සම්බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි පැවිදි ජීවිතයක් ගතකොට ඇත. ඒ ජීවිතයේදී ත්‍රිපිටක ධර්මය හදාරා ඇත. ධ්‍යාන භාවනාවන්ද වඩා සංඛාරුපෙක්ඛා ඤාණය දක්වා විදර්ශනාවද පුගුණ කර තිබෙනවා.

මේ ආසන්න ආත්ම භාව 4 ක් සහ කාශ්‍යප සර්වඥ සාසනය තුළ වූ ජීවිත පිළිබඳවයි. ඒ සියලු ජීවිත ඉතාමත් පුණ්‍යවන්ත - වාසනාවන්ත අයුරින් පාරමී මුදුන්පත් කරගනිමින් වාසය කර ඇති අයුරු පැහැදිලි වෙනවා. මේ ගමන තුළින් මේ වන විට පාරමී ධර්ම බොහෝ සේ සම්පූර්ණ කර ඇතැයිද යනු අපගේ හැඟීම වෙනවා. මාහිමිපාණන් වහන්සේ එතරම් භාග්‍යවන්ත ලෙස මේ අත්බවයන් සපුරා තිබෙනවා.







## අපිට සම්මුඛ වූ බෝසත් දිවිය

මෙලෙස පාරමී මුදුන්පත් කරමින් එන අසිරිමත් ගමන තුළදී අප හට ඒ උතුම් බෝසතාණන් වහන්සේ සම්මුඛ වූයේ උතුම් ප්‍රව්‍රජ්‍යා ජීවිතයක් ලෙසයි. ඒ නා උයනේ ඉපදී කුඩාම අවදිය පටන් බුදුමග නිරතව තුරුණු විය ප්‍රව්‍රජ්‍යාවට පත්ව ත්‍රිපිටකධාරීව, සීල, සමාධි, ප්‍රඥා ධර්ම මග හසළ ලෙස වඩා ගත්තා වූ ද පර්යාප්ති, ප්‍රතිපත්ති මගේ ඉතා සුවිශේෂීව ගමන් කළ බුද්ධ පුත්‍රයන් වහන්සේ නමක් ලෙසින් මෙන්ම භාවනා ඤාණය විදසුනෙහි සංඛාරුපෙක්ඛා ඤාණය තෙක් දියුණු - පමුණු කරගත් උත්තමයන් වහන්සේ නමක් ලෙසින් ය.

## වත්මන් අත්භවය (මහා බ්‍රහ්ම තලය)

මාහිමිපාණන් වහන්සේ එදා ඊළඟ අත්භවය සේ සටහන් කර තිබූ ආකාරයට අනුව අද වැඩ සිටින්නේ මහා බ්‍රහ්ම තලයෙහි ය. ඕදත කසිණ ප්‍රථම ධ්‍යානයෙන් මේ මහා බ්‍රහ්මතලය වෙත ගමන් කර ඇත. ඒ එදා නා උයනේ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ලෙසින් වැඩ සිට ප්‍රගුණ කළ වැඩූ ධර්ම ශක්තියේ භාවනා මාර්ගයේ ප්‍රතිඵල හේතුවෙන් ය. එනිසා වත්මන් අත්භවය මේ වන විට මහා බ්‍රහ්ම රාජයකු වශයෙන් වැඩ සිටිනවා ඇත.

## මෙත් බුදු සසුනේ

"යදහි ලෝකෙ මෙත්තෙයො - සම්බුජ්ඣිස්සති තං තදා
සක්කරිත්වා පූජයිත්වා - සසද්ධම්මං සසාවකං"

"මතු බුදු වන මෛත්‍රී බුද්ධ සාසන කාලයේදී මනුලොව කේතුමතී රාජධානියෙහි ඉපිදී ප්‍රථම වයසේදී බුදු සසුනට උදර ලෙස සිව්පසයෙන්

සංග්‍රහ කොට පැවිදි උපසම්පදාව ලබා ත්‍රිපිටකධාරීව පඤ්ච අභිඥා අෂ්ට සමාපත්ති ලාභීව මතු බුදු වන බවට නියත විවරණ ලබා ගැනීමට වාසනා වේවා!..." යනුවෙන් ප්‍රාර්ථනා කර තිබෙනවා.

එසේම මෛත්‍රී සර්වඥ සාසනය තුළදීත් මාහිමිපාණන් වහන්සේ මනු ලොව උපත ලැබීමේ වාසනාව ලබන බවත්, ප්‍රව්‍රජ්‍යාවට පත්ව ත්‍රිපිටකධාරීව, සංඛාරුපෙක්ඛා ඤාණය දක්වා සසුන් ගුණ දම් සපුරණ අයුරුත් මාහිමිපාණන් වහන්සේ ම අනාගත භවයන් පරිග්‍රහ කරන විට මනාව පසක් කරගෙනයි තිබෙන්නේ.

මෛත්‍රී සාගරයක් බඳු වූ ඒ උතුම් මෛත්‍රී සර්වඥයන් වහන්සේගේ පිරිනිවීමෙන් පසුව ඒ සම්බුදු සසුන ද පැවත ධර්මානුරූපව විනාශ වී යනවා. ඒ මේ මහා භද්‍ර කල්පයෙහි පහළ වූ අවසාන වූ පස්වන ලෝකනාථයන් වහන්සේ ලෙසින් ය. ඒ වන විට පාරමී ගුණ බහුල වූ බොහෝ සතුන් නිවන් පුර අමා සැපතින් සැනසී අවසන් ය.

අප මාහිමිපාණන් වහන්සේ ද එම බුදු සසුනේ ඉහත පරිදි ප්‍රව්‍රජ්‍යා දිවිය නිමවා සම්බුද්ධත්වය තෙක් ඉතිරි කාලයත් පාරමී දිවිය තුළ ගත කරාවි.

## ආත්ම භාව 1800 ක්

පූජනීය අප මාහිමිපාණන් වහන්සේ "ඉතිපි සෝ" ගාථා පාඨයෙන් 40 වැනි ලක්ෂ වාරය සම්පූර්ණ කළ දින අලුයම සිහිනයක් දැක ඇත. සුදු වතින් සැරසී ගත් බ්‍රහ්ම රාජයෙකු මාහිමිපාණන් වහන්සේ වෙත පැමිණ "ස්වාමීනි! ස්වාමීන් වහන්සේගේ ප්‍රාර්ථනාව ඉෂ්ට සිද්ධ වන කාලය ස්වාමීන් වහන්සේ දන්නවාද?" යි විමසා ඇත. එවිට අප මාහිමිපාණන් වහන්සේ මා

එය දන්නේ නැත" යි කීවිට "1800" යන ගණන කියා බ්‍රහ්ම රාජයා අතුරුදන්ව තිබෙනවා.

ඒ වගේම අප මාහිමිපාණන් වහන්සේ භාවනා වඩන අතරතුර අනාගත භව පරම්පරාව බැලීමේදී මතු ආත්ම භාව 1800 ක් නිමවීමෙන් නාම රූප භව ගමනේ නිමාව සිදුවන අයුරු දැක තිබෙනවා. "....මතු 1800 ක් ආත්ම භාව කෙළවර බුදුබවට පැමිණීමත් අරමුණු විය." යනුවෙන් එය දැක්වෙනවා.

මෙම කරුණු වලට අනුව අපගේ මාහිමිපාණන් වහන්සේට තවත් ආත්ම භාව 1800 ක අනාගත භව ගමනක් තිබෙනවා. මේ කාලයද අප මාහිමිපාණන් වහන්සේ  පසු කර යා යුතු වෙනවා. මෙසේ සුදුසු කාලය උදාවන තෙක් තවත් ආත්ම භාව 1800 ක් ඉදිරියට පාරමී ගමන තුළ යෙදේවි. මේ කාලය සම්බුද්ධත්වය වෙනුවෙන් පාරමී ධර්ම සපුරණ බෝසත් උතුමන් හට සුළු කාලයක් යැයි සිතෙනවා.

## පිංබර එක්තරා කල්පයක

එසේ කාලය ගෙවී ගොස් කල්ප විනාශයක් සිදුවී නැවත අපගේ මාහිමිපාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වන පිංබර කල්පය උදාවේවි. ඒ කාලයේදී පෙර බෝසත්වරු සේ අප මාහිමිපාණන් වහන්සේ ද උතුම් බෝසත් පෙළපතේ පහළ වේවි.

## තුසිත දෙව්ලොව

සියලු බුද්ධකාරක ධර්ම සම්පූර්ණ කොට නිමවා තුසිත දිව්‍ය ලෝකයෙහි පහළව සුදුසු කල තෙක් වැඩ සිටීවි.

# බුද්ධ කෝලාහලය

බුද්ධත්වයට 1000 ක් අවුරුදු තිබියදී ශුද්ධාවාස බ්‍රහ්මයෙකු විසින් තව අවුරුදු දහසකින් උතුම් බුදුවරයෙකු පහළ වන්නේ යැයි දසදහසක් සක්වළට දැනුම් දේවි. එමගින් බුද්ධ කෝලාහලයක් ද ඇති වේවි.


## ආරාධනාව

බුද්ධ කෝලාහලයෙන් පසු දසදහසක් සක්වළ දිව්‍ය - බ්‍රහ්ම සේනාව පිරිවරාවිත් සම්මා සම්බුද්ධත්වය පිණිස ආරාධනා කරාවි.

## පංච මහා විලෝකනයන්

ඒ අනුව සම්මා සම්බුද්ධත්වය පිණිස පුණ්‍යවන්ත කාලයන් - දීපයන් - දේශයන් - කුලයන් - මවත් (ආයුෂත්) විලෝකනය කරාවි.

## මනෝමය ලෙස බුදුබව ලබා


ශ්‍රද්ධාවෙන් බණ අසමින්ම සිටිද්දී මගේ සිත
සමාධිය ධ්‍යානයෙන් අමුතුම තත්වයකට පත්වී
එම බණ මඩුවේ විශාල ඇරුණු දොර කවුළුවට
විටදී නැගෙනහිර දිශා බලා බණ වඳින
සෝභමාන බුද්ධ ප්‍රත්‍යක්ෂවක් බවට මා
පත්වී සිටින ආකාරය ඉතාමත් පැහැදිලිව
සිතට පෙනී ගියේ අසිරිමත් ලෙසිනි.
ජීවිතයේ අවසාන ගමන මේ සිද්ධිය
මගේ නිවන් ගමනට මග පෑදමක් යයි සිතමි.

යනුවෙන් මාහිමිපාණන් වහන්සේ සටහන් කර ඇති පරිදි කුඩා අවදියේ තමන් වහන්සේ බුදු බවට පත්ව වැඩ සිටිමින් ධර්ම දේශනා කරන බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් ලෙසින් දැක තිබෙනවා. එතරම් කුඩා අවදියක එලෙස සිත් පහළ වීම මතු සැබෑ ලෙසම ලබන ඒ උත්තම පදවිය වෙනුවෙන් කුඩා අවදියේ සිටම සිත් පහළ කරවා ඒ සඳහා උනන්දු කරවීමක් පිණිස සසර පුණ්‍ය ශක්තියෙන් සිදුවූවක් සේ හැගෙනවා.

## භාවනාමය ඥාණයෙන්

"...සම්බුද්ධත්වයට පැමිණ අවිද්‍යාදීන්ගේ නිරෝධයට පත්වන සැටි පෙනී බලවත් චිත්ත සමාධියක් ඇතිවිය."

යනුවෙන් දක්වා ඇති ආකාරයට පූජනීය මාහිමිපාණන් වහන්සේ භාවනා වඩන අතරතුරදී අනාගතයට සිත මෙහෙයවා නාම රූප නිරෝධය, නිර්වාණ අවබෝධය වන අයුරු බලා ඇත. එහිදී සර්වඥතා ඥානය ප්‍රතිවේධ කරගැනීම තුළින් එම නාම රූප නිරෝධය සිදුවී තිබෙනවා. භාවනා ඥාණය තුළිනුත් මාහිමිපාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය අවබෝධ කරගන්නා ආකාරය දෙවනුව ද මනෝමය ලෙස එසේ දැක ගත්තා.

## සම්මා සම්බුදුබව අවබෝධ කිරීම

මනෝමය වශයෙන් සර්වඥතාඥාන ප්‍රතිවේධය කරන ආකාරය එලෙස දැකගත් මාහිමිපාණන් වහන්සේ මතු අනාගතයේ පංච මහා විලෝකනයෙන් අනතුරුව අවුරුදු ලක්ෂයක් ආයු ඇති කල ලොව පහළව සම්පූර්ණ කරන ලද සමත්‍රිංශත් පාරමී ධර්ම හේතුවෙන් බෝධිද්‍රැම රාජයා කරා එළඹ චතුරංග සමන්නාගත වීර්ය උපදවා උතුම් වජ්‍රාසනාරූඪ වූ ඒ උතුම් දිනයෙහි ප්‍රථම යාමයෙහි පුබ්බේනිවාසානුස්සති ඥාණය ද මධ්‍යම

යාමයෙහි දිව්‍යචක්ෂුරභිඥාණය සුව සේ ප්‍රතිවේධ කොට පශ්චිම යාමයෙහි ද්වාදශාංග ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සම්මර්ශනය කරමින් අරුණෝද්ගමනය සමග දස දහසක් සක්වළ අනේක ශ්‍රී විභූතීන්ගෙන් සමලංකෘත කොට දශබල චතුර්වෛශාරද්‍යාදී සියලු ගුණ සමූහයෙන් ප්‍රතිමණ්ඩිත සර්වඥතා ඥානය ප්‍රතිවේධ කරමින් මතු අනාගතයේ ලොව්තුරා සම්මා සම්බුදු වන සේක.

මෙසේ ප්‍රාර්ථනා මස්තකප්‍රාප්ත කොට සම්මා සම්බුද්ධත්වයට පත්ව "අනේක ජාති සංසාරං..." යනාදී උදානයන් පවත්වා කෙළලක්ෂ ගණන් සමාපත්තීන්ට සමවදිමින් බෝමැඩ සමීපයෙහිම සත් සති යවා සම්බුදු කිසෙන් ලෝකයා වෙත පරම වූ මෙත් සිතින් අනුග්‍රහ සිදු කරන්නාහ.

## වසර 80,000 ක් පමණ

එකල පරමායුෂ අවුරුදු ලක්ෂයක් බැවින් අවුරුදු 80,000 ක් පමණ කාලයක් වැඩ සිටිමින් අසංඛ්‍ය ගණන් ලෝවැසි සත්වයන් හට සුගන්ධිත මුඛ පද්මයෙන් අෂ්ටාංග සමන්වාගත බ්‍රහ්ම ස්වරයෙන් ශ්‍රී සද්ධර්මය දේශනාකර උතුම් ධර්මාවබෝධය කරවමින් පරම වූ අසහාය ධර්ම සේවාවෙන් ලෝසතුන් වැඩ සදන්නාහ.

## තවත් සම්බුදු කිසක් නිමාකර

ඈත සසර පටන් නානාවිධ ප්‍රාර්ථනාවෙන් යුතුව තමන් වහන්සේ හා පාරමී පුරමින් පැමිණි ඒ මහත් බුදු පිරිසටත් සසර දුකෙහිම ගැලී සිටි අසංඛ්‍ය ගණන් නොයෙක් සත්නටත් ත්‍රිවර්ග සැප සාදා දෙවූ තවත් සම්බුදු කිසක් නිමවා ආයු ශ්‍රී වින්දනය කෙළවර ලෝක ධාතු කම්පා කරවමින්, සංවේග උත්පාදනය කරවමින් ඒ උත්තම සර්වඥරාජෝත්තමයන් වහන්සේ ද අනුපාදිසේස පරිනිර්වාණයෙන් පිරිනිවන් පා වදාරන්නාහු වෙති.

ස්වර්ණ කඳක් පරදන සෝභමාන සම්බුදු රුව ආදාහනයෙන් පසු ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා ද වන්දිතව පූජිතව ලෝ සතුන් හට අනේක විධ වූ කුසලින් ත්‍රිවර්ග සැප සාදලනු පිණිස සර්වඥ අදිටන පරිදි වැඩහිඳ ශ්‍රී ධාතූන් ද පරිනිර්වාණයට පත්වන්නාහ. එපමණකින් ඒ අසහාය, නිර්මල ආත්මාර්ථ පරාර්ථ වූ ධර්ම සේවය නිමාවට පත්වන්නේ ය.

## තුන් කලම ධර්මතා

අනන්ත වූ අතීත සසර ගමනක අවුදින් විවරණ ශ්‍රී ලැබ බුද්ධාංකුර පාරමී ගමනක පැමිණියා වූ ද අපගේ ආචාර්යෝත්තම මාහිමිපාණන් වහන්සේ නම් බෝසත් දිවිය ලෙසින් ද මතු අනාගත බෝසත් පාරමී ගමන නිමවා සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ නමක් ලෙසින් වූ ධර්මතාවෝ සියල්ල ධර්මතා ලෙසින් කාලයට මුසුවීම වූ අයුරු ය. එහෙත් ධර්මතාවෝ එකම ය.

## ධර්මතාව මාහිමිපාණන්ම පෙන්වා දුන් අයුරු

මෙබඳු වූ බෝසතාණන් වහන්සේලා ද පාරමී සපුරා සම්මා සම්බුද්ධත්වය, උතුම් බුදු කිස ආදී සියලු දේ සත්‍ය දහමට අනුගත වන අයුරු මාහිමිපාණන් වහන්සේ ම පෙන්වා දුන්හ.

"...මෙසේ වැඩ සිටිය ශාන්ති නායකයන් වහන්සේ දස දහසක් සක්වළ ඒකාලෝක වෙමින් දැල්වුණු පහනක් නිවී යන්නාක් මෙන් පිරිනිවෙනවා. රහතන් වහන්සේලාද, ආයුසංස්කාර නිමවී පිරිනිවෙනවා. ආයප්‍රියන් වහන්සේලාද ස්වර්ගස්ථ වෙනවා. සෙසු පෘථග්ජන ජනතාව කර්මානුකූලව පරලොව යනවා. වැඩ සිටි රාජධානිය ද, උයන් පොකුණු ද සියල්ල නෂ්ටාවශේෂ වෙනවා. මේ වගේ ඉර, හඳ, තාරකා, මහ පෘථිවි, මහාමේරු පර්වත, මහා සාගර යන විශාල වස්තු ද, ගෙවල් දොරවල්, යාන

වාහන, ඇඳුම් පැලඳුම්, මිල මුදල්, ඉඩ කඩම් යන පාරිභෝගික වස්තු ද කෑමෙන් බීමෙන් ඇඳීමෙන් පැලඳීමෙන්, බතින් බුලතින් පරිහරණය කරන මේ ආත්ම භාව සියල්ලත්, හිත ඇති, හිත නැති සෑම සංස්කාර ධර්මත් ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිවෙනවා. නැතිවෙනවා. අනිත්‍යයි. ඇතිවීමෙන් නැතිවීමෙන් පෙළෙන බැවින් දුකයි. කැමති කැමති සෙයින් නොපවත්නා බැවින් අනාත්මයි. ත්‍රිලක්ෂණයට අයත් සියලු සංස්කාර ධර්ම දුක්ඛ සත්‍යයි. දුකට හේතුව වන පූර්ව භව තෘෂ්ණාව දුක්ඛ සමුදය සත්‍යයි. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව නිරෝධ සත්‍යයි. නිරෝධ සත්‍යය අවබෝධ කරගැනීමට භාවනා වශයෙන් වැඩිය යුතු ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපද ආර්‍ය්‍ය සත්‍යය වෙනවා. අනන්ත අපරිමාණ බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා දීර්ඝ කාලයක් පිරූ දාන ආදී පාරමිතා බලයෙන් මේ ආර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරගෙන අජරාමර නිවන් පුරයට පැමිණියා. සසර දුක තරණය කළා වූ කෙලෙස් ගිනි නිවා හදවතින්ම ශාන්ත නිවන් සුව වැළඳූ සියලු බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලාට සිතින් කයින් වචනයෙන් සෑම කල්හිම ගෞරවාචාර නමස්කාරය වේවා!"

## ධර්මයම පමණි

කුමන අයුරින් වුවද අප මේ ස්පර්ශ කරන්නේ ධර්මයන් පමණි. සසර ගමනක සැරිසරන අප ඒ ධර්මතාවන් අවබෝධ කරගනිමින් ධර්මතා, ධර්මතා ලෙස දක්නට උත්සුක වීමයි අවශ්‍ය වන්නේ. අප ආචාර්යෝත්තම මාහිමිපාණන් වහන්සේ ඒ මග මනාව අනුගමනය කළ ආකාරය අප කාටත් පැහැදිලියි.

මාහිමිපාණන් වහන්සේගේ දිවිය ඉගෙනීමෙන්, හැකියාවන්ගෙන්, දේශනයෙන්, ලේඛනයෙන්, වියත්-විශාරද බවින්, උගත්කමින්, බුද්ධිමත් බවින්,

සංවර බවින්, කීකරු බවින්, ඇහුම්කන් දීමෙන්, සීලයෙන්, සමාධියෙන්, ධාරණ ශක්තියෙන්, මහත් ලැබීම් තුළින්, සැලකිලි සත්කාර සම්මානයෙන්, කීර්ති, ප්‍රශංසා, තනතුරු - උපාධි - සම්මාන, දෙස්, අපහාස, වපසන, උවදුරු රෝගාබාධ ආදී වූ කී නොකී බොහෝ දෑ ලැබුවා. ඒ මාහිමිපාණන් වහන්සේ ලැබුවේ ධර්මතාවන් ය. ඒ සියල්ල ධර්මතා ලෙස අත්දැකීමට ඒ මනස හුරුව තිබුණා. සෑම දේ තුළ දහමට අනුව සැනසුම අත්වින්ද, ලෝකයා වෙතද දහමින් සැනසෙන මග කියා දුන්නා. එහි යෙදවූවා. ඒ මග කියාදීමට, එහි යෙදවීමට මහත් සේ කැපවුණා.

## ධර්මයම පිහිටයි

මාහිමිපාණන් වහන්සේට සේ අප සෑම - සියලු සත්වයන්ටත් පිහිට, සරණ ධර්මයයි. මිසදිටු බව, මිසදිටු ධර්ම සේවනය සසර ඉහළම දුක උරුම කර දෙනවා. මිසදිටු නොවී සැබෑ ධර්මය තුළ නිර්වාණ සැප පිණිස අප්‍රමාදී වන ලෙස මාහිමිපාණන් වහන්සේ දිවිය පුරාවට අවවාදයෙන්, ආදර්ශයෙන්, දේශනයෙන්, ඉගැන්වීමෙන් ආදී හැම අයුරින් කියා දුන්නා.

## උතුම් ගෞරවය

අපිත් ඒ උතුම් ධර්මය සරණ යමු. පිහිටාධාර කරගනිමු. වඩමු. දියුණු කරමු. ඒ ධර්ම ක්ෂාන්තිය අත්විඳිමු. නිවනින් සැනසෙමු. ඒ වෙනුවෙන් අප්‍රමාදී වෙමු.

අප මාහිමිපාණන් වහන්සේ වෙනුවෙන් අපහට කිරීමට ඇති උතුම් ගෞරවය අප්‍රමාදීව ඒ දහමෙහි නිරත වීමයි. ඒ සඳහා පූජනීය අප මාහිමිපාණන් වහන්සේගේ මෙම උත්තම ජීවන තොරතුරු, භාවනා කමටහන් වැඩූ අයුරු හා අත්දැකීම් සැම උපකාරයක් ම වේවා! ඒ පිවිතුරු ධර්ම සම්භාරය මෙසේ ලෝකයා වෙත දයාද කිරීමෙන් ද, එමගින් ගිහි - පැවිදි

උතුමන් තම දිවි මගට, නිවන් මගට යම් පමණ උපකාරයක්, උපයෝගයක්, අනුගමනයක් කරගනියි ද ශ්‍රද්ධා, වීර්ය ආදී ගුණ ඇති - දැඩි කර ගනියි ද එමගින් අත්වන සකලවිධ කුසල ධර්ම සම්භාරය අප මාහිමිපාණන් වහන්සේගේ ඒ අතිපාරිශුද්ධ, අනුත්තරීතර ලොව්තුරා සම්මා සම්බුද්ධත්ව ප්‍රාර්ථනාව සුවසේම මුදුන්පත් කරගැනීම පිණිසම හේතු වේවා!

අපගේ ආචාර්යෝත්තම බුද්ධාංකුර මහා ස්වාමිපාදෝත්තමයන් වහන්සේට සිතින් - කයින් - වදනින් හැම කල්හි අපගේ ගෞරවාදර නමස්කාරය වේවා!

අපගේ සිත - කය - වදනින් සිදුවූ යම් වරදක් ප්‍රමාද දෝෂයක් වේ නම් ඊට සමාව ලැබේවා!

මෙහි විස්තර වශයෙන් ඉදිරිපත් කෙරෙන සියලු කරුණු මාහිමිපාණන් වහන්සේගේ ලිඛිත - වාචික තොරතුරු හා ජීවන තොරතුරු වලටත් ධර්මයට අනුකූලවත් දැක්වෙනවා. එහි යම් හෝ ප්‍රමාද දෝෂයක් වේ නම් ශ්‍රී සද්ධර්මයෙන් අපහට සමාව ලැබේවා! පූජනීය අපගේ මාහිමිපාණන් වහන්සේගෙන් ද සමාව ලැබේවා!


පරිශීලනය කරන සත්පුරුෂ උතුමන් ද මෙහි යම් වරදක් දක්නේ නම් ඊට අප හට ඛමාවී එය ඉවත ලා බුද්ධාංකුර උතුමන් වහන්සේගේ සීල - සමාධි - ප්‍රඥා අමිල ගුණයම දැක එය තම පිළිවෙත් මගට උපකාරයක්, වීර්යයක් බවට පත්කොට දහම් මග වැඩීමට අප්‍රමාදී වෙත්වා!

සියලු සත්වයෝ දහමින් සැනසෙත්වා!




පූජනීය අප මාහිමිපාණන් වහන්සේ නා උයන අරණෙහි වැඩසිටි කුටිය









# ථෙරාසභො අරියධම්මයතින්‍දනාථො.

සීලාදිනෙකගුණසොභිතපුඤ්ඤතෙජො
සබ්බසු තීසු පිටකෙසුපි කොවිදෙ යො
ථෙරාසභො අරියධම්මයතින්‍දනාථො
සබ්බඤ්ඤුතං ලභතු තං පරමුත්තමං සො

සීලාදී නොයෙක් ගුණයන්ගෙන් ශෝභමාන වූ පින් තෙදක් ඇත්තා වූ, සියලු ත්‍රිපිටකයෙහිම දක්‍ෂ වූ, ශ්‍රේෂ්ඨ මහතෙරනමක් වූ යම් අරියධම්ම නමැති අතිඋතුම් යතිවරයන් වහන්සේ නමක් වේද, ඒ උතුමන් වහන්සේ ඒ පරම - උත්තම වූ සර්වඥතා ඥානය ලබන සේක්වා.

ඛීණාසවොති භුවි පත්‍ථටකිත්තිඝොසො
ඣානාදිනෙකබලපූරිතධම්මකායො
සද්ධො තිසාසනධරො යතිපුඞ්ගවො යො
සබ්බඤ්ඤුතං ලභතු තං පරමුත්තමං සො

රහතන් වහන්සේ නමක් යැයි ලොවපුරා පැතිරුණු කීර්ති ඝෝෂා ඇත්තා වූ, ධ්‍යානාදී නොයෙක් බලයන්ගෙන් පිරුණු ධර්මකායක් ඇත්තා වූ, පිරිසිදු ශ්‍රද්ධාවකින් යුක්ත වූ, පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ සාසනයම දරන්නා වූ, ශ්‍රේෂ්ඨ යතිවරයන් වහන්සේ නමක් වූ (අරියධම්ම නමැති) ඒ මහෝත්තමයාණන් වහන්සේ, ඒ පරම - උත්තම වූ සර්වඥතා ඥානය ලබන සේක්වා.

**ජාතීනමට්ඨසත චෙව සහස්සමත්තං**
**ගන්ත්වාන ඤාණපදසා උජුභූතමග්ගෙ**
**සම්බොධිඤාණලභිතුං නියතො සුපඤ්ඤො**
**සබ්බඤ්ඤුතං ලභතු තං පරමුත්තමං සො**

ජාති (භව) 1800ක් පමණ කාලයක් ඤාණය නමැති පාදයෙන් සෘජු නිවන් මාර්ගයෙහි වැඩම කොට සම්බෝධි ඤාණය (ලොවුතුරා බුඩත්වය) ලැබීමට නියත වූ මනා ප්‍රඥ ඇත්තා වූ ඒ (අරියධම්ම නමැති) අති උතුම් යතිවරයන් වහන්සේ ඒ පරම - උත්තම වූ සර්වඥතා ඥනය ලබන සේක්වා.!!!

◡◡–◡–––◡––◡–◡◡ (වසන්තතිලකා වෘත්තය)

"භාවෙතබ්බං පනිච්චෙවං - භාවනාද්වයමුත්තමං

පටිපත්තිරසස්සාදං - පත්ථයන්තේන සාසනෙ" ති.

(අභිධම්මත්ථ සංගහ)

කෙලෙසුන් නැති කිරීමට කෙලෙසුන් ජය ගැනීමට මග පල නිවනට පැමිණීමට විදර්ශනාව ඒකායන මාර්ගයයි. "සමාහිතෝ යථා භූතං පස්සති" වදාළ ඇති බැවින් විදර්ශනාවට සමාධිය පදනම් වෙයි. ඒ හෙයින් සමථ විදර්ශනා භාවනා ක්‍රම දෙකම ප්‍රගුණ කරගත යුතු වේ.

ශ්‍රී ලංකාවේ ඈත අතීතයේ මෙන් නැවතත් ධ්‍යාන අභිඥා මාර්ග ඵල අධිගම ලාභීන් බහුල වීමට මෙම භාවනා මාර්ගය අනුගමනය කරනු පිණිස සසර ඇවිදි සියලු දෙනා උත්සාහවත් වෙත්වා යන පැතුමෙන් මෙසේ සටහන් කරනුයේ ශාසනාභිවෘද්ධි ප්‍රාර්ථනාවෙනි.



පූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්ථවිර.

Designing & Printed By : EPA Advertising (pvt) Ltd